වාර්ෂික වාර්තාව

2022

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව -2022

පටුන **පිටුව**

දැක්ම හා මෙහෙවර 1

ඓතිහාසික පසුබිම 2

2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය **6**

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය **7**

2022 වර්ෂය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය **10**

අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන 11

2022 විගණන කමිටු වාර්තාව 12

ඉකුත් වසර 7 තුළ වත්කම් හා වගකීම් 14

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල -2022 16

01 කොටස **පාලන වාර්තාව**

පළමුවැනි පරිච්ඡේදය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය 18

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කර්තව්‍යයන් 19

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය 20

මහවැලි කලාප වල ව්‍යුහය හා පරිපාලනය 21

සැලසුම් හා මෙහෙයුම් අංශය 43

අභ්‍යන්තර විගණන අංශය 43

ජල කළමනාකරණ ලේකම් කාර්යාලය 45

ප්‍රසම්පාදන අංශය 48

දෙවැනි පරිච්ඡේදය තාක්ෂණ සේවා අංශය 49

පහල නිම්න සංවර්ධන අංශය 51

ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් 54

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය 56

විදුලි හා යාන්ත්‍රික අංශය 58

ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය 67

ඉඩම් පරිහරණ සැලසුම් අංශය 67

වන හා පරිසර සංරක්ෂණ අංශය 76

තුන්වැනි පරිච්ඡේදය	ඉඩම් අංශය	80
	කෘෂිකර්ම සංවර්ධන අංශය	83
	සීවර හා පශු සම්පත් සංවර්ධන අංශය	89
	ආයතන සංවර්ධන අංශය	94
	ව්‍යාපාර සංවර්ධන අංශය	96
සිව්වැනි පරිච්ඡේදය	පිරිස් හා පාලන අංශය	99
	නීති අංශය	100
	මුදල් අංශය	102
	මහවැලි ආරක්ෂක බලකාය	104
	ප්‍රවාහන අංශය	108
පස්වැනි පරිච්ඡේදය	i කොටස ශ්‍රී ලං.ම.අ.යටතේ පිහිටුවනු ලැබ ඇති සමාගම්	109
	ii කොටස වාර්ෂික ගිණුම්	110
	iii කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව	124
	iv කොටස විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම	148
	v කොටස ශ්‍රී ලං.ම.අ. කාර්ය සාධන වාර්ථාව	173

දැක්ම

තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය,
පරිසර සංරක්ෂණය සහ මහවැලි බල ප්‍රදේශවල
පදිංචි පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවනු
වස් භූමිය සහ ජලය ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම
සඳහා වන ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට
පත්වීම.

මෙහෙවර

මහවැලි ප්‍රජාව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය
ඉහළ නැංවීම සඳහා නවීන තාක්ෂණය මත
පදනම් වූ නවෝත්පාදන හා තිරසාර
කෘෂිකාර්මික ඵලදායිතාවය උදෙසා භූමිය හා
ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම,
පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, හරිත
පරිසරය සහ පරිසර හිතකාමී සංචාරක
කර්මාන්තයට දායක කර ගැනීම.

ඓතිහාසික පසුබිම

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබ ඇති දැවැන්ත භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහනකි. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේදී එවකට පැවති රජය විසින් UNDP/FAO සංවිධානය මගින් ලද තාක්ෂණික සහායන් මත සැලසුම් කරන ලදී. මධ්‍යම කඳුකරයේ පවතින ස්වාභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂි කර්මාන්තයට හා ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යභාරයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය තීව්‍ර වීමත් සමග පැන නැඟුනු අතුරු ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී නිෂ්පාදන වේගය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. 1969 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 11.8 ක් විය. මෙය 1940 ජනගහනයේ මෙන් දෙගුණයක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 3.1% ක් විය. මෙලෙස ජනගහනය වැඩිවීම නිසා ආහාර සඳහා 1980 වන විට සහල් මෙ.ටො. මිලියන 1.8ක් අවශ්‍ය යැයි උපකල්පනය කරන්නට විය. නමුත් 1969 දී සහල් නිෂ්පාදනය වූයේ මෙ.ටො. මිලියන 0.7 ක් පමණි. එමෙන්ම කර්මාන්ත වර්ධනයට හා ගෘහස්ථ පරිභෝජනයට විදුලිය ගිගා වොට් පැය 2000 ක් පමණ විය. නමුත් 1969 වන විට විදුලිය නිෂ්පාදනය වූයේ වසරකට ගිගා වොට් 470 ක් පමණි. ඉන් ගිගා වොට් පැය 388 ක් ජල විදුලිය වූ අතර ඉතිරිය ඛනිජ තෙල් දහනයෙන් ලද තාප විදුලිය වේ. තවද 1960-1967 කාල සීමාව තුළ සහල් මෙ. ටො. 466,000 ක් වාර්ෂිකව ආනයනය වූ අතර ඒ සඳහා වසරකට රු. මි. 200 බැගින් විදේශයන්ට ගලා යන්නට විය. මේ හැර අතිරේක බෝග සඳහා ද රු. මි. 139 ක් වාර්ෂිකව වැය වී ඇත. එම වියදම ඉතා ඉහළ අගයක් විය.

ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ජනගහනය ඒකරාශිවීමක් දක්නට ලැබුණි. තෙත් කලාපය තුළ ජනඝනත්වය වර්ග කිලෝමීටරයට 465 වූ අතර වියළි කලාපය තුල වර්ග කිලොමීටරයට 80 ක් පමණ විය. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 66% ක්ම වියළි කලාපයට අයත් වන අතර ජනගහනයෙන් 70% ක් තෙත් කලාපයේ ජීවත් විය. මේ අනුව වියළි කලාපයේ විශාල බිම් ප්‍රදේශයක් පුරාම ඉතා අඩු ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබිණි. ඒ අනුව ලංකාවේ අනෙකුත් ගංඟා හා සසඳන කළ තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 6න් 1කට ලැබෙන වර්ෂා ජලය සිය ග්‍රහණයට ගෙන වියළි කලාපය මැදින් මුහුදු වෙත ගලායන මහවැලි ගඟ වසරේ සෑම කාලයකදීම සුපෝෂිත ගංඟාවකි. මේ අනුව මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් ලැබෙන ජලයෙන් වියළි කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමත්, ඉහළ මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිතව විදුලි බලාගාර ඉදිකිරීමත් මගින් ශ්‍රී ලංකාවේ අනාගත අවශ්‍යතා සපුරා ගත හැකි බව ප්‍රත්‍යක්ෂ විය. මේ පිළිබඳ ඉදිරිපත් වූ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස රජය කළ ඉල්ලීමකට අනුව එක්සත් ජනපද මෙහෙයුම් දූත මණ්ඩලය වියළි කලාපය ආශ්‍රිත ඉඩම් සංවර්ධනය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් 1956 දී ආරම්භ කර ඇත. ඒ සමඟම ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා මිනුම් දෙපාර්තමේන්තු යන ආයතනවල සහය ඇතිව කැනේඩියානු රජයේ තාක්ෂණික ආධාර මත කැනේඩියන් හන්ටින් සර්වේ කෝපරේෂන් ආයතනයද ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මහවැලි ගඟ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම ආයතන එම අධ්‍යයනය පිළිබඳ ස්වාධීන වාර්තා දෙකක් 1961 දී ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අනුමැතිය සඳහා 1962 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

සමස්ත මහවැලි ද්‍රෝණියේම ජල සම්පත පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු නොකර මහවැලි ජලයෙන් කොටසක් හරවා යැවීම අයහපත් ප්‍රතිඵල ජනනය කරන බැවින් දේශීය විද්වතුන්ගේ අදහස් හේතුවෙන් පාර්ලිමේන්තුව මෙම යෝජනා අනුමත නොකරන ලදී. ඉන්පසු මහවැලි ගඟ ඇතුළු වෙනත් ගංඟා ආශ්‍රිත ඉඩම් හා ජල සම්පත් පිළිබඳ සමස්ත අධ්‍යයනයක් කර සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ව්‍යාපෘති තෝරා ස්වාධීන නිර්දේශ ඉදිරිපත් කරන ලෙස 1962 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවන ලදී. එයට අමතරව එම කණ්ඩායමට සහාය සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥ පිරිසක් හා කාර්ය මණ්ඩලයක් ද පත් කරන ලදී.

සිව් වසරක දැඩි අධ්‍යයන පරිශ්‍රමයකින් පසුව 1968 දී වෙන් වෙන් වූ විශේෂ වාර්තා 14 කින් යුතු කාණ්ඩ තුනක අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලද මහවැලි සංවර්ධන සැලැස්ම 1968 වසරේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
උතුරු මැද පළාත් සහ නැගෙනහිර පළාත් ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ප්‍රදේශය කලාප 13 ක් ලෙස නම් කරන ලද අතර එය ඉංග්‍රීසි A සිට M දක්වා නම් කෙරුණි. ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා අඩු ආයෝජනයක් මගින් වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි ව්‍යාපෘති පළමු වන පියවර යටතට ගන්නා ලදී.

මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්ම ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟේ ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900 ක් පමණ වූ ජල ප්‍රමාණයක් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා සැපයීමයි. දෙවන අරමුණ වූයේ ජලාශ 15 ක් ඉදිකර 11 ක් ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද මහවැලි මහ සැලැස්ම අනුව මහවැලි ගංගා ද්‍රෝණියේ සහ වියළි කලාපය තුළ වූ තවත් ගංගා ද්‍රෝණි වල පිහිටි ඉඩම්, හෙක්ටයාර් 364,372 ක් සඳහා යල මහ දෙකන්නයටම වගා කිරීමට වාරි ජල පහසුකම් සලසා දීමට යෝජනා කර තිබුණි. මෙයින් හෙක්ටයාර 264,777ක් අළුතින් අස්වැද්දීමට යෝජිත වූ අතර හෙක්ටයාර 110,404 ක් ඒ වන විට වසරක එක් කන්නයක් පමණක් වගා කළ ඉඩම් විය. සැලසුම් කළ ජලාශ හා ඇල මාර්ගවල විභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් ගිගා වොට් පැය 2037 ක වාර්ෂික ස්ථාවර විදුලිය ප්‍රමාණයක් ජනනය කළ හැකි බවද එයින් පෙන්වා දී තිබුණි. මහවැලි මහා සැලැස්ම අනුව එම සංවර්ධන කටයුතු වසර 30 ක් තුළ නිම කිරීමට යෝජනා විය. අරමුදල් යෙදවීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුව මෙන්ම විශේෂයෙන්ම සංවර්ධන ප්‍රතිලාභ වල අවශ්‍යතාවය යන කරුණු පිළිබඳ අවධානය යොමුකර සංවර්ධන කටයුතු පියවර තුනකට බෙදා තිබුණි.

I ප්‍රථම පියවර

1969-1980 අතර කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. මේ තුළින් අළුත් ඉඩම් හෙක්ටයාර් 74,494 කට පැරණි ඉඩම් හෙක්ටයාර් 58,300 කට වාරි ජලය සැපයීමටත් ගිගාවොට් පැය 820 ක් වාර්ෂික ස්ථාවර විදුලිය බල ප්‍රමාණයක් ජනනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙම පියවරේ වැඩ කටයුතු ව්‍යාපෘති තුනක ට බෙදන ලදී. එනම්,

- පොල්ගොල්ල හැරවුම (1969-1973)
- වික්ටෝරියා / මිනිපේ හැරවුම (1973-1977)
- මොරගහකන්ද බහුකාර්යය ඒකකය

II දෙවන පියවර

මේ යටතේ මාදුරුඔය ජලාශය, තල්දෙන බහුකාර්ය සංකීර්ණය හා කන්දකාඩු අමුණ යන මූලස්ථ වැඩ කොටස් යටතේ මහවැලි හා මාදුරු ඔය නිම්නයන්හි ඉඩම් හෙක්ටයාර 93,117 ක් වගා කිරීමට වාරි පහසුකම් ලැබෙන අතර මෙයින් ඉඩම් හෙක්ටයාර 8,502 ක් ඒ වන විටත් වගා කරමින් තිබූ ඉඩම් යැයි ගණන් බලා තිබේ. මෙගා වොට් 15 ක ස්ථාපිත ජවයක් සහිත ජල විදුලි බලාගාරයක් තල්දෙනදී ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය පෝෂණය කිරීමට උල්හිටිය රත්කිඳ ජලාශයේ සිට උමඟක් ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය ආශ්‍රිතව මෙගා වොට් 4.9 ක ස්ථාපිත ජවයක් ඇති කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මෙහි ප්‍රධාන කාර්යයන් විය.

III තෙවන පියවර

මෙමගින් දිවයිනේ උතුරු මධ්‍යම පළාතේ අලුත් ඉඩම් හෙක්. 105,668 ක් සංවර්ධනය කෙරේ. ජල විදුලිය නිපදවීමේ අවසන් සැලසුම ක්‍රියාත්මක කොට මෙගා වොට් 293 ක ප්‍රමාණයක ස්ථාපිත ජවයක් ඇති විදුලි බලාගාර ඉදිකරන අතර එමගින් වාර්ෂිකව ගිගා වොට් පැය 1169 ක ස්ථාවර විදුලි ජනනයක් කරනු ඇත. පැරණි මිනිපේ වම් ඉවුර ඇල වැඩි දියුණු කිරීම, කිලෝමීටර් 164 ක් උතුරු මධ්‍යම ඇල ඉදිකිරීම, රොටලාවල, උමාඔය, රන්ටැඹේ. කොත්මලේ, කළුගඟ ආදී ජලාශ ඉදිකිරීම මෙම පියවරට ඇතුලත් විය.නමුත් කාලීන අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දෙමින් මහවැලි මහ සැලැස්ම සංවර්ධන අදියර 3 කින් ක්‍රියාවට නැංවෙමින් පවතී.

මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (1 වන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්ම යටතේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙස පොල්ගොල්ල හා බෝවතැන්න ව්‍යාපාර 1970 දී ආරම්භ කරනු ලැබූ අතර, 1976 වන විට ඉදිකිරීම් කටයුතු අවසාන කිරීමට හැකි විය. මෙමගින්, පෙර පැවති ඉඩම් හෙක්ටයාර් 16,000 කට හා නව ඉඩම් හෙක්ටයාර 23,000 කට වාරි ජලය සැපයීමටද , මෙගා වොට් 40 ක ස්ථාපිත ධාරිතාවයකින් යුත් ජල විදුලිය නිපදවීමට ද හැකි විය. මේ ව්‍යාපාරය යටතේ මහවැලි එච් කලාපයට අයත් කලා වැව නිම්නයේ ගොවි පවුල් 23,000 ක් 1977 වන විට පදිංචි කරනු ලැබිණි. මේ වන විට මහවැලි ව්‍යාපාරය යටතේ එච් කලාපයේ සියලු ජනාවාස කටයුතු අවසන් කර ඇති අතර, එහි පදිංචි කරනු ලැබ ඇති මුළු පවුල් සංඛ්‍යාව 39,500 කි.

1977 වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ගැටලු රැසකට මුහුණ දී තිබිණි. සහල් ඇතුලු කෘෂි නිෂ්පාදන ආනයන වියදම ඉහළ යෑම ප්‍රධාන ගැටළුවක් විය. රට තුළ සහල් අවශ්‍යතාවයෙන් නිපදවූයේ 69%ක් වූ අතර 31% ක් ආනයනය මත රඳා පැවතිනි. එයට අමතරව තවත් අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන රැසක්ද ආනයන කරන ලදී. විදුලි බල නිෂ්පාදනය 1977 වන විට විදුලිබල මණ්ඩලයේ විදුලි ධාරිතාවය මෙගා වොට් 408 ක ප්‍රමාණයක් රටේ විදුලිබල ඉල්ලුම සැපයීමට එය ප්‍රමාණවත් නොවුනි. විදුලි බිඳ වැටීම් සාමාන්‍ය දෙයක් වූ අතර එය වසරකට දින 70 ක විදුලිය විසන්ධිවීමක් දක්වා වර්ධනය වී තිබිණි.

ශ්‍රී ලංකාවේ විරැකියාව 17% දක්වා වර්ධනය විය. විරැකියාව පහළ දැමීම අත්‍යවශ්‍ය කරුණක් විය. මෙම ගැටලුවට කඩිනම් විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය විය. මෙම ගැටළු ඉක්මනින් විසඳීමේ පියවරක් ලෙස මහවැලි සංවර්ධන මහ සැලැස්ම කඩිනම් කල යුතු බවට 1977.10.12 දින එවකට පැවැති රජය තීරණය කරන ලදී.

මහවැලි කඩිනම් වැඩසටහන (දෙවන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්මට අයත් තෝරාගත් ව්‍යාපෘති කිහිපයක් එක විට අරඹා වසර 6 ක් වැනි කෙටි කාලයකදී නිම කිරීමට 1977 දී රජය තීරණය කළේය. එය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම අමාත්‍යාංශයක් ද ආරම්භ කරනු ලැබීය. ඒ අනුව කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල හා මාදුරු ඔය ජලාශ යෝජනා ක්‍රම අරඹා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා විය. පසුව මෙයට රන්ටැඹේ ව්‍යාපාරය ද ඇතුළත් කෙරිණි. මෙයින් මාදුරුඔය හැර අනෙකුත් ජලාශ පාදක කොට ගෙන ජල විදුලිය උත්පාදනය කරනු ලබන අතර, එම ජලයම වාරි කර්මාන්තය සඳහා ද භාවිත කෙරේ. මේ අනුව මහවැලි සී හා බී කලාප සංවර්ධනය කොට ගොවි ජනයා පදිංචි කිරීමද මහවැලි කඩිනම් වැඩසටහනට අයත් විය. ඒ අනුව බී කලාපයේ පවුල් 30,465 ක් ද සී කලාපයේ පවුල් 45,488 ක් ද පදිංචි කර ඇත.

මෙම ව්‍යාපෘති සඳහා පිලිවෙලින් ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ජර්මනිය, හා කැනඩාවත්, පහළ නිම්න සංවර්ධනය සඳහා ලෝක බැංකුව, EEC, ජපන් හා කුවෙට් යන රටවල් මූල්‍ය ආධාර සපයන ලදී. මෙම ව්‍යාපෘති දියත් කිරීම සඳහා 1979 දී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපනය කරන ලද අතර, ඉංජිනේරු හා නිර්මාණ කාර්යයන් සඳහා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියත් නැවත පදිංචි කිරීම සඳහා මහවැලි ආර්ථික ඒජන්සියත් ස්ථාපිත කරන ලදී. එමෙන්ම කඩිනම් මහවැලි සංවර්ධනය මගින් ඉදිවුණු විශාල ජලාශ පාලනය සඳහා මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා මෙහෙයුම් අංශය 1986 දී ස්ථාපිත කරන ලදී. 1990 වර්ෂය වන විට කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘති නිමවූ අතර එමගින් විදුලිබල ක්ෂේත්‍රය හා කෘෂිකර්මාන්තය නැංවීමට විශාල ආයෝජනයක් සිදුවිය. මේ නිසා තවදුරටත් කෘෂිකර්මාන්තය ආයෝජනය සිදු කිරීමට රජය මැලි වූ බැවින් මහවැලි මහ සැලසුමට අදාළ මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටපත් විය. කෙසේ නමුත් දීර්ඝ කාලයක් මුළුල්ලේ සැලසුම් වලට පමණක් සීමා වී තිබූ මෙම සංවර්ධන ව්‍යාපෘතිය වර්තමානය වන විට ක්‍රියාත්මක තත්වයට පැමිණ තිබීම මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට ඉවහල් වේ.

මහවැලි ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය හා අනාගත සැලසුම්
(තෙවන සංවර්ධන අදියර)

මහවැලි සංවර්ධන වැඩසටහන රටේ සිව් දෙස ව්‍යාප්තවීමේ අදියර ලෙස තෙවන සංවර්ධන අදියර හැඳින්විය හැකිය. මොරගහකන්ද කළුගඟ ජලාශ යෝජනා ක්‍රමය හරහා උතුර, උතුර මැද, නැගෙනහිර, වයඹ සහ මධ්‍යම පළාත්වල කුඩා පරිමාණ වැව් 1,200 කට ජලය සැපයීමේ අරමුණින් මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. ඇලහැර ප්‍රදේශයේ කුඹුරුවලට, පොළොන්නරුව ප්‍රදේශයේ සියලු ජලාශවලට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියලු ප්‍රධාන ජලාශවලට වර්ෂය පුරා අඛණ්ඩ ජල සැපයුමක් ලබාදී නව වගා ඉඩම් හෙක්. 81,000 සඳහා ජලය සම්පාදනය කරමින් කෘෂිකාර්මික දියුණුවක් ඇති කිරීම මගින් දැය ස්වයංපෝෂිත කිරීමට දායකවීමත්, එහි විදුලි බලාගාරයේ විදුලි උත්පාදනය මගින් ජාතික විදුලි බල පද්ධතියට මෙ. වො. 25 ක ධාරිතාවයක් එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායකවීමත් මෙහි මූලික අරමුණු අතර වේ. එමෙන්ම ව්‍යාපෘතිය හරහා අවතැන් වූ ජනතාවට අවශ්‍ය ජනාවාස ඉදිකර දීමෙන් නොනැවතී, සියලු යටිතල පහසුකම් සහිරි ලග්ගල නගරය අලුතින්ම ඉදිකර ජනතා අයිතියට පත් කිරීමේ මහගු මෙහෙවරද මේ වන විට සාර්ථකව නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත සංවර්ධන වැඩසටහන් අතරින් තවත් එක් පියවරක සාර්ථක නිමාවක් සනිටුහන් කෙරේ.

මහවැලි සංවර්ධන අධිකාරිය තම කර්තව්‍ය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මේ මගින් උමාඔය ගංගා ද්‍රෝණියේ ජලය වැලිමඩ ප්‍රදේශයේ ඉදිකළ ජලාශ දෙකක එක්රැස් කර දිවයිනේ ප්‍රථම වරට කි. මී. 15.6 ක උමං මාර්ගයක් ඔස්සේ කිරිඳිඔය ද්‍රෝණියට හරවා යැවේ. එමගින් ආසියාවේ විශාලතම භූගත විදුලි බලාගාරය හරහා මෙ.වො. 120 ක ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත්, අතිදුෂ්කර ඌව පළාතේ කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම හා ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම යන තම මූලික අරමුණු ඉටුකරගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සාර්ථකව ගමන් කරමින් සිටී.

එපමණක් නොව මහවැලි ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරි මාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය, රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය, වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යනාදී ව්‍යාපෘතීන් රැසක් මහවැලි කලාප ආශ්‍රිතව ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද වර්තමානය වන විට විවිධ සංවර්ධන කාර්යයන් රැසක් මහවැලි එච්, බී, සී, ඩී, මොරගහකන්ද, රඹකැන්ඔය, හුරුළුවැව, ඊ සහ එල් යන කලාප ආශ්‍රිතව ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගමන් මඟ නව මඟකට යොමුකර මහවැලි නිෂ්පාදන හා ඵලදායිතාවය ඉහළ නැංවීම, මහවැලි ජනපදිකයින්ගේ ආදායම් ඉහළ නැංවීම සහ කඩිනමින් ගොවීන්ගේ ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමෙන් ඉඩම් අයිතිය තහවුරු කිරීම යනාදින් සිදු කරමින් මහවැලි ජානපදිකයින්ගේ ජීවන තත්වය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම අපේක්ෂා කරනු ලබයි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත ජලාශ හා අනෙකුත් ජලය පිරිසිදු ව්‍යාපෘතියක් මෙන්ම ජල පෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ වැඩසටහන්ද මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක කරමින් පවතී. එලෙසම ජාතික ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා මහවැලි කලාප ආශ්‍රිතව හා සත්ව පාලන කටයුතු ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

තවද සුනිත්‍ය බල ශක්ති වැඩසටහන යටතේ මහවැලි ජලාශවල පාවෙන සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම හා කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය කිරීම මගින් පරිසර හිතකාමී ලෙස ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත් ඒ මගින් විශාල ආදායම් උත්පාදනයක් සිදුකිරීම හරහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නව උපායමාර්ගික ආදායම් මාර්ග හඳුනා ගනිමින් සිටී.

මහවැලි කලාප ආශ්‍රිතව දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තෙවන සංවර්ධන අදියරේ සියලු මූලික අරමුණු ඉටුකර ගැනීමේදී රටේ සිව් දෙස ව්‍යාප්ත වෙමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික, වාරිමාර්ග හා පශු සම්පත්, බලශක්ති උත්පාදනය සහ පරිසර සංරක්ෂණය යන ක්ෂේත්‍ර වලින් උපරිම දායකත්වය ලබාදීම සඳහා නව සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතී.

2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

අනු අංකය	නම / තනතුර	කාලය
01	අයිවන් ඩි සිල්වා (සාමාජික), ලේකම් (වාරිමාර්ග අමාත්‍යාංශය),	2022 පෙබරවාරි සිට 2022 අගෝස්තු දක්වා
	යු.ඩී.සී ජයලාල් (සාමාජික), ලේකම් (වාරිමාර්ග අමාත්‍යාංශය),	2022 අගෝස්තු සිට 2022.12.31 දක්වා
02	සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොලඹ 10.	2021 ජනවාරි සිට 2022 දක්වා
03	පී.පී.එස්.ආර්. සිල්වා මහතා (සාමාජික), අධ්‍යක්ෂ (බාහිර සම්පත්), මුදල් අමාත්‍යාංශය, කොලඹ 01.	2022 මාර්තු සිට 2022.12.31 දක්වා
04	ආචාර්ය ඩී.එම් සූරතිස්ස මහතා (සාමාජික), අධ්‍යක්ෂ, පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, අංක 17,මලලසේකර මාවත, කොළඹ 07.	2022 අගෝස්තු සිට 2022.12.31 දක්වා
05	ගයානි ප්‍රේමතිලක මිය, නීති නිළධාරි, පලාත් සභා හා පලාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, අංක 330, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02	2022 අගෝස්තු සිට 2022.12.31 දක්වා

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2022 වර්ෂය අවසන් වන විට සිටි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පිළිබඳ තොරතුරු වාර්තාව

අනු අංකය	තනතුරු නාමය	නම
1	අධ්‍යක්ෂ ජනරාල්	කීර්ති බී. කොටගම මයා
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	එම්.එම්.ඒ. ගුණතිලක මයා, නේවාසික ව්‍යාපාර කළමනාකාර (2022.09.21 - 2022.12.31 වන දින දක්වා රාජකාරී ආවරණය)
3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)	ජී.ඩී.එන්. ද සිල්වා මයා (2021.07.22 – 2022.02.03 වන දින දක්වා ද්විතීයන පදනම මත)
		ඩී.කේ.වී. විජයවීර මිය, අධ්‍යක්ෂ (පර්යේෂණ, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති) (2022.08.01 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
4	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)	ඩී.එම්.එන්.ජේ. ධනපාල මයා, අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය) (2021.10.26 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
5	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)	ආර්.එම්. නෙවිල් රාජපක්ෂ මයා, අධ්‍යක්ෂ (කෘෂිකර්ම) (2021.12.01 - 2022.12.31 වන දින දක්වා රාජකාරී ආවරණය)
6	අධ්‍යක්ෂ (පිරිස් හා පාලන)	එම්.ඩබ්ලිව්.ආර්.එන්. ඩෙල්පට් මිය, රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) (2021.07.26 වන දින සිට මේ දක්වා වැඩ බැලීම), (2022.06.01 - 2023.07.25 වන දින දක්වා ද්විතීයන පදනම මත)
7	අධ්‍යක්ෂ (මුදල්)	ටී.ඩී. ප්‍රියන්ත මයා
8	අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)	එච්.එන්. යාලිංග මිය
9	අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය)	මහාචාර්ය එස්. මද්දුම බණ්ඩාර මයා (2022.02.01 - 2022.07.26 වන දින දක්වා කොන්ත්‍රාත් පදනම මත)
		ඩී. ප්‍රනාන්දු මයා (2022.08.18 වන දින සිට මේ දක්වා කොන්ත්‍රාත් පදනම මත)
10	අධ්‍යක්ෂ (කෘෂිකර්ම)	ඩී.කේ.එච්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ආර්. සෙනෙවිරත්න මිය, අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) (2021.12.01 වන දින සිට මේ දක්වා රාජකාරී කර ගෙන යාම)
11	අධ්‍යක්ෂ (ඩීවර හා පශු සම්පත්)	එම්.ජී.ටී. ප්‍රියදර්ශනි මිය
12	අධ්‍යක්ෂ (ඉඩම්)	එස්.ඒ.ඊ.ඩබ්ලිව්. කුලරත්න මිය, වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම්) (2021.01.26 – 2022.05.31 වන දින දක්වා වැඩ බැලීම) ඒ.එම්.ඒ.පී.එච්. ගුණවර්ධන මයා, නේවාසික ව්‍යාපාර කළමනාකාර (2022.08.01 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
13	අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන)	එම්.එල්.ඩී.සී. අබේවර්ධන මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) (2017.09.08 - 2022.03.31 වන දින දක්වා රාජකාරී ආවරණය) හා (2022.04.01 - 2022.07.25 වන දින දක්වා වැඩ බැලීම) හා (2022.07.26 වන දින සිට තනතුරේ ස්ථිර කර ඇත.)
14	අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන)	ඩී.කේ.එච්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ආර්. සෙනෙවිරත්න මිය

15	අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්)	ඉංජි. එස්.ඒ.ඒ. ධර්මසිරි මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පහළ නිම්න සංවර්ධන) (2021.10.26 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
16	අධ්‍යක්ෂ (පහළ නිම්න සංවර්ධන)	ටී. රණසිංහ මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) (2021.04.30 - 2022.12.31 වන දින දක්වා)
		ඉංජි. එම්.පී.එම්. පෙරේරා මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) (2022.12.30 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
17	අධ්‍යක්ෂ (ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්)	ඉංජි. එස්.ආර්.කේ. අරුප්පොල මයා (2017.02.01 - 2022.12.31 වන දින දක්වා)
18	අධ්‍යක්ෂ (ගංඟා ද්‍රෝණි කළමනාකරණ)	ඉංජි. චන්ද්‍රා සෙනරත් මෙය (2022.12.31 වන දින දක්වා)
19	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්)	ජේ.එම්.අයි.එච්. ජයවර්ධන මිය, සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) (2018.08.27 - 2021.08.31 වන දින දක්වා රාජකාරී ආවරණය) හා (2021.09.01 වන දින සිට මේ දක්වා රාජකාරී ඉටු කිරීම)
20	අධ්‍යක්ෂ (වන හා පරිසර)	ඒ.එම්.කේ.බී. අත්තනායක මයා
21	අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය)	ඉංජි. ඩී.එම්.එන්.ජේ. ධනපාල මයා (2021.04.30 වන දින සිට මේ දක්වා)
22	අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන)	බී.එල්.බී. සේනාරත්න මයා, සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) (2018.08.27 - 2021.08.03 වන දින දක්වා රාජකාරී ආවරණය) හා (2021.08.04 වන දින සිට මේ දක්වා රාජකාරී ඉටු කිරීම)
23	අධ්‍යක්ෂ (පර්යේෂණ, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති)	ඩී.කේ.වී. විජයවීර මිය
24	අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික)	ජේ.ආර්. බෝපිටිය මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) (2019.11.15 - 2021.08.31 වන දින දක්වා රාජකාරී ආවරණය) හා (2021.09.01 - 2022.12.31 වන දින දක්වා රාජකාරී ඉටු කිරීම)
25	නේවාසික ව්‍යාපාර කළමනාකාර (බී කලාපය)	පී.ජී. නොයෙල් ජයසිරි මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2020.11.03 - 2022.08.01 වන දින දක්වා රාජකාරී ආවරණය)
		අයි. රණවීර මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2022.08.01 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
26	නේවාසික ව්‍යාපාර කළමනාකාර (සී කලාපය)	අයි.එම්.යූ.කේ. කුමාර මහතා (2020.10.26 වන දින සිට මේ දක්වා)
27	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඩී කලාපය)	ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා (2021.02.04 - 2022.07.31 වන දින දක්වා)
		ඒ.ජී.ටී.එච්. ජයසිංහ මයා නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2022.11.16 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
28	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඊ කලාපය)	ජේ.පී. ජයතිලක මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (කෘෂිකර්ම) (2021.02.12 - 2022.08.03 වන දින දක්වා රාජකාරී ආවරණය)
		එච්.එම්.කේ.ආර්. හේරත් මයා (2022.08.01 වන දින සිට මේ දක්වා)
29	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ජී කලාපය)	ඒ.ජී.ටී. හේමන්ත ජයසිංහ මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2017.02.01 -2022.07.27 වන දින දක්වා රාජකාරී ආවරණය)
		ආර්.එම්.කේ.බී. රන්දෙණිය මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2022.09.29 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)

30	නේවාසික ව්‍යාපාර කළමනාකාර (එල් කලාපය)	එච්.එම්.කේ.ආර්. හේරත් මයා (2021.04.05 - 2022.07.31 වන දින දක්වා)
		ජේ.පී. ජයතිලක මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (කෘෂිකර්ම) (2022.08.04 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
31	නේවාසික ව්‍යාපාර කළමනාකාර (එච් කලාපය)	ඩබ්ලිව්.එම්.එස්. වීරසිංහ මයා, කොට්ඨාශ කළමනාකාර (2020.10.29 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
32	නේවාසික ව්‍යාපාර කළමනාකාර (හුරුළුවැව කලාපය)	එම්.එම්.ඒ. ගුණතිලක මයා (2020.10.14 - 2022.08.02 වන දින දක්වා)
		පී.ජී.එන්. ජයසිරි මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) (2022.08.02 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
33	නේවාසික ව්‍යාපාර කළමනාකාර (රඹකැන්ඔය කලාපය)	ඒ.එල්. ඔස්මන් ද සිල්වා මහතා (2021.10.04 - 2022.12.31 වන දින දක්වා)
		එච්.පී.එස්. තිලකරත්න මයා, ගණකාධිකාරී (2022.12.23 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)
34	නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය)	එල්.එම්.එන්. ප්‍රියන්ත මයා, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (පාලන) (2021.10.01 වන දින සිට මේ දක්වා රාජකාරී ආවරණය)

2022 වසර සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය

1979 අංක 23 දරණ පනත මගින් විශේෂ බලතල සහිතව බහුවිධ අරමුණු පෙරදැරිව ආරම්භ කල මහවැලි ගග සංවර්ධන යෝජනා ක්‍රමය මෙරට ක්‍රියාත්මක දැවැන්තම භෞතික හා මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය වන අතර එමඟින් ආරම්භයේ පටන් වර්තමානය දක්වා විවිධ වූ විෂය ක්ෂේත්‍රයන් මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. මහවැලි සංවර්ධන සැලැස්මට අනුකූලව ජාතික ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය වාරි ජල පහසුකම් සැපයීම, පුනර්ජනනීය විදුලිබල උත්පාදනය, පානීය ජලය සහ වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම මෙන්ම මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ ඉලක්කයන් සපුරාගැනීමේලා මහවැලි සංවර්ධන වැඩසටහන දශක 5කට වඩා වැඩි කාලයක් පුරාවට ජාතික ආර්ථික ක්‍රියාවලියට සුවිශේෂ දායකත්වයක් ලබාදෙනු ලබයි. විවිධ විෂයය ක්ෂේත්‍රයන් යටතේ සංවර්ධන කාර්යන් වඩාත් කාර්යක්ෂමව ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීමේ ව්‍යුහයක් සහිත ආයතනයක් ලෙස සංවර්ධනයට වෙන් කල දේශීය හා විදේශීය අරමුදල් සහ රාජ්‍ය නොවන ආයතනවල අරමුදල් ඵලදායිව ආයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

පසුගිය වර්ෂය දෙක තුල පැවති Covid 19 අවදානම් තත්වය මෙම වර්ෂයේ මුල් කාර්තුවෙන් පසුව පහව යාමත් සමග දේශීය ආර්ථිකය නගා සිටුවීම සඳහාත් ජනපදික ගොවි ජනතාවගේ ආර්ථික තත්වය නගා සිටුවීම සඳහාත් මෙම වර්ෂයේදි කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කැපිපෙනෙන වර්ධනයක් අත් කර ගෙන ඇති අතර දේශීය වි සහ අතිරේක බෝග බීජ නිශ්පාදනය ප්‍රවර්ධනය කිරීම, අතිරේක භෝග මහවැලි කලාප ආශ්‍රිත ගොවිබිම් තුල වගා ක්‍ර ඉහළ අස්වැන්නක් ලබා ගැනීම, මහවැලි කලාපීය ගෙවතු සංවර්ධන වැඩසටහන දිරිමත් කිරීම, වාරි සෞභාග්‍ය වැඩසටහන ලද සීමිත ප්‍රතිපාදන මත සාර්ථකව නිම කිරීම, ධීවර හා පශුසම්පත් සංවර්ධනය යටතේ දියර කිරි,බිත්තර, මිරිදිය හා විසිතුරු මත්ස්‍ය හා මිරිදිය ඉස්සන් නිෂ්පාදනය යන සියලු වැඩසටහන් වලින් විශාල ඵ්‍රතියක් ලබාගත් වර්ෂයකි. කෘෂිකර්ම අංශය සඳහා නවීන තාක්ෂණික ක්‍රමෝපායන් හදුන්වාදීමට කටයුතු කර ඇති අතර එහි සාර්ථක ප්‍රථිපල ගොවි ජනතාව භුක්තිවිදිමින් සිටි.මෙයට අමතරව කෘෂිකර්ම හා පශු සම්පත් අංශයේ අභිවෘද්ධිය සඳහා විදේශ ව්‍යාපෘති ලෙස එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය, ආසියානු සංවර්ධන බැංකුව,WORLD VISION ව්‍යාපෘතිය, මගින් ප්‍රතිපාදන වෙන්ව මුලික කටයුතු ආරම්භ කල වර්ෂයකි.
මෙයට අමතරව සුළු හා මධ්‍ය පරිමාණ වාරිපද්ධති සංවර්ධනය සඳහා විදේශ ව්‍යාපෘතියක් ලෙස ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් සැලසුම්කරන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇත. පරිසර හා වන සංරක්ෂණ අංශයෙන් ආක්‍රමණශීලි ශාක ව්‍යාප්තිය පාලනය,ජල පෝෂක හා පහල නිම්න ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂනය සඳහා පැළ සිටුවීම හා ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීම යන කාර්යයන් ඉටු කර ඇත. ගොවි සංවිධාන ශක්තිමත් කර ජනපදික ඉඩම් ගැටලු නිරාකරනය කරමින් හිමිකම් ඔප්පු ලබාදීම මෙම වර්ෂයේදි කඩිනම් කර ඇත. දිර්ඝ කාලීනව විදුලිය විසන්ධි වීම පාලනය සඳහා විශේෂ අවදානය යොමු කර ජල විදුලි නිශ්පාදන දායකත්වය ඉහල නැංවීම තුලින් ජාතික ආර්ථිකයට විශාල දායකත්වය දීමට හැකි විය. එමෙන්ම ගංවතුර පාලනය ඇතුලු ජල කළමනාකරණය සාර්ථකව සිදුකිරීම මගින් ජනපදික ගොවි ප්‍රජාවගේ වගා සුරක්ෂිතතාව තහවුරු කර ඇත.

ඉහත කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මුලික මගපෙන්වීම හා උපදේශනය සපයන ගරු වාරිමාර්ග අමාත්‍ය රොෂාන් රණසිංහ මැතිතුමන්ගෙන් ලැබෙන ධෛර්යය හා ඉතා අගය කොට සලකමි. එමෙන්ම අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමන්ලාගේ සුවිශේෂී කැපවීම මත ඉහත ඉලක්කයන් සාර්ථකව ජය ගැනීම සඳහා කටයුතු කල ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු සමස්ථ කාර්යය මණ්ඩලයට හා අනුබද්ධිත සියලුම වල දේශීය විදේශීය ව්‍යාපෘතීන්හි කාර්යය මණ්ඩලය වෙත මාගේ ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



කීර්ති.බී.කොටගම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රීලංකා මහවැලි අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 2022-12-31 දිනට සංවිධානයේ විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමඟ කාරුණිකව ඉදිරිපත් කරමු.

2022 වර්ෂය පිළිබඳ සමාලෝචනය

අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති සමාලෝචනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිදුකරන ලද සංවිධානයේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර ප්‍රකාශයක් අන්තර්ගත කර ඇත.

එසේම සංවිධානයේ වත්කම්, සුරැකීම්, වංචා, දූෂණ හා වෙනත් අක්‍රමිකතා සොය බැලීම සහ අවදානම් අවම කිරීමේ අරමුණින් අභ්‍යන්තර පාලනය පිළිබඳ මනා කළමනාකාරීත්වයකින් කටයුතු කර ඇත.

තවද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලුම කාර්ය මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී දක්වා ඇති ඉමහත් කැපවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් වශයෙන් අපගේ ප්‍රශංසාව මෙයින් පල කරමු.

යු.ඩී.සී ජයලාල් දිසානායක මහතා

ලේකම්

වාරිමාර්ග අමාත්‍යාංශය

පී.පී.එස්.ආර්. සිල්වා මහතා

අධ්‍යක්ෂ (බාහිර සම්පත්),

මුදල් අමාත්‍යාංශය

ආචාර්ය ඩී.එම් සූරතිස්ස මහතා,

අධ්‍යක්ෂ,

පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

ගයානි ප්‍රේමතිලක මිය,

නීති නිළධාරි,

පලාත් සභා හා පලාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

2022 විගණන කමිටු වාර්තාව

අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි(මු.රෙ.133) ප්‍රකාරව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා තිබෙන අතර මු.රෙ.134(1) ප්‍රකාරව ප්‍රධාන අභ්‍යන්තර විගණක සෘජුවම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරනු ලබයි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය, ශ්‍රී ලංකා ජනරජය විසින් නිකුත් කර ඇති මූල්‍ය රෙගුලාසි (Financial Reguations), ආයතනික රෙගුලාසි (Adminstration Regulations), කාලීනව නිකුත් වන චක්‍රලේඛ, ප්‍රතිපත්ති තීරණ සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, පරීක්ෂණ නිරීක්ෂණ මගින් අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කරමින්, කළමනාකාරිත්වයට සහය වීම සිදු කරනු ලබයි.

<u>කාර්යය භාරයන්</u>

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුකූලව සහ යහපාලන ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියාත්මක කරනවාද යන්නත්, සිදු කරන ලද ගනුදෙනු වලින් ආර්ථිකමය ප්‍රතිලාභ (Value for Money) ලැබෙනවාද යන්නත්, විගණන පරීක්ෂණයන් නිරීක්ෂණ, සැසඳීම්, භෞතික පරීක්ෂණ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICA) මඟින් සහ ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිතීන් (IAS) මගින් නිකුත් කරන ලද ප්‍රමිතීන් වලට අනුගතව, විගණනය සිදු කර කළමනාකාරිත්වය වෙත වාර්තා කිරීම.

අ) වැරදි හා වංචා හෙළිදරව් කර ගැනීම හා වැලැක්වීම සඳහා අධිකාරියේ ක්‍රියාත්මකව පවතින අභ්‍යන්තර පාලන පද්ධතියේ ශක්තිමත්භාවය ඇගයීම.

ආ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිභාවය හා විශ්වාසනීයත්වය පරීක්ෂාව

ඇ) අධිකාරියේ වත්කම් නිසි පරිදි ආරක්ෂිතව පවතීද යන්න සොයා බැලීම

ඈ) අධිකාරියේ එක් එක් අංශයන්හි වගකීම් හා කාර්යභාරය ඉටු කිරීමෙහිලා ඒවායේ කාර්යසාධනය ඇගයීමට ලක් කිරීම.

ඉ) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර හා වෙනත් රාජ්‍ය චක්‍රලේඛ, අධිකාරියේ පාලන චක්‍රලේඛ ඇතුලු නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූලව කටයුතු කර තිබේද යන්න පරීක්ෂා කිරීම.

ඊ) අවශ්‍ය වූ විටකදී විශේෂ විමර්ශන පැවැත්වීම.

උ) නිශ්කාර්ය වියදම්, ඌන උපයෝජිත වත්කම්, හිඟහිට තිබෙන ආදායම්, ගෙවිය යුතු හා ලැබිය යුතු මුදල් යනාදිය පිළිබඳව පරීක්ෂා කිරීම.

ඌ) ව්‍යාපෘති සම්බන්ධයෙන් ඒවායේ මෙහෙයුම් හා ප්‍රගතිය, ඉලක්කයන් සාක්ෂාත්කර ගැනීම, ප්‍රමාදයන්, පරිපාලනය යනාදිය පිළිබඳව පරීක්ෂා කිරීම.

2022 වර්ෂය තුල පහත සඳහන් කාර්යයන් සිදු කොට අවසන් කර ඇත.

1. අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කරන ලද විගණන වාර්තා ගණන 43 කි.
2. නිකුත් කරන ලද විමර්ශන වාර්තා ගණන 04 කි.
3. පවත්වන ලද විගණන හා කළමනාකරණ රැස්වීම් ගණන
    - අමාත්‍යාංශ මට්ටමින් විගණන කළමනාකරන කමිටු රැස්වීම් 03
    - අධිකාරි මට්ටමින් විගණන කළමනාකරණ රැස්වීම් 01
4. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ලබාදුන් පිලිතුරු සහ විමසුම් මගින් ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම.
5. විගණන හා කළමනාකරණ කමිටු මගින් ලබාදුන් මහපෙන්වීම හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට, ප්‍රගති වාර්තා ලබාගැනීම තුලින් උපදෙස් ලබාදීම.

<u>විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, විගණන හා කළමනාකරණ කමිටුව, පහත සඳහන් ආකාරයට සමන්විත වේ.

1. පී. පී. එස්. ආර්. ද සිල්වා මයා - සභාපති -මහා භාණ්ඩාගාරය
2. මහාචාර්ය ඩී. එම්. සූරතිස්ස මයා - කමිටු සාමාජික
3. නීතිඥ කේ. කේ. ජී. ප්‍රේමතිලක මිය - කමිටු සාමාජික

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අමාත්‍යාංශය
5. විගණනකාධිපතිවරයා නියෝජනය කරන විගණන අධිකාරි
6. අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන)- අමාත්‍යාංශය

කමිටුව සඳහා සහභාගි වන වෙනත් නිලධාරීන්

7. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
8. අධ්‍යක්ෂ (මුදල්)
9. අවශ්‍යතාවය මත කැඳවන වෙනත් නිලධාරීන්

කමිටු කාර්යභාරය

- වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අධීක්ෂණය කිරීම.
- විගණකාධිපති වාර්තා හා අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ එමගින් හඳුනාගන්නා ගැටළු නිරාකරණය කිරීමට මඟ පෙන්වීම.
- 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) C අනු වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා දක්වා ඇති කරුණු පිලිබඳව කටයුතු කිරීම සහ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම සඳහා උපදෙස් ලබාදීම.
- කාර්තුමය කමිටු රැස්වීම් පැවැත්වීම.

ඉකුත් වසර 7 තුළ වත්කම් හා වගකීම							
	2022	**2021 (නැවත ප්‍රකාශ කිරීම)**	**2020**	**2019**	**2018**	**2017**	**2016**
	Rs'000	**Rs'000**	**Rs'000**	**Rs'000**	**Rs'000**	**Rs'000**	**Rs'000**
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපල පිරියත හා උපකරණ	111,447,032	114,258,254	119,033,935	4,972,468	4,675,657	4,116,187	4,195,724
ආයෝජන (LT)	235,989	231,04	164,555	166,299	171,313	187,531	178,556
අස්පෘශ්‍ය වත්කම්	0	6	785				
ප්‍රාග්ධන නොනිමි වැඩ	8,738	31,390	57,166	47,482	84,947	78,552	41,301
මුළු ජංගම නොවන වත්කම්	**111,691,760**	**114,312,754**	**119,256,441**	**5,186,249**	**4,931,917**	**4,382,270**	**4,415,581**
පෙව වත්කම් ප්‍රාග්ධන	320,905	286,717	259,342	219,777	167,027	134,578	101,940
යෝජිත ලියා හැරීම්				-	-	859	859
ජංගම වත්කම්							
භාණ්ඩ තොග	270,140	276,905	166,810	170,983	180,342	184,815	168,173
පෙව වත්කම් - වෙළඳ	119,708	41,118	42,721	47,178	26,312	15,875	22,630
ලැබිය යුතු - වෙළඳ හා අනෙකුත්	4,576,005	3,471,407	2,594,637	2,997,661	2,032,715	2,084,069	1,730,015
අස්ථිර ගිණුම				-	-	-	-
කලින් ගෙවීම්				-	4,767	3,896	8,754
බැංකු ඇපකර			377	374	6,292	6,164	4,153
අන්තර් සමාගම් ජංගම ගිණුම් ශේෂයන්				-	-	-	-
මුදල් හා මුදල් සමාන දෑ	272,418	1,177,597	667,498	258,877	312,702	343,312	312,750
ජංගම වත්කම් වල එකතුව	5,238,270	4,967,027	3,472,043	3,475,073	2,563,130	2,638,131	2,246,475
මුළු වත්කම්	**117,250,935,**	**119,566,498**	**122,987,826**	**8,881,100**	**7,662,074**	**7,155,838**	**6,764,855**

	2022	2021 (නැවත ප්‍රකාශ කිරීම)	2020	2019	2018	2017	2016
	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000	Rs'000
වගකීම්							
ජංගම බැරකම්							
ගෙවිය යුතු	39,760,813	39,819,011	39,970,622	968,185	651,986	879,967	376,737
ඵලායන්ස් ෆිනෑන්ස් සමාගමේ කල් බදු				-	-	2,153	3,080
උපචිත වියදම්	107,390	103,544	94,434	211,909	102,067	175,733	122,286
අන්තර් ආයතන ජංගම ගිණුම් ශේෂයන්				-	-		
ජංගම බැරකම්වල එකතුව	**39,868,202**	**39,922,555**	**40,065,057**	**1,180,094**	**754,053**	**1,057,853**	**502,103**
ජංගම නොවන බැරකම්							
පාරිතෝෂික දීමනා	1,413,100	1,343,221	1,500,519	1,371,814	1,379,494	1,388,101	1,489,288
බැංකු ණය				-	-		2,455
කල් බදු				-	219	271	2,653
විලම්බිත බදු			612	612	612	612	612
ජංගම නොවන බැරකම් වල එකතුව	1,413,100	1,343,221	**1,501,131**	**1,372,426**	**1,380,325**	**1,388,984**	**1,495,008**
බැරකම් වල එකතුව	**41,281,302**	**41,265,776**	**41,566,188**	**2,552,520**	**2,134,378**	**2,446,837**	**1,997,111**
මුළු ශුද්ධ වත්කම්	**75,969,633**	**78,300,722**	**81,421,638**	**6,328,579**	**5,527,696**	**4,709,001**	**4,767,744**
ශුද්ධ වත්කම්වල එකතුව							
සමුච්චිත අරමුදල	70,823,574	73,877,177	76,926,922	1,837,751	24,649,830	24,407,260	24,066,161
සංචිත - ඉ/ගෙ ආදායම් හා වියදම් ගිණුම් ශේෂය	(2,723,686)	(1,238,559)	(1,178,028)	(657,528)	(24,040,551)	(23,755,208)	52,121
ආදායම් සංචිත - සමාගම්	-		48,288	48,288	50,865	4,006,082	4,019,027
ප්‍රත්‍යාගණන සංචිත	7,869,744	5,662,104	5,624,456	5,100,069	4,867,551	50,865	(23,369,566)
ශුද්ධ වත්කම්/ ස්කන්ධය එකතුව	**75,969,633**	**78,300,722**	**81,421,638**	**6,328,580**	**5,527,696**	**4,708,999**	**4,767,743**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය

අ.අ.	සමාගම	වර්ෂය තුළ ඉටුකළ කාර්යය/තත්වය
01	සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම	▪ පළාතේ කිරි ගොවීන්ගෙන් කිරි එකතු කිරීම හා ඔවුන්ට එමඟින් සේවාවන් සැපයීම. ▪ කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා ඒ නිෂ්පාදන මහවැලි කලාප සහ අවට ප්‍රදේශ වල අලෙපවි කිරීම. ▪ පුං ගවයන් ලෙස යොදා ගැනීම සඳහා මීගවයන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දීම. ▪ 2022 වසරේ මුල් කාර්තු දෙක තුලදී තත්වයෙන් උසස් බොයිලර් මස් නිෂ්පාදනය කර අලෙවිය. ▪ මහකන්නයේ ගිරාදුකෝට්ටේ සත්ව ගොවිපල අක්කර 200 ක් බඩ ඉරිගු වගාව සඳහා ගොවීන් වෙත ලබා දීම සහ කුඹුරු අක්කර 25 ක් කුඹුරු වගා සිදු කර ඇත. ▪ දම්මින්න සත්ව ගොවිපලේ කන්න දෙකක් බිත්තර වී සඳහා හෙක්ටයාර 08 (අක්කර 20) වගා කර ඇත. ▪ සුළු වශයෙන් ඩ්‍රැගන් පෘට් වගාව
02.	සී/ස මහවැලි උපෙද්ශණ ෙසේවා කාර්යාංශය (පුද්) සමාගම	මෙම සමගම 2020.12.30 දින සිට වාර්මාර්ග අමාත්‍යාංශයට මාරු වී ඇත.
03.	සී/ස ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා පුද්ගලික සමාගම	ඇවර කිරීමට තීරණය කිරීමෙන් පසු සියලුම මුල්‍ය ප්‍රකාශන නීති අංශයට භාර දී ඇත.

පාලන වාර්තාව

I කොටස

පළමු පරිච්ඡේදය

1.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය.

1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවා ඇති අතර එකී පනතේ 12 වන වගන්තිය යටතේ යම් විශේෂිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත පරිදි පැහැදිලි කර ඇත.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යාන්ත්‍ර, ස්ථාන ඉදිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැඟීම. එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍ය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් කරනු ලැබිය හැකිය.

(ආ) පූර්ණ හා ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාර වීම සහ එම සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඇ) කෘෂිකාර්මික ඵලදායී වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම තත්ත්වයට පත් කිරීම සහ කෘෂි ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා සුරක්ෂිත කිරීම.

(ඈ) භෞතික පරිසරය සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම.

(ඉ) ජනතා පොදු සුබසාධනය හා සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ පරිපාලනය කිරීම.

(ඊ) අභ්‍යන්තර සහ බාහිර පෞද්ගලික ප්‍රාග්ධනය කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම.

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජන ක්‍රමය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාවට නැංවීමේදී රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන පළාත් පාලන ආයතන රජයේ සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන පෞද්ගලික හෝ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ සුරක්ෂිත කිරීම.

1.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කර්තව්‍යයන්

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එක් එක් විෂය ක්ෂේත්‍රයන් යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති හා ක්ෂේත්‍ර කාර්යාලයන්හි කටයුතු සම්බන්ධීකරණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් හා නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් මගින් සිදුකරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කර්තව්‍යයන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඉටුකර ඇත.

- සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයේ ප්‍රගතිය මාසිකව විමර්ශනය කොට අවශ්‍ය මැදිහත්වීම් මගින් නියමිත ඉලක්ක සපුරා ගැනීම.

- වත්කම් නඩත්තුව හා පරිපාලනය පිළිබඳ නිසි සැලැස්මක් අනුව කටයුතු කිරීම තුළින් වත්කම් අපහරණය කිරීම.

- කාලරාමුවකට අනුව මොරගහන්ද කළුගඟ ජලාශය හා කිවුල් ඔය ජලාශය ඉදිකිරීම.

- බී කලාපය දකුණු ඉවුර හා එල් කලාපයේ වාරි බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා ප්‍රදේශ හඳුනාගෙන මූලික පරිසර අධ්‍යයනයක් සිදුකිරීම.

- කෘෂිකාර්මික සහාය සේවා ප්‍රවර්ධනය කෘෂිකාර්මික ප්‍රවර්ධනය හා ආදායම් උත්පාදන වැඩසටහන් දියුණු කිරීම හා රටේ සුරක්ෂිතතාවය ඇති කිරීම.

- වාරි පද්ධති නඩත්තුව හා කළමනාකරණය ගොවි සංවිධානවලට පැවරීමට හැකිවන පරිදි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිලිබඳ නිලධාරීන් හා ගොවි නියෝජිතයන් බල ගැන්වීම.

- මහවැලි ජානපදික ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට පශු සම්පත් ක්ෂේත්‍ර බලගැන්වීම.

- කෘෂිකාර්මික ඉඩම් සීමිත සම්පතක් වන මහවැලි ජානපදිකයන්ගේ දෙවන, තෙවන පරම්පරාවල ආර්ථික සංවර්ධනය හා රැකියා ජනනය උදෙසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැර වූ රැකියා ආයෝජන ව්‍යාපෘති සඳහා යොමු කිරීම හා මග පෙන්වීම.

- සියළුම මට්ටම් වල නිලධාරීන් හා සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා කටයුතු කිරීම හා කාර්යය මණ්ඩල තොරතුරු පරිසනක ගත කර ඊ-මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කිරීම.


- රේඛීය ආයතන සමඟ සාකච්ඡා කරමින් කන්න මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය තුළින් ප්‍රධාන ජලාශ මගින් වාරිමාර්ග ජනාවාස ව්‍යාපෘති ප්‍රධාන ජලවිදුලි නිෂ්පාදනය හා ගෘහස්ථ ජල විදුලිබලය හා ගෘහස්ථ ජල සම්පාදනය සඳහා ජලය වෙන් කර දීම.

- බී, සී, ඊ, එච්, එල්, ඩී, මොරගහකන්ද, හුරුළුවැව, වලව සහ රඹුක්කන්ඔය යන ව්‍යාපෘති වල භෝග විවිධාංගීකරණය, සමාජ හා ආර්ථික සංවර්ධනය රැකියා උත්පාදනය සඳහා කටයුතු කිරීම.

- ජල කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය කෘෂිකාර්මික සංවර්ධනය පස සහ ජලය සංරක්ෂණය දියබෙත්ම කලමනාකරණය පාරිසරික දූෂණය හා ජල දූෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.

- ප්‍රධාන ජලාශවල හැරවුම නිර්මිත සුරක්ෂිතාවය සිදු කිරීම සඳහා සළුලදායි මෙහෙයුම් නඩත්තු වැඩසටහන් සැකසීම ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් ගොවි සංවිධාන දැනුවත් කිරීම

1.3 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන



1.4 මහවැලි කලාප - ව්‍යුහය, පරිපාලනය හා වර්තමාන තත්වය


මහවැලි ගංගා ද්‍රෝණි සංවර්ධන මහ සැලැස්මට අනුව ඇති කරන ලද ජනාවාස පරිපාලනය වාරි පද්ධති මෙහෙයවීම නඩත්තුව හා පරිපාලනය සඳහා මහවැලි බල ප්‍රදේශ කලාප වශයෙන් පරිපාලන ඒකක 10 ක් පිහිටුවා ඇත. මහවැලි ගංගා නිම්නය ආශ්‍රිතව බී, සී, ඊ, ඩී, එච්, මොරගහකන්ද, හුරුළු වැව යන කලාපද උඩවලව, වැලිඔය (එල් කලාපය) සහ රඹුක්කන්ඔය කලාප වැනි විශේෂ කලාප ද මෙසේ ආරම්භ කර ඇත.


මහවැලි කලාප වල හා විශේෂිත ප්‍රදේශයන්හි සංවර්ධනය හා කළමනාකරණ කර්තව්‍යයන් නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ගේ බලතල යටතට පවරා ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත වගකිව යුතු අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ අධීක්ෂණය යටතේ කලාප මට්ටමින් සිදුවිය යුතු කාර්යයන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා පත්කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා දෙනු ඇත.
එසේම සෑම කලාපයකටම ප්‍රධාන විධායක නිලධාරිවරයා නේවාසික ව්‍යාපාර කළමණාකරු වන අතර තාක්ෂණ, ඉඩම්, කෘෂිකර්ම හා සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අධීක්ෂණ නිලධාරීන් ලෙස නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් අනුයුක්ත කර ඇත. ඒකක කිහිපයකට එක් කොට්ඨාස කළමනාකාර කාර්යාලයක් ද එම කාර්යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා කොට්ඨාස කළමනාකාරවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු, ආයතන සංවර්ධන නිලධාරියෙකු, කෘෂිකර්ම නිලධාරිවරයෙකු හා ඉඩම් නිලධාරිවරයෙකු ස්ථාන ගත කර ඇත. එම සියලු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියළුම විෂය ක්ෂේත්‍රයන්ගේ රාජකාරි ඉටුකිරීම හා එක් එක් ඒකකයකට එක් ඒකක කළමනාකාරවරයෙකු බැගින් ස්ථාන ගත කොට ඇත. මෙම ඒකකයක් සාමාන්‍යයෙන් පවුල් 250-300 අතර ප්‍රමාණයක ඉඩම් ලාභීන් පිරිසක් පදිංචි කිරීම සිදුකර ඇත.

මහවැලි කලාපයන්හි ඉඩම් පරිපාලනය සිදුකරනු ලබන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත ප්‍රමුඛ කරගත් රජයේ ඉඩම් ප්‍රතිපත්තියට අනුව ය. රජයේ ඉඩම් සංවර්ධන කටයුතු සඳහා බැහැර කිරීමේ සිට ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම දක්වා මූලික කටයුතු එම ඉඩම් වලට අදාළ පසු කටයුතු ද සිදු කරනු ලැබේ. මීට අමතරව වාණිජ හා ආයෝජන කටයුතු සඳහා ඉඩම් බදු පදනම මත බැහැර කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරනු ලබන්නේ ද, මුල් ජානපදිකයන්ට අමතරව දෙවන, තුන්වන පරම්පරාවට ඉඩම් ලබා දීම ද කලාප කාර්යාල තුළින් සිදු කෙරේ.

එසේම වාරි ජල කළමනාකරණය, ආයතනික සංවර්ධනය මගින් වාරි පද්ධති නඩත්තුව, කළමනාකරණය හා වැඩි දියුණු කිරීම ද කෘෂිකාර්මික සංවර්ධනය යටතේ බීජ නිෂ්පාදනය ගොවිපල සංවර්ධනය, පුහුණු හා ආදර්ශ කටයුතු ද පශු සම්පත්, ධීවර හා පරිසර සංරක්ෂණ කටයුතු ව්‍යාප්ති සංවර්ධනය කුඩා හා මධ්‍ය පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාවට නැංවීම, වාණිජ කෘෂි ව්‍යාපාර මෙහෙයවීම, කෘෂි කර්මාන්ත හා සම්බන්ධ ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාවට නැංවීමද කලාපීය පරිපාලනය යටතේ සිදු කෙරේ.

මහවැලි කලාප - සිතියම





බී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ විශාලතම මහවැලි කලාපය වන්නේ මහවැලි බී කලාපයයි. මහවැලි බී කලාපය 1982 – 1983 යන කාල පරාසය තුල ආරම්භ වූ මහවැලි සංවර්ධන කලාපයකි. මෙම කලාපය කොට්ඨාස 08 කින් සමන්විත වන අතර ඒකක 48 න් යුක්ත වේ. ප්‍රධාන වැවිලි බෝගය වී වන අතර අතිරේක බෝග බඩ ඉරිගු , කව්පි, මුං, එළවළු, පැපොල්, අන්නාසි, කෙසෙල්, අඹ, පොල් වේ. අතිරේක ආදායම් මාර්ග - සත්ව පාලනය , මිරිදිය ධීවර කටයුතු ආදිය වේ. අස්වද්දා ඇති බිම් ප්‍රමාණය හෙක් 20,006 (වම් ඉවුර) වේ.

ප්‍රධාන වශයෙන් විශාලතම ජලාශය මාදුරුඔය ජලාශය වන අතර එහි මුළු ධාරිතාවය 596.6 MCM වේ. මීට අමතරව කුඩා ප්‍රමාණයේ වැව් 84 ක් පවති. මහවැලි බී කලාපය වම් ඉවුර සහ දකුණු ඉවුර යන කොටස් දෙකකින් සමන්විත වන අතර පොලොන්නරුව හා මඩකලපුව යන දිස්ත්‍රික්ක වලට අදාළව පිහිටා ඇත. වැලික්නද,දිඹුලාගල ,කෝරළයිපත්තු උතුර වාකරයි යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුනකින් මෙම කලාපය ආවරණය වේ. මහවැලි බී කලාපය1979 .06.15 දිනැති ගැසට් පත්‍රයට අනුව ප්‍රකාශයට පත් කරන ලද අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුළ විශේෂ බල ප්‍රදේශයක් වේ.

මහවැලි මහ සැලැස්මට අනුව ඉදිකරන ලද මාදුරුඔය ජලාශය බී කලාපයේ ප්‍රධාන ජල මූලාශ්‍රයයි. මාදුරුඔය ප්‍රධාන ඇල කි.මී 52.887 ක් වේ. තවද පිඹුරත්තැව ජලාශයද බී කලාපයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ඇළ ද කි.මී. 23 ක් වේ. තවද කි.මී. 72.655 ක අතු ඇළවල් පිහිටා ඇත. ඒමෙන්ම බේදුම් ඇල කි.මී.418.223 ක් වේ. තවද කලාපයේ කෙත් ඇළ කි.මී. 1381.834 වන අතර දැනට වම් ඉවුර මහවැලි මාදුරුඔය ජලාශය යටතේ සංවර්ධනය කර ජනපද ඇති කර මහවැලි කොට්ඨාස කාර්යාල අටකින් යුක්ත වන අතර පරිපාලනය ඉඩම්, කෘෂිකර්ම , වාරිමාර්ග , සමාජ සංවර්ධන , තාක්ෂණ යනාදි අංශයන් විසින් සිදු කරනු ලැබේ.

DL2 කෘෂි දේශගුණික කලාපයට අයත් බී කලාපයේ වාර්ෂික වර්ෂාපතනය මී. මි 1305 වේ.සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් 31 වේ. ප්‍රධාන පාංශු කාණ්ඩය චුර්ණමය නොවූ දුඹුරු පසය(NCB). කලාපීය සංවර්ධන කටයුතු අංශ කිහිපයක් මගින් ක්‍රියාත්මක වන අතර වර්ෂයේ අත්කරගත් ප්‍රගතිය පහත සටහන මගින් දක්වා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, බී කලාපය, නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය යටතේ පාලනය වන විවිධ අංශ පවතී. එනම් තාක්ෂණ සේවා අංශය, කෘෂිකර්ම සංවර්ධන අංශය, ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය, ආයතන සංවර්ධන අංශය, සංස්කෘතික හා ක්‍රීඩා අංශය, ඉඩම් අංශය, පරිසර හා වන සංරක්ෂණ අංශය, ව්‍යාපාර සංවර්ධන අංශය, ප්‍රවාහන අංශය, ගිණුම් අංශය සහ පාලන අංශය වන අතර එම අංශ කලාපයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය දෙමින් කටයුතු කරනු ලබයි.

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ප්‍රතිසංස්කරණ





වාරි ප්‍රති සංස්කරණ කටයුතු - බෙදුම් ඇල (Distribution Canel)





වාරි ප්‍රති සංස්කරණ කටයුතු - කෙත් ඇල (Field canel)




ප්‍රති සංස්කරණ කටයුතු - අපවහන ඇල (Drainage Canals)





සී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරයට අයත් මහවැලි සී කලාපය " බින්තැන්න" නමින් හැඳින්වෙන ඓතිහාසික ප්‍රදේශයේ කොටසකටද " පුලතිසි " නමින් හැඳින්වෙන ඓතිහාසික ප්‍රදේශයේ කොටසකටද අයත් සුවිශේෂී කලාපයකි.බදුල්ල,අම්පාර සහ පොලොන්නරුව යන දිස්ත්‍රික්ක තුනට මායිම්ව පිහිටා ඇති අතර මහියංගනය,දෙහිඅත්තකණ්ඩිය,දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනට වන අතර කොට්ඨාස කළමණාකාර කාර්යාල 7 කින් හා ඒකක කළමණාකාර කාර්යාල 31 කින් සෑදුම් ලබා ඇත. කලාපය අයත් ප්‍රධාන පරිපාලන නගරය දෙහිඅත්තකණ්ඩිය නගරය වන අතර වලට අයත් මහවැලි දකුණු ඉවුරු නිම්නයේ පිහිටා ඇති "සී" කලාපය බටහිරෙන් මහවැලි ගඟද,නැඟෙනහිරින් දකුණු ඉවුරු අන්තර් නිම්න ඇළ සහ උල්හිටිය - රත්කිද ජලාශ ආශ්‍රිත දකුණු ඉවුරේ ප්‍රධාන ඇළ ද මායිම්ව පිහිටා ඇත.

කලාපයේ වාරි ඉඩම් **22406** ක් අස්වැද්දවීම සඳහා කි.මී **2039** ක් වූ වාරි ඇළ පද්ධතිය මඟින් ජලය සැපයීම සිදු කරයි.මේ සඳහා වැව් 56 කින් හා උල්හිටිය රත්කිද ජලාශ මඟින් ජලය රැස් කිරීම සිදු කරයි.ගොවි සංවිධාන සංඛ්‍යාව 200 කි.

මහවැලි සී කලාපය දෙහිඅත්තකණ්ඩිය ප්‍රධාන නගරය කර ගනිමින් වේගයෙන් සංවර්ධනය වන කෘෂිකාර්මික කලාපයකි. මෙහි ප්‍රධාන කෘෂිකාර්මික භෝගය වී වන අතර දේශීය නිෂ්පාදනයට දායකත්වය 4%කි. ජානපදිකයින් පදිංචි කර ඔවුන්ට වගාකිරීමට අවශ්‍ය ඉඩම් ලබාදීම,පානීය හා ගෘහස්ථ ජලය ලබාදීම, විදුලිය ඇතුලු අනෙකුත් යටතල පහසුකම් ලබාදීමේ කටයුතු වේගයෙන් ක්‍රියාත්මක වූ කලාපයකි. මෙම කලාපයේ ගොවිබිම් සඳහා අවශ්‍ය වාරි ජලය මහවැලි අධිකාරිය මඟින් සිදුකරනු ලබන අතර කාර්යක්ෂම ජල කළමණාකරනය කෘෂිකාර්මික නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මඟින් ඉඩම් කාර්යක්ෂමතාව 100% වැනි ඉහළඅගයක් ගනී. මහවැලි තාරුණ්‍ය ප්‍රමුඛ කරගත් වගා ළිං ආශ්‍රිතව පළතුරු වගාව, ආරක්ෂිත ගෘහ තුළ වගාව, විසිතුරු මත්ස්‍ය වගාව, කලාපයේ ප්‍රමුඛ තැනක් ගනී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිගැන්වීම තුළින් විශාල කාර්යයක් ඉටුකරන මෙම කලාපය ඉෙව විවිධත්ව සංරක්ෂණය සඳහා විශේෂ පරිසර සංරක්ෂණ ව්‍යාපෘති දියත් කර ඇත. කලාපයේ ජනතාව මූලික කරගත් පරිපාලන රටාව අධිකාරියේ කටයුතු ජනතාවට වඩාත් සමීප කර ඇත.

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ක්‍රියාත්මක් වැඩසටහන්

කොට්ඨාස කමිටු - සිරිපුර



කොට්ඨාස කමිටු - ගිරාදූරුකෝට්ටේ





විජේපුර 403/D12 ඇල අළුත්වැඩියා කිරීම





මල්දෙණිය වැවේ පිටවාන අළුත්වැඩියා කිරීම

ආයතන සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක් වැඩසටහන්





ලෝක ජල දින සැමරුම් - මැදගම






කලාපයේ ආගමික පුනරුදය වර්ධනය කරලීම





කාන්තා දින වැඩසටහන - මැදගම

ක්‍රීඩා සමාජ පිහිටුවීම



ඩී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කල මැදිරිගිරිය ප්‍රදේශයේ 2004 වර්ෂයේ ස්ථාපිත කර ඇති මහවැලි ඩී කලාපය කොට්ඨාශ 03 කින් යුක්ත වේ. ඒ බිසෝපුර, සූරියපුර හා මීගස්වැව වේ. බිසෝපුර කොට්ඨාශය මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලැබූ පළමු ජනපද පුරවරයයි. බිසෝපුර කොට්ඨාශය ඒකක 07 කින් (දහම්වැව,බණ්ඩාර වැව, බිසෝපුර,නබඩවැව, මැදිරිගිරිය, දිවුලන්කඩවල, නවනගරය) හා සූරියපුර කොට්ඨාශය ඒකක 02කින් (සමණිපුර ,සූරියපුර) මීගස්වැව කොට්ඨාශය ඒකක 04කින් (මීගස්වැව, දම්සෝපුර, ජයගම්පුර, දියසෙන්පුර)සමන්විත වේ.උතුරින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රදේශය දක්වාත්, නැගෙනහිරින් සේරුවිල ප්‍රදේශය දක්වාත්, දකුණින් හා බටහිරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර, හිඟුරක්ගොඩ ප්‍රදේශය දක්වාත් විහිදි පවතී.

තාක්ෂණ සේවා අංශය යටතේ ක්‍රියාත්මක් වැඩසටහන්

සූරියපුර හැළඹයාය අමුණ, දර්ශනපුර අමුණ හා සූරියපුර කිඹුල ඇල අමුණ ඉදි කිරීම

මීගස්වැව වඩිගවැවෙහි රොන් මඩ ඉවත් කිරීම

අඹගස්වැව ඩී3 කෘෂි මාර්ගය ඉදි කිරීම - මීගස්වැව






කෘෂිකර්ම සංවර්ධන අංශය යටතේ යටතේ ක්‍රියාත්මක් වැඩසටහන්






සීවර සහ පශු සම්පත් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක් වැඩසටහන්

මහා පරිමාණ තෘණ වගා ව්‍යාපෘතිය

වෙන් කල බිම් ප්‍රමාණය අක්කර 56

භාවිතයට ගත හැකි බිම් ප්‍රමාණය අක්කර 40

බෙදා දුන් බිම් ප්‍රමාණය අක්කර 19

වගාව ආරම්භ කල බිම් ප්‍රමාණය අක්කර 17

ජාතික ආර්ථිකයට සිදු කල දායකත්වය

මුළු ගොවිපල ගණන - 17

තෘණ අස්වැන්න ලබා දීම සමඟ එක් ගොවිපලක ඉහල ගිය කිරි ප්‍රමාණය - ලීටර් 05

ඒ අනුව මුළු ගොවිපල තුල ඉහල ගිය කිරි ප්‍රමාණය (17 X5L X 30 = 2550L) - ලීටර් 2550

මාසිකව ලැබූ මූල්‍ය ප්‍රගතිය (2550L X150.00) - රු. 382500.00










ආයතන සංවර්ධන අංශය යටතේ යටතේ ක්‍රියාත්මක් වැඩසටහන්





ඊ කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත අනුව මහවැලි අධිකාරිය පිහිටුවීමෙන් පසුව වියළි කලාපය සංවර්ධනය කිරීමේ අරමුණ පාදක කරගෙන කොත්මලේ ජලාශය, වික්ටෝරියා ජලශය, රන්දෙණිගල ජලාශය හා රංටැඹේ ජලාශය කටයුතු ආරම්භ කර ඇත. එහිදී සංවර්ධන ප්‍රේරිත අවතැන්වුවන් නැවත පදිංචි කිරීම සඳහා හා ජලාශ ඉදිකිරීමට අත්පත් කරගත් ඉඩම් කටයුතු විදිමත් කිරීම සඳහා වික්ටෝරියා විශේෂ කලාපය ආරම්භ කරන ලදි. එසේම 2019 වර්ෂයේ දී අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් මිණිපේ හා විල්ගමුව ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ මහවැලි "E", කලාපය ලෙස නම් කර ඇත. ඒ අනුව වර්තමානයේ කොත්මලේ, වික්ටෝරියා විශේෂ බල ප්‍රදේශයත්, මිණිපේ සහ විල්ගමුව කොට්ඨාශද ඇතුලුව සමස්තය මහවැලි ඊ කලාපය ලෙස එකම නේවාසික ව්‍යාපාර කළමණාකාරවරයකු යටතේ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් ප්‍රදේශයක් වන කොත්මලේ හා මහවැලි ගග හරස් කොට ඉදිකර ඇති මිණිපේ අමුණ ඇතුළු වාරි නිර්මිත රැසක් මෙන්ම මහවැලි අධිකාරියේ හදවත බදු කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල, රංටැඹේ හා පොල්ගොල්ල ජලාශ ත් මෙම කලාපයට අයත් වේ.

"E", කලාපයට අයත් වන පරිපාලන දිස්ත්‍රික්ක මාතලේ, මහනුවර, නුවරඑළිය දිස්ත්‍රික්ක නම් කල හැකි අතර, ඉඩම් පරිපාලන කටයුතු මහවැලි අධිකාරිය විසින් අත්පත් කරගත් ප්‍රදේශවල පමනක් එනම් වික්ටෝරියා කොත්මලේ ප්‍රදේශවල පමනක් සිදු කරණු ලැබේ.

කොත්මලේ වික්ටෝරියා ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අහිමි වූ අයවළුන්ගේ පවුල් 3500 ක් කොත්මලේ කලාපයේ පදිංචි කර ඇති අතර, වික්ටෝරියා රන්දෙණිගල ජලාශ ඉදිකිරීම වෙනුවෙන් ඉඩම් අහිමි වූ පවුල් 500 ක් ද මෙම කලාපය තුල නැවත පදිංචි කර ඇත.

මීට අමතරව ජලාශ ව්‍යාපෘතින් නිසා ඉවත් කරන ලද නගර වෙනුවෙන් තිස්පනේ, කොත්මලේ, අධිකාරිගම, ගුරුදෙණිය, කුණ්ඩසාලේ, දිගන, තෙල්දෙණිය නව නගර නිර්මාණය කොට ඇත. කටුගස්තොට පුළුල් කර සංවර්ධනය කරන ලද කොටස්ද මෙම කලාපයට අයත් වේ.

2021 වර්ෂයේ ක්‍රියාත්මක සැලසුමට අනුව වික්ටෝරියා කොත්මලේ ප්‍රදේශ තුල ඉඩම් රාජකාරි හා තෝරා ගත් සංවර්ධන වැඩ සටහන් සඳහා පමණක් විවෘතව ඇති අතර, මිණිපේ හා විල්ගමුව යන කොට්ඨාශවල සංවර්ධන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දී තිබුණි. එසේම මිණිපේ වනජීවී දෙපාර්තමේන්තුවට අයත් වසම් 18 ක් නැවත ගැසට් කර ගැනීම සඳහා මේවන විට පාරිසරික ඇගයීම් වාර්තාවක් සැලසුම් වෙමින් පවති. පහත අංශ යටතේ මෙම කලාපයේ කටයුතු සිදු වේ.

ව්‍යාපාර සංවර්ධන අංශයේ කටයුතු














ආයතන සංවර්ධන අංශයේ කටයුතු









ජී කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

මහවැලි මහ සැලැස්ම යටතේ ඉදිකරන ලද පළමු වේල්ල වන පොල්ගොල්ල ජල බෙදාහැරීමේ පද්ධතිය ජල මාර්ග දෙකක් හරහා ජලය මුදා හරිනු ලැබේ. බෝවතැන්න ජලාශය අබන් ගඟේ සිට පරාක්‍රම සමුද්‍රයටත්, ඇලහැර ඇල හරහා ගිරිතලේ, මින්නේරිය, කවුඩුල්ල සහ කන්තලේ ජලාශ වෙත මුදා හරිනු ලැබේ.

1982 සිට 1999 දක්වා "ජී" කලාපය මහවැලි "බී" කලාපයේ කොට්ඨාස කාර්යාලයක් ලෙස පවත්වගෙන යනු ලැබීය. පසුව එය 1999 දී "ජී" කලාපය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ආරම්භයේ දී මහවැලි ජී කලාපය බකමූණ සහ අත්තනකඩවල යන කොට්ඨාස දෙකකින් යුක්ත විය.

මහවැලි මහ සැලැස්මේ අවසාන ජලාශ ව්‍යාපෘතිය වන්නේ මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියයි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමඟ ලග්ගල පල්ලේගම සහ නාඋල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ වල ග්‍රාම නිලධාරී කොට්ඨාස 24 කට බලපෑවේය. එහෙයින් මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියෙන් තම මුල් ගම් ප්‍රදේශ වලින් ඉවත්වූ ජනතාව කළුගඟ වම් ඉවුරේ සහ කළුගඟ දකුණු ඉවුරේ නැවත පදිංචි කරන ලදී.

ඒ අනුව, "ජී" කලාපයට හෙක්ටයාර් 4,524ක් ඒකාබද්ධ කරමින් මොරගහකන්ද කලාපය ලෙස ප්‍රකාශයට පත් කෙරුණි. 2010 වර්ෂයේ දී කළුගඟ වම් ඉවුර ප්‍රදේශයේ පරිපාලන කටයුතු සඳහා වැල්ලෙවෙල සහ කළුගඟ දකුණු ඉවුර ප්‍රදේශයේ පරිපාලනය සඳහා ගුරුවෙල යන කොට්ඨාස 2012 වර්ශයේ දී පිහිටුවන ලදී.

මොරගහකන්ද කලාපයට උතුරින් දියබෙදුම - කටුකැලියාවත්, නැගෙනහිරින් කළුගඟ - වස්ගමුවත්, දකුණින් නකල්ස් කඳු වැටියත් බටහිරින් ගිරිතලේ - මින්නේරිය ස්වභාවික රක්ෂිතයක් පිහිටා ඇත. මොරගහකන්ද කලාපය උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයට සහ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයට අයත්වේ.

- කලාපයට අයත් දිස්ත්‍රික්ක - පොළොන්නරුව සහ මාතලේ
- කොට්ඨාශ - 04
- ඒකක කාර්යාල - 17
- පවුල් සංඛ්‍යාව - 13,612
- ජනගහනය - 56,441

කෘෂි නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා අවශ්‍ය නිෂ්පාදන යෙදවුම් සම්පාදනය කරන, නවීන කෘෂි තාක්ෂණය කෘෂි නිෂ්පාදකයින් වෙත රැගෙන යන පරිසර හිතකාමී ගොවි ප්‍රජාවගේ සංවිධානය බවට ගොවි සංවිධාන පත් කිරීම හා ඒ සඳහා ක්‍රියා කිරීම.








අත්තනකඩවල බීජ ගොවිපල - Seed farm



ආරක්ෂික ගොවිපල







එච් කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

කලා වැව කේන්ද්‍ර කොටගෙන 1977 - 1978 කාලයේ පවුල් 31500 කට මඩින් අක්කර 2½(හෙක්. 01)ද, ගොඩින් අක්කර ½ බෙදා දෙන ලද මහවැලි යෝජනා ක්‍රමයේ සුවිශේෂී කලාපය මහවැලි "එච්" කලාපයයි. මෙහි කෘෂි බිම් අක්කර ලක්ෂයක් (වාරි හා ගොඩ) පමණ පවතී. මහවැලි යෝජනා ක්‍රමයේ සමාරම්භක ජනාවාස කලාපයවන මෙහි නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන වශයෙන් අංශ අටක් ,කෘෂිකර්ම සංවර්ධන අංශය ,තාක්ෂණ සේවා අංශය ,එනම් .පවතී (08) ව්‍යාපාර ,අංශය පරිසර හා වන සංරක්ෂණ ,ඉඩම් අංශය ,සංවර්ධන අංශය ,ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය ,සංවර්ධන අංශයගිණුම් අංශය සහ පාලන අංශය වශයෙන් කලාපයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය දෙමින් කටයුතු කරනු ලබයි කලාපයේ පිහිටීම සැලකීමේදි බටහිරින්, අනුරාධපුර - පුත්තලම් මහා මාර්ගයත් , උතුරින් දකුණු ඉවුරු ඇලත් දකුණින් , බලලු වැව ඉවුරු උස්ගල සියඹලන්ගමුව ඔස්සේ රාජාංගන ඉවුරු ඇලෙනුත් සීමාවී පවතින අතර අමතර වශයෙන් කාගම කටියාව හා උස්ගල සියඹලන්ගමුව වැනි පැරණි ජනපද ප්‍රදේශ වලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ,එච් කලාපය ,තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය ප්‍රධාන වශයෙන් අංශ අටක් (08) පවතී .එනම් ,තාක්ෂණ සේවා අංශය ,කෘෂිකර්ම සංවර්ධන අංශය ,ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය ,සංවර්ධන අංශය ,ඉඩම් අංශය ,පරිසර හා වන සංරක්ෂණ අංශය ,ව්‍යාපාර සංවර්ධන අංශය ,ගිණුම් අංශය සහ පාලන හා ප්‍රවාහන අංශය වශයෙන් කලාපයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය දෙමින් කටයුතු කරනු ලබයි .

තාක්ෂණ සේවා අංශය යටතේ ක්ෂේත්‍රයේ නොච්චියාගම කොට්ඨාස කාර්යාලය ඉදි කිරීමේ කටයුතු අවසන්ව ඇත. නල්ලච්චිය වාන ඉදිකිරීමද සම්පූර්ණ වශයෙන් අවසන්ව ඇත. ඒ අනුව, තාක්ෂණ අංශය වෙත 2022 වර්ෂය තුල ප්‍රදානය කරන ලද ඉලක්කගත වැඩ කොටස්වලින් 100% ක භෞතික ප්‍රගතියක් මෙන්ම 100% මූල්‍යම ප්‍රගතියක් ලභා කර ගැනීමට හැකි විය. වාරී සෞභාග්‍යා වැඩසටහන යටතේ එච් කලාපයේ දැවැන්ත කතිකාවතට ලක්ව තිබූ මහ බෙල්ලන්කඩවල වාන නිර්මිත සෑදීම ආරම්භ කර 40%ක පමණ ඉදිකිරීම් ප්‍රගතියක් ලබා ගෙන ඇත. 2022 වර්ෂයේ සිදු වුණු විශේෂ කටයුත්තක් වූයේ ලෝක බැංකු අධාර මත කලාවැව වම් ඉවුර ප්‍රධාන ඇලෙහි ගේට්ටු හා නිර්මිත අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව (රුපියල් මිලියන 160කට අධික කොන්ත්‍රාත් වටිනාකමකින් යුත්) ආරම්භ කිරීමයි. මෙහි වැඩ නිමාවත් සමඟ කලාවැව වම් ඉවුර ජල කාර්යක්ෂමතාව වැඩි කර ගත හැක. 2022/ 2023 මහ කන්නය ආරම්භ කිරීම සඳහා දියවර නිකුත් කරන තුරු ඇල තුළ ඉදිකිරීම් කටයුතු සිදු විය. කන්නය ආරම්භ වීමත් සමඟම අනෙකුත් කළ හැකි ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ දැනටද කෙරෙමින් පවතී.

ජලපාලන කටයුතු

2021/2022 මහ කන්නය (ජනවාරි සිට මාර්තු)

ඇල මාර්ගය	වගා කළ භූමි ප්‍රමාණය	ඇස්තමේන්තුගත ජල ප්‍රමාණය		භාවිත කළ ජල ප්‍රමාණය		ජල කාර්යක්ෂමතාව (Ft)
		mcm	A.cft.	mcm	A.cft.	
ද.ඉ. ප්‍රධාන ඇල	14,028.00	185.00	149,850.00	174.20	141,102.00	4.02
ව.ඉ. ප්‍රධාන ඇල	6,642.00	75.00	60,750.00	62.90	50,949.00	3.07
යෝධ ඇල	4,720.00	40.00	32,400.00	21.30	17,253.00	1.46
එකතුව	**25,390.00**	**300.00**	**243,000.00**	**258.40**	**209,304.00**	**3.30**

2022 යල කන්නය (අප්‍රේල් සිට අගෝස්තු)

ඇල මාර්ගය	වගා කළ භූමි ප්‍රමාණය (ha)	ඇස්තමේන්තුගත ජල ප්‍රමාණය		භාවිත කළ ජල ප්‍රමාණය		ජල කාර්යක්ෂමතාව
		mcm	A.cft.	mcm	A.cft.	
ද.ඉ. ප්‍රධාන ඇල	13,598	186.5	151,065	164.3	133,083	3.91
ව.ඉ. ප්‍රධාන ඇල	6,392	69.4	56,214	63.2	51,192	3.20
යෝධ ඇල	4027	23.6	19,116	22.3	18,063	1.79

සුහුරු කෘෂි කර්මාන්තය සඳහා කලාපීය ගොවි ජනතාව යොමු කිරීම සඳහා 2022 වර්ෂයේදී වැඩි අවධානයක් යොමු කරමින් කටයුතු ඉටු කරන ලද අතර, කෘමි ප්‍රතිරෝධී දැල්/ බෝග ආරණ භාවිතය මගින් රෝග පළිබෝධ හානි අවම කරගැනීම, වල් මර්ධනය සඳහා පොලිතීන් වසුන් භාවිතය, ජල සම්පාදනය සඳහා විසිරුම් ජල සම්පාදන පද්ධති යොදා ගැනීම මගින් ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, ආරක්ෂිත ගෘහ තුල වගාව මගින් ඉහළ ආදායම් උත්පාදනය සඳහා ගොවීන් යොමුකිරීම සඳහා මෙම වර්ෂයේදී මහත් පරිශ්‍රමයකින් කටයුතු කරන ලදී.






ජාතික නිෂ්පාදනයට ප්‍රධාන බෝගයන්හි මහවැලි එච් කලාපීය දායකත්වය හා ඒ සඳහා සිදුකර ඇති ව්‍යාප්ති වැඩසටහන්-2022





වී වගාව ප්‍රවර්ධනය



එල් කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම


1984 වර්ෂයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ජනාවාසකරණ කටයුතු ආරම්භ කර ඇති මෙම ප්‍රදේශය 1988 වර්ෂයේදී 562 දරණ ගැසට් නිවේදනය මගින් මහවැලි කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. හෙක්. 163,000 ක් වන වන අතර 2007 මාර්තු 09 අංක 1487/32 දරණ ගැසට් නිවේදනය මගින් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 199210 දක්වා පුළුල් කර ඇත.මෙහි හෙක්ටයාර් 16857 ක සංවර්ධන කටයුතු අවසන් කර ඇත. කොට්ඨාශ 03ක් තුළ ඒකක 16 ක් සථාපිත කර පවුල් 6,295 ක් පදිංචි කර ඇත. වැව් 47ක් මඟින් කුඹුරු හෙක්ටයාර් 980ක් සඳහා වාරි ජලය සපයනු ඇත. මෙම කලාපයේ භූමි ප්‍රදේශය උතුරටත්" මුලතිව් වව්නියා ප්‍රධාන මාර්ගයද" නැගෙනහිරින් මුලතිව් මුහුදු වෙරළ තීරයෙන්ද, දකුණින් පුල්මුඩේ කැබිතිගොල්ලෑව ප්‍රධාන මාර්ගයෙන්ද බස්නාහිරින් සිංහයා උල්පතහින්න ත්‍රිකෝණමිතික ස්ථානය ඔස්සේ මහහෙට්ටියාවහින්න කඳුවැටිය ඔස්සේ රේඛාව පුලියන්කුලිම වව්නියාව මාර්ගයෙන්ද සීමා වෙන ප්‍රදේශයක් පුරා විහිදි ඇත.

සිදුකළ විශේෂ කාර්යයන් හා එයින් ජාතික ආර්ථිකයට සිදුකළ දායකත්වය





කෘෂි ළිං ඉදිකිරීම - 264



ගොවි පුහුණු වැඩසටහන - වැඩසටහන් 16ක්





ඉඩම් කච්චේරි පැවැත්වීම.





“ඔබේ මහවැලි උරුමය නිවසටම” ඔප්පු බෙදා දීම.




වාණිජ ඉඩම් ලාභීන් සඳහා දීර්ඝකාලීන බදුකර ඔප්පු බෙදා දීම.



ගැබිණි මාතාවන් සඳහා උපකරණ කට්ටල බෙදා දීමේ වැඩසටහන



ලෝක වැඩිහිටියන් දිනය සැමරීම.



හුරුළුවැව කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1997-07-16 වන දිනැති අංක: 984/5 දරණ නිවේදනය මගින් හුරුළුපෝෂිත ඇලෙහි ජල කළමනාකරණය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරන ලද අතර 1998-05-09 වන දින හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය දඹුල්ල පැල්වෙහෙරෙහි ස්ථාපිත කරන ලදි.

හුරුළුවැව ජල පෝෂක කලාපයෙන් ලැබෙන ජල ප්‍රමාණය වගා ජල අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් නොවීම නිසා පොල්ගොල්ල බෝවතැන්න හැරවුම් ජලය ලෙනදොර සිට ගෙන යාමට 1973-1976 කාලය තුලදී හුරුළුපෝෂිත ඇල ඉදිකරන ලදි. මහවැලි ‘‘එච්’’ කලාපයේ පාලනයට යටත්ව තිබුණු කණ්ඩලම දඹුළුඔය ජලාශ වලින් පෝෂණය වන මඩාටුගම හා ගල්කිරියාගම කොට්ඨාස 2008.05.15 වන දින සිට ජල කළමනාකරණය කාර්යක්ෂම කිරීම හා සේවා පහසුව සඳහා හුරුළුවැව කලාපයට ඒකාබද්ධ කරන ලදි

ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව, පලාගල, පලුගස්වැව හා ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට අයත් ග්‍රාම නිලධාරී වසම් 49 ක් ද, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල හා නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 32 ක් ද, ගල්කිරියාගම, මඩාටුගම, පළගස්වැව, කළුන්දෑව හා සීගිරිය යන කොට්ඨාස පහට අයත් වේ.

මාතලේ දිස්ත්‍රික්කයේ ලෙනදොර උමං පිටවුම දිය බෙදුමේ සිට කි.මී. 33ක් වූ හුරුළුපෝෂිත ඇළද එතැන් සිට කි.මී.32 ක් සීගිරි ඔය හා තල්කොටේ වැව, හිරිවඩුන්න වැව,හබරණ වැව හරහාත් යාන් ඔය ඔස්සේ හුරුළුවැව දක්වා ප්‍රදේශයත් කණ්ඩලම ජලාශයෙන් පෝෂණය වන කලාවැව දක්වා වූ මහවැලි මහ සැලැස්මේ ‘‘එච්’’ 06, 07, 08 ලෙස දැක්වෙන කණ්ඩලම මිටියාවත්, දඹුළුඔය ජලාශයේ සිට කලාවැව දක්වා මහවැලි මහ සැලැස්මේ ‘‘එච්’’ 09 ලෙස දැක්වෙන දඹුළුඔය මිටියාවතත් දක්වා විහිදෙන දළ වශයෙන් හෙක්ටයාර 14,266 කින් සමන්විත මෙම කලාප සීමාවේ ලෝක උරුමයක් වන සීගිරියත්, පිදුරංගල රජමහා විහාරයත්, ජනප්‍රවාදයට අනුව හා පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථාන ලෙස සැලකෙන කොටාගල ශ්‍රී පියංගල රජමහා විහාරය, කටාරං සහිත පැරණි රත්මල් කන්ද රජමහා විහාරය, ගල්ලෙන් 68 ක් සහිත ඇලගමුකන්ද රජමහා විහාරය, සහ බෝගහවැව විහාරස්ථානය ඇතුළු ඓතිහාසික ස්ථානත් නාමල් උයන රෝස තිරුවානා කන්දත් පිහිටා ඇත.

වැඩි ඝනත්ව වගා ආදර්ශන පිහිටුවීම සඳහා JICA ආධාර යටතේ හුරුලුවැව කලාපය වෙත ලැබුනු බඩ ඉරිහු බීජ 1000 (Kg) එක් ගොවි මහතෙක් සඳහා අක් 4/3.ක වගාවක් පිහිටුවීමට අවශ්‍ය 5 (Kg) බැගින් ගොවීන් 200 සඳහා බෙදා දෙන ලදී. මෙහිදී පලුගස්වැව කොට්ටාශයේ ග්‍රාම නිලධාරී වසම් හතරක් ආවරණය වන පරිදි ගොවීන් 172ක්, සීගිරිය කොට්ටාශයේ ග්‍රාම නිලධාරී වසම් තුනක් ආවරණය වන පරිදි ගොවීන් 12ක් හා ගල්කිරියාගම කොට්ටාශයේ ග්‍රාම නිලධාරී වසම් හතක් ආවරණය වන පරිදි ගොවීන් 16 දෙනෙක් සඳහා වගාව පිලිබඳව දැනුවත් කර අක්කර 150ක් සඳහා බීජ ලබා දෙන ලදි.




පොලිටනල් ඉදි කිරීම





හුරුලුවැව කලාපයේ ගල්කිරියාගම කොට්ටාශයේ රණව වැව හා මඩාටුගම කොට්ටාශයේ ඇලගමුව වැව වෙත මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීමේ අරමුනින් මත්ස්‍ය ඇඟිල්ලන් ලක්ෂ එක හමාරක් (150,000) මුදා හැරීම.





හුරුලුවැව කලාපයේ, ගල්කිරියාගම හා මඩාටුගම කොට්ටාශයේ තෝරාගත් සමෘද්ධිලාභීන් අටදෙනෙක් (08) සඳහා ගව නිවාස සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය (සෙව්ලි තහඩු, සිමෙන්ති, මැටල්, වැලි,ඇණ,කම්බි) සහ ජල බඳුන් ලබා දීම.



රඹකැන්ඔය කලාපය

1979 අංක 23 දරන මහවැලි අධිකාරී පනත යටතේ 2000/05/04 දින අංක 1130/13 දරණ ගැසට් පත්‍රය මගින් මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇතුළුව රඹකැන්ඔය ව්‍යාපෘති ප්‍රදේශය මහවැලි විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව 2010-09-01 දින සිට මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පවතින ජලය සහ අනෙකුත් ස්වභාවික සම්පත් උපයෝගී කර ගනිමින් ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සිදුකරන බවට ප්‍රකාශයට පත් කරන ලදි. මෙම ප්‍රදේශයේ පවතින දිළිඳුභාවය තුරන් කිරීම සහ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන්නා වූ දායකත්වය ඉහළ නැංවීම උදෙසා සකස් කර ඇති මෙම සංවර්ධන වැඩසටහන වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ රේඛීය ආයතන හා ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි.මේ අනුව රඹකැන්ඔය ජලාශ ව්‍යාපෘතියේ වාරි ඉඩම් සංවර්ධන කටයුතු සහ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ඉටු කරනු ලබයි.

රඹකැන්ඔය කලාපය අම්පාර හා බදුල්ල යන දිස්ත්‍රික්ක වලට අයත්වේ. මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් වේ. මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 17 කින් සමන්විත වන අතර ,පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 20 කින් සමන්විත වේ. රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත්වේ. රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිළධාරී වසම් 42 කින් සමන්විත වේ.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2010 වසරේ මහඔය ප්‍රදේශයේ නේවාසික ව්‍යාපාර කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. පොල්ලේබැද්ද, පදියතලාව සහ රිදීමාලියද්ද යන කොට්ඨාස කාර්යාල තුනක් රඹකැන්ඔය කලාපය තුළ ක්‍රියාත්මක වේ.

රඹකැන්ඔය කලාපය අනෙකුත් කලාප වලට වඩා සැලකිය යුතු ලක්ෂණ ඇත. මෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ පොල්ලේබැද්ද ප්‍රදේශයේ ආදිවාසී ජනතාව ජීවත් වීමයි. ආචාර්ය ස්පිටෙල් (1940-1950) මෙම ආදිවාසී ප්‍රජාව සම්බන්ධයෙන් ඔහුගේ සහරාවක ද සඳහන් කරයි. මෙම ප්‍රදේශය සද්ධාතිස්ස රජුගේ යුගයට අයත් විය. එබැවින් පුරාවිද්‍යා නටබුන් රාශියක් ඇති අතර පුරාණ විහාරස්ථාන ද පිහිටා ඇත.

2022 වර්ෂය තුල සිදු කළ විශේෂ කාර්යයන් හා එයින් ජාතික ආර්ථිකයට සිදු කළ දායකත්වය

- පවතින ආර්ථික අර්බුධය තුළ හදුනාගත් අඩු ආදායම්ලාභී දරුවන් වෙත පාසල් පොත් ලබා දීම හා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීමට අදාල උපකරණ ලබා දීම තුලින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට දායක වීම.
- ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් සිදු කිරීම මඟින් පවතින ආර්ථික තත්වය තුල තම ව්‍යාපාර අනුවර්ථනය කර ගැනීමට හා ඒ සඳහා මුහුණ දෙමින් ඔවුන්ගේ ව්‍යාපාර වැඩි දියුණු කිරීමට දායක වීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත පුහුණු වැඩසටහන් සිදු කිරීම මඟින් ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කර ගැනීමට දායක වීම.
- අනෙකුත් ක්‍රියාකාරකම් තුලින් කලාපයේ සිටින ජනතාවගේ ආකල්ප වර්ධනය කිරීමටත් රෝග නිවාරණ වැඩසටහන් තුළින් විවිධ වූ රෝග පිළිබඳ දැනුවත් කර තම සෞඛ්‍ය තත්වය වර්ධනය කර ගැනීමට දායක වීම ඇතුළු උක්ත කාර්යයන් මගින් විවිධ ආකාරයෙන් ජාතික ආර්ථිකයට සංවර්ධන අංශය දායකත්වය දෙන ලදි.



ලාහුගල ඒකකයේ පෙර පාසල



මිරිස්වැල්ලන්ද වැව ඉදි කිරීම



රළුමට්ටම් කිරීම ඉදිකිරීම




මාර්ග මොටර්ග්‍රේඩර් කිරීම



පාසල් සඳහා වැසිකිළි පද්ධති ඉදි කිරීම



පාසල් සඳහා ජල ව්‍යාපෘති ඉදිකිරීම



වලව කලාපය

කලාපය පිළිබඳ හැඳින්වීම

වලව මිටියාවත වර්ග කි.මී.2442 කින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ බලංගොඩ රත්නපුර කදුකරයේ සිට හම්බන්තොට /රන්න දකුණු වෙරළබඩ තීරය දක්වා විහිදේ. පුරාණ වැව් සිය ගණනක් වලව නිම්නය තුළ පිහිටා ඇත.

උඩවලව බහුකාර්ය යෝජනා ක්‍රමය 1963 ජූලි මස 12 වැනිදා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කර ඇති අතර, උඩවලව ජලාශය ඉදිකිරීමත් එයට සමගාමීව ජනාවාස කරණය සහ ගොවි බිම් සංවර්ධනය 1981 දක්වා ක්‍රියාත්මක කරන ලද්දේ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය මගිනි.

1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 (1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 1981/04/16 දින අංක 137 දරණ ගැසට් පත්‍රය මගින් ගරු ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍යවරයා වූ ගාමිණි දිසානායක මැතිතුමා විසින් වලව කලාපය වලව විශේෂ බලප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. ඒ අනුව 1982.01.01 දින සිට වලව කලාපයේ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට පත් වී ඇත.

වලව කලාපයේ පරිපාලන කටයුතු මහවැලි අධිකාරිය යටතට පත්ව දැනට වසර 34 ක් ගතවී ඇති අතර, මෙම කාලය තුළ වලව කලාපය සීඝ්‍ර දියුණුවක් ලබා ඇත. මෙම කලාපය දකුණු පළාත, සබරගමු පළාත හා ඌව පළාත යන පළාත් 03 කට අයත් හම්බන්තොට, රත්නපුර හා මොණරාගල යන දිස්ත්‍රික්ක 03 කට අයත්වේ.

අඟුණකොළපැලැස්ස, මුරවැසිහේන, සුරියවැව, මයුරපුර, චන්ද්‍රිකාවැව, කිරිඉබ්බන්වැව හා සෙවනගල යන කොට්ඨාස 06 කින් සමන්විත වන අතර, ඒකක 39 කට බෙදී ඇත.

කලාපයේ ඇති භූමි ප්‍රමාණය පිළිබඳ තොරතුරු.

වලව කලාපයේ ආයතන සංවර්ධන අංශයේ සංවිධානයෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වයෙන් සිදුකළ කේක් ආකෘති නිර්මාණ කිරීමේ පුහුණු වැඩසටහන





වලව කලාපයේ ආයතන සංවර්ධන අංශයේ සංවිධානයෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්ව මත සිදුකරන ලද ගෘහස්ථ විදුලි පද්ධති සවි කිරීමේ පුහුණු වැඩසටහන



වලව කලාපයේ මුරවැසිහේන කොට්ඨාසයේ ආයතන සංවර්ධන අංශයේ සංවිධානයෙන් හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වය මත සිදුකරන පාසල් නිල අැඳුම් (ගැහැනු පිරිමි දරුවන්ගේ)මැසීමේ පුහුනු වැඩසටහන





2022-12-31 දිනට මූල්‍ය ප්‍රගතිය - කලාප වශයෙන්

අ.අ	කලාපය	2022 වර්ෂයට වෙන් කළ මුදල (රු.මිලි.)	2022-12-31 දිනට වියදම් කළ මුදල (රු.මිලි.)	මූල්‍ය ප්‍රගතිය%
1	බී	262.87	171.65	65
2	සී	482.64	183.30	38
3	ඩී	77.13	34.41	45
4	මොරගහකන්ද	56.84	36.97	65
5	එච්	190.80	94.01	49
6	එල්	60.47	27.51	45
7	රඹකැන්ඔය	92.40	26.39	29
8	උඩවලව	313.85	131.21	42
9	ඊ	329.88	91.79	28
10	හුරුළුවැව	20.34	10.45	51

අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ කළමනාකරණය වන අංශ.

1. සැලසුම් හා නියාමන අංශය
2. අභ්‍යන්තර විගණන අංශය
3. ජල කළමනාකරණ ලේකම් කාර්යාලය
4. ප්‍රසම්පාදන අංශය

01. සැලසුම් හා නියාමන අංශය

කාර්යභාරයන්

- ආයතනයේ දැක්ම හා මෙහෙවරට අනුව සංයුක්ත ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා වාර්ෂික සැලැස්ම අනුව කටයුතු කිරීම.
- විශේෂ ව්‍යාපෘති වාර්තා සැකසීම හා ආර්ථික සාමාජීය සමීක්ෂණ හා විශ්ලේෂණ සිදු කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මේ සහ ව්‍යාපෘති වාර්තාවල ඇති ප්‍රගතිය මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව සමාලෝචනය කිරීම. ව්‍යාපෘති ඇගයීම් සම්බන්ධීකරණය හා මෙහෙයුම් ඇගයීම් පද්ධතියක් සහතික කිරීම.
- තාක්ෂණ වාර්තා, ශක්‍යතා වාර්තා මෙහෙයුම් හා ඇගයීම් වාර්තා සංරක්ෂණය හා භාවිතයට ලබා දීම.
- මහවැලි පරිගණක ජාලය මෙහෙයවීම නඩත්තුව හා නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ සහාය සැපයීම.
- බලපෑමට ලක්වන ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයන් සම්බන්ධීකරණය කිරීම.

02. අභ්‍යන්තර විගණන අංශය

<u>අභ්‍යන්තර විගණන අංශය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි)මු.රෙ (133.ප්‍රකාරව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා තිබෙන අතර මු.රෙ (1)134.ප්‍රකාරව ප්‍රධාන අභ්‍යන්තර විගණක සෘජුවම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරනු ලබයි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය, ශ්‍රී ලංකා ජනරජය විසින් නිකුත් කර ඇති මූල්‍ය රෙගුලාසි (Financial Reguations), ආයතනික රෙගුලාසි (Adminstration Regulations), කාලීනව නිකුත් වන චක්‍රලේඛ, ප්‍රතිපත්ති තීරණ සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, පරීක්ෂණ නිරීක්ෂණ මගින් අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කරමින්, කළමනාකාරිත්වයට සහය වීම සිදු කරනු ලබයි.

<u>කාර්යය භාරයන්</u>

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුකූලව සහ යහපාලන ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියාත්මක කරනවාද යන්නත්, සිදු කරන ලද ගනුදෙනු වලින් ආර්ථිකමය ප්‍රතිලාභ (Value for Money) ලැබෙනවාද යන්නත්, විගණන පරීක්ෂණයන් නිරීක්ෂණ, සැසඳීම්, භෞතික පරීක්ෂණ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICA) මඟින් සහ ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිතීන් (IAS) මගින් නිකුත් කරන ලද ප්‍රමිතීන් වලට අනුගතව, විගණනය සිදු කර කළමනාකාරිත්වය වෙත වාර්තා කිරීම.

අ	වැරදි හා වංචා හෙළිදරව් කර ගැනීම හා වැලැක්වීම සඳහා අධිකාරියේ ක්‍රියාත්මකව පවතින අභ්‍යන්තර පාලන පද්ධතියේ ශක්තිමත්භාවය ඇගයීම.
ආ	අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිභාවය හා විශ්වාසනීයත්වය පරීක්ෂාව
ඇ	අධිකාරියේ වත්කම් නිසි පරිදි ආරක්ෂිතව පවතීද යන්න සොයා බැලීම
ඈ	අධිකාරියේ එක් එක් අංශයන්හි වගකීම් හා කාර්යභාරය ඉටු කිරීමෙහිලා ඒවායේ කාර්යසාධනය ඇගයීමට ලක් කිරීම.
	ආයතන සංග්‍රහය ,මුදල් රෙගුලාසි ,භාණ්ඩාගාර හා වෙනත් රාජ්‍ය චක්‍රලේඛ ,අධිකාරියේ පාලන චක්‍රලේඛ ඇතුලු නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූලව කටයුතු කර තිබේද යන්න පරීක්ෂා කිරීම.
ඊ	අවශ්‍ය වූ විටකදී විශේෂ විමර්ශන පැවැත්වීම.
උ	නිශ්කාර්ය වියදම් ,ඌන උපයෝජිත වත්කම් ,හිඟහිට තිබෙන ආදායම් ,ගෙවිය යුතු හා ලැබිය යුතු මුදල් යනාදිය පිළිබඳව පරීක්ෂා කිරීම.
ඌ	ව්‍යාපෘති සම්බන්ධයෙන් ඒවායේ මෙහෙයුම් හා ප්‍රගතිය ,ඉලක්කයන් සාක්ෂාත්කර ගැනීම , ප්‍රමාදයන් ,පරිපාලනය යනාදිය පිළිබඳව පරීක්ෂා කිරීම.

2022වර්ෂය තුල පහත සඳහන් කාර්යයන් සිදු කොට අවසන් කර ඇත.

1. අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කරන ලද විගණන වාර්තා ගණන 43 කි.
2. නිකුත් කරන ලද විමර්ශන වාර්තා ගණන 04 කි.
3. පවත්වන ලද විගණන හා කළමනාකරණ රැස්වීම් ගණන
    - අමාත්‍යාංශ මට්ටමින් විගණන කළමනාකරන කමිටු රැස්වීම් 03
    - අධිකාරි මට්ටමින් විගණන කළමනාකරණ රැස්වීම් 01
4. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ලබාදුන් පිලිතුරු සහ විමසුම් මගින් ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම.
5. විගණන හා කළමනාකරණ කමිටු මගින් ලබාදුන් මඟපෙන්වීම හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට, ප්‍රගති වාර්තා ලබාගැනීම තුලින් උපදෙස් ලබාදීම.

<u>විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, විගණන හා කළමනාකරණ කමිටුව, පහත සඳහන් ආකාරයට සමන්විත වේ.

2022 පී. පී. එස්. ආර්. ද සිල්වා මයා - සභාපති -මහා භාණ්ඩාගාරය
2023 මහාචාර්ය ඩී. එම්. සූරතිස්ස මයා - කමිටු සාමාජික
2024 නීතිඥ කේ. කේ. ජී. ප්‍රේමතිලක මිය - කමිටු සාමාජික
ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

2025 ප්‍රධාන අභ්‍යන්තර විගණක - අමාත්‍යාංශය
2026 විගණනකාධිපතිවරයා නියෝජනය කරන විගණන අධිකාරි
2027 අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන)- අමාත්‍යාංශය

කමිටුව සඳහා සහභාගි වන වෙනත් නිලධාරීන්
2028 අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
2029 අධ්‍යක්ෂ (මුදල්)
2030 අවශ්‍යතාවය මත කැඳවන වෙනත් නිලධාරීන්

කමිටු කාර්යභාරය
- වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අධීක්ෂණය කිරීම.
- විගණකාධිපති වාර්තා හා අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ එමගින් හඳුනාගන්නා ගැටළු නිරාකරණය කිරීමට මඟ පෙන්වීම.
- 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) C අනු වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා දක්වා ඇති කරුණු පිලිබඳව කටයුතු කිරීම සහ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම සඳහා උපදෙස් ලබාදීම.
- කාර්තුමය කමිටු රැස්වීම් පැවැත්වීම.

03. ජල කළමනාකරණ ලේකම් කාර්යාලය.

හැඳින්වීම


ජල කළමනාකරණ ලේකම් කාර්යාලය මගින් වාර්ෂික යල සහ මහ කන්නයන් සඳහා මෙහෙයුම් ප්‍රතිපත්ති නිර්දේශ කර මහවැලි පද්ධති සඳහා මෙහෙයුම් සැළසුම් සකස් කිරීම සිදුකරන අතර මෙය මූලික ලෙස වාරිමාර්ග හා බලශක්ති අවශ්‍යතා මත පදනම් ව ප්‍රධාන ලෙස වී සහ අතුරු වැවිලි බෝග නිෂ්පාදනය සඳහා පුලුල් දායකත්වයක් ලබාදෙන ජාතික වැඩ සටහන වේමෙය සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ උපදෙස් සපයන ඒකකයක් ලෙස ජල . පාලන ලේකම් කාර්යාලය මගින් ජලපාලන කමිටුවට අයත් සාමාජික ආයතන සම්බන්ධීකරණය කරගනිමින් සියලු මෙහෙයුම් සැළසුම් සතිපතා අධීක්ෂණය කරමින් එහි ප්‍රගතිය සමාලෝචනය හා ඉදිරි සති ජලමෙහෙයුම් සැළසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීම සිදුකරන අතර එය කෘෂිවිදුලි හා පානීය ජල අවශ්‍යතාද , සලකමින් සමස්ථ පද්ධතිය තුල නිර්දේශිත ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු කරනු ලබන්නකි.

2021/22 මහ කන්නය) 2022 ජනවාරි 01 මාර්තු - 31

2021/22 මහ කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටුව 2021 සැප්තැම්බර් 10 දින පේරාදෙනිය ගන්නෝරුව පැලෑටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර, ඒ වනවිට පද්ධතියේ අපේක්ෂිත සියලු ජලාශවල සක්‍රීය ජල මට්ටම් කොත්මලේ 72.1%, වික්ටෝරියා 78.9%, වලව 73.1%, හුරුලුවැව 19.3% මට්ටමක පැවතී අතර මාදුරුඔය 49.5% ලෙස විය.


ඒ වනවිට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී තිබීම හේතුකොට ජලය නිකුත් කිරීම ඒ අනුව කලාප එවි, ඩී 02, හා වලව කලාපය 2021 නොවැම්බර් පළමුවන සතිය වනවිට ආරම්භ කිරීමට හැකිවිය. ඒ අනුව 2021/22 මහ කන්නයේ මුලු වගා වපසරිය හෙක්. 194,639 වූ අතර එය සමස්ථ ලෙස 100 % පමන විය.

2021/22 මහ කන්නය තුල 2022 ජනවාරි සිට මාර්තු මාසය දක්වා මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 429.85ක්ද, කැළණි පද්ධතියෙන් ගිගාවොට් පැය 494.05 ක්ද, ජාතික විදුලිබල පද්ධතියට එක්කරන ලදී. මෙම කන්නය තුල විදුලිබල උත්පාදනය පැවති ආකාරය පළමුවන රූප සටහනින් දැක්වේ



පළමුවන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ ඇති කලාපවල 2021/22 මහ කන්නයේ වගා සැළසුම හා එහි ප්‍රගතිය දෙවන රූප සටහනින් දැක්වේ.




දෙවන රූප සටහන

2022 යල කන්නය - (2022 අප්‍රේල් 20 - 2022 සැප්තැම්බර් 30)

2022 යල කන්නය සඳහා වූ මහවැලි ජල පාලන කමිටු රැස්වීම 2022 මාර්තු මස 25 වන දින පේරාදෙණිය, ගන්නෝරුව , පැලෑටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලද ඒ වන විට සක්‍රීය ජල මට්ටම කොත්මලේ ජලාශයේ 19%, වික්ටෝරියා 19.1%, මාදුරුඔය 39.8%, හුරුළුවැව 44.6% ක් ලෙස පැවති අතර පරාක්‍රම සමුද්‍රය 92.6% ක් උපරිම ජල මට්ටම ආසන්නව පැවතුණි.


එබැවින් සමස්ථයක් ලෙස වගාව වී 75% පමණ උපරිමය අපේක්ෂා කල අතර, ඒව් සහ වලව කලාප සඳහා වී වගාව 50% ලෙස යෝජිත විය. ඒ අනුව යල කන්නයේ මුලු වගා වපසරිය හෙක්. 184,622 වූ අතර ආසන්න ලෙස මුලු වගාවෙන් 94.6% ක ප්‍රමාණයක් විය.

මෙම කන්නය තුල මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 1126.18 ක විදුලිබල උත්පාදනයක්ද, කැළණි පද්ධතියෙන් ගිගාවොට් පැය 1635.13 ක විදුලිබල උත්පාදනයක්ද සිදුකරන ලදී. 2022 විදුලිබල උත්පාදනය යල කන්නය තුල පැවති ආකාරය 3 වන රූප සටහනේ දැක්වේ.



තුන්වන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ පවතින කලාපවල 2022 යල කන්නයේ වගා සැලසුම හා ලබාගත් ප්‍රගතිය සිව්වැනි රූප සටහනින් දැක්වේ.




සිව්වැනි රූප සටහන

2022/23 මහ කන්නය (2022 ඔක්තෝබර් - 2022 දෙසැම්බර් 31 දක්වා)

2021/22 මහ කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටුව 2022 සැප්තැම්බර් 16 දින පේරාදෙනිය ගන්නෝරුව පැලෑටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර , ඒ වනවිට පද්ධතියේ අපේක්ෂිත සියලු ජලාශවල සක්‍රීය ජල මට්ටම් කොත්මලේ 88%, වික්ටෝරියා 95%, වලව 41%, හුරුලුවැව 22% මට්ටමක පැවති අතර මාදුරුඔය 43% ක් ලෙසද විය.


ඒ වනවිට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී තිබීම හේතුකොට ජලය නිකුත් කිරීම ඒ අනුව කලාප H ,D හා වලව කලාපය 2022 ඔක්තෝම්බර් දෙවන සතිය වනවිට ආරම්භ කිරීමට හැකිවිය. ඒ අනුව 2022/23 මහ කන්නයේ මුලු වගා වපසරිය හෙක්. 195,267 ක් වූ අතර ඒය සමස්ථ ලෙස 100% ක් විය.

මෙම කන්නය තුල මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 816.8 ක්ද කැළණි පද්ධතියෙන් ගිගාවොට් පැය 860.2 ක්ද විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදී. විදුලිබල උත්පාදන 2022/23 මහ කන්නය තුල පැවති ආකාරය 5 වන රූප සටහනේ දැක්වේ.



පස්වන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ ඇති කලාපවල 2022/23 මහ කන්නයේ වගා සැළසුම් හයවන රූප සටහනින් දැක්වේ.



හයවන රූප සටහන

04. ප්‍රසම්පාදන අංශය

කාර්යභාරයන්

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාළ කාර්යයන් හා සම්බන්ධ සියලු කටයුතු මෙහෙයවීම.

2. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පැවැත්වීම හා එයට අදාළ සියලුම කාර්යයන් ඉටු කිරීම.

3. ශ්‍රී. ල. ම. අධිකාරියෙහි සංයුක්ත ප්‍රසම්පාදන සැලසුම් සකස්කිරීම හා අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම.

4. ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු හා සියලුම තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම හා පසු විපරම.

5. ප්‍රසම්පාදන කාර්යයන් හා සම්බන්ධ රජයේ මාර්ගෝපදේශ, චක්‍රලේඛණ විධි විධාන හා ක්‍රමවේදයන් පිළිබඳව ආයතනය දැනුවත් කිරීම හා උපදෙස් ලබාදීම.

6. අභ්‍යන්තර චක්‍රලේඛණ හා මූල්‍ය බලතල විමධ්‍යගත කිරීම් මගින් ආයතනයේ ප්‍රසම්පාදන කාර්යයන් වඩා කාර්යක්ෂමව හා විනිවිද භාවයකින් යුතුව පවත්වාගෙන යාම.

7. ශ්‍රී. ම. අ. ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල සඳහා අවශ්‍ය වන ප්‍රසම්පාදනයන් සිදු කිරීම හා මෙහෙය වීම.

8. ශ්‍රී. ල. ම. අධිකාරියෙහි අංශ මගින් සිදුකරනු ලබන මිල/ ලංසු කැඳවීම් සඳහා වන ප්‍රසිද්ධ මිල/ ලංසු විවෘත කිරීම් සිදු කිරීම හා මෙහෙය වීම්.

9. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන විශේෂ/ හදිසි ප්‍රසම්පාදනයන් හා වෙනත් රාජකාරිමය කාර්යන් ඉටු කිරීම.

10. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත්වන ලේඛණ, ලිපිගොණු හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා පරීක්ෂාකිරීම, නිවැරදි කිරීම හා නිර්දේශයන් ලබාදීම.

11. ශ්‍රී. ල. ම. අධිකාරියෙහි වාර්ෂික වාර්තාවන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සකස් කිරීම හා ඊට අදාළ සියළුම කාර්යයන් මෙහෙයවීම.

දෙවන පරිච්ඡේදය

2.1තාක්ෂණ සේවා අංශය

කාර්යභාරයන්

- සංයුක්ත සැලැස්ම/වාර්ෂික සැලැස්මට අනුව නව අංගයකින් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම.

- තාක්ෂණික සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සඳහා මගපෙන්වීම හා මෙහෙයවීම.

- ප්‍රධාන වේලි හා ජල හැරවුම් මාර්ග සහ පහළ නිම්න ප්‍රදේශයේ වාරි පද්ධතිය ඇතුළු භෞතික සම්පත් නිසි පරිදි නඩත්තු කර ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රියාවලියක් සැකසීම.

- ජලාශ හා වාරිපද්ධති හරහා කෘෂිකාර්මික කටයුතු,ජල විදුලි නිෂ්පාදනය, පානීය ජලය ඇතුලු අනෙකුත් අවශ්‍යතා සඳහා ජලය කළමනාකරණය කර සපයා දීම සඳහා විධිමත් සැලසුම් පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ව්‍යාපෘති සැලසුම් කිරීම, ශක්‍යතා ඇගයීම, මෙහෙයවීම හා ප්‍රගතිය සමාලෝචනය.

මූලික වශයෙන් ඉහත දැක්වූ ප්‍රධාන ක්‍රියාවලීන් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තාක්ෂණ සේවා අංශය කටයුතු කරනු ලබයි. ඒ අනුව 2022 වසර තුල මෙම අංශය මගින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කරන ලදී.

- මාදුරුඔය දකුණ ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය
- කිවුල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය
- රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය
- රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපෘතිය
- වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය
- සුර්ය බලශක්තිය ගොඩ ඉඩම් වල හා ජලාශවල පිහිටුවීම සඳහා මඟ පෙන්වීම
- කුඩා ජල විදුලි බලාගාර පිහිටුවීම සඳහා මග පෙන්වීම


තවද පහත සඳහන් ක්‍රියාමාර්ග තුලින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම

- වාණිජ ජල සැපයුම් ලබා දීම.
- ජලාශ හා වැව් වල රොන්මඩ/වැලි වාණිජ මට්ටමින් ඉවත් කිරීම.

2022 වසර සඳහා මහා භාණ්ඩාගාරය විසින් ඒ ඒ කලාප සහ ව්‍යාපෘති සඳහා වෙන් කල ප්‍රතිපාදන වැය කිරීම් වගුවේ දක්වා ඇත.

අනු අංකය	ව්‍යාපෘති/කලාප/අංශ	2022 වර්ෂයේ තා.සේ. අංශයට වෙන් කල මුදල /(රු.මි.)	2022 වසරේ මුල්‍ය ප්‍රගතිය /(රු.මි.)	අතැති බිල්පත් /(රු.මි.)	මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය%
1	ව්‍යාපෘති	140.00	128.99	0.00	92.14%	98.00%
2	කලාප	231.53	210.59	24.71	101.62%	100.00%
	උප එකතුව 1 (1+ 2) (පහළ නිම්න සංවර්ධන අංශය)	**371.53**	**339.58**	**24.71**	**98.05%**	**99.25%**
3	ගංගා ද්‍රෝණි කළමනාකරණ අංශය	1.70	1.26	0.00	74.14%	99.35%
4	ප්‍රධාන වේලි හා ජලාශමෙහෙයුම්අංශය	493.88	399.44	28.00	81.00%	86.50%
5	ඉඩම් පරිහරණය සහ සැලසුම් අංශය	0.06	0.05	0.00	91.20%	100.00%
6	පාරිසරික හා වනාන්තර අංශය	29.76	25.99	1.37	92.00%	90.00%
	උප එකතුව 2 (3+4+5+6)	**525.40**	**426.74**	**29.37**	**81.60%**	**86.49%**
	මුළු එකතුව - (උප එකතු1+උප එකතුව 2) (තාක්ෂණ සේවා අංශය)	**896.93**	**766.32**	**54.08**	**91.47%**	**91.92%**

2022 වසරේ තාක්ෂණ සේවා අංශයේ එක් එක් අංශයට වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන පහත සඳහන් වෘත්ත ප්‍රස්ථාරය මගින්ද දක්වා ඇත



2.1.1 පහළ නිම්න සංවර්ධන අංශය

හැඳින්වීම

මහවැලි බල ප්‍රදේශයන්හි ඇති වාරි පද්ධති, වැව් හා ජලාශ මෙහෙයවීම සහ නඩත්තු කිරීම, ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු කිරීම සහ කලමනාකරණය කිරීම, මාර්ග පද්ධති අළුත්වැඩියාවන් හා ඊට අදාල ඉදිකිරීම්, ඇස්තමේන්තු කිරීම, ඉදිකිරීම්වල තත්ව පාලනය කිරීම් සහ ප්‍රගති සමාලෝචනය මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

කාර්යභාරයන්

සියලුම කලාපවල හා විශේෂ ව්‍යාපෘති ඇතුළුව වැඩ සහ සේවා සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත් පරිපාලනයට පහසුකම් සැලසීම.

වාර්ෂික ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සම්බන්ධ වාර්ෂික අයවැය, වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමාලෝචනය කිරීම.

මහවැලි කලාපවල වැව් හා ඇල මාර්ග පද්ධතිවල අදාල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ජල පාලන ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් මහවැලි ප්‍රදේශයේ වගාවන් සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීම සහ බෙදා හැරීම සහතික කිරීම.

තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් අනෙකුත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පවතින අංශ සමඟ සහ භාහිර ආයතන සමග සම්බන්ධීකරණය කිරීම..

මූල්‍ය ප්‍රගතිය

2022 වසර සඳහා මහා භාණ්ඩාගාරය විසින් කලාප හා ව්‍යාපෘති සඳහා වෙන් කල ප්‍රතිපාදන වැය කිරීම් පහත පරිදි වේ.

(1) ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතිය	සම්පූර්ණ ආයෝජන ඇස්තමේන්තු මුදල /(රු.මි)	2022 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත වියදම්/(රු.මි)	2022 සඳහා වෙන් කිරීම /(රු.මි)	2022 සඳහා වියදම /(රු.මි.)	අතැති බිල්පත්/ (රු.මි.)	2022 සඳහා මූල්‍ය ප්‍රගතිය %	2022 සඳහා භෞතික ප්‍රගතිය%
1	රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය	1100.00	870.58	40.00	36.55	0.00	85.40%	98.00%
2	රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපෘතිය	1086.00	706.65	60.00	54.69	0.00	77.72%	98.00%
3	වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය	3957.00	2534.38	40.00	37.75	0.00	94.00%	98.00%
	එකතුව (ව්‍යාපෘති)	**6,143.00**	**4,111.61**	**140.00**	**128.99**	**0.00**	**92.14%**	**98.00%**

පහත ව්‍යාපෘති දෙක සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ මුදල් වෙන් කරනු ලබන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් අධීක්ෂණ කටයුතු සිදු කෙරේ.

අනු අංකය	ව්‍යාපෘතිය	සම්පූර්ණ ආයෝජන ඇස්තමේන්තු මුදල /(රු.මි)	2022 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත වියදම /(රු.මි)	2022 සඳහා වෙන් කිරීම /(රු.මි)	2022 සඳහා වියදම (රුමි.)	අතැති බිල්පත් /(රු.මි.)	2022 සඳහා මුල්‍ය ප්‍රගතිය %	2022 සඳහා භෞතික ප්‍රගතිය%
1	මාදුරුඔය දකුණ ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය	38,500.00	724.30	500.00	390.20	94.80	97.00%	85.00%
2	කිවුල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය	8,000.00	59.65	100.00	31.45	0.00	31.45%	40.00%

(2) ආයතනික ප්‍රාග්ධන

අනු අංකය	කලාපය	2022 වසරේ තා.සේ. අංශයට වෙන් කල මුදල /(රු.මි.)	2022 වසරේ මුල්‍ය ප්‍රගතිය /(රු.මි.)	අතැති බිල්පත් /(රු.මි.)	මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය%
1	බී කලාපය	40.25	40.25	3.80	109.44%	100.00%
2	සී කලාපය	46.49	29.74	16.75	100.00%	100.00%
3	ඩී කලාපය	11.16	10.95	0.21	100.00%	100.00%
4	ජී කලාපය	11.30	10.69	0.61	100.00%	100.00%
5	එච් කලාපය	47.31	47.31	0.00	100.00%	100.00%
6	වලව කලාපය	47.23	44.23	3.00	100.00%	100.00%
7	හුරුළුවැව කලාපය	9.59	9.62	0.04	100.73%	100.00%
8	වික්ටෝරියා කලාපය	11.70	11.30	0.30	99.15%	100.00%
9	ප්‍රධාන කාර්යාලය (තා.සේවා)	0.50	0.50	0.00	100.00%	100.00%
10	පරිශ්‍ර කළමනාකාර	6.00	6.00	0.00	100.00%	100.00%
	උප එකතුව 2 (කලාප)	**231.53**	**210.59**	**24.71**	**101.63%**	**100.00%**

(3) විශේෂ කාර්යන් සහ ජාතික ආර්ථිකයට සිදුකල දායකත්වය

පාසල් ගොඩනැගිලි ආදිය ලබාදීම මගින් අධ්‍යාපනයට පහසුකම් ලබාදීම.

මාර්ග අලුත් වැඩියා කිරීම මගින් වඩාහොඳ යටිතල පහසුකම් ලබාදීමට හැකිවීම.

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය මගින් ගොවි ජනතාවගේ ජීවිත තත්වය නගා සිටුවීමට කටයුතු කිරීම.

වැව්වල රොන්මඩ ඉවත්කර ඒවායේ ධාරිතාව වැඩිකිරීම මගින් අස්වැද්දිය හැකි ඉඩම් ප්‍රමාණය වැඩිකිරීම

වාරිමාර්ග අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

වාරි සෞභාග්‍යා වැඩසටහන **2022**

කලාපය	**2022** සඳහා වෙන්කල ප්‍රතිපාදන		**2022** සඳහා සංශෝධිත ප්‍රතිපාදන		ඇස්තමේන්තු සකස් කරන ලද වැව් සංඛ්‍යාව	වැඩ ආරම්භ කර ඇත		ප්‍රගතිය **12/31/2022**		**2022** වසරේ වැඩ නිමකිරීම	
	වැව් සංඛ්‍යාව	ප්‍රතිපාදන /(රු.මි)	වැව් සංඛ්‍යාව	ප්‍රතිපාදන /(රු.මි)		ඉලක්කය (වැව් සංඛ්‍යාව)	ප්‍රගතිය (වැව් සංඛ්‍යාව)	භෞතික %	මූල්‍ය /රු.මි	ඉලක්කය (වැව් සංඛ්‍යාව)	ප්‍රගතිය (වැව් සංඛ්‍යාව)
බී කලාපය	9	23.50	3	4.00	3	3	3	100.00%	2.70	1	1
සී කලාපය	8	30.40	5	17.80	5	5	5	100.00%	17.80	1	2
ඩී කලාපය	14	13.93	9	7.73	9	9	9	100.00%	7.90	4	4
ජී කලාපය	0	-	0	-	0	0	0	0.00%	-	0	0
එච් කලාපය	37	37.80	21	16.21	21	21	21	100.00%	16.21	20	20
හුරුළුවැව කලාපය	1	2.50	1	0.32	1	1	1	0.00%	0.32	0	0
එල් කලාපය	5	25.50	2	1.70	2	2	2	58.00%	1.80	2	0
වලව කලාපය	5	7.50	3	8.97	3	3	3	95.00%	9.15	3	1
රඹකැන්ඔය කලාපය	25	40.18	9	23.10	4	4	4	100.00%	22.05	4	4
වික්ටෝරියා කලාපය	7	18.00	1	0.20	1	1	1	0.00%	0.20	0	0
එකතුව	**111**	**199.31**	**54**	**80.00**	**49**	**49**	**49**	**93.90%**	**78.13**	**35**	**32**

ගාස්තු අයකිරීමේ පදනම මත ජලාශ වල වැලි ඉවත් කිරීම

අංකය	කලාපය	ප්‍රධානය කල කොන්ත්‍රාත්		සම්පූර්ණ ප්‍රධානය කල මුදල /රු. මි.	වැඩ අරම්භ කල		ලැබුනු ආදායම රු.මි		ලැබුනු සම්පූර්ණ ආදායම /රු.මි
		කොන්ත්‍රාත් සංඛ්‍යාව	වැව් සංඛ්‍යාව		සම්පූර්ණ වැව් සංඛ්‍යාව	අවසන් කල වැව් සංඛ්‍යාව	2021 වර්ෂය	2022 වර්ෂය	
1	බී කලාපය	8	10	268.37	9	-	7.69	7.03	14.72
2	එච් කලාපය	8	10	131.16	6	-	0.42	0.87	1.29
3	එල් කලාපය	1	2	84.00	2	-	2.05	1.00	3.05
4	වලව කලාපය	7	33	337.75	13	7	2.92	1.08	4.00
	එකතුව	**24**	**55**	**821.28**	**30**	**7**	**13.08**	**9.98**	**23.06**

2.1.2 ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් යෝජිත ව්‍යාපෘවල, ක්‍රියාත්මක වෙමින් පවතින හා සංවර්ධනය කරන ලද ව්‍යාපෘතිවල ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් සකස් කිරීම ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය මගින් සිදුකරනු ලබයි.

එනම්,

- ✓ මහවැලි ජල සම්පත් සැලැස්ම යාවත් කාලීන කිරීම
- ✓ රාජ්‍ය හා පුද්ගලික ව්‍යාවසායකයින් විසින් ඉදිරිපත් කරනු ලබන කුඩා පරිමාණ ජල ව්‍යාපෘති යෝජනා හා සැලසුම් විශ්ලේෂණය කිරීම
- ✓ නිර්මාණ හා සැලසුම් වලට අදාල ඉංජිනේරු ඇස්තමේන්තු හා ප්‍රමාණ බිල්පත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සකස් කිරීම
- ✓ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පිළිගත් තත්වයන්ට අනුව ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්කරණය පිළිබඳව නවක ඉංජිනේරුවන් පුහුණු කිරීම.

<u>මහවැලි බී කලාපය</u>

1.1 මහවැලි බි කලාපයේ අරලගංවිල පිහිටි Rhyad වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලට අදාලව ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත, වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු සැලසුම් ඉදිරිපත්කරන ලදී.

1.2 මහවැලි බි කලාපයේ සිංහපුර කෝට්ඨාශයේ යෝජිත මුතුවැල්ල කෘෂිකාර්මික, සත්ව පාලන සහ ආශ්‍රිත කර්මාන්ත ආයෝජන ව්‍යාපෘති සඳහා පාරිසරික වාර්තාව ලබාගැනීමට අවශ්‍ය ඉංජිනේරු සැලසුම් ඉදිරිපත්කරන ලදී.

1.3 ක්ෂුද්‍ර ජල විදුලි බල යෝජනා ක්‍රම දායකත්වය
මහවැලි බි කලාපයේ Z-D ඇළට සම්බන්ධව යෝජිත ක්ෂුද්‍ර ජලවිදුලි බලාගාරය සැලසුම් කිරීම හා ඉංජිනේරු සැලසුම් ඉදිරිපත්කරන ලදී.

<u>මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය</u>

<u>මැනුම් වියරය</u>

ප්‍රධාන ඇළ පද්ධතිය ඔස්සේ මාදුරුඔය ජලාශයේ ජලය සිට රැගෙන යන දකුණු ඇළ මාර්ගයට අදාලව 2+200 km ස්ථානයේ මැනුම් වියරයකට අවශ්‍ය (RBMC2) drawings ඉදිරිපත් කරන ලදි.

<u>මහවැලි සී කලාපය</u>

තුවරගල අමුණ සැලසුම් පරීක්ෂාව හා අවශ්‍ය ඉදිරි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කිරීම.

<u>මහවැලි ඩී කලාපය (මැදිරිගිය)</u>

කිව්ලේ ඇල අමුණ නිර්මාණය.

සමගිපුර ප්‍රධාන බෙදුම් ඇළ නියාමක සැලසුම නිර්මාණය කිරීම.

<u>මහවැලි එච් කලාපය</u>

කලාවැව සංචාරක බංගලාවට අදාළව සිදුකරන ලද නවීකරණය සඳහා අවශ්‍ය සැලසුම් හා නිර්මාණ ඉදිරිපත් කිරීම.

තඹුත්තේගම ජල පවිත්‍රාගාරය සඳහා ජලය ලබා ගැනීමට අවශ්‍ය මූලික ශක්‍යතා අධ්‍යනය ඉදිරිපත් කිරීම.

කලාවැව වම් ඉවුර ප්‍රධාන ඇළ Weir සහ Transition සඳහා අවශ්‍ය සැලසුම් හා නිර්මාණ ඉදිරිපත් කිරීම.

<u>හුරුලුවැව කලාපය</u>

<u>පිවිසුම් ඇළ මාර්ගය සැලසුම් කිරීම</u>

තල්කොටේ වැවේ සිට සිට අවුඩංගාව වැව දක්වා ජලය රැගෙන යාමට ඇළ මාර්ගයක් සකස් කිරීමට අදාළ නිර්මාණ සැලසුම් හා ශක්‍යතා අධ්‍යනය සිදු කිරීම.

<u>කණ්ඩලම පෝෂක ඇල නවීකරණය</u>

හුරුළුවැව පෝෂක ඇළ මාර්ගයේ සිට කණ්ඩලම වැව දක්වා ජලය ගෙනයාමට ඇති බෙදුම් නිර්මිතයේ ආරක්ෂක පැති බැම්ම නිර්මාණය කිරීම.

<u>**එල් කලාපය - වැලිඔය**</u>

කිවුල්ඔය ව්‍යාපෘතියට අදාලව පිටවාන /වැව් බැම්ම/ පහල නිම්න සංවර්ධන සඳහා මූලික ඉංජිනේරු නිර්මාණ සැලසුම් නැවත පරිෂාව හා ඉදිරිපත් කරන ලදි.

එල් කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාරණ කාර්යාලය හරහා සිදුවන සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යය ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් ලබා දෙන ලදි.

මහවැලි එල් කලාපයේ වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත වැව් සඳහා තාක්ෂණික සකාෂ්‍යතා වාර්තාව අධ්‍යක්ෂ පරිසර වෙත ඉදිරිපත් කිරීම.පහත සඳහන් වැව් සඳහා පාරිසරික විමර්ෂණ වාර්තා සකස් සකස් කරන ලදි.

- ✓ කුඩාදික්වැව
- ✓ දික්වැව
- ✓ නාමල්ගම 02
- ✓ දුංකුඩුනේරුව
- ✓ රුවන්මඩුව
- ✓ මහකම්බිලියාව
- ✓ පුරාණමායා

<u>**පොල්ගොල්ල ජලාශය**</u>

අකුරණ හදිසි ගංවතුර පරීක්ෂණ වාර්තාව පිළියෙල කිරීම.

<u>**බෝවතැන්න ජලාශයේ**</u>

බෝවතැන්න ජලාශයේ වම් පස මඩ සොරොව්ව ප්‍රදේශය සඳහා ආරක්ෂිත බැම්ම සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම.

<u>**වලව කලාපය**</u>

උඩවලව වම් ඉවුර ප්‍රධාන ඇළෙහි MD15 ව්‍යුහය සැලසුම් කිරීම.

වල්සපුගල යෝජිත කිරි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වාරි ජාල සැලැස්ම සකස් කිරීම.

අහුණකොළපැලැස්ස බස් නැවතුම්පල සැලසුම් අදියර 02 අවශ්‍ය ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් ඉදිරිපත් කිරීම..

<u>**මහවැලි රඹකැන් ඔය කලාපය**</u>

අක්කර 1000, පුලාවල, බොංචිගොඩ, ඉඹුල්ගොඩ සහ උල්පත්කණ්ඩිය වැව් සඳහා අවශ්‍ය ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් ඉදිරිපත් කිරීම.

- ✓ පිටවාන
- ✓ වැව බැම්ම
- ✓ පහල නිම්න සංවර්ධන සැලැස්ම (BOP)

<u>**පුහුණුව**</u>

වර්ෂයට අදාල නවක ඉංජිනේරුවන් පස් දෙනෙකු සඳහා වරලත් ඉංජිනේරු ප්‍රවේශයට පුහුණු කිරීම සිදු කරන ලදි.

<u>**අමතර කටයුතු**</u>

- ✓ මහවැලි කෘෂිකර්ම හා පශු සම්පත් අංශයේ ඉල්ලීම මත කුකුළු හා එළු පැල්පත් මෙන්ම මත්ස්‍ය අභිජනජන සැලසුම් සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම.

2.2 ගංගාද්‍රෝණි කළමනාකරණ කාර්යාලය

හැඳින්වීම


ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය, මඩාටුගම මහවැලි පරිශ්‍රයේ පිහිටා ඇති අතර අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ) යටතේ ක්‍රියාත්මක වේ. ගංගා ද්‍රෝණි කළමනාකරණ සංකල්පයට අනුකූලව පාරිසරික හා ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලවන කාර්යයන් ඉටු කිරීම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදු කරනු ලබන ඉදිකිරීම් හා නඩත්තු කාර්යන්හි ප්‍රමිතිය පරීක්ෂා කිරීම මෙම කාර්යාලයේ මූලික වගකීම වේ.

ඒ අනුව මෙම කාර්යාලය යටතේ පවත්වාගෙන යනු ලබන ජල තත්ව විද්‍යාගාරය මඟින් මහවැලි ගඟ සහ මහවැලි පද්ධතිය හා සහසම්බන්ධ ගංගා ද්‍රෝණිවල පිහිටි ජල ප්‍රභව වල ජලයෙහි ගුණාත්මය පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර එම දත්ත ඇසුරින් ජලයේ ගුණාත්මය ස්ථානීයව හා කාලීනව වෙනස් වන අයුරු අධ්‍යනය කිරීම සිදු කරනු ලැබේ.

ඒ යටතේ,

1. කලාවැව, කණ්ඩලම, දඹුළු ඔය, බෝවතැන්න, උඩවලව සහ චන්ද්‍රිකා වැව යන මහවැලි ජලාශ වල ජලයේ ගුණාත්මය පිළිබඳව මාසිකව පරීක්ෂා කිරීම.
2. මහවැලි කලාපයන්හි ඇති තෝරාගත් කුඩා වැව්වල ජලයේ ගුණාත්මකභාවය මාසිකව පරීක්ෂා කිරීම.
3. මහවැලි ගඟ සහ මහවැලි පද්ධතිය හා සහ සම්බන්ධ තෝරාගත් ජල දහරා වල ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.





අප අංශය සතු ජල තත්ව විද්‍යාගාරය මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත විද්‍යාගාරයක් බැවින් කර්මාන්ත සඳහා වන පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත්කර ගැනීමේදී එම ආයතන හරහා පරිසරයට මුදා හරින අපජලයේ තත්වය පරීක්ෂා කර නිර්දෙශයන් ලබා දීමද සිදු කරනු ලැබේ. මෙහිදී එම ආයතන හිමියන්ගෙන් කෙරෙන ඉල්ලීම් වලට අනුව පරීක්ෂණ සිදුකර අප ජලයෙහි සංයුතිය පිළිබඳ වාර්තා ලබා දෙන අතර ඒ සඳහා ගාස්තු අයකරනු ලැබේ.මීට අමතරව බාහිර ආයතන මඟින් කරනු ලබන ඉල්ලීම් අනුව ජල සාම්පල පරීක්ෂා කරනු ලබයි.

ඒ අනුව, ජල තත්ව විද්‍යාගාරය මඟින් 2022 වර්ෂය තුලදී **<u>ගාස්තු අයකරමින් සිදුකරන ලද</u>** පරීක්ෂණ වල වටිනාකම රු. 1350994.80 කි. ඊට අමතරව 2021 වර්ෂය තුලදී ලැබීමට තිබූ හිඟ මුදල් ලෙස රු. 267,505.00 ක මුදලක් ද 2022 වර්ෂයේදී ලැබී ඇත.ඒ අනුව, 2022 වර්ෂය තුලදී රු. 1618499.80 ක මුදලක් ජල සාම්පල් පරීක්ෂාව සඳහා ලැබී ඇත.තවද **<u>ගාස්තු අයකිරීමකින් තොරව මහවැලි අධිකාරියට අදාලව සිදු කරන ලද</u>** සාම්පල් පරීක්ෂාවල වටිනාකම රු.3173633.87 ක් වේ.ඒ අනුව, 2022 වර්ෂය තුලදී **<u>ගාස්තු අය කර සහ නොකර</u>** සිදු කරන ලද සාම්පල වල වටිනාකම රු. 4792133.67 ක් වේ.



තත්ව පාලන පරීක්ෂණාගාරය මඟින් මහවැලි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කෙරෙන ඉදිකිරීම් වල ප්‍රමිතිය උසස් මට්ටමක පවත්වාගෙන යෑමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. එහිදී මහවැලි කලාප වල සිදු කරන ඉදිකිරීම් සඳහා භාවිතා කරන ඉදිකිරීම් ද්‍රව්‍ය වල යෝග්‍යතාවය පිරික්සීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ සිදුකිරීමද එම ඉදිකිරීම්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර

පරීක්ෂණ සිදු කිරීමද කලාප කාර්යාල වලින් ඉල්ලීම් ලැබෙන පරිදි කරනු ලබයි. එම ඉදිකිරීම් කොන්ත්‍රාතකරුවන් මඟින් හෝ ගොවි සංවිධාන මඟින් සිදුකරගන්නේ නම් පරීක්ෂණ කටයුතු සඳහා ගාස්තු අයකරනු ලැබේ.

2022 වර්ෂය තුලදි **<u>ගාස්තු අයකරමින් සිදුකරන ලද පරීක්ෂණ</u>** වල වටිනාකම රු. 140,432.60 කි. 2022 වර්ෂය තුලදී එම මුළු මුදලම ලැබී ඇත.

ඊට අමතරව 2023 වර්ෂයේදී සිදු කිරීමට නියමිත පරීක්ෂණ සඳහා අත්තිකාරම් වශයෙන් රු. 825.00 ක මුදලක් 2022 වර්ෂය තුලදී ලැබී ඇත.

එමෙන්ම පසුගිය වර්ෂ වල සිදු කල පරීක්ෂණ සඳහා ලැබිය යුතු රු. 503,563.23 ක මුදලක් 2022 වර්ෂය තුලදී ලැබී ඇත.



ඒ අනුව, 2022 වර්ෂය තුලදී රු. 638,385.83 ක මුළු මුදලක් තත්ව පාලන පරීක්ෂණ **සඳහා** ලැබී ඇත.

එමෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) විසින් විශේෂිතව දැනුම් දෙන අවස්ථාවලදී සහ අහඹු ලෙසද මහවැලි කලාප කාර්යාල මඟින් සිදුකරන ඉදිකිරීම් වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමද සිදු කරයි. එබඳු විටදී **<u>ගාස්තු අයකිරීමකින් තොරව</u>** පරීක්ෂණ සිදු කරන අතර 2022 වසරේදී එසේ සිදු කරන ලද තත්ව පරීක්ෂා කිරීම් වල වටිනාකම රු. 141,637.25 ක් වේ.

ඒ අනුව, 2022 වර්ෂය තුලදී **<u>ගාස්තු අය කර සහ නොකර</u>** සිදු කරන ලද සාම්පල වල වටිනාකම රු. 282,069.85 ක් වේ.

<u>ජාතික ආර්ථිකයට හා සමාජයට ලබාදුන් දායකත්වය</u>

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය මගින් සැලකිය යුතු මූල්‍යමය ඉපයීමක් සෘජු ලෙසම සිදු නොකරන නමුත් ජාතික ආර්ථිකය සහ සමාජීය ප්‍රගමනය කෙරෙහි වක්‍ර දායකත්වයක් ලබා දෙයි.

ජල තත්ව විද්‍යාගාරයේ ක්‍රියාත්මක වීම මගින් පාරිසරික වශයෙන් ජලයේ සිදුවන ගුණාත්මකභාවයන්හි විචල්‍යයන් පහසුවෙන් හඳුනාගැනීමේ හැකියාව ලැබී ඇති අතර මෙම විචල්‍යයන්ගේ දීර්ඝ කාලීන හැසිරීම් අධ්‍යනය කිරීම තුළින් පරිසරයට මූලිකව එකතුවී ඇති පරිසර දූෂකයන්ද නිගමනය කිරීමේ හැකියාව ලැබේ. එය වඩාත් නිවැරදිව හඳුනාගැනීම තුළ ඊට නිසි ක්‍රියාමාර්ගයන්ට එළඹීමේ හැකියාවද ලැබෙන අතර එය අනාගත පරපුර සඳහා වන පාරිසරික ආයෝජනයක්ද වේ.

තත්ව පාලන පරීක්ෂණ සිදුකිරීම මගින් ප්‍රමිතිය නියමිත මට්ටමට නොමැති ඉදිකිරීම් හඳුනාගැනීමට හැකිවන අතර ඒවා යථාවත් කිරීම සඳහා ඒ අවස්ථාවේදීම පිලියම් යෙදීමට මග පාදාගත හැකිවේ. එමගින් නිර්මිත වල ආයුකාලය සැලසුම් කල පරිදි පවත්වාගත හැකිවන අතර වරින්වර අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය අවම කරවයි. එනිසා ඒවායේ ප්‍රතිලාභ ප්‍රජාව වෙත අඛණ්ඩව ලබාදීමට හැකියාව ලැබෙන අතර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දැරිය යුතු පිරිවැය අවම කරගැනීමටද හැකියාව ලැබේ. එය රටෙහි නිෂ්පාදන ආරථිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි.

2.3 විදුලි හා යාන්ත්‍රික අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විදුලි හා යාන්ත්‍රික අංශය ප්‍රධාන වශයෙන් මහවැලි කලාප තුල පුනර්ජනණීය බල ශක්ති ව්‍යාපෘති නියාමනය සහ අවශ්‍ය පහසුකම් සැපයීම, විදුලි හා යාන්ත්‍රික කාර්යයන් සඳහා වැඩ අනුමැතීන් සඳහා නිර්දේශ ලබාදීම සහ විදුලි හා යාන්ත්‍රික ප්‍රසම්පාදන කටයුතු සඳහා තාක්ෂණ ඇගයීම් වාර්තා ලබාදීම ඉටු කරනු ලබයි.

<u>පුනර්ජනණීය බල ශක්ති ව්‍යාපෘති</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2002 වර්ෂයේදී කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති සඳහා ශක්‍යතාවයක් පවතින ස්ථාන හඳුනාගන්නා ලදි .ටෙන්ඩර් පටිපාටියට අනුව තරගකාරී මිල ගණන් කැඳවීම මගින් මේ සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගන්නා ලදි .ප්‍රධාන තෝරා ගැනීමේ ක්‍රමවේදය වූයේ ඉඩම සහ භාවිතයට ගන්නා ජලය වෙනුවෙන් විදුලිය විකිණීමෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවනු ලබන රාජ්‍ය භාගයයි.

ඒ අනුව ලබා දෙන රාජ්‍ය භාගය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට සුදුසු කුඩා පරිමාණ ව්‍යාපෘති 10ක් ආරම්භයේදී හඳුනා ගෙන එම ව්‍යාපෘති සඳහා අභිප්‍රාය ලිපි නිකුත් කරන ලදි .ව්‍යාපෘති වැඩබිමියෙහි ස්වභාවය අනුව මෙම රාජ්‍ය භාගය 3.42 %සිට 34.2 %අතර විය. ඉන් පසුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රධාන ගංගාවේ හා යාමනය කරන ලද ජල මාර්ග වල සුදුසු භූමි වල ව්‍යාපෘති ඉදිරිපත් කරන ලද තවත් ආයෝජකයින් 10 දෙනෙකුට අභිප්‍රාය ලිපි ඉදිරිපත් කරන ලදි. යාමනය කරන ලද ජල මාර්ග වල පිහිටි ව්‍යාපෘති වලින් 10 % ක් ද ප්‍රධාන ගංගාවේ පිහිටි ව්‍යාපෘති වලින් 6 % ක්ද ලෙස රාජ්‍ය භාගය අය කර ගැනීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදි. මේ වන විට කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 12ක් සම්පූර්ණ කර ඇති අතර ඉන් ජාතික විදුලි බල පද්ධතියට මෙ.වො .39.85 ක ධාරිතාවයක් එක් කොට ඇත.

මීට අමතරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් භූමිය මත පිහිටි හා පාවෙන සූර්ය විදුලි බලාගාර ඉදි කිරීම සඳහා සුදුසු ස්ථානද හඳුනා ගෙන ඇත .මෙම ව්‍යාපෘති වල මූලික අරමුණ වනුයේ සාම්ප්‍රදායික ශක්ති ප්‍රභව වන ගල් අඟුරු, තෙල් හා වායු වලින් තොර පිරිසිදු හරිත සූර්ය විදුලි බලය ජනප්‍රිය කරවීමයි.

අනු අංකය	විස්තරය	සංඛ්‍යාව	ධාරිතාවය/ (මෙ.වො.)	**2022** වර්ශයේ ආදායම/(රු.)
1	ක්‍රියාත්මකව පවතින කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති	12	39.85	271,810,951.59 *
2	වැඩකටයුතු සිදුකරමින් පවතින කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති	10	26.18	-
3	ක්‍රියාත්මකව පවතින සූර්ය විදුලි බල ව්‍යාපෘති	8	44.25	11,925,600.00
4	2022 වර්ශය අවසානවනවිට ක්‍රියාකාරී මට්ටමේ පැවති නව සූර්ය විදුලි බල ව්‍යාපෘති	29	414.0	8,968,600.00
එකතුව		59	524.28	292,705,151.59

<u>වගු අංක 1: **පුනර්ජනණීය** බල ශක්ති ව්‍යාපෘති සාරාංශය</u>

* - මෙම මුදල ලංකා විදුලි බල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත සෘජුවම ගෙවනු ලබන අතර ජනාධිපති කාර්‍යාලයේ උපදෙස් පරිදි 2021 නොවැම්බර් මස සිට 2022 මැයි මස දක්වා මුදල් අයකිරීම අත්හිටුවා තිබූ අතර 2022 ජූණි මස සිට නැවත අයකිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. එසේ උවද 2022 වර්ශය සඳහා කිසිදු මුදලක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවා නොමැත

01.ක්‍රියාත්මකව පවතින කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති:

අනු අංකය	ව්‍යාපෘතිය	ව්‍යාපෘති ආයෝජකයාගේ නම	විදුලි ජනනය ආරම්භ කරන ලද දිනය	ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව / %	යාමනය කරන / නොකරන	ධාරිතාවය / (MWh.)	2022 වර්ෂය සඳහා ආදායම / (රු.)
1	මාදුරුඔය වම් ඉවුර සොරොව්ව **ජල විදුලි ව්‍යාපෘතිය** (මාදුරුඔය I)	ඊගල් පවර් (පුද්.) සමාගම, අංක 09, මෝදර විල කර්මාන්ත කලාපය, පානදුර.	2011 ජූනි	34.2	යාමනය කරන ලද	5.00	76,793,729.77
2	කෝලදෙණිය **ජල විදුලි ව්‍යාපෘතිය**	කෝළදෙනිය හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම, අංක 344, සිරිමංගලවත්ත, මාම්පේ, පිළියන්දල.	2012 අප්‍රේල්	6.0	යාමනය නොකර න ලද	1.20	2,667,531.81
3	බ්‍රැන්ෆෝඩ් **ජල විදුලි ව්‍යාපෘතිය**	බ්‍රැන්ෆෝඩ් හයිඩ්‍රොපවර් (පුද්.) සමාගම, අංක 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.	2013 අප්‍රේල්	13.1	යාමනය කරන ලද	2.50	9,491,000.15
4	ලෙනදොර **ජල විදුලි ව්‍යාපෘතිය**	කෙන්ට් හයිඩ්‍රෝ (පුද්.) සමාගම, අංක D/1, ගිල්ඩ්ෆෝඩ් චන්ද්‍රවංකය, කොළඹ 07.	2013 මැයි	13.0	යාමනය කරන ලද	1.40	4,495,034.70
5	පලාපත්වල **ජල විදුලි ව්‍යාපෘතිය**	එනර්ජී ජෙනරේටර්ස් (පුද්.) සමාගම, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01.	2013 මැයි	6.0	යාමනය කරන ලද	6.00	33,565,437.71
6	මාදුරුඔය වම් ඉවුර 24+140 km බැසුම් වියුහය **ජල විදුලි ව්‍යාපෘතිය** (මාදුරුඔය II)	ඊගල් පවර් (පුද්.) සමාගම, අංක 09, මෝදර විල කර්මාන්ත කලාපය, පානදුර.	2013 නොවැම්බර්	27.0	යාමනය කරන ලද	2.00	15,351,782.72
7	පහළ කොත්මලේ **ජල විදුලි ව්‍යාපෘතිය**	ලෝවර් කොත්මලේ ඔය හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම, අංක 9/1-5, රාජකීය මාවත, කොළඹ 07	2014 ජූනි	6.0	යාමනය නොකර න ලද	4.80	-

8	රොස් එස්ටේට් **ජල විදුලි ව්‍යාපෘතිය**	රොස් හයිඩ්‍රෝ පවර් (පුද්.) සමාගම, අංක 11, ජෝෂප් වීදිය, කොළඹ 04.	2014 සැප්තැම්බර්	10.0	යාමනය කරන ලද	3.80	30,877,015.74
9	ඕවල **ජල විදුලි ව්‍යාපෘතිය**	එස්කාස් (ඕවල) පවර් (පුද්.) සමාගම, අංක 276, මාබිම, හෙයියන්තුඩුව	2015 අප්‍රේල්	10.0	යාමනය කරන ලද	2.80	20,407,526.63
10	මාදුරුඔය වම් ඉවුර 28+450 km බැසුම් ව්‍යුහය **ජල විදුලි ව්‍යාපෘතිය** (මාදුරුඔය III)	ඊගල් පවර් (පුද්.) සමාගම, අංක 09, මෝදර විල කර්මාන්ත කලාපය, පානදුර.	2015 අගෝස්තු	3.4	යාමනය කරන ලද	0.60	1,507,424.72
11	දඹුළුඔය **ජල විදුලි ව්‍යාපෘතිය**	එච්.පී.ඩී. පවර් (පුද්.) සමාගම, අංක 334, ටී.බී. ජයා මාවත, කොළඹ 10.	2016 අගෝස්තු	10.0	යාමනය කරන ලද	3.25	23,092,084.80
12	අන්කන්ද **ජල විදුලි ව්‍යාපෘතිය**	එස්කාස් (අන්කන්ද) පවර් (පුද්.) සමාගම, අංක 276, මාබිම, හෙයියන්තුඩුව	2018 සැප්තැම්බර්	10.0	යාමනය කරන ලද	6.50	53,562,382.84
එකතුව						**39.85**	**271,810,951.59**

සටහන – 1. පහල කොත්මලේ ව්‍යාපෘතිය අදාල බිල පිටපත් ලබානොදීම හේතුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත අය විය යුතු මුදල කවරේද යන්න සොයා ගත නොහැකි වී ඇත. එහෙයින් මෙකී ආයතනයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග සඳහා නීති අංශය වෙත යොමු කර ඇත.

2. ජනාධිපති කාර්යාලයේ උපදෙස් පරිදි 2021 නොවැම්බර් මස සිට 2022 මැයි මස දක්වා මුදල් අයකිරීම අත්හිටුවා තිබූ අතර 2022 ජූනි මස සිට නැවත අයකිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. එසේ උවද 2022 වර්ශය සඳහා කිසිදු මුදලක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවා නොමැත.

1. වැඩකටයුතු සිදුකරමින් පවතින (දැනට ක්‍රියාත්මක තත්වයේ නොමැති) කුඩා පරිමාණ ජල විදුලි බල ව්‍යාපෘති:

අනු අංකය	ව්‍යාපෘතිය	ආයෝජකයා	ධාරිතාවය / (මෙ.වො.)	යාමනය කරන / නොකරන ලද	ප්‍රගතිය
1	උකුවෙල-කුරිවෙල	ඔනික්ස් හයිඩ්‍රෝ පවර් කම්පැණි (පුද්.) සමාගම	2.2	යාමනය කරන ලද	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට (Power Purchasing Agreement) එළඹීම හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමග බදු ගිවිසුමකට (Lease Agreement) එළඹීම සිදු කිරීමට ඇත.
2	දිග්ගල	එස්කාස් දිග්ගල පවර් (පුද්.) සමාගම	4.4	යාමනය කරන ලද	සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් කටයුතු බොහෝ දුරට නිමකර ඇත. ජනන යන්ත්‍ර සවි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
3	කිවුල	එස්කාස් කිවුල පවර් (පුද්.) සමාගම	2.8	යාමනය කරන ලද	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම (SPPA) අත්සන් කිරීමට කටයුතු යොදා ඇත.
4	නායක්කුඹුර	රැලික් හයිඩ්‍රෝ පවර් ජෙනරේෂන් (පුද්.) සමාගම	0.5	යාමනය කරන ලද	පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව (EIA) සම්පූර්ණ කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුවේ තීරණය අනුව තාවකාලික අනුමැතිය (Provisional Approval) ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ඉල්ලුම් කර ඇත.
5	චන්ද්‍රිකා වැව	මහවැලි උපදේශන කාර්යාංශය (පුද්.) සමාගම	0.63	යාමනය කරන ලද	පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සම්පූර්ණ කර ඇත. නිල්වලා ව්‍යාපෘතියේ අවසාන වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකළ හැක.
6	කුඹල්ඔළුව I	නෝවුඩ් හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම	2.4	යාමනය නොකරන ලද	ආයෝජකයින් දෙදෙනා අතර පවතින ගැටුම නිරාකරණය කර ගැනීම සඳහා බිම් මැනුමක් සිදු කිරීමට සැලසුම් කර ඇත.
7	කුඹල්ඔළුව II	කුඹල් ඔළුව හයිඩ්‍රෝපවර් (පුද්.) සමාගම	1	යාමනය නොකරන ලද	
8	මාදුරුඔය LBL3	නිපොන් නිටි (පුද්.) සමාගම	0.15	යාමනය කරන ලද	මූලික පාරිසරික විමර්ශනය (IEE) අවසන් කොට ඇත.

9	මොරගොල්ල කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘතිය	සීජියැන් යන්ග් එනර්ජි කම්පැනි (පුද්.) සමාගම	2.1	යාමනය කරන ලද	පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය (EIA) සිදු කරමින් පවතී.
10	ගැටඹේ	ඒෂියන් හයිඩ්‍රොපවර් ජෙනරේෂන් (පුද්.) සමාගම	10	යාමනය නොකරන ලද	තාවකාලිකව නතර කර ඇත.
එකතුව			**26.18**		

2. ක්‍රියාත්මකව පවතින සූර්ය විදුලි බල ව්‍යාපෘති:

අනු අංකය	ආයෝජකයා	ස්ථානය	ධාරිතාවය / (මෙ.වො.)	භූමි ප්‍රමාණය / (හෙක්ටයාර)	වාර්ෂික බදු මුදල / (රු.)
1	සාගා සෝලාර් පවර්	වලව / මයුරපුර කොට්ඨාසය	10.0	18.21	3,456,000.00
2	අයිරිස් ඉකෝ පවර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.0	18.50	3,888,000.00
3	ඇනාර්වි ලංකා සෝලාර් (පුද්.) සමාගම	වලව / මයුරපුර කොට්ඨාසය	10.0	18.50	3,888,000.00
4	ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය	වලව / මයුරපුර කොට්ඨාසය	1.237	18.60	-
5	සෝලාර් වන් සිලෝන් (පුද්.) සමාගම	"බී" කලාපය/ සේනපුර කොට්ඨාසය	10.0	19.50	297,600.00
6	බින්තැන්න සෝලා (පුද්.) සමාගම	"සී" කලාපය/ ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාසය	1.0	2.63	120,000.00
7	ඌව සෝලා (පුද්.) සමාගම	"සී" කලාපය/ ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාසය	1.0	2.63	128,000.00
8	මාපාකඩ සෝලා (පුද්.) සමාගම	"සී" කලාපය/ ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාසය	1.0	2.83	148,000.00
එකතුව			44.25	101.4	11,925,600.00

3. 2022 වර්ශය අවසානවනවිට ක්‍රියාකාරී මට්ටමේ පැවති නව ව්‍යාපෘති**:**

අනු අංකය	ආයෝජකයාගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / (රු.)	**2022.12.31** දින වන විට තත්වය
<u>වලව මහවැලි විශේෂ බල ප්‍රදේශය</u>						
1	සෝල් නැවිටාස් (පුද්.) සමාගම.	මයුරපුර කොට්ඨාසය	18.21	10.0	4,320,000.00	වාර්ෂික බදු පදනම මත නිදහස් කර ඇත. ව්‍යාපෘතිය ආරම්භ කර නැත.
2	ඉලෙක්සිස් පවර් (පුද්) සමාගම.	මයුරපුර කොට්ඨාසය	17.20	10.0	4,648,800.00	වාර්ෂික බදු පදනම මත නිදහස් කර ඇත. ව්‍යාපෘතිය ආරම්භ කර නැත.
3	සිජියැංග් යං (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	20.23	10.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත. මැණීම් කටයුතු අවසන් කර ඇත.
4	ඒෂියන් සන් එඩිෂන්(පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	8.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත. මැණීම් කටයුතු අවසන් කර ඇත.
5	ඒෂියන් සන් පවර් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	8.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත. මැණීම් කටයුතු අවසන් කර ඇත.
6	ඒෂියන් ඇක්ටිව් සෝලාර් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	8.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත. මැණීම් කටයුතු අවසන් කර ඇත.
7	ඒෂියන් සෝලාර් කන්සෙප්ට් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	8.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත. මැණීම් කටයුතු අවසන් කර ඇත.
8	ඩුඩු ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	12.15	10.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
9	ඔරියන් සෝලාර් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	12.15	10.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
10	ටැනිෂ් ඉන්ටර්නැෂනල්	මයුරපුර කොට්ඨාසය	12.15	10.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.

අනු අංකය	ආයෝජකයාගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / (රු.)	**2022.12.31** දින වන විට තත්වය
	(පුද්.) සමාගම					
11	ටනූ ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	12.15	10.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
12	නිධන්‍යයා ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	12.15	10.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
13	ඉලෙක්ට්‍රෝලයිට් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
14	එලිෆන්ට් පවර් ඉන්ටනැෂනල් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
15	ජෙනකෝ (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
16	ලෙෂර් ක්‍රියේෂන්ස් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
17	පෝටෝන් වැලි (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
18	පොටෝවොට් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
19	සෝලාජෙන් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
20	ස්ටාලියන් එනර්ජි (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.

අනුක්‍රමය	ආයෝජකයාගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / (රු.)	**2022.12.31** දින වන විට තත්වය
21	ටල්නා හෝල්ඩින්ස් (පුද්.) සමාගම	මයුරපුර කොට්ඨාසය	10.0	10.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
<u>"බී" කලාපය</u>						
22	පොලොන්නරුව සෝලාර් (පුද්.) සමාගම	අසේලපුර කොට්ඨාසය	12.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
23	කාසල් ඒ සෝලාර් (පුද්.) සමාගම	අසේලපුර කොට්ඨාසය	12.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
24	ඉකෝ සෝලාර් වන් (පුද්.) සමාගම	පුනානි බටහිර/කෝරළෙයි පත්තුව - දකුණ/ මඩකළපුව	10.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
25	ඉකෝ සෝලාර් ටූ (පුද්.) සමාගම	පුනානි බටහිර/කෝරළෙයි පත්තුව - දකුණ/ මඩකළපුව	10.0	5.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
26	ඉකෝ සෝලාර් සොලුෂන් (පුද්.) සමාගම	පුනානි බටහිර/කෝරළෙයි පත්තුව - දකුණ/ මඩකළපුව	4.0	2.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.
27	සීක් එනර්ජි (පුද්.) සමාගම	පුනානි බටහිර/කෝරළෙයි පත්තුව - දකුණ/ මඩකළපුව	148.0	100.0	-	සුණිත්‍ය බලශක්ති අධිකාරියේ තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත.
28	සෝලා ෆෝජ් (පුද්.) සමාගම	පුනානි බටහිර/කෝර	190.0	100.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත.

අනු අංකය	ආයෝජකයාගේ නම	ස්ථානය	භූමි ප්‍රමාණය / හෙක්ටයාර	ධාරිතාවය / මෙ.වො.	වාර්ෂික බදු මුදල / (රු.)	**2022.12.31** දින වන විට තත්වය
		ළෙයි පත්තුව - දකුණු/ මඩකළපුව				
"හුරුළුවැව" කලාපය						
29	සයිශා සෝලා (පුද්.) සමාගම	හබරන	6.02	2.0	-	බලශක්ති බලපත්‍රය ලබාගෙන ඇත. මැණිම් කටයුතු අවසන් කර ඇත.
එකතුව			630.41	414.0	8,968,600.00	

2.4 ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත, 1979 අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතට අනුව එවකට මහවැලි සංවර්ධන මණ්ඩලය නමින් තිබූ ආයතනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නමින් විශේෂ බලතල පැවරුණු අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙසට පරිවර්තනය කරන ලදී.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය හා කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදිකරනු ලැබූ ප්‍රධාන ජලාශ, වේලි හා අමුණු වැඩිදියුණු කිරීම, ක්‍රියාකරවීම් හා නඩත්තු කිරීම් උදෙසා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුල 1985 දී පිහිටුවා ස්ථාපිත කරන ලද අංශය මූලික වැඩ පාලන ක්‍රියාකරවුම්, මෙහෙයුම් හා නඩත්තු අංශය නමින් හැඳින්විය. මහජනතාවගේ හඳුනා ගැනීමේ පහසුව සඳහා 2019 වර්ෂයේ සිට මෙම අංශය **"ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය"** නමින් හඳුන්වා දී ඇත.

මේ දක්වා ඉදිකර ඇති ප්‍රධාන වේලි හා ජලාශ පද්ධතිය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වත්කමක් ලෙස රජය වෙනුවෙන් භාරකාරිත්වය පැවරී ඇති අතර එම වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පාලනය කරනු ලැබේ. මෙම ප්‍රධාන වේලි හා ජලාශ පද්ධතියේ ඉදිකිරීම් වියදමෙහි සමස්ථ වත්මන් වටිනාකම රුපියල් බිලියන 420ක් පමණ වේ.

මෙම අංශය මඟින්මහජනතාවගේ ආරක්ෂාව තහවුරු වන අන්දමින් ප්‍රධාන ජලාශ වල මෙහෙයුම් කටයුතු සියල්ල ඉටුකරනු ලැබේ. මේ සඳහා අන්තර්ජාතික ජලාශ හා වේලි මෙහෙයුම් පිළිබඳ නූතන තාක්ෂණ ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් ජලය භාවිතා කරන්නන්ට උපරිම ජල අවශ්‍යතාව සැපයේ. ඊට අමතරව පහළ නිම්න වල ගංවතුර හානි අවම කරලීමට අවශ්‍ය ගංවතුර පාලනය කිරීම සඳහා ජලාශ පාලන ගේට්ටු ක්‍රියාකිරීම සිදු කෙරේ.

තවද, ජලාශ හා අන්තර් නිම්න ඇල මට්ටමේ ජල කළමණාකරණ මෙහෙයුම් කටයුතු, ජලාශ හා ඊට අනුබද්ධ නිර්මිත නඩත්තු කිරීම කරන අතර, ජලාශ වල දීර්ඝ කාලීන පැවැත්ම උදෙසා වූ වැඩිදියුණු කිරීම් සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම් හා ජලාශ පද්ධති වලට අදාල පුනුරුත්තාපන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද කරනු ලබයි.

<u>මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන්</u>

පරිපාලනය- වේලි හා ජලාශ වල ජලදේහය, ස්වාරක්ෂක කලාපය(100m Buffer zone) හා ඊට අයත් රක්ෂිත ආරක්ෂා කර ගැනීම උදෙසා වූ රෙගුලාසි ක්‍රියාත්මක කරමින් ජලාශ හා රක්ෂිත වලට අයත් බල ප්‍රදේශ පරිපාලන කටයුතු කිරීම.

ක්‍රියාකරවීම - ජල කළමණාකරණ ලේකම් කාර්යාලයෙන් නිතිපතා ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ජලාශ හා අන්තර් නිම්න ඇල මට්ටමේ සොරොව් ගේට්ටු ක්‍රියාත්මක කිරීම හා ජලාශවල ඉහල සහ පහල නිම්නවල ගංවතුර අවමකරලීම පිණිස ගංවතුර පාලනය සඳහා ගේට්ටු ක්‍රියාකරවීම.

නඩත්තුව- ජලාශ හා එම ජලාශ වලට අනුබද්ධිත වේලි,ගේට්ටු, ජලාශ පර්යන්ත ප්‍රදේශ හා ජලාශයට අනුබද්ධිත සියලු නිර්මිතයන් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව (ICOLD) නඩත්තු කිරීම මෙන්ම වැඩිදියුණු කිරීම.

2022 වර්ෂය තුළ සිදුකළ ජලාශ ආශ්‍රිත පරිසර සංරක්ෂණ කටයුතු

අනු අංකය	විස්තරය	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන
01	ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහන් දිගන, නිලගම සහ කාර්යාල පරිශ්‍රය	90	0.270
02	වික්ටෝරියා සහ පොල්ගොල්ල ජලාශ රක්ෂිතයේ ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත්කිරීමේ ශ්‍රමදාන වැඩසටහන්	85	0.000
03	ජලාශ රක්ෂිත වල ඇති ආක්‍රමණික ශාක, ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත් කිරීමේ මාසික වැඩසටහන්	80	0.306
04	ජලාශ රක්ෂිතයේ උණ/ වනවගා පැල සිටුවීම	90	0.131
05	කාර්යාල පරිශ්‍රවල ගෙවතු වගා කිරීම	08	0.100
06	කර්මාන්ත හා පරිසර දූෂණ ආයතන සහ ස්ථාන සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවන්	60	0.000
07	ඩෙංගු කමිටු, පරිසර කමිටු සහ සම්බන්ධීකරණ කමිටු සඳහා සක්‍රීය දායකත්වය සැපයූ වැඩසටහන්	90	0.285
08	අපජල විශ්ලේෂණ වාර්තා සහ පරිසර බලපත්‍ර ගාස්තු	100	0.050
එකතුව			1.142

2022 වර්ෂය තුල ජල විදුලි බලාගාර වලට ජලය සැපයීම සහ ඒ තුලින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

අනු අංකය	ජලාශය/ විදුලිබලාගාර	විදුලිබල නිශ්පාදනය සඳහා ජලය සැපයීම (MCM)	ජනනය කල විදුලි ප්‍රමාණය (kWh)	ජාතික* ආදායම (රු.මිලියන)
01	වික්ටෝරියා	2,256.500	909.301X 10^6	16,176.465
02	රන්දෙනිගල	2,211.810	421.331X 10^6	7495.478
03	රන්ටැඹේ	2,578.240	199.219X 10^6	3,544.106
04	කොත්මලේ	988.375	532.166X 10^6	9,467.233
05	බෝවතැන්න	465.498	59.595X 110^6	1,060.195
06	මාදුරුඔය	562.17	18.9557 X 10^6	223.093
07	පොල්ගොල්ල	976.968	170.502X 10^6	3,033.231
08	මොරගහකන්ද	1,045.380	77.007X 10^6	1,369.951
09	උඩවලව	1002.508	16.388 X 10^6	291.543
එකතුව		**12,087.449**	**2,404.465 X 10^6**	**44,077.242**

2022 වර්ෂය තුලකෘෂිකර්මික කටයුතු සඳහා ජලය නිකුත් කිරීම

අනු අංකය	ජලාශය		සපයන ලද ජල ධාරිතාවය ඝණ මීටර් මිලියන (MCM)
01	පොල්ගොල්ල හැරවුම (බෝවතැන්න ජලාශයට)		977
02	මිණිපේ ඇල	වම් ඉවුර	315
		දකුණු ඉවුර	1326
03	මොරගහකන්ද ජලාශය		1046
04	උඩවලව	වම් ඉවුර	502
		දකුණු ඉවුර	475
		එකතුව	**4641**

ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයෙන් පාලනය වන ජලාශ.


ජලාශ	නඩත්තු කරනු ලබන අංගයන්
කොත්මලේ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
පොල්ගොල්ල හැරවුම	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ උමං මාර්ග
බෝවතැන්න	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
දඹුලු ඔය	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
කණ්ඩලම	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
කලාවැව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
වික්ටෝරියා	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
රන්දෙනිගල	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
රන්ටැඹේ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මිණිපේ අමුණ	සොරොව් ගේට්ටු, වාන්දොරටු, අන්තර් නිම්න ඇල, බදුලු ඔය ජල පාලම, උමං මඟ සහ ජල පැන්නුම් වල නිර්මිත
ලොග්ගල්ඔය, හෑපොල ඔය හා දිහබාන ඔය මට්ටම් පැන්නුම්	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
උල්හිටිය-රත්කිඳ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මාඳුරුඔය	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
උඩවලව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
චන්ද්‍රිකාවැව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මොරගහකන්ද	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
පුහුල්පොල	ව්‍යාපෘතියේ වැඩ නිමකර නොමැති අතර නඩත්තු කාර්යන් භාරගෙන නොමැත. අප අංශයේ කාර්ය මණ්ඩලයේ කීපදෙනෙකු ස්ථාපිත කර ඇත.
ඩයරබා	




කොත්මලේ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 173



පොල්ගොල්ල ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 4.1



වික්ටෝරියා ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන721



රන්දෙනිගල ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 801



රන්ටැඹේ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන1.15



මාදුරුඔය ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන්96



බෝවතැන්න ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන56



දඹුලුඔය ජලාශය
ධාරිතාව :ඝණ මීටර් මිලියන 117



කලා වැව ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 123



උල්හිටිය - රත්කිද ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 145



චන්ද්‍රිකාවැව ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 27.7



මිණිපේ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 0.12



උඩවලව ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 268.65



මොරගහකන්ද ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 558.0



කණ්ඩලම ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 33



පුහුල්පොළ ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 0.634



ඩයබරා ජලාශය
ධාරිතාව :ඝණ මීටර්මිලියන 0.970

2.5 ඉඩම් පරිහරණ සැලසුම් අංශය

හැඳින්වීම

තිරසාර සංවර්ධනය අරමුණු කරගත් ඒකාබද්ධ සැලසුම්කරණය ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ කාර්යභාරයයි. ඒ සඳහා භෞතික, ආර්ථික, සමාජයීය සංවර්ධන හා පරිසර කළමනාකරණ ඉලක්ක ඔස්සේ සැලසුම් සකස් කෙරේ. මහවැලි මහ සැලැස්මට අනුව සංවර්ධන ව්‍යාපෘති හා කාර්යයන් සඳහා ඉඩම් හඳුනා ගැනීම හා සැලසුම් සකස් කිරීම ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ මූලික කාර්යයක් වන අතර එහිදී, වර්තමාන ඉඩම් පරිහරණ රටාව අධ්‍යයනය කරමින් අනාගත සංවර්ධනය සඳහා යෝග්‍ය ඉඩම් හා සංරක්ෂණය කළයුතු ප්‍රදේශ වෙන්කරමින් උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම සිදු කරනු ලබයි.

අංශයේ දැක්ම

"තිරසාර ඉඩම් පරිහරණ රටාවක් තුළින් පරිපූර්ණ ජීවන රටාවක්"

අංශයේ කාර්යභාරයන්





1. සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් හඳුනාගැනීම.
2. ව්‍යාපෘති ප්‍රදේශ වල අදාළ සැලසුම් සැකසීම හා මහවැලි නගර වල යටිතල පහසුකම් ප්‍රවර්ධනය.
3. නව ව්‍යාපෘති ප්‍රදේශ වල නැවත පදිංචි කිරීම සිදුකිරීම.
4. මහවැලි බල ප්‍රදේශ වල සැලසුම් යාවත්කාලින කිරීම.
5. වාර්ෂික වැඩ සැලසුම් හා ඇස්තමේන්තුව සැකසීම.
6. ඉඩම් බැහැර කිරීම සඳහා ඉඩම් පරිහරණ නිර්දේශ ලබාදීම.
7. මහවැලි ප්‍රදේශ සංවර්ධනයට අදාළ තොරතුරු සිතියම්ගත කිරීම.
8. ඛණිජ සම්පත් නිස්සාරණයට අදාළ නිර්දේශ ලබාදීම.
9. මහවැලි ජලාශ රක්ෂිත තුළ පිහිටි පෞද්ගලික ඉඩම් වල සංවර්ධන කටයුතු සඳහා නිර්දේශ ලබා දීම.

<u>ඉඩම් පරිහරණ සැලසුම් අංශය මගින් 2022 වර්ෂය තුල කරනු ලැබූ කාර්යන්හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු</u>

- 2022 වසර සඳහා මහවැලි කලාපයන්හි ආයෝජන ඉඩම් සිතියම් ගත කිරීමේ වැඩ සටහනට අදාළව රු. 60,000 ක පමණ මුදලක් වෙන්කරන ලද අතර එම වැඩසටහන සඳහා රු.54,755ක මුදලක් ඉඩම් පරිහරණ සැලසුම් අංශය මගින් වියදම් කරන ලදී. ඒ අනුව 2022 වර්ෂය තුල ඉඩම් පරිහරණ අංශයේ මූල්‍ය ප්‍රගතිය 91.2% ක් වේ.
- මහවැලි කලාප තුල ප්‍රශස්ත ඉඩම් භාවිතයක් සඳහා මග පෙන්වීම හා අවිධිමත් ඉඩම් භාවිතය නියාමනය කිරීමේ අරමුණින් මහවැලි කලාප තුල පදිංචි ජනපදිකයන්ගේ ඉල්ලීම් අනුව ගොඩ, වාරි, පදිංචිය හා අනෙකුත් පොදු අවශ්‍යතා සඳහා සැලසුම් අනුව විධිමත්ව අනුබෙදුම් සකසා නිත්‍යානුකූල කිරීම සඳහා 2022 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් 30 දක්වා යොමුකරන ලද ස්ථාන 356 ක් සඳහා භෞතික සැලසුම් නිර්දේශ ලබා දී ඇත.
- මහවැලි බල ප්‍රදේශය තුල පිහිටි ඛණිජ සම්පත් තිරසාර ලෙස නිස්සාරණය සඳහා ඉඩම් භාවිතය විධිමත් කිරීම තුලින් ජනපදිකයින්ගේ ආර්ථික හා සමාජීය මට්ටම් ඉහළ දැමීමේ අරමුණින් ඛනිජ නිස්සාරණ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම 2022 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා ඉඩම් පරිහරණ අංශය මගින් සිදු කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා ස්ථාන 305 ක් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර 2022 වර්ෂයේ සැප්තැම්බර් 30 දක්වා රුපියල් මිලියන **122.15** ක් පමණ ඉඩම් පරිහරණ ගාස්තු අයකරගෙන ඇත.

<u>ඉඩම් පරිහරණ සැලසුම් අංශය මගින් 2022 වර්ෂය තුල කරනු ලැබූ කාර්යන් පිළිබඳ තොරතුරු සාරාංශය</u>

01. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුවේ යාවත්කාලින කරන ලද දත්ත ඇසුරින් දැනට සංවර්ධන කටයුතු සිදුකරනු ලබන සියළු මහවැලි කලාපයන්හි ඉඩම් පරිහරණ සිතියම් නැවත සකස් කිරීම.

02.මහවැලි ඩි කලාපයේ ගෙවතු ඉඩම් සඳහා ජනපදිකයින් විසින් නිරන්තරයෙන් කරනු ලබන ඉල්ලීම් සැලකිල්ලට ගෙන මැදිරිගිරිය කොට්ඨාසයේ නබඩ වැව, බිසෝපුර, දහම් වැව යන ඒකකයන්හි පර්.20 බැගින් ගෙවතු ඉඩම් වන ලෙස කට්ටි සැලසුම් සකස් කර ඩි කලාපය






වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කිරීම.

03.මොරගහකන්ද කලාපයේ අත්තනකඩවල හා බකමූණ යන කොට්ඨාශ වල ජනාවාස වල මූලික සැළසුම් හි ළඳු කැලය හා කැලය වශයෙන් වෙන්කර ඇති ප්‍රදේශ තුලින් හඳුනාගත් ඉඩම් කට්ටි 06 ක් ආශ්‍රිතව වන අලි ඒකරාශී වීම හා දහවල් කාලයට එම ප්‍රදේශ තුල ලැගුම් ගන්නා අලි රාත්‍රී කාලයේදී ගම් වැදීම හේතුවෙන් ගම්මාන වල ජානපදිකයින්ගේ ජනජීවිතයට වන තර්ජනය සැළකිල්ලට

ලබාදිය යුතු ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර්)	විශේෂ නිරීක්ෂණ
23.6771	මට. 20 බැගින් නිවාසවලින් යුත් කට්ටි ප්‍රමාණය 300.
36.4730	මට. 20 බැගින් නිවාසවලින් යුත් කට්ටි ප්‍රමාණය 45.
4.9168	මට. 20 බැගින් නිවාසවලින් යුත් කට්ටි ප්‍රමාණය 53.
5.3675	ජර්ව වන වැටෙක් දැලක වෙන්වා ගෙන යයි.
19.2624	යෝජිත ඉඩම යුතු පවරාගත් කැලය වෙනින් බැහින් හඳිනය ගංගෙවලය නිවාසවල ගෙගෙවන අතර වර්තර කඳුගොනුවේය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයක් දැලක වෙන්වා ගෙන යයි හා මට. 20 බැගින් නිවාසවලින් යුත් කට්ටි ප්‍රමාණය 110.
5.0261	යෝජිත ඉඩම යුතු පවරාගත් කැලය වෙනින් බැහින් හඳිනය ගංගෙවලය නිවාසවල ගෙගෙවන අතර වර්තර කඳුගොනුවේය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයක් දැලක වෙන්වා ගෙන යයි.
94.7229	

ගෙන එම බිම් කොටස් ජනාවාස සඳහා කට්ටි කිරීම සඳහා නිර්දේශ ලබා දීමට අදාළව කේෂත්‍රය පරික්ෂා කිරීම සහ සැලසුම් සකස් කිරීම.

04. මහවැලි බී කලාපයේ දකුණු ඉවුර සංවර්ධන ප්‍රදේශයේ බඩ ඉරිහු වගාව සඳහා විභවතාවයක් පවතින ස්ථාන

හඳුනා ගැනීම සඳහා කේෂත්‍ර සකස් කිරීම සහ අවශ්‍ය කටයුතු කිරීම.


පරීක්ෂණයක් සිදු කිරීම, සිතියම්

05.පොල්ගොල්ල සිට නාවලපිටිය දක්වා මහවැලි ගඟේ ඉවුර ඇඳීම සහ ගඟ ඉවුර ආසන්නයේ වැලි තැන්පත් වී ඇති ස්ථාන හඳුනා ගැනීම.

06.බිසෝපුර නගරයේ වාණිජ ඉඩම් කට්ටි සැලසුම් සකස් කිරීම.

07. උතුරු පළාත් විශේෂ ගැටළු විසඳීමේ ඒකකයට අදාලව කෝකිලායි ප්‍රදේශයේ ජනතාවගේ ඉඩම් හා ධීවර ගැටළු නිරාකරණය පිළිබඳ ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී ගනුලැබූ තීරණ ප්‍රකාරව එල් කලාපයේ භෞතික සැලසුම්කරු සමඟ සම්බන්ධීකරණය වෙමින් කෝකිලායි ප්‍රදේශයේ ජනතාව විසින් ජනකපුර ඒකකයේ වගා කටයුතු සිදු කරන ලබන කෘෂිකාර්මික ඉඩම් ගැටළුව ස
හ ධීවර ගැටළු නිරාකරණය කිරීම පිළිබඳ දත්ත රැස්කිරීම හා අවසන් වාර්තාව සකස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.


08 .මහවැලි ඩි කලාපයේ බිසෝපුර කොට්ඨාසයේ බිසෝපුර ඒකකයේ පශු සම්පත් හා සත්ව පාලන සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති භූමිය සඳහා කට්ටි සැලසුම් සකස් කර අවශ්‍ය කටයුතු සඳහා ඩි කලාපය වෙත යොමු කිරීම.




09.මහවැලි එල් කලාපයේ වෙහෙරතැන්න කොට්ඨාසයේ, පශු සම්පත් හා සත්ව පාලන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජිත භූමියේ මූලික කට්ටි සැලසුම සකස් කර අවශ්‍ය කටයුතු සඳහා එල් කලාපය වෙත යොමු කිරීම.




10.මහවැලි ඩි කලාපයේ සුරියපුර කන්තලේ කොට්ඨාසයේ ජනපදිකයින් විසින් කරනු ලබන නිරන්තර ඉල්ලීම් සැලකිල්ලට ගෙන ගෙවතු හා කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු බවට හඳුනා ගත් ඉඩම් සඳහා මූලික කට්ටි සැලසුමක් සකස් කර අවශ්‍ය කටයුතු සඳහා ඩි කලාපය වෙත යොමු කිරීම.






11.පාවෙන සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘති සඳහා යෝජිත ස්ථාන දැක්වෙන සිතියම සකස් කිරීම සහ සූර්ය බල ශක්ති උත්පාදන ව්‍යාපෘති සඳහා යෝජිත ස්ථානයන්හි පිහිටීම සිතියම් මගින් පරීක්ෂා කර මහවැලි බල ප්‍රදේශහි පිහිටා ඇති ද යන්න වග නිශ්චිතව තහවුරු කිරීම.




12.මහවැලි කලාප තුළ සහ ආශ්‍රිතව පිහිටා ඇති ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ ප්‍රදේශ සහ වන සංරක්ෂණ ප්‍රදේශ ඇතුළත් සිතියම සකස් කිරීම.



13.සී කලාපයේ මහවනාවෙල නගර සැලැස්ම යාවත්කාලීන කර අවශ්‍ය කටයුතු සඳහා කලාපයට යොමු කිරීම.



14. මාදුරු ඔය දකුණු ඉවුර වාකනේරි ප්‍රදේශයන්හි මායිම් සංශෝධනය කිරීම සඳහා අදාළව නැවත ගැසට් කිරීමේ උපලේඛණ හා සිතියම් සකස් කිරීම.



15.මොරගහකන්ද හා කළුගඟ ස්වාරක්ෂක කලාපය වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරීමට අදාළ කටයුතු සඳහා අවසන් උපලේඛණ සැකසීම , වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සම්බන්ධීකරණය කිරීම.








හා




16.මහවැලි අධිකාරියේ නිලධාරීන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිලධාරීන් හා සමග ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයන්ට සහභාගී වෙමින් වල්සපුගල තෘණ භූමි සංවර්ධන ව්‍යාපෘතියට අදාළ දළ සිතියම් සකස් කිරීම හා පරිසර වාර්තා කෙටුම්පත සකස් කිරීම.













17 . හුරුළුවැව විශේෂ කලාපය තුලට ගැසට් කර නොමැති පලුගස්වැව ප්‍රාදේශීය කොට්ඨාසයට අයත් ග්‍රාමසේවා වසම් 05ක් මහවැලි හුරුළුවැව විශේෂ කලාපයට ඇතුලත් කර ගැනීමට අදාළව තොරතුරු රැස් කිරීම ,සිතියම් සකස් කිරීම හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කෙටුම්පත සකස් කිරීම.





18.මහවැලි විශේෂ බල ප්‍රදේශ ලෙස ගැසට් කරන ලද නමුත් මේ වනතෙක් සංවර්ධන කටයුතු සිදු නොකරන ලද A කලාපය, J කලාපය, K කලාපය හා I කලාපය න් හි සංවර්ධන කටයුතු සිදු කිරීමට පවතින විභාවතාවයන් හඳුනා ගැනීම සඳහා පවතින ද්විතික දත්ත (ජාතික භෞතික සැලසුම 2050) අධ්‍යනය කරමින් සංවර්ධන විභවතා හඳුනා ගැනීම සහ උක්ත ප්‍රදේශයන්හි දැනට පවතින පරිපාලන ව්‍යුහය හා පවතින ඉඩම් පරිහරණය පිළිබඳ අධ්‍යනය කිරීම සඳහා මූලික සිතියම් සකස් කිරීම. (ග්‍රාම නිලධාරි වසම් සිතියම, ඉඩම් පරිහරණ සිතියම, සාමොජ්ච රේඛා සිතියම, ජල මාර්ග සිතියම)





2.6 වන හා පරිසර අංශය.

හැදින්වීම:

ශ්‍රී ලංකාවට සමාජ ආර්ථික ප්‍රතිලාභ රැසක් හිමිකර දෙමින් මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක වූ අතර එය කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම සඳහා තිරසාර පරිසර සංරක්ෂණ වැඩපිළිවෙලට අනුගතවන පරිදි ඉදිරියට ගෙන යාමට එහි පාරිසරික සැලසුම්කරුවන් විසින් මූලිකව සැලසුම් කල අතර එමගින් යෝජිත සංවර්ධන ක්‍රියාවලියේ සෑම පියවරකින්ම සිදුවිය හැකි පාරිසරික බලපෑම් හා විපර්යාස අවම මට්ටමකින් පවත්වාගෙන යාම අරමුණ විය.

ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම හා මහවැලි කලාප වල මහවැලි)පහල නිම්න වල(ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම හා ජෛව විවිධත්වය හා වටිනා පරිසර පද්ධතීන් සංරක්ෂණය කිරීම හා අනාගතය වෙනුවෙන් සුදුසු සංරක්ෂණ ක්‍රමෝපායන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම පරිසර හා වන සංරක්ෂණ ක්‍රියාදාමයේ මූලික අරමුණ වේ. මෙහිදී එම ප්‍රදේශවල එනම් ඉහල මහවැලි ජල පෝශක ප්‍රදේශ . තුල හා පහල නිම්නයේ ඇති ගැටළු හා හේතු කාරණා ප්‍රායෝගිකව හඳුනා ගැනීම හා ඒ සඳහා තිරසාර විසඳුම් යෝජනාකර ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

දැක්ම:

තිරසර සංවර්ධනයක් උදෙසා මහවැලි ගංගා ද්‍රෝණිය නිරෝගීව හා සවිමත්ව පවත්වා ගැනීම.
(Healthy Mahaweli River Basin for Sustainable Development)

මෙහෙවර :

- සමස්ථ මහවැලි සංවර්ධන කටයුතු පරිසරය සංරක්ෂණය වන අයුරින් ක්‍රියාත්මක කරවීම සඳහා සංවර්ධන කටයුතු මෙහෙයවීම.

- වසර පුරා අඛණ්ඩ ජලධාරාවක් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව පවත්වාගෙනයාම සඳහා ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම.

- මහවැලි ජලදේහයන් හා පහළ මහවැලි ප්‍රදේශවල ස්වභාවික පරිසර පද්ධතිය ආරක්ෂාකර ගැනීමට කටයුතු කිරීම.

- මහවැලි ප්‍රදේශවල ආවේණික ශාඛ හා සත්ත්ව විශේෂ සහ ජෛව පරිසර පද්ධතිය ආරක්ෂාකර ගැනීම සඳහා වන සම්පත සුරැකීම.

- මහවැලි සංවර්ධන කටයුතු හේතුවෙන් ඉවත්වූ වනවගා ප්‍රදේශ වෙනුවට නව වගාවන් යලි ඇති කිරීම.

ප්‍රධාන ක්‍රියාකරකම්:

1. ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ ක්‍රියාකාරකම්,
2. මහවැලි පහළ නිම්න හා අනෙකුත් මහවැලි කලාපවල සිදුකරන ලද පරිසර සංරක්ෂණය හා කළමනාකරණය ක්‍රියාත්මක වැඩසටහන හා ඒකාබද්ධ ව්‍යාපෘති වල පරිසර සංරක්ෂණය වැඩසටහන් අධීක්ෂණය හා ක්‍රියාත්මක කිරීම,
3. ජාතික පාරිසරික පනත යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයක් ලෙස පාරිසරික බලපෑම් ඇගයීම් කටයුතු පරිපාලනය හා පසුවිපරම් කටයුතු සිදුකිරීම,
4. මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ ව්‍යාපෘතිවල පරිසර සංරක්ෂණ කටයුතුවල පරිසර අනුමැතියේ කොන්දේසි ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු හා පසුවිපරම් කිරීම සහ අමාත්‍යාංශය හා මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරවීමට යෝජිත ව්‍යාපෘති වල තාක්ෂණික කමිටු, මෙහෙයුම් කමිටු හා පසු විපරම් කමිටු නියෝජනය කිරීම.
5. රේඛීය රාජ්‍ය ආයතන වලින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු නියෝජනය, ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරවීමට යෝජිත පරිසර ක්‍රියාකාරකම් සම්බන්ධ රැස්වීම් හා වැඩමුළු සඳහා අධිකාරිය නියෝජනය කිරීම හා අභ්‍යන්තර කමිටු නියෝජනය කිරීම.

ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය සඳහා වූ ක්‍රියාකාරකම් සහ පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාකාරකම්

පරිසර හා වන සංරක්ෂණ අංශය - කොත්මලේ

වර්ග කි. මී. 3118 ක් පමණ වූ ශ්‍රී ලංකාවේ මධ්‍යම තෙත් කලාපයට අයත් ඉහල මහවැලි ජල පෝෂක ප්‍රදේශය මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉටු කෙරෙන වාරිමාර්ග හා ජල විදුලි බල උත්පාදන ව්‍යාපෘතියන්ට ජලය සපයන ප්‍රධානම මාර්ගයයිඑමගින් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ මුලික අරමුණට අමතරව රටෙහි බලශක්ති . අවශ්‍යතාවය සපුරාලීම සඳහා ජල විදුලි නිෂ්පාදනයට ද දායකවේ .මහවැලි ව්‍යාපාරය ආරම්භක අවස්ථාවේදී 50% කට ආසන්නව පැවති මෙම ජල විදුලි නිෂ්පාදන හැකියාව රටෙහි බලශක්ති අවශ්‍යතාවය මත හා දේශගුණික විපර්යාස හා වෙනත් ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් මෙලෙස රැස්කරන ජලය භාවිතා කිරීම හේතුවෙන් ජලවිදුලි නිෂ්පාදනයට දායක වන ප්‍රමාණය අඩු වුවද දැනටද මහවැලි ජලාශ මගින් නිෂ්පාදනය වන ජල විදුලිය ප්‍රමාණය මගින් රටතුල ජාතික බලශක්ති අවශ්‍යතාවය සඳහා විශාල දායකත්වයක් ලබා දීමට

අමතරව පානීය ජල අවශ්‍යතාවය හා කෘෂිකර්මාන්තය සඳහා වූ ජලය අවශ්‍යතාවය සඳහා දායකත්වය අගයක් ගනී. විශේෂයෙන්ම මහවැලි වැඩසටහනේ දිගු කාලීන ප්‍රතිඵල ශ්‍රී ලංකාවට ලබාගත හැකි වනු ඇත.

පහළ නිම්නයේ දැනට පදිංචි පවුල් වල ජීවන තත්වය සංවර්ධනය වීම ඉහළ මහවැලි ප්‍රධාන ජලාශවල ජල සැපයීමේ හැකියාව මත තීරණය වනු ඇත. එබැවින් මහවැලි ගංගාවේ ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශ ඉහළ මහවැලි ජල ධාරිතා කළමනාකරණය තුළින් මෙම හදු බිම වේ. ඉහළ මහවැලි ජල සංරක්ෂණ ක්‍රියාදාම ක්‍රියාවට නංවනු ඇත. පෝෂක ප්‍රදේශ සංරක්ෂණය මෙන්ම මහවැලි කලාපවල පරිසර සංරක්ෂණය වැඩසටහන් මගින් ජෛව විවිධත්වය සුරැකීම හා එහි පරිසර පද්ධති වල සමතුලිතතාවය රැක ගැනීමට දායක වන අතර එම ප්‍රදේශ වල ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා කටයුතු සිදුකෙරේ.

ඉහළ ජලාධාර සංරක්ෂණ ක්‍රියාකාරකම්

- තිරසාර පාරිසරික ක්‍රමවේදයන් හරහා ඉහළ ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය හා පාංශු බාදනය අවම කිරීම තුලින් වාරි හා ජල විදුලිය නිෂ්පාදනයේ තිරසාරත්වය තහවුරු කිරීම. විශේෂයෙන් කෘෂිකාර්මික ඉඩම්වල ජෛව හා යාන්ත්‍රික පාංශු සංරක්ෂණය හා ජල කඳුරු සංරක්ෂණය.
- විවිධ වන වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගොවි පුහුණු වැඩසටහන්.
- ජෛවවිවිධත්ව සංරක්ෂණ වැඩසටහන්.
- පැල තවාන් මගින් පැල නිෂ්පාදනය කිරීම හා දේශීය පැල අවශ්‍යතාවය සඳහා ලබාදීම.
- පැළ නිෂ්පාදනය සඳහා පාසැල් ලමුන් සම්බන්ද කර ගැනීම සඳහා මහවැලි තුරු ඉතුරුම්වැඩ සටහන් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ගොවීන් සම්බන්ධකර ගනිමින් පැල නිෂ්පාදනය කිරීම හරිත (රැකියා උත්පාදනය)
- පටක රෝපණ තාක්ෂණය මගින් ජලාශ රක්ෂිත සංරක්ෂණය සඳහා උණ ශාක නිෂ්පාදනය හා රෝපනය සඳහා ලබාදීම.
- පාරිසරික සංරක්ෂණ කාර්යයන් පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීම සඳහා පාරිසරික ප්‍රචර්ධන වැඩසටහන් පවත්වා ගෙන යාම.
- මහවැලි පවිත්‍ර ගංගා වැඩසටහන යටතේ,
- ජල විද්‍යාත්මක දත්ත ලබාගැනීම එකී දත්තයන් සංවර්ධන කාර්යයන් සඳහා උචිත ලෙස යොදා ගැනීම.
- ජලපෝෂක ප්‍රදේශයේ ජලතත්ව අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ඉහල මහවැලි ජල පෝෂකය තුල හා මහවැලි කලාපවල ඇති රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධීකරණය හා එකී ආයතන ජල පෝෂක සංරක්ෂණ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම හා ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ගංගා ඉවුරු සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ජලාශ හා ජල පෝෂක ප්‍රදේශවල පැතිර ඇති ආක්‍රමණ ශීලී සත්ව හා ශාක විශේෂ මර්ධනය කිරීමට කටයුතු කිරීම.
    a) ඝන අප ද්‍රව්‍ය හා අප ජලය මහවැලි ගඟට එක් කිරීම අවම කිරීමේ කාර්යයන් සිදු කරනු ලබයි.

ප්‍රධාන කාර්යාලය

මහවැලි පරිපාලන කලාපවල ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර අනුමැතිය ලබා ගැනීමට අදාල කටයුතු සම්පාදනය හා පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියේ පරිපාලන කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

මහවැලි කලාප තුල ක්‍රියාත්මක පරිසර සංරක්ෂණ වැඩසටහන

මහවැලි කඩිනම් සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් බලපෑමට ලක්වූ ස්වභාවික පරිසර පද්ධති සංරක්ෂණය කිරීම ,එම කලාපවල වැඩිවන ජනගහනය හේතුවෙන් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු නිසා පාරිසරික හා සාමාජීය වශයෙන් ඇතිවන බලපෑම අවම කිරීම සදහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පරිසර අංශයේ මග පෙන්වීම යටතේ සිදුවේ .

ඒ යටතේ මූලිකවම පහත පරිසර ක්‍රියාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

I. වන ගහනය වැඩිකිරීම සදහා වූ අවශ්‍ය පැල තවාන් ආරම්භ කිරීම හා නඩත්තු කිරීම.

II. ක්ෂද්‍ර ජල පෝෂක ප්‍රදේශජලාශ රක්ෂිත ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම හා වනගහනය , වැඩිකිරීම සදහාවූ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

III. මහවැලි ජානපදිකයින් හා පාසැල් ළමුන් සදහා පරිසර අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. ජලයේ ගුණාත්මක භාවය සුරැකීම සදහා ජල තත්ව පරීක්ෂාව හා මූලික දත්ත පද්ධතියක් පවත්වා ගැනීම හා ජනතාව දැනුවත් කිරීම.

V. පහල නිම්න බල ප්‍රදේශ තුල ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා තිරසාර සංවර්ධනය තහවුරු කිරීම සදහා ක්ෂෙත්‍ර පරීක්ෂණ හා හා නිර්දේශ ලබාදීම.

VI. වන පැල , පළතුරු පැල ඖෂධ පැල නිෂ්පාදනය හා එතුලින් රටතුල වන ආවරණය ඉහළ දැමීමට කටයුතු කිරීම.

VII. මහවැලි බල ප්‍රදේශ තුල ජෛව විවිධත්ව සංරක්ෂණය හා ජෛව නිෂ්පාදන අඩපන කරන ආක්‍රමණශීලී ජීවී විශේෂ ව්‍යාප්තිය පාලනය

VIII. මහවැලි ගංහා හා අනෙකුත් ගං ඉවුරු ආශ්‍රිත සංරක්ෂණ ක්‍රියාවලිය

IX. මිනිසුන් සහ වන ජීවීන් අතර ගැටුම් කළමනාකරණය තුලින් වන ජීවීන් හා සහජීවන පැවැත්මක් තහවුරු කිරීමජීව වැට ඉදිකිරීම හා ,අලිමිනිස් ගැටුම අවම කිරීම සදහා විදුලි වැට ඉදිකිරීම . නඩත්තු කිරීම.

X. පරිසර හිතකාමී ප්‍රවර්ධනය හා හරිත රැකියා ප්‍රවර්ධනය

XI. පරිසර හිතකාමී ජීවන රටාවකට ජනතාව හුරු කරවීම හා හරිත නගර හා හරිත ගම්මාණ මහවැලි ගම්මාණ තුල ප්‍රවර්ධනය කිරීම.

තුන්වැනි පරිච්ඡේදය

3.0 සංවර්ධන අංශය

3.1 ඉඩම් අංශය

හැඳින්වීම

සීමිත සම්පතක් වන ඉඩම් යහපත් කළමනාකාරණ විධි මඟින් මහවැලි බලප්‍රදේශ තුළ පදිංචි ප්‍රතිලාභී ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය වැඩි දියුණු කිරීමට දායකවීම.


ඉඩම් අංශයේ කාර්යභාරය :-

01.) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පුද්ගලයින් වෙත ඉඩම් ලබාදීම හා පසු කටයුතු. මහවැලි විශේෂ බලප්‍රදේශයන්හී පිහිටි රජයේ ඉඩම් පරිපාලනය හා කළමනාකරණය කිරීම ඉඩම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඉඩම් නොමැති පුද්ගලයින් වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පදිංචියට මෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහාද ඉඩම් බෙදාදීමත්, ඊට අදාල වන පසු කටයුතු සිදු කරනු ලබයි.

02.) රජයේ ඉඩම් ආඥා පනත යටතේ පුද්ගලයින් වෙත ඉඩම් ලබාදීම හා පසු කටයුතු. වාණිජ ආයෝජන ව්‍යාපෘති, නිවාස, රජයේ ආයතන හා ආගමික ස්ථාන ආදිය වෙනුවෙන් දීර්ඝ කාලීන බදු පදනම්න් ඉඩම් බැහැර කිරීම මෙන්ම බදු ආදායම් රැස් කිරීම සහ ඒ හා සම්බන්ධ පසු කටයුතු රජයේ ඉඩම් ආඥා පනතේ ඇති ප්‍රතිපාදන මත සිදු කිරීමත් මෙම ඉඩම් අංශය මඟින් සිදු කරනු ලබයි.

මූල්‍ය ප්‍රගතිය - 2022


කලාපය	මූල්‍ය ඉලක්කය රු.(මී)	ප්‍රගතිය
බී	11.3	11.3
සී	8.85	8.85
ඩී	7.03	6.85
එච්	22	22
එල්	7.30	7.30
වික්ටෝරියා	5.88	5.88
හුරුළුවැව	4.19	4.19
මොරගහකන්ද	14.55	14.80
වලව	25.19	25.19
රඹකැන්ඔය	25.35	22.74
ප්‍රධාන කාර්යාලය	8.57	5.47
එකතුව	**140.21**	**134.57**



ප්‍රදානපත්‍ර ලබාදීම

ඉඩම් සංවර්ධන ආඥා පනත - 202

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	6,700	5,393
සී	7,700	3,897
ඩී	300	727
එච්	5,600	5,245
එල්	5,000	1,243
වික්ටෝරියා	100	99
හුරුළුවැව	1,600	655
මොරගහකන්ද	1,100	1,673
වලව	34,800	4,241
රඹකැන්ඔය	1,500	657
එකතුව	**65,000**	**23,830**



රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍ර/ බදුකර ලබාදීම - 2022

කලාපය	ඉලක්කය	දීමනාපත්‍ර/බදුකර ප්‍රගතිය
බී	22	22
සී	88	13
ඩී	87	06
එච්	33	33
එල්	20	17
වික්ටෝරියා	470	381
හුරුළුවැව	-	-
මොරගහකන්ද	111	38
වලව	25	24
රඹකැන්ඔය	-	-
එකතුව	**856**	**534**

රජයේ ඉඩම් ආඥා පනත යටතේ විහාරස්ථාන දීමනාපත්‍ර ලබාදීම - 2022

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	3	3
සී	5	9
ඩී	8	2
එච්	-	-
එල්	-	-
වික්ටෝරියා	5	2
හුරුළුවැව	3	3
මොරගහකන්ද	7	-
වලව	2	2
රඹකැන්ඔය	-	-
එකතුව	**33**	**21**

රාජ්‍ය ආයතන සඳහා ඉඩම් ලබාදීම - 2022

කලාපය	පැවරුම් නියෝග		ඉඩම්භාරදීම	
	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
බී	-	-	10	10
සී	19	-	-	-
ඩී	14	3	35	14
එච්	-	-	18	18
එල්	-	-	1	1
වික්ටෝරියා	-	-	375	26
හුරුළුවැව	-	-	-	-
මොරගහකන්ද	14	8	-	3
වලව	-	-	2	2
රඹකැන්ඔය	1	1	7	7
එකතුව	**48**	**12**	**448**	**81**

3.2 කෘෂිකර්ම සංවර්ධන අංශය

කාර්ය භාරය

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි කලාප වල පදිංචි ගොවියන්ගේ ආර්ථිකය ඵලදායි ලෙස වැඩිදියුණු කිරීම උදෙසා පරිසර හිතකාමී කෘෂි තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා හුරුකිරීම සඳහා ගොවීන් පුහුණු කිරීම.

- ආහාර නිෂ්පාදන ජාතික ඉලක්කයන්ට අනුව මහවැලි වාරි හා වාරි නොවන ඉඩම් වල බෝග වගාව, සත්ව නිෂ්පාදනය හා කෘෂි ව්‍යාපාර ඇති කිරීම සඳහා වාර්ෂික ඉලක්කයන් සකසා ගැනීම.

- වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්ක ලභාකර ගැනීම සඳහා ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන වලට අනුකූලව ව්‍යාප්ත ඉලක්ක හා උපක්‍රම සැලසුම් සකස් කිරීම, ඒවා කලාප මට්ටමින් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කරවීම, පසුවිපරම අධීක්ෂණය හා වාර්තා කිරීම.
- කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනෙකුත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන හා සියළුම බාහිර ආයතන සම්බන්ධීකරණය කිරීම

ගෙවතු සංවර්ධන වැඩසටහන

අනු අංකය	කලාපය	වාර්ෂික භෞතික ඉලක්කය (ගෙවතු)	2022.12.31 දින දක්වා භෞතික ප්‍රගතිය (ගෙවතු)	%
		(ගෙවතු)	(ගෙවතු)	
1	බී	29,969	23,950	80%
2	සී	35,891	31,371	81%
3	ඩී	20,354	20,354	100%
4	ඊ	1,533	1,533	100%
5	එච්	42,584	42,182	99%
6	එල්	5,570	5,570	100%
7	මොරගහකන්ද	7,100	7,100	100%
8	හුරුළුවැව	11,532	11,532	100%
9	වලව	29,186	29,186	100%
10	රඹකැන්ඔය	30,794	30,794	100%
	එකතුව	214,513	203,572	92%

බෝග නිෂ්පාදනය ප්‍රගතිය සහ දායකත්වය - 2021/22මහ සහ 2022 යල කන්නය

බෝගය	2021/22මහ		2022යල		2022එකතුව	
	වපසරිය (හෙක්)	නිෂ්පාදනය (ටො.මෙ)	වපසරිය (හෙක්)	නිෂ්පාදනය (මෙටො)	වපසරිය (හෙක්)	නිෂ්පාදනය (මෙටො)
වී	96,227	344,388	80,668	336,316	177,895	680,704
බඩඉරිඟු	5,365	16,094	1,366	4,098	6,731	20,192
මිරිස්	417	3,256	575	6,897	992	10,153
සෝයා	343	446	4,020	8,041	4,363	8,487
ලොකුළූණු			668	13,360	688	13,380
මුං	325	325	1,005	1,005	1,330	1,330
කව්පි	666	599	1,210	1,210	1,876	1,809
රටකජු	526	683	690	1,725	1,216	2,408
උඳු	214	193	1,039	1,039	1,253	1,232
කුරක්කන්	602	903	3,21	481	923	1,384
තල	146	102	353	282	499	384
අලවර්ග එලවළු +	6,388	83,898	6,463	91,511	12,851	175,409
පළතුරු					12,387	160,078

ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන තුල ජාතික ආහාර නිෂ්පාදනයට දායක වෙමින් හෝ ආර්ථිකය සරු කිරීම හා නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීම ඉතා සාර්ථකව ඉටුකර ඇත.

වී වගාව ප්‍රවර්ධනය සදහා වන වැඩසටහන්



අතිරේක බෝග වගාව ප්‍රවර්ධන වැඩසටහන්



අතිරේක බෝග වගාව බීජ නිෂ්පාදන වැඩසටහන -

බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය



ගොවි පුහුණු සහ දැනුවත් කිරීම්



වගා ළිංසහ ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම යටතේ වගාව







මහවැලි ගොවිපල තුල බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය





කාබනික පොහොර නිෂ්පාදනය හා ගෙවතු වගාව





එළවළු සහ පලතුරු නිෂ්පාදනය



අපනයන කෘෂි බෝග වගාව



3.3 ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය

හැදින්වීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL) යනු බෝග, ධීවර සහ පශු සම්පත් ක්ෂේත්‍ර වල පුළුල් නිෂ්පාදන විවිධත්වයක් තුළින් දේශීය ආහාර නිෂ්පාදනය ඉහල නැංවීමට යොමු වී සිටින ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ව්‍යාපෘති ආයතනයකි.එසේම කෘෂිකර්මාන්තයට අමතරව මහවැලි ජනපදිකයින්ගේ ආදායම් නගා සිටුවීමේ විකල්ප ආදායම් මාර්ග ලෙස ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත. ග්‍රාමීය ආර්ථිකය තුළ විවිධ කාර්යභාරයක් ඉටු කරන බැවින් පශු සම්පත් ක්ෂේත්‍රය තුළ කිරි ගව සංවර්ධනකෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් හිමි වේ.තව ද පෝෂණමය වැදගත්කම,පෝෂණ අවශ්‍යතා සපුරාලීම හා ආහාර සුරක්ෂිතතාවය සලකා බැලීමේ දී කිරි හා අතුරු නිෂ්පාදන වැදගත් වේ.එසේ ම අයහපත් කාලගුණික විපර්යාස හමුවේ බෝග නිෂ්පාදනයට සිදුවන අවදානමට විසඳුමක් ලෙස ද පශු සම්පත් ක්ෂේත්‍රය හැදින්විය හැක.එසේම වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වල නිෂ්පාදන පිරිවැය අධික වීම සහ ඒ සඳහා ලැබෙන මිල අඩු වීම හේතුවෙන් ගොවින්ට ලැබෙන ආදායම අඩු වේ.මීට අමතරව ඉඩම් කැබලි කිරීම මගින් ගොවි ජනතාවගේ ආර්ථිකය තව දුරටත් පිරිහී ඇත.මෙම තත්ත්ව යටතේ,ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීම සඳහා වඩාත් සුදුසු විසඳුමක් ලෙස ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍ර හඳුන්වා දිය හැක.

මහවැලි ප්‍රදේශ තුල ධිවර හා පශු සම්පත් ක්ෂේත්‍ර සඳහා පවතින විභවය සහයෝග්‍යතාවය සලකා බැලීමේ දී විශාල සත්ත්ව ගහනයක් සිටීම ,සතුන්ගේජානමය විවිධත්වය, හෙක්ටයාර් 49,419ක ජල ව්‍යාප්තිය සහිත අභ්‍යන්තර ජලාශ 611 ක් පැවතීමහඳුනාගත හැකිය.මෙම ක්‍රියාලිය තුළ, මහවැලි කලාප තුළ පශු සම්පත් හා මිරිදිය ධීවර යන ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීම,අදාළ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය,අවශ්‍ය තාක්ෂණික නායකත්වය හා කළමණාකරණ සහය ලබා දීම ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය මගින් සිදු කරයි.

දැක්ම

සත්ව නිෂ්පාදන තුළින් මහවැලි පදිංචිකරුවන්ගේ පවුල්වල ආදායම් මට්ටම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම.

මෙහෙවර

සත්ත්ව නිෂ්පාදන ඵලදායීතාව හා ලාභදායීතාව ඉහළ නැංවීම තුළින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම හා රටේ දළ දේශීය නිෂ්පාදනයට දායකවීම සඳහා වූ තිරසාර නිෂ්පාදන කාර්යය සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම.

2022 සඳහා අපේක්ෂිත ඉලක්ක

- වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන50 දක්වා වැඩි කිරීම සහ ජාතික කිරි අවශ්‍යතා සපුරාලීම සඳහා වන දායකත්වය වැඩි කිරීම(ජාතික දායකත්වය 8%).
- වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 14000 දක්වා ඉහළ නැංවීම සහ ජාතික දළ දේශීය නිෂ්පාදන දායකත්වය 13% දක්වා වැඩි කිරීම
- වාර්ෂික බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන 80 දක්වා වැඩි කිරීම.
- වාර්ෂික විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය යුගල මිලියන 41 දක්වා ඉහළ නැංවීම.
- ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලන අතරම සත්ව නිෂ්පාදන හරහා පදිංචිකරුවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.
- කාර්යක්ෂම හා ඵලදායී තාක්ෂණික ව්‍යාප්තිය සහ යෙදුම සහතික කිරිම.
- නිසි පශු වෛද්‍ය සේවාවක් සැපයීම සම්බන්ධීකරණය තුළින් සත්ව සෞඛ්‍යයේ ආරක්ෂාව සහතික කිරීම.
- අගය එකතු කළ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරණ ජාලය ශක්තිමත් කිරීම.
- කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සහ පදිංචිකරුවන්ගේ ගෘහ ආදායම වැඩි කිරීම.

ධීවර හා සත්ව පාලන කළමනාකරණයේ ව්‍යාපෘති ක්‍රමවේදය කිරි නිෂ්පාදන සංවර්ධනය ,කුකුළු පාලනය ,මිරිදිය ධිවර කර්මාන්තය සහ විසිතුරු මත්ස්‍ය වගාව ලෙස ප්‍රධාන ක්ෂේත්‍ර හතරකින් සමන්විත වේ.

1. කිරි ගව සංවර්ධන වැඩසටහන

මහවැලි කෘෂිකාර්මික ගොවිපල දහයකට අවමය එක් ගොවිපලක කිරි ගව පාලන ඒකකයක් පිහිටු වීම යන සංකල්පය මත 2022 කිරි ගව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක විය. මහවැලි කලාප තුල ඒකක මට්ටමින් කිරි ගව පාලනයේ නියුතු ගොවිපල 12,940 ක් වන අතර එම ගොවිපල තුලින් 2022 වර්ෂය තුල දියර කිරි ලීටර මිලියන 50 ක නිෂ්පාදන ඉලක්කයෙන් 48.3 ක් සපුරා ගෙන ඇත. 2021 වර්ෂයේ නිෂ්පාදිත දියර කිරි ලීටර මිලියන 42.06 ඉක්මවා 2022 වර්ෂයේ ලීටර මිලියන 6.24 ක දියර කිරි නිෂ්පාදනයක් ලබාගෙන ඇත. එම අගය පෙර වර්ෂයේ නිෂ්පාදනයට වඩා 15%ක වැඩි වීමකි. 2022 වර්ෂයේ දියර කිරි ලීටරයක් අලවි කල සාමාන්‍ය මිල රු. 135/=ක් වූ අතර නිෂ්පාදිත දියර කිරි අලවියෙන් රුපියල් මිලියන 6,520.5 ක් මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිත කිරි ගව පාලනයේ නියුතු ගොවීන්ට උපයා ගැනීමට හැකි වී ඇත. දියර කිරි අලවියෙන් ලද ශුද්ධ ලාභය රුපියල් මිලියන 2,415කි.
2022 වර්ෂය තුල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වෙන්කල මුදලින් ක්‍රියාත්මක කල කිරිගව සංවර්ධන ව්‍යාප්ති වැඩසටහන සඳහා ඉලක්ක ගත මුදල වූ රුපියල් මිලියන 28.52 න් වැය වූ මුළු මුදල රුපියල් මිලියන 26.6කි.එය 93.26 % ක ප්‍රතිශතයකි.

2022 වර්ෂය කිරි ගව කර්මාන්තයට අභියෝගාත්මක වර්ෂයක් විය. කොවිඩ් වසන්ගත තත්ත්වය, ඉන්ධන හිගය හා සත්ත්ව ආහාර (සාන්ද්‍ර ආහාර) හිගය හා මිල අධික වීම,රසායනික පොහොර හිගය, කෘතීම සිංචනය විධිමත්ව සිදුකර ගැනීමට නොහැකි වීම හා ව්‍යාප්ති සේවාව විධිමත්ව සිදු නොවීම යන කරුණු හේතුවෙන් ජාතික මට්ටමින් දියර කිරි නිෂ්පාදනයද ක්‍රමයෙන් අඩුවන මට්ටමට පත්ව ඇත.

නිෂ්පාදන ඉලක්ක ලගාකර ගැනීම ගත් ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරකම් ලෙස මහවැලි කිරි ගව ගොවි ක්ෂේත්‍ර පාසැල් (FFS) පැවැත්වීම, කිරි ගව ගොවිපල ආශ්‍රිත සත්ත්ව ආහාර සුලභ කිරීම, සත්ත්ව අභිජනනය හා සත්ත්ව සෞඛ්‍ය ප්‍රවර්ධනය, ගොවිපල යටිතල පහසුකම් සංවර්ධනය, පරිසර හිතකාමී කිරි ගව ගොවිපල කළමණාකරණය, මහවැලි ගොවිපල ආශ්‍රිත තෘණ වගාව ප්‍රවර්ධනය, ධාරිතා සංවර්ධන වැඩසටහන් දැක්විය හැකිය.

වගුව 2022 වර්ෂය තුලදී හඳුනාගත් ආදර්ශ කිරි ගව ගොවිපල ආශ්‍රිතව මහවැලි සම්බන්ධීකරණයෙන් හා මහවැලි දායකත්වය මත ක්‍රියාත්මක කල උප ක්‍රියාකාරකම්

අ අ	උපක්‍රියාකාරකම	ඒකකය	වර්ෂයේ භෞතික 2022	
			ඉලක්ක	ප්‍රගතිය
1	අවම අක්කර 1/4, 1/2, 1ක තෘණ ආදර්ශණ	නො.	178	140
2	රෝපන ද්‍රව්‍ය හා යෙදවුම්	ගොවීන්	64	64
3	ඇසොල්ලා වගා ආදර්ශන	ගොවිපල	730	704
4	සයිලේජ් බැරල්	නො.	157	158
5	වැස්සී පැටවුන් පෝෂණ	වැඩ.	102	102
6	AI වැඩසටහන ප්‍රවර්ධනය	පැටවුන්	322	353
7	පුං ගවයින් හදුන්වා දීම සහ කිරි දෙනුන් හදුන්වා දීම	සතුන්	33	27
8	අභිජනන ගොවිපල	නො.	2	2
9	සත්ත්ව සායන හා එන්නත්	වැඩ.	70	73
10	Mastitis kits	නො.	70	70
11	සතුන් රක්ෂණය කිරීම	සතුන්	82	82
12	ගව නිවාසය	නො.	33	32
13	තෘණ කැබලි කරණ යන්ත්‍ර/ තෘණ කපන කරණ යන්ත්‍ර	නො.	45	45
14	ගව නිවාසයට ජල සැපයුම් පද්ධති පිහිටු වීම	නො.	41	42
15	කිරි භාජන හා උපකරණ	නො.	69	69
16	ජීව වායු ඒකක පිහිටු වීම	නො.	2	2
17	කාබනික පොහොර ඒකක	නො.	60	45
18	කිරි ගොවි ක්ෂේත්‍ර පාසැල්/ ගොවි පුහුණු	වැඩස.	374	374





2.කුකුළු පාලනය

මිනිසාගේ දෛනික ප්‍රෝටීන අවශ්‍යතාවය 65g වන අතර ඉන් 15g සත්ව ප්‍රෝටීන මගින් සපුරා ගත යුතුය. එම නිසා ලාභදායීම සත්ව ප්‍රභවය ලෙස බිත්තර මානව පෝෂණයට වැදගත් කාර්යය භාර්යක් ඉටු කරයි.නයිට්‍රජන් බහුල කාබනික පොහොරක් ලෙස කුකුළු පොහොර ගෙවතු වගාවේ අස්වැන්න වැඩි කර ගැනීමට භාවිතා කළ හැක.

නිෂ්පාදන පරිමාණය මත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කලාප තුල වාණිජ බිත්තර නිෂ්පාදනය ගොවිපලවල් කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ ලෙස ප්‍රධාන ආකාර 03 කි.මහවැලි කලාප තුල බිත්තර කුකුළු පාලනය වැඩි වශයෙන් සිදු කරන අතර බ්‍රොයිලර් කුකුළු පාලනය ඉතා සුළු වශයෙන් සිදු කරයි. බිත්තර කුකුළු පාලනය වාණිජ කුකුළු පාලනය හා ගම් කුකුළු පාලනය ලෙස ප්‍රධාන ආකාර 02 කි.
මූලික කාර්ය භාර්ය

- මහවැලි බිත්තර නිෂ්පාදනය මිලියන 80 දක්වා වැඩි කිරීම
- කුකුළු පාලනය සඳහා යොමු වී ඇති ගොවීන් සඳහා සහනාධාර ක්‍රමයට කුකුළු නිවාස සකසා ගැනීමට උදව් කිරීම
- බිත්තර නිෂ්පාදනය වැඩි කර ගැනීමේ අරමුණින් ගුණාත්මක කුකුළු පැටව් ලබා දීම
- කුකුළු පාලනයට අදාලව ගොවි පුහුණු කටයුතු සිදු කිරීම
- දේශීය අමු ද්‍රව්‍ය භාවිතා කර කුකුළු ආහාර නිපදවීම
- මහවැලි කලාප තුල ප්‍රෝටීන අවශ්‍යතාව සපුරා ගැනීම

2022 වර්ෂයේ බිත්තර නිෂ්පාදනය මිලියන 80 ක් අපේක්ෂා කලද ඉන් සපුරා ගනු ලැබුවේ මිලියන 60 ඉලක්කයක් පමණි. ආහාර මිල ඉහල යාම, ගුණාත්මයෙන් යුතු ආහාර සපයා ගැනීමට නොහැකි වීම, විදුලි කප්පාදුව හේතුවෙන් පැටවුන් නිෂ්පාදනය අඩු වීම නිසා එම ඉලක්ක ගත නිෂ්පාදනය අත් කර ගැනිමට නොහැකි විය. එක් බිත්තරයක සාමාන්‍ය මිල රු. 40.00 වූ අතර සමස්ථ ආදායම රු. මිලියන 2402.4 කි. මූල්‍ය ඉලක්කය රු. මිලියන 11.82 ක් වූ අතර ඉන් සපුරා ගනු ලැබුවේ රු. මිලියන 11.46 ක ප්‍රගතියක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස 96.99% කි.

කුකුළු පැටවුන් බෙදා දීම



03. මිරිදිය ධිවර සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් පාලනය කරනු ලබන මහවැලි බල ප්‍රදේශ 10 ක ජලාශ 732 ක් පිහිටා ඇති අතර එම ජලාශ වල වපසරිය හෙක්ටයාර් 47,171 ක් පමණ වේ. ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් සංඛ්‍යාව 4258 ක් පමණ වේ. 2022 වසරේ දිවයින තුල පැවති ව්‍යාකූල තත්ත්වය තුල ද ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 36 ක මුලා ප්‍රතිපාදන මෙම ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා වෙන් කරන ලද අතර එහි ප්‍රගතිය රුපියල් මිලියන 35 ක් විය.

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2022 වසරේදී මෙට්‍රික් ටොන් 14,398ක් වූ අතර එය 2021 වසරට සාපේක්ෂව19% කින් සැලකිය යුතු ලෙස වැඩිවී ඇත. ජාතික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයට මහවැලි දායකත්වය 13% කි. එය පෙර වසරට වඩා 1.5% කින් වර්ධනය වී ඇත. 2022 මිරිදිය ඉස්සන් නිෂ්පාදනය මෙ.ටො. 35 ක් පමණ වේ. එහි වටිනාකම රුපියල් මිලියන 52.5 කි.

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ බලපෑමට ලක්වතිබූ මත්ස්‍ය බීජ නිෂ්පාදනය 2022 වසරේ දිවයින තුල ඇතිවූ අස්ථාවරභාවය හේතුවෙන් තවදුරටත් පසුබෑමට ලක් විය. එම තත්වය තුලනය කර ගැනීම සඳහා ජලජීවී වගාව සඳහා යොදා ගන්නා වගා වපසරිය වැඩිකිරීම, තැන්පත් කරන ඇඟිල්ලන් ප්‍රමාණයවැඩිකිරීම සහ කළමනාකරණය විධිමත් කිරීම යන වැඩසටහන් ක්‍රියාත්මක කෙරුනි.
ජලාශ 161 ක් සඳහාතැන්පත් කර ඇති මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය ඇඟිල්ලන් මිලියන 22.8 ක් වන අතර තැන්පත් කර ඇති මිරිදිය ඉස්සන් පසු කීටයින් සංඛ්‍යාව මිලියන 9.20 කි . 2022 වසරේ මත්ස්‍ය කිලෝග්‍රෑමයක සමාන්‍ය තොග මිල රුපියල් 450.00 ක් පමණ වේ.

4.විසිතුරු මත්ස්‍ය වගා සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ විසිතුරු මත්ස්‍ය වගා ගොවිපල 1180 ක් පමණ ක්‍රියාත්මක වේ. මත්ස්‍යාන්ගේ තත්ත්වය උසස් කිරීම සඳහා තත්ත්වාරෝපිත ටැංකි ගොවිපල වලට හදුන්වාදී ඇති අතර 2022 වසර තුල එවැනි ටැංකි 39 ක් ඉදි කර ඇත. 2022 වසර තුල දේශීය සහ විදේශීය වෙලඳපොල වෙත සපයා ඇති විසිතුරු මසුන් ප්‍රමාණය මිලියන 42.5 ක් පමණ වේ. එහි වටිනාකම රුපියල් මිලියන 1912.5 කි.ගුණාත්මයෙන් උසස් විසිතුරු මසුන් නිෂ්පාදනය සඳහා සහ ගොවිපල යහ කළමණාකරන පිළිවෙත් පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා ඇති අතර ඉන් පුහුණු වැඩසටහන් 4 ක් ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ විසිතුරු මත්ස්‍යය අභිජනන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙහිදී නිලධාරීන් 48 ක් හා ගොවීන් 76 ක් පුහුණු කරන ලදී.
විසිතුරු මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීමේ උපාය මාර්ග ලෙස විසිතුරු මත්ස්‍ය වගා ඒකක ප්‍රමාණය වැඩිකිරීම, නිෂ්පාදනය කරනු ලබන මසුන්ගේ ගුණාත්මකභාවය ඉහල නැංවීම, වෙළඳපොල ඉහළ ඉල්ලුමක් සහිත මසුන් වගාව සඳහා ගොවීන් උනන්දු කරවීම, ගොවිපලතුල යහ කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම සහ ගොවිපලතුල යහ කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම සිදුකරන ලදී.

ජලාශ තුල පාවෙන දැල් කූඩු ස්ථාපිත කර තුල මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය



පුහුණු වැඩසටහන්




තත්වාරෝපිත ටැංකි





විසිතුරු මත්ස්‍ය වගාව පිළිබඳ පුහුණු වැඩසටහන්



3.4 ආයතන සංවර්ධන අංශය

දැක්ම

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය උදෙසා මහවැලි කලාපවල මානව සම්පත ප්‍රශස්තව මෙහෙයවීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය උදෙසා මහවැලි කලාපවල ජානපදිකයින්ගේ ජීවන තත්වය උසස් කිරීම.

ආයතන සංවර්ධන අංශයේ කාර්යභාරය

ප්‍රජා සංවර්ධනය

මහවැලි කලාප තුළ මතින් තොර, හිංසනයෙන් තොර, අපචාරයන්ගෙන් තොර, සාරධර්ම සපිරි නිරෝගිමත් ගොවි ප්‍රජාවක් බිහිකිරීම සඳහා මගපෙන්වීම ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි මූලික අරමුණ වේ.

මේ යටතේ,

- මත්ද්‍රව්‍ය භාවිතය වැළක්වීම සඳහා ග්‍රාමීය ස්වේච්ඡා නායක නායිකාවන් පුහුණු කිරීම හා පාසල් ළමුන් හා ප්‍රජාව දැනුවත් කිරීම
- ළමා අපචාර, කාන්තා හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අඩුවයස් විවාහ හා ගැබ්ගැනීම් වැළක්වීම සඳහා දැනුවත් කිරීම
- බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීම හා සෞඛ්‍ය සායන පැවැත්වීම (විශේෂයෙන් සීග්‍ර ලෙස පැතිරියන වකුගඩු රෝගයෙන් ආරක්ෂා වීම පිළිබඳ දැනුවත් කිරීම හා හදුනාගත් රෝගීන් ප්‍රතිකාර සඳහා යොමු කිරීම)
- අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම (පහ වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පොෙ.ස. සාමාන්‍ය පෙළ විභාගය හා අ.පොෙ.ස. උසස්පෙළ විභාගය සඳහා)
- මහවැලි පදනම ශිෂ්‍යත්ව ලබා දීම (දෙමාපියන් ඉතා දිළිඳු, ආබාධිත හෝ මියගිය, සාමාන්‍ය පෙළ සමත් දරුවන් සඳහා ලබා දේ) සිදු කෙරේ.

2022 වර්ෂයේ ප්‍රජා සංවර්ධනය වැඩසටහන් වලට අදාල ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව 495

කි. ඉන් වැඩසටහන් 483ක ප්‍රගතිය ලබා ගෙන ඇති අතර මූල්‍යඉලක්කය රුපිල් මිලියන 91.6ක් හා මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 88කි.

<u>ජානපදික හැකියා හා වෘත්තීය පුහුණු</u>

- මහවැලි ජානපදිකයින්ගේ ආර්ථික මට්ටම රුපියල් 30,000. 00 වඩා ඉහළ නැංවීම අරමුණු කරගනිමින් වෘත්තීය පුහුණු ලබා දීම හා ඒ ඔස්සේ ඔවුන් රැකියා/ගත කිරීම මූලික අපේක්ෂාව වේ.
- ගොවි සංවිධාන නිළධාරීන් සඳහා ගිණුම් පුහුණුව ලබාදීම හා පොල්ගොල්ල ජාතික අධ්‍යාපන සමූපකාර සංවර්ධන ආයතනය යටතේ මහවැලි කලාප වල උසස් පෙළ සමත් තරුණ තරුණියන්ට විගණනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී ගොවි සංවිධාන විගණනය සඳහා බලය ලබා දීම හා කලාපයේ ගොවි සංවිධාන වාර්ෂිකව විගණනය කිරීම ඔවුන් විසින් සිදු කිරීම.

2022 වර්ෂය තුළ මේ යටතේ වැඩසටහන් 95ක් ඉලක්ක ගතව තිබූ අතර වැඩසටහන් 97ක ප්‍රගතියක් හා රුපියල් මිලියන 8.413ක මූල්‍ය ඉලක්කයක් හා 7.315 ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගන්නා ලදී. තවද දිළිදුකම තුරන් කිරීමේ වැඩසටහන යටතේ 2022 වර්ෂයේ මාසික ආදායම රුපියල් 30,000.00 ට වැඩියෙන් උපයන සංඛ්‍යාව 697 ක් ලෙස රැකියාගත කිරීම සිදුකරන ලදී.





(ඡායාරූප- ජානපදික පුහුණු වැඩසටහන්)

කාන්තා සංවර්ධන වැඩසටහන්

- ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීම හා ගෘහස්ථ මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා මගපෙන්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ.
- මහවැලි කලාප තුළ සිටින කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා මේ යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි
- තම නිවසේ සිටම ආදායම් උත්පාදනය සඳහා ඇයට කටයුතු කළහැකි වන පරිදි ස්වයංරැකියා හා විවිධ වෘත්තීය පුහුණු ලබාදීම සිදුකරන අතර ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමද මේ යටතේ සිදුකරයි.2022 වර්ෂයේ මෙහි වැඩසටහන් ඉලක්කය 100ක් වන අතර ප්‍රගතිය වැඩසටහන් 100කි. මූල්‍ය වියදම රුපියල් මිලියන 2.565කි.

ගොවි සංවිධාන ප්‍රවර්ධනය

ගොවි සංවිධාන නිලවරණ පැවැත්වීම හා ගොවි සංවිධාන සඳහා අදාලවන අණපනත්, නීති රීති, ජලකළමනාකරණය ආදිය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. එමෙන්ම ගොවීන් ගේ ආකල්ප වර්ධනය හා ධාරිතා සංවර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් සිදුකරන අතර කළමනාකරණ කමිටු යටතේ ගොවි ගැටලු සඳහා විසඳුම් ලබාදීම සිදු කරයි.

ක්‍රීඩා කටයුතු

මහවැලි ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම අරමුණුකොටගෙන මහවැලි ක්‍රීඩා පැවැත්වීම සිදු කරන අතර ඒ යටතේ

- ඒකක/කොට්ටාස හා අන්තර් කලාප ක්‍රීඩා තරග පැවැත්වීම
- ක්‍රීඩා පුහුණු කඳවුරු පැවැත්වීම
- මහවැලි ක්‍රීඩා සමාජ පිහිටුවීම
- අඩු ආදායම්ලාභී දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කරගැනීම සඳහා මුල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබාදීම
- අඩු පහසුකම් සහිත පාසල් හා ක්‍රීඩා සමාජ වෙත ක්‍රීඩා උපකරණ ලබාදීම

2022 වර්ෂයේදී සිදු කරන ලදී. ඒ අනුව කලාප දහය පුරා මහවැලි ක්‍රීඩා සමාජ 317ක් පිහිටුවා ඇති අතර ඒ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2264 ක් සහභාගී වී ඇත. ක්‍රීඩා කටයුතු වෙනුවෙන් 2022 වර්ෂයේදී වැය කරන ලද මුදල රුපියල් මිලියන 3.619කි.





(ඡායාරූප - මහවැලි ක්‍රීඩා)

<u>ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්</u>

මහවැලි කලාප තුළ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යවසායන් වැඩි දියුණු කිරීම සඳහා සහන ක්‍රමවේද මත මූල්‍ය පහසුකම් සලසා දීම මෙහි මූලික අරමුණයි.

ඒ අනුව දේශීය නිෂ්පාධන ආශ්‍රිත නව ව්‍යවසායකයින් බිහිකිරීමත්, විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍ර යටතේ පවතින ව්‍යවසායන් වැඩිදියුණු කිරීම සඳහාත් අවධානය යොමුකර එක කලාපයක් සඳහා ව්‍යවසායකයින් 25 දෙනෙකු බැගින් ව්‍යවසායකයින් 250 ක් සඳහා ඉලක්ක ලබාදීමට කටයුතු කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය තුළ ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්ධ සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමය කලාප මට්ටමින් දියත් කර ඒ යටතේ ණය අයදුම්කරුවන් 367 දෙනෙකු තෝරා ගනිමින් අදාළ කලාපවල බැංකු ශාඛා වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.

3.5. ව්‍යාපාර සංවර්ධන අංශය

ව්‍යාපාර සංවර්ධන අංශය , ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටුකරන අංශයක් වෙයි . මහවැලි කලාප තුළ එක් එක් කලාපයන්ට අනන්‍ය වූ සීමිත සම්පත් උපරිම ඵලදායී ලෙස උපයෝජනය කරමින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය හා ආර්ථික සංවර්ධනය සඳහා වගකීම් දරමින් කටයුතු කරයි.
ඒ අනුව මහවැලි කලාපවල කෘෂිකර්ම ,සත්ත්ව පාලන ,සංචාරක ආදී අදාළ විවිධ ක්ෂේත්‍රයන්හි කුඩා ,මධ්‍ය හා මහා පරිමාණයේ විවිධ වූ ව්‍යවසායකයන් බිහි කරලීම සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම ,ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම හා ඇගයීම, පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවර්ධනයට යොමු කර ගැනීම, අළෙවිකරණය සඳහා වෙළෙඳපොළ සම්බන්ධතා ඇති කිරීම , ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ණය යෝජනා ක්‍රම දියත් කර ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම ,ඔවුන්ට අවශ්‍ය මගපෙන්වීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

<u>ව්‍යාපාර සංවර්ධන අංශයේ අරමුණු:-</u>

01. ස්වයං රැකියා පුහුණුව මඟින් කුඩා පරිමාණයේ නිෂ්පාදන ක්ෂේත්‍රයට දායකත්වය ලබාදීම.
02. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් බිහි කිරීම.
03. ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය මැදිහත්කරුවෙකු වීම.
04. ව්‍යවසායකත්ව හැකියා වර්ධනය හා තාක්ෂණ නිපුණතාවය ලබා දීම.
05. වෙළඳපල සම්බන්ධීකරණය මඟින් මහවැලි බල ප්‍රදේශවල නිෂ්පාදනවලට ඉහළ වටිනාකමක් ලබාදීම
06. මහවැලි බල ප්‍රදේශවල තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ජනනය කිරීම.
07. ආයෝජන තුළින් ප්‍රාදේශීය සංවර්ධනය.
08. ජාතික නිෂ්පාදනයට දායකත්වයක් ලබාදීම හා අපනයන ප්‍රවර්ධනය.
09. ව්‍යාපාර උපදේශනය/ව්‍යාපාර සැලසුම් සකස්කිරීමට සහය ලබාදීම හා ඇහයීම.
10. අධිකාරියේ වාර්ෂික ආදායම් තත්වය ඉහළ නැංවීම.

<u>ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්යභාරය:-</u>

- ග්‍රාමීය වශයෙන් හදුනාගත් සම්පත් ව්‍යාප්ති ස්වභාවය යටතේ ව්‍යාපාර සැලසුම් සකස් කිරීම
- හදුනාගත් ස්වයං රැකියා ක්ෂේත්‍රයන් සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීම
- සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබාදීම හා 50% මහවැලි දායකත්වය යටතේ යන්ත්‍ර හා උපකරණ ලබාදීම
- කෘෂිකාර්මික හා සත්ව පාලන ව්‍යාපෘති මඟින් විදේශීය විනිමය ඉපයීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම.
- සත්ව පාලන,විසිතුරු මත්ස්‍ය,පොල් වගාව,වෙනත් බෝග හා පලතුරු වගා ආදී ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම මත බදු ආදායම් ලබා ගැනීම.
- සුර්යබල ශක්ති, පෛව ස්කන්ධ විදුලි බල ශක්ති, ජල විදුලි බලශක්ති ආදි විදුලිබල ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් වල බදු අදායම්/මහවැලි අධිකාරිය සමඟ හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම තුලින් ලාභ ඉපයීම.
- කර්මාන්ත උද්‍යාන පවත්වා ගෙන යාම මඟින් ප්‍රාදේශීය මට්ටමේ ආර්ථිකය ශක්තිමත් කිරීම.
- මහවැලි බල ප්‍රදේශවල ඉතා ආකර්ෂණීය ස්ථානවල පිහිටි සංචාරක බංගලා නවීකරණය කරමින් දෙස් විදෙස් සංචාරකයින්ට විවෘත කිරීම තුළින් අදායම් උත්පාදනය.
- පාරම්පරික දේශීය ආහාර ප්‍රචලිත කිරීම හා කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය සඳහා මහවැලි හෙල බොජුන් හල් ආරම්භ කිරීම.
- පරිසර හිතකාමී සංචාරක අවස්ථා පුළුල් කිරීම උදෙසා ජලාශවල සංචාරක බෝට්ටු සේවා සඳහා අවසර ලබාදී වාර්ෂික බදු මුදලක් ලබා ගැනීම

මහවැලි සංචාරක බංගලා

1979 වසරේ අංක 23 දරණ පනත යටතේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය 1979 වසරේ සිට මේ දක්වා සිය සංවර්ධන අරමුණු කරා යොමු වීමේදී සංචාරක බංගලා රාශියක්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුව සංචාරක බංගලා 35 ක් මහවැලි බල ප්‍රදේශ පුරා, සංචාරකයන් මහත් ආකර්ශණයන්ට ලක්වන මනරම් පරිසර පද්ධති ආශ්‍රිතව ස්ථාපිත කර ඇත.

එම එක් එක් මහවැලි සංචාරක බංගලාවන් පිහිටි දිස්ත්‍රික්ක හා ආසන්න නගරය පහත පරිදි වේ.

අනු අංකය	සංචාරක බංගලාව	කලාපය	දිස්ත්‍රික්කය	ආසන්න නගරය
1	රුහුණුකෙත	බී	පොළොන්නරුව	වැලිකන්ද
2	පිඹුරත්තැව			අරලගංවිල
3	මහවැලි මංසල	සී	අම්පාර	දෙහිඅත්තකණ්ඩිය
4	උල්හිටිය රත්කිඳ II			ගිරාදුරුකොට්ට
5	ගිරාදුරුකෝට්ටේ		බදුල්ල	ගිරාදුරුකොට්ට
6	බකමුණ	ජී	පොළොන්නරුව	බකමුණ
7	මහවැලි වියමන	ඩී		මැදිරිගිරිය
8	නොච්චියාගම	එච්	අනුරාධපුර	නොච්චියාගම
9	තඹුත්තේගම			තඹුත්තේගම
10	කලාවැව			කලාවැව
11	වැලිඔය	එල්	මුලතිව්	සම්පත්නුවර
12	නුවරඑළිය	ඒ	නුවරඑළිය	නුවරඑළිය
13	දිගන		මහනුවර	දිගන
14	බූවැලිකඩ		මහනුවර	මහනුවර
15	කොත්මලේ 22/23/24		මහනුවර	කොත්මලේ
16	ඇඹිලිපිටිය	වලව	රත්නපුර	ඇඹිලිපිටිය
17	උඩවලව			උඩවලව
18	මහඔය	රඹකැන්ඔය	රඹකැන්ඔය	මහඔය
19	පොල්ගොල්ල	කාර්යයභාර ඉංකාර්යාල	මහනුවර	පොල්ගොල්ල
20	කොත්මලේ 119	කාර්යයභාර ඉංකාර්යාල		කොත්මලේ
21	රන්දෙණිගල	කාර්යයභාර ඉංකාර්යාල	රන්දෙණිගල	රන්ටැඹේ
22	බෝවතැන්න	කාර්යයභාර ඉංකාර්යාල	මාතලේ	නාඋල
23	මාදුරුඔය	කාර්යයභාර ඉංකාර්යාල	පොළොන්නරුව	අරලගංවිල
24	මොරගහකන්ද	කාර්යයභාර ඉංකාර්යාල	මාතලේ	දඹුල්ල
25	කළුගග	කාර්යයභාර ඉංකාර්යාල	මාතලේ	ලග්ගල
26	රත්මලාන		කොළඹ	රත්මලාන



කලාවැව මහවැලි සංචාරක බංගලාව

මහවැලි සංචාරක බංගලා පද්ධතියෙහි සුවිශේෂී අරමුණු ලෙස ආයතනයේ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වලදී නිලධාරීන්ගේ නවාතැන් අවශ්‍යතා සැපයීම, මහවැලි අධිකාරියේ නිලධාරීන්ගේ පෞද්ගලික සංචාරයන් වලදී නවතැන් අවශ්‍යතා සහ දේශීය හා විදේශීය සංචාරකයන්ගේ නවාතැන් අවශ්‍යතා සඳහාද ගාස්තු අයකර ගැනීමේ පදනම මත වෙන් කර දීමට අවස්ථාව සලසා ඇත. මීට අමතරව මෑත කාලීනව මංගල උත්සව, ප්‍රිය සම්භාෂණ වැනි උත්සව අවස්ථා සඳහා ලබා දුන්නද එම උත්සව අවස්ථාවන්හිදී පාලනය හා නඩත්තුව පිළිබඳ විවිධ අවස්ථා වල විවිධ ගැටලු පැන නැඟී ඇත.

එමෙන්ම 2017 වර්ෂයේ සිදු කල නවීකරණ කටයුතු හේතුවෙන් 2017 වර්ෂය වන විට රුපියල් මිලියන 2 කට අඩුවෙන් පැවති වාර්ෂික ආදායම, 2022 වර්ෂය වන විට රුපියල් මිලියන 19.6 දක්වා වර්ධනය වී ඇත.

එහෙත් 2020 වර්ෂයේ ආරම්භයේ සිට ලෝක වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරක ව්‍යාපාරය මුළුමනින්ම බිඳ වැටීමට ලක් වූ අතර එය මෙරට ආර්ථිකයටද සෘජුව බලපාන ලදී . 2022 වර්ෂය වන විට මෙම තත්ත්වය පාලනයට රජය ගත් ක්‍රියාමාර්ග හමුවේ මේ වන විට වසංගත තත්ත්වය පහව ගොස් ඇති අතර සංචාරක ක්ෂේත්‍රය ඇතුළු බොහෝ ක්ෂේත්‍රයන්ගේ නව පිබිදීමක් ඇති කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.



මොරගහකන්ද සංචාරක බංගලාව

හතරවන පරිච්ඡේදය

4.1 පිරිස් හා පාලන අංශය.

පිරිස් හා පාලන අංශය වෙත පැවරී ඇති කාර්යභාරයන්

1. **සේවක අවශ්‍යතා හඳුනා ගැනීම, සැලසුම් කිරීම සහ ආකර්ෂණය කර ගැනීම**
   - පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම
   - විභාග/සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම
   - සුදුස්සන් තෝරා පත් කර ගැනීම
   - සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු)
2. **සේවක පුහුණුව හා සංවර්ධනය**
   - නවක නිලධාරීන් ආයතනගත කිරීමේ පුහුණු වැඩසටහන්
   - කෙටිකාලින හා දිගුකාලින පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම.
   - දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ලබා දීම
3. **වන්දි හා ප්‍රතිලාභ සම්බන්ධ කටයුතු**
   - උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම
   - වැටුප් සංශෝධන කටයුතු (ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව)
   - පාරිතෝෂික දීමනා ප්‍රතිලාභ නිදහස් කිරීම
   - සේ.අ.අ./සේවා නියුක්ත භාර අරමුදල් නිදහස් කිරීම සම්බන්ධ කටයුතු.
4. **සේවක කාර්ය සාධන කළමනාකරණය**
   - පුද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම
   - කාර්ය සාධනය ඇගයීම
   - කාර්ය මණ්ඩලය අධීක්ෂණය හා සුපරීක්ෂණය
   - විශ්‍රාම ගැන්වීම්
   - සේවය අවසන් කිරීම්
   - ස්ථානමාරු
   - විනය කටයුතු (ආයතන සංග්‍රහය හා විනය කාර්ය පටිපාටියට අනුව)
5. **කළමනාකරණ සම්බන්ධතා හා කම්කරු සම්බන්ධතා**
   - සේ.අ.අ./සේවා නියුක්ත භාර අරමුදලේ සාමාජිකයන් ලියාපදිංචි කිරීම.
   - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙනුවෙන් නීතිමය කටයුතු සඳහා පෙනී සිටීම.
   - සම්බන්ධීකරණය (විවිධ අංශ, කලාප හා බාහිර පර්ශවයන් අතර)
   - මහජන සම්බන්ධතාවය.
   - නිල උත්සව සම්බන්ධ කටයුතු.
   - පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු උපදේශක කාරක සභා කටයුතු.
   - මහජන පෙත්සම් කාරක සභා කටයුතු.
   - පාර්ලිමේන්තු වාචික ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට, සහභාගී වීම හා අනෙකුත් අංශ සම්බන්ධීකරණය.

2022 වර්ෂයේ නව බඳවා ගැනීම්, අභ්‍යන්තර උසස් කිරීම් සිදු කර නැත.

2022 වර්ෂයේ පුහුණු කිරීම්

අනු අංකය	වැඩසටහන් නම	වියදම (රු.)
01	පරිපාලන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	582,874.00
02	සංචාරක බංගලා භාරකරුවන් සඳහා පුහුණු වැඩසටහන	315,970.00
03	වියදම් හා ගෙවීම් පටිපාටිය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුව	18,000.00
04	2022 යල වගා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ක්‍රමවේදයන් සැකසීමේ වැඩමුළුව	97,975.00
05	මූලික ගබඩා කළමනාකරණය පිළිබඳ පාඨමාලාව	83,575.00
06	සංචාරක බංගලා සඳහා ලි බඩු මිලදී ගැනීම සහ හෙළ බොජුන්හල්වල ගුණාත්මය වර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන	153,000.00
07	පොදු ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	10,000.00
08	පෞද්ගලික ලිපිගොනුවක් සකස් කර ගන්නා ආකාරය පිලිබඳ පුහුණු වැඩමුළුව	10,000.00

4.2 නීති අංශය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නීති අංශය ප්‍රධාන කාර්යාලයේ 8 වන මහලේ ස්ථාපිත කර ඇති අතර එහි ප්‍රධානියා වශයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) කටයුතු කරනු ලබයි.

දැක්ම
මහවැලි ජනපදිකයින්ගේ ජන ජීවිතය නංවාලීම හා සමස්ත මහවැලි අධිකාරිය තුළ උද්ගත වන නෛතික ගැටළු නිරාකරණය කිරීමට හා ගැටළු අවම කිරීමට උපරිම දායකත්වය ලබා දීම.

අරමුණු
උපරිම කාර්යක්ෂමතාවයකින් හා අවම පිරිවැයක් තුළ නෛතික ගැටළු අවම කර ගැනීම සහ අධිකාරියේ ආදායම් උත්පාදනය සඳහා දායක වීම.

නීති අංශයේ කාර්ය භාරයන් සහ උපදෙස් ලබා දෙන විෂය ක්ෂේත්‍ර

- සේවකයන්ගේ නීතිමය ගැටළු සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ, කාර්මික අධිකරණයේ, කම්කරු විනිශ්චය සභාවේ සිට ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා අදාළ කටයුතු ඉටු කිරීම.

- ආයතනයට අදාළ සියලු නීතිමය කටයුතුවලදී නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීම සහ අදාළ අධිකරණ කටයුතු සිදු කිරීම.

- කොන්ත්‍රාත් සහ අවබෝධතා ගිවිසුම් හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙනුවෙන් අත්සන් තබන අනෙකුත් ගිවිසුම් නීතිමය අවශ්‍යතාවන්ට අනුකූල වන ලෙස සකස් කිරීම, අත්සන් ලබා ගැනීම සහ ඉදිරි නීතිමය කටයුතු සිදු කිරීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ පාර්ශ්වකරුවන් අතර පවතින ගිවිසුම්, එකඟතා ගනුදෙනු සම්බන්ධ ආරවුල්වලදී ඊට අදාළ බේරුම් කටයුතු කිරීම සහ / හෝ ඊට අදාළව නඩු පැවරීම් සිදු කිරීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉඩම්, දේපළ සම්බන්ධයෙන් නීතිමය ගැටළුවලදී ක්‍රියාත්මක වීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම.

- කාර්මික ආරවුල්, බේරුම්කරණ, කම්කරු විනිශ්චය සභා සහ අනෙකුත් අධිකරණමය කටයුතු ඉටු කිරීම.

- බදු මුදල් පැහැර හැරීම, අනවසර ඉවත් කිරීම් වැනි ඉඩම් රාජකාරීවලදී අවශ්‍ය කරන උපදෙස් ලබා දීම සහ නීතිමය කටයුතු ඉටු කිරීම.

- අංශයට අදාළ වාර්තා සකස් කිරීම.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අදාළ සියලුම අංශවලින් පැන නගින නීතිමය ගැටළු සඳහා උපදෙස් ලබා දීම.

- වාහන අනතුරු නඩු

- කුඩා පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අදාළ උපදෙස් ලබාදීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සමාගම් සම්බන්ධ කටයුතු කිරීම හා උපදෙස් ලබාදීම.

- නෛතික ගැටළුවලට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කිරීම.

2022 වර්ෂයේ තැබූ ඉලක්කයන් හා ලැබූ ප්‍රගතිය

හිඟ බදු අයකර ගැනීමට අදාළව ප්‍රගතිය

- දැන්වීම් යැවීම.
- එන්තරවාසි යැවීම.
- රජයේ ඉඩම් .පනත යටතේ අස්කිරීමේ නිවේදන යැවීම (සන්තකය ආපසු ලබාගැනීමේ)
- වටිනාකම රු500., -/000කට අඩු නම් එම ගැටළු සමඨ මණ්ඩලය වෙත යොමු කිරීම.
- නඩු පැවරීම.
- ඉදිරි වර්ෂ සඳහාද මේ වන විටත් කටයුතු කරමින් පවතී.
- 2022.12.31 දින වන විට රු157., 033,521.85 ක ආදායමක් උත්පාදනය කොට ඇත.

<u>2022 වර්ෂය තුළ සිදු කළ විශේෂ කාර්යයන් සහ එයින් ජාතික ආර්ථිකයට සිදු කළ දායකත්වය</u>

- ❖ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අය විය යුතු හිඟ බදු මුදල් හා අනෙකුත් පැහැර හරින ලද මුදල් අය කර දීම.
- ❖ යම් යම් සේවක ගැටළු, ඉඩම් ගැටළු සහ අනෙකුත් ආරවුල් අධිකරණමය කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම සමඨ කිරීම.
- ❖ විවිධ පාර්ශ්වයන් විසින් රජයට එරෙහිව පවරන ලද නඩුවලදී යුක්තිය ඉටු කිරීමට අවශ්‍ය සහාය ලබා දීම, රජයේ හා ආයතනයේ කීර්ති නාමය රැක ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම.
- ❖ යම් අක්‍රමිකතා කරන ලද මහවැලි නිළධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබා දීම තුළ අවංක මහවැලි නිළධාරීන් බිහි කිරීම තුළින් ඵලදායීතා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට දායක වීම. එතුළින් රජය විසින් දැරීමට සිදු වන ලද වියදම් අඩු කිරීම සහ ඒ සඳහා වැයවන රජයේ නිළධාරීන්ගේ කාලය සහ ශ්‍රමය ඵලදායීව යොදා ගැනීමට අවස්ථාව සලසා දීමට හැකි වීම.
- ❖ නීතිමය ගැටළුවලදී නීතිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීමය දායකත්වය සහ උපදෙස් ලබා දීම තුළින් වඩා නීත්‍යානුකූල මහ පෙන්වීමක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා දීමෙන් තිරසාර මහවැලි ඉදිරි ක්‍රියාමාර්ග කෙරෙහි දායකත්වය ලබා දීම සහ මහවැලි සේවක හා දේපල සුරක්ෂිතතාවය සහ අභිවෘද්ධිය සලසා දීමට හැකි වීම තුළින් ජාතික ආර්ථිකයට එම යහපත් ප්‍රතිඵල ලබා දීමට හැකි වීම.

1.3 මුදල් අංශය.

ආයතනයේ ආයතනික සැලසුම‘ හා වාර්ෂික සැලසුම‘ අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජාතික අයවැය ලේඛනය යටතේ මහවැලි අධිකාරිය සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අයවැය යෝජනා සැකසීම, මාසිකව අවශ්‍ය මුදල් පිළිබඳව පූරෝකථනය කිරීම හා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගැනීම, දේශීය හා විදේශීය ව්‍යාපෘති වල වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම, සේවක වැටුප් හා අනෙකුත් ගෙවීම්, භෞතික සම්පත් කළමණාකරනය , විගණන විමසුම් සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ (COPE) විමසුම් අනුව තොරතුරු සැපයීම මෙම අංශය වෙත පැවරෙන මූලික කාර්යභාරයන් වේ.

මූල්‍ය වෙන්කිරීම් හා වියදම් පිළිබඳ විස්තර

	ප්‍රාග්ධන මූලය	ප්‍රතිපාදන (රු.'000)	වියදම් (රු.'000)
පුනරාවර්තන වියදම්		4,479,939	4,090,614
ප්‍රාග්ධන වියදම්		1,200,000	995,470
මහවැලි ව්‍යාපෘති			
රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය	40,000	33,997
රඹකැන්ඔය ව්‍යාපෘතිය	දේශීය	60,000	46,636
වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය	දේශීය	40,000	27,666
කෘෂි හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය	193,000	160,741
එකතුව		6,012,939	5,355,124

දේපළ පිරියත හා උපකරණ

						රු '000
විස්තරය	01.01.2022 දිනට පිරිවැය	මිල දී ගැනීම්	විකිණීම්, බැහැර කිරීම්, මාරුකිරීම්	31.12.2022දිනට පිරිවැය	ක්ෂය වීම	ක්ෂයවීම් අඩු කිරීමෙන් පසු 31.12.2022
ඉඩම්	296,000	-	-	296,000	-	296,000
ගොඩනැගිලි හා කාර්යාල	2,851,325	34,840	224	2,885,941	861,864	2,024,077
ගොඩනැගිලි - වෙනත්	3,062,493	32,566	2,946	3,092,113	1,986,353	1,105,761
ප්‍රධාන ඇල	74,989,140	-	-	74,989,140	5,999,131	68,990,009
මෝටර් වාහන	1,694,043	27,669	10,746	1,710,967	1,203,467	507,500
කාර්යාල උපකරණ සහ සුභසාධන අයිතම	192,202	306,788	173,946	324,045	58,622	265,423
විදුලි ජනක යන්ත්‍ර	6,570,424	6,711,936	6,569,602	6,712,758	1,008,177	5,704,581
යන්ත්‍ර හා උපකරණ - වැඩපොළ සේවා	28,108	69,548	27,522	70,134	9,848	60,628
යන්ත්‍ර හා උපකරණ - ඉදිකිරීම්	537,728	771,925	533,362	776,291	118,656	657,635
යන්ත්‍ර හා උපකරණ - පොදු	297,070	412,034	273,888	435,216	75,271	359,944
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	339,390	7209	1,640	344,960	128,394	216,565
පරිගණක හා උපාංග	211,189	22,665	7104	226,750	107,329	119,420
ආරක්ෂක උපකරණ	4,410	436	-	4,846	455	4,391
පොත් හා අත්පොත්	6,532	-	-	6,532	94	6,437
වේලි	31,764,287	-	-	31,764,287	635,286	31,129,002
එකතුව	**122,843,342**	**8,397,618**	**7,600,980**	**123,639,979**	**12,192,948**	**111,447,032**

4.4 මහවැලි ආරක්ෂක බලකාය

හැඳින්වීම :

මහවැලි ආරක්ෂක සංවිධානය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන ඉදිකිරීම් , අවශේෂිත ගොඩනැගිලි සංකීර්ණ සහ දේපළ ආරක්ෂා කිරීම ප්‍රධාන කොටගෙන ද මහවැලි නිළධාරීන් හා කාර්ය මණ්ඩලය / ජනපදිකයින් ආරක්ෂා කිරීම වස් ද **1985 වර්ෂයේ ජූනි 15** දින 1979 අංක 23 දරණ මහවැලි අධිකාරි පනත යටතේ ආරක්ෂක නිළයන් 10කට ආසන්න ප්‍රමාණයකින් සමන්විතව **මහවැලි ආරක්ෂක සංවිධානය** පිහිටුවා ඇත.

මෙම අවධියේ දී මහවැලි ආර්ථික ඒජන්සිය හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ ආරක්ෂක කටයුතු එම ආයතන මඟින්ම ආරක්ෂක නිළධාරීන් සුළු පිරිසකින් ඉටු කර ගත් අතර එම සංඛ්‍යාව ප්‍රමාණයෙන් ඉතා සුළු පිරිසක් වුහ . ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක කටයුතු විමධ්‍යගත කිරීමේ පරමාර්ථයෙන් හා විධිමත්ව පාලන හා මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා මහවැලි අධිකාරියේ උපදෙස් පරිදි මහවැලි ආර්ථික ඒජන්සියේ හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ සේවය කළ ආරක්ෂක නිළයන් 1989 වර්ෂයේ දී මහවැලි ආරක්ෂක සංවිධානය වෙත අන්තර්ග්‍රහණය කරන ලදි.

1985 වර්ෂයේ ජූනි 15 දින මෙම බලකාය ස්ථාපිත කළ අවධියේ ආයතන ප්‍රධානී තනතුර වශයෙන් අධ්‍යක්ෂ තනතුරක් නොතිබූ අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධිකාරි ලත් නිළයක් ද්විතීයික පදනම මත **ආරක්ෂක සම්බන්ධීකාරක වශයෙන්** මෙම ආරක්ෂක සංවිධානය මෙහෙයවන ලදී. ඒ අනුව පළමු වැනි ආරක්ෂක සම්බන්ධීකාරක වශයෙන් **ලුතිනන් කර්නල් එන්.පී. ප්‍රනාන්දු මහතා** 1985 ජූනි 15 දින සිට 1988 වර්ෂය දක්වා මෙම ආයතනයට නායකත්වය ලබා දී ඇත.

ඒ අනුව ආරක්ෂක සම්බන්ධීකාරක වශයෙන් 1988 වර්ෂයේ සිට 1989 මැද භාගය දක්වා **කර්නල් බී මහීපාල මහතා** කටයුතු කර ඇති අතර 1989 වර්ෂයෙන් පසු මෙම ආයතනයේ විෂය පථය පුළුල් වීම හේතුවෙන් හා මෙම ආයතනය භාවිතා කරනු ලබන අවි ආයුධ ආදියට මෙන්ම එකල ප්‍රධාන වශයෙන් ආරක්ෂාව සපයන ලද වික්ටෝරියා , රන්දෙණිගල , මාදුරු ඔය , කොත්මලේ , පොල්ගොල්ල , බෝවතැන්න ආදී සීමිත වූ නමුත් අතිශය සංවේදී ආර්ථික මර්මස්ථාන වල ආරක්ෂාව සම්බන්ධව සෘජු වගකීම හා වගවීම සම්බන්ධව සළකා බලා 1990 වර්ෂයේ දී **අධ්‍යක්ෂ (ආරක්ෂක)** තනතුර ස්ථාපිත කරන ලදී.

ඒ අනුව මහවැලි ආරක්ෂක සංවිධානයේ **පළමු අධ්‍යක්ෂ (ආරක්ෂක) වශයෙන් මේජර් තිලක් රත්නසේකර මහතා** රාජකාරි ඉටු කර ඇත.
එසේම ආරම්භක අවධියට වඩා 1990 දශකයේ අග භාගය වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක අවශ්‍යතාවයන් විශාල ලෙස පුළුල් වීමත් සමඟම එතෙක් පැවති මහවැලි ආරක්ෂක සංවිධානය නව සන්නාමයකින් **මහවැලි ආරක්ෂක බලකාය** වශයෙන් සංශෝධනය කරන ලදී.

කෙසේ වුවද 2011 වර්ෂයේදී බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනයේ දී මෙම ආයතනයේ එතෙක් පැවති අධ්‍යක්ෂ (ආරක්ෂක) තනතුර අහෝසි කර ඒ වෙනුවට සහකාර අධ්‍යක්ෂ (ආරක්ෂක) තනතුර ස්ථාපිත කරමින් ඒ වන විට අධ්‍යක්ෂ (ආරක්ෂක) තනතුරේ රාජකාරි ඉටු කරමින් සිටි අධ්‍යක්ෂවරයා ඔහුගේ තනතුරට පුද්ගලික වන සේ තබා ඇති බව දැන්වේ. ඒ අනුව දැනට මහවැලි ආරක්ෂක බලකායට නායකත්වය දෙනු ලබන්නේ සහකාර අධ්‍යක්ෂ (ආරක්ෂක) විසිනි.

එසේම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ අලුතෙන් ඉදි වූ හා ආරම්භ කළ මොරගහකන්ද , කළු ගඟ , ආදී සුවිශාල ජලාශ වල ආරක්ෂක වගකීම මෙන්ම රඹකැන්ඔය , ඊ කලාපය , මාදුරුඔය දකුණ ඉවුර , මයුරපුර වන අලි කළමනාකරණ රක්ෂිතය ආදී ස්ථාන වලද ආරක්ෂක කටයුතු මේ වන විට මෙම බලකාය මඟින් ඉටු කරනු ලැබේ. විශේෂයෙන් මේ වන විට රටේ පවතින තත්ත්වය අනුව මුල් අවධියේ පැවති කාර්යභාරයට වඩා ආරක්ෂක විෂය පථය පුළුල් වීමත් සමඟ සුවිශේෂී ආරක්ෂක මර්මස්ථාන සම්බන්ධ වගකීම වත්මන මෙම අංශයට පැවරී ඇති අතර ඒ අනුව **වික්ටෝරියා , කොත්මලේ , රන්දෙණිගල , පොල්ගොල්ල , රන්ටැඹේ , මාදුරුඔය , මොරගහකන්ද , කළු ගඟ , බෝවතැන්න , උඩවලව ඇතුලු මහවැලි අධිකාරියට අයත් ප්‍රධාන ජලාශ හා වාරි පද්ධති ගොඩනැගිලි හා දේපොළ ආරක්ෂා කිරීම් , ඉඩම් හා වන සංරක්ෂණ කටයුතු , කාර්යාල , වැඩ බිම් , ගොවිපොළ හා ව්‍යාපාරික ස්ථාන ආරක්ෂා කිරීම අනවසර ක්‍රියාකාරකම් වැළැක්වීම , අල්ලස් ගැනීම් වැනි නීති විරෝධී ක්‍රියා පාලනය කිරීම , ආරක්ෂක කටයුතු සංවිධානය කිරීම , බුද්ධි තොරතුරු රැස් කිරීම, විශේෂිත ආරක්ෂක මෙහෙයුම් සැළසුම් කිරීම , මහවැලි අධිකාරියේ නිලධාරීන් සඳහා ආරක්ෂාව සැපයීම , මහවැලි අධිකාරියේ පොදු අවශ්‍යතා සඳහා ආරක්ෂක සහය ලබා දීම , ප්‍රභූ ආරක්ෂාව සැපයීම සහ ජාතික ආරක්ෂාවට සහය ලබා දීම** වැනි වගකීම් සහගත කාර්යභාරයක් මේ වන විට මෙම බලකායට පැවරී ඇත.

ප්‍රධාන අරමුණු

- මහවැලි සංවර්ධනය යටතේ ඉදි කරනු ලැබූ ප්‍රධාන ජලාශ , ඇළවේලි හා ගොඩනැගිලි ඇතුලුව 1979 අංක 23 දරණ පනත ප්‍රකාරව නිශ්චල හා චංචල දේපළ , කායමණ්ඩල සහ කොන්ත්‍රාත්කරුවන් විසින් භාර දෙන ලද ව්‍යාපෘති හා දේපළ වලට ආරක්ෂාව ලබා දීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සියලුම කාර්යාල සංකීර්ණ , ගොඩනැගිලි , ගබඩා පරීශ්‍ර ආදියට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් කාර්යමණ්ඩලවලට හා ජනපදිකයින්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම.

අනෙකුත් රාජකාරින් හා කාර්යභාරය

- ගරු මහවැලි සංවර්ධන අමාත්‍යතුමා හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමන්ලා ඇතුළු මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ , ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රභූ සම්මාන සහ ප්‍රභූ ආරක්ෂක රාජකාරින් මහවැලි ක්‍රීඩා සහ අනෙකුත් විශේෂ උත්සව සඳහා අවශ්‍ය සම්මාන සහ ආරක්ෂක රාජකාරින් ඉටු කිරීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දේපළ ආරක්ෂාව සම්බන්ධයෙන් යුද හමුදාව හා පොලිසිය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු මුදල් හා වටිනා දේපළ ප්‍රවාහනයේ දී ආරක්ෂාව සැපයීම.

- මහවැලි ආරක්ෂක බලකායට හා අනෙකුත් ආයතන වලට අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම.

- මහවැලි ආයතනයන් හි ප්‍රධාන නිලධාරින්ට සහ ව්‍යාපෘතිභාර නිලධාරින්ට ඔවුන් සේවය කරන ආයතන වල මුරකරුවන්ගේ රාජකාරින් අධික්ෂණය කිරීමෙන් සහය වීම.

- මහවැලි අධිකාරියේ සහ ඊට අයත් ආයතන වල සොරකම් අයතා පාවිච්චිය සහ වංචා නැවැත්වීමට කටයුතු කිරීම හා එසේ කරන පුද්ගලයින්ට විරුද්ධව කටයුතු කිරීම.

- මහවැලි අධිකාරි පනත යටතේ මහවැලි ප්‍රදේශවල අනවසර පදිංචි වීම් , අනවසර ඉදි කිරීම් හා අනවසර කටයුතු වැළැක්වීම.

- මහවැලි අධිකාරියට අයත් පුපුරන ද්‍රව්‍ය , අවි ආයුධ ,පතරොම් යන ද්‍රව්‍ය තබාගැනීම , ආරක්ෂා කිරීම , බෙදා හැරීම හා ගිණුම්ගත කිරීම.

- මහවැලි අධිකාරියට හා ඊට අයත් ආයතන වලට ආරක්ෂක උපදේශන සේවා සැපයීම.

- මහවැලි අධිකාරිය , කාර්යමණ්ඩලවලට හා ජනපදිකයින්ට අවශ්‍ය පරිදි ආරක්ෂක පුහුණුවීම් පැවැත්වීම.

මහවැලි ආරක්ෂක බලකායේ ප්‍රධාන කාර්යභාරය ඉහත පරිදි වන අතර , එය රජයේ වාරිමාර්ග අමාත්‍යාංශයේ මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී සහ එයට අනුකූල වන දේපළ හා පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා සැකසූවකි. මෙහි කාර්යභාරය ක්‍රියාවට නැංවීමේ දී **මහවැලි ආරක්ෂක බලකායට අණ දීම සහ උපදෙස් දීම සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙක් ද ඒ යටතේ මෙහෙයුම් අංශයක් ද , ක්ෂේත්‍රයේදී එම අණ සහ උපදෙස් ක්‍රියාවට නැංවීමට බල ප්‍රදේශ 10ක් ද , අවශ්‍ය පරිදි ආරක්ෂක නිලධාරින් සහ ආරක්ෂක නියාමකයින්ගෙන් සමන්විත විශාල , මධ්‍යම හා කුඩා වශයෙන් අනුබණ්ඩයන් 42ක් ද දැනට ස්ථාපිත කර ඇත** . එසේම සියළුම නිළයන්ගේ පාලන හා වැටුප් ගෙවීම් ආදි ගිණුම් කටයුතු ඉටු කරලීම සඳහා 50 දෙනෙකුගෙන් පමණ සමන්විත සිවිල් කාර්යමණ්ඩලයක් ද සේවයේ නිරත අතර දිගන මෙම බලකා මුලස්ථානය මඟින් එකී කටයුතු ඉටු කරනු ලැබේ . ඒ අනුව 2021 නොවැම්බර් මාසය වන විට අප බලකායේ සම්පූර්ණ ආරක්ෂක කාර්යමණ්ඩලය 620කි .

එම ආරක්ෂක රාජකාරින් ඉටු කරන ආරක්ෂක නිළයන් මනා සංයමයකින් හා විනයකින් යුතුව රාජකාරී කටයුතු වල නියැලීම පිණිස අවශ්‍ය ස්ථාවර නියෝග හා උපදෙස් නිකුත් කර ඇත.

මහවැලි ආරක්ෂක බලකාය රජයේ වෙනත් සිවිල් ආරක්ෂක ආයතන වලට වඩා මනා නිපුණත්වයකින් ද , අවි ආයුධ සන්නද්ධව සැකසුන විධිමත් ආරක්ෂක අංශයකි.

2022 වර්ෂයේ අත් පත් කර ගත් ඉලක්ක හා විශේෂ සිදුවීම්

තවද 2022 වර්ෂයේ මූල් කාල වකවානුවේ සිටම ඇති වූ දැඩි ආර්ථික හා දේශපාලන අර්බුදකාරී තත්ත්වය මත අතිකාල දීමනා වැනි දීමනා කප්පාදු කිරීම් , විශාල නිළයින් ප්‍රමාණයක් වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා විශ්‍රාම ලබා ගැනීම , නව නිළයින් බඳවා නොගැනීම වැනි හේතූන් නිසාවෙන් ආරක්ෂක රාජකාරී පවත්වාගෙන යෑමේදී දැඩි අර්බුදකාරී තත්ත්වයන් ඇති වුවද ඉතාමත් සීමිත වූ බල සංඛ්‍යාව මනා කළමනාකරණයකින් යුතුව රාජකාරී යෙදවීම තුළින් ආරක්ෂක රාජකාරී අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා මෙන්ම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලු නිශ්චල හා චංචල දේපළ සුරැකීම සඳහා මෙම බලකායේ රාජකාරී නිරත ආරක්ෂක නිළයින් ඉමහත් පරිශ්‍රමයක් හා දැඩි කැපකිරීමක් සිදු කළ බව ද අභිමානයෙන් යුතුව සිහිපත් කරමු.

එසේම මහවැලි ආරක්ෂක බලකායේ ආරක්ෂක කටයුතු විධිමත්ව හා අඛණ්ඩව පවත්වාගෙන යෑමේ අරමුණින් මෙම බලකායේ ආරක්ෂක කටයුතු සඳහා 2021 වර්ෂයේදී මිළදී ගත් ESCORT AIMGUARD වර්ගයේ රිපීටර් ගිනි අවි සඳහා SG NO 12 ජීව පතුරම් 4700ක් දින මිළදී ගැනීමට ඉකුත් 2022 වර්ෂයේදී හැකි විය.

තවද 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ ජනරාල් තුමා (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය)ගෙන් ලද අනුමැතිය අනුව පවත්වාගෙන ගිය ESCORT AIMGUARD වර්ගයේ රිපීටර් ගිනි අවි පිළිබඳව පුහුණු වැඩමුළුවේ ඉදිරි අදියරයන් වශයෙන් 2022 මාර්තු 24 දින සිට 2022 මාර්තු 24 දින දක්වා බී කලාපයේ ආරක්ෂක නිළයින් උදෙසාද , 2022 ඔක්තෝබර් 15 දින දිගන ආරක්ෂක අනුබණ්ඩයේ රාජකාරී නිරත ආරක්ෂක රාජකාරී නිරත නිළයන් උදෙසාද පැවැත්වීම තුළින් කෙතරම් අර්බුදකාරී තත්ත්වයන් පැණ නැගුනද 2022 වර්ෂය අවසන් වන විට මෙම බලකායේ සම්පූර්ණ බල සංඛ්‍යාවෙන් විශාල පිරිසක් උදෙසා එකී පුහුණු වැඩමුළුව ඉතා සාර්ථකව පවත්වා අවසන් කිරීමට හැකි වීම අප බලකාය ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය.

රන්දෙණිගල අනුබණ්ඩයේ දීර්ඝ කාලයක් පුරාවට පැවති රිලවුන්ගෙන් ඇති වන හානිය අවම කරගැනීම සඳහා එම අනුබණ්ඩය වෙත වායු රයිෆලයක් මිළදී ගෙන දීමද 2022 වර්ෂයේදී මෙම බලකාය අත්පත් කර ගත් තවත් ඉලක්කයක් බව සිහිපත් කරමි.

එමෙන්ම මෙම බලකායේ රාජකාරී නිරත ආරක්ෂක සුපරීක්ෂකයින් / ආරක්ෂක සුපරීක්ෂක සහකාරවරුන් හා ආරක්ෂක ආරක්ෂක නියාමකයින් 582 ක් උදෙසා රාත්‍රී නිළ ඇඳුම් සඳහා අවශ්‍ය නිළ ඇඳුම් රෙදි සහ ප්‍රාදේශීය කලමනාකාරවරුන් හා ආරක්ෂක නිලධාරීන් 14 දෙනෙකු උදෙසා සෆාරි නිළ ඇඳුම් 02 බැගින් ලබාදීම සඳහා අවශ්‍ය රෙදි මිළදී ගැනීමටද 2022 වර්ෂයේදී හැකි විය.

එසේම මොරගහකන්ද කලාපයේ ආරක්ෂක රාජකාරී අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යෑමේ අරමුණින් එම කළාපයේ භාවිතය සඳහා මොරගහකන්ද අනුබණ්ඩය හා කළුගඟ අනුබණ්ඩය ආවරණය වන පරිදි ස්ථාවර

ගුවන් සංඥා කුළුනු දෙකක් සහ ස්ථාපිත ගුවන් සංඥා යන්ත්‍ර දෙකක් සවි කිරීමද මෙම බලකාය ලද තවත් සුවිශේෂී ජයග්‍රහණයකි.

තවද 2022 නොවැම්බර් 03 දින මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ භාවිත කළ අංක 32 - 3343 දරණ පෙජරෝ රථය සහ 50 - 3804 දරණ ඩබල් කැබ් රථය මෙම මූලස්ථාන කාර්යාලය වෙත ලබා ගැනීමෙන් මෙම බලකායේ ප්‍රවාහන කටයුතු වඩාත් විධිමත්ව පවත්වාගෙන යෑමට මනා රුකුලක් වූ බවද සිහිපත් කරමි.

2022 අත්පත් කර ගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය

ගිණුම් අංකය

2003 ණය පොලී ආදායම	1.05
2005 දඩ පොලී ආදායම	0.04
2008 නොගෙවන ටෙන්ඩර් තැන්පතු	--
2010 විවිධ ආදායම්	--
එකතුව	**1.09**

මූල්‍ය ප්‍රගතිය

			මිලියන
2021	වෙන් වූ මුදල		57.7
2005	ඉලක්කය		57.7
2008	ප්‍රධාන කාර්යාලයෙන් ලැබූ මුදල	57.7	
2010	වියදම් වූ මුදල		48.5
			1.6

4.5 ප්‍රවාහන අංශය.

හැඳින්වීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය වන සේවාවන් අතර ප්‍රමුඛ කාර්යය භාරයන් ප්‍රවාහන අංශය වෙත පැවරෙයි. ඒ සඳහා ආයතනයේ ප්‍රවාහන සේවාව, ආයතනය තුළ පවතින භෞතික හා ශ්‍රම සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගෙන කඩිනම් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලෙස ආර්ථික, සාමාජීය හා පාරිසරික බලපෑම් අවම කරගනිමින් විධිමත් අයුරින් පවත්වාගෙන යාම ප්‍රවාහන අංශයේ මූලික කාර්යය ලෙස දැක්විය හැකිය.

නව සංකල්ප හා නවීන තාක්ෂණ ක්‍රමවේද වෙත අනුගත වෙමින් පරිසර හිතකාමී සේවාවන් ලෙස පවත්වාගෙන යාම යුගයේ අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉටුකිරීමට නිවැරදි මඟ පෙන්වීම, අවශ්‍ය උපදෙස් ලබා දීම, සංචිත වාහන කළමනාකරණය කිරීම නිවැරදි මඟකට යොමු කිරීම තුළින් වඩාත් ඵලදායි පරිසර හිතකාමී කාර්යක්ෂම සේවාවන් ලබා දීම අපගේ පරමාර්ථය වේ. අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය රජයට වැය බරක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු බවත්, එහි ආදායම් උපද්දවා හෝ ලාභ ලබන ආයතනයක් ලෙස ඉදිරියට කටයුතු කල යුතු බවටත් මහා භාණ්ඩාගාරය (මුදල් අමාත්‍යාංශය) විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව, ඉදිරි කටයුතු සැලසුම් කිරීමේදී ප්‍රවාහන කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරවන ලදි.

අංශයේ ප්‍රධාන කාර්යයන් හා වගකීම

අධිකාරියට අයත් සියලුම වාහන සම්බන්ධයෙන් වගකීම, සියලුම වාහනවල අලුත්වැඩියාව හා නඩත්තුව හා වාහන නඩත්තු සහ ඉන්ධන සඳහා වාර්ෂික වියදම් සකස් කිරීම, ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික නියමිත දිනට යාවත්කාලින කිරීම,රාජකාරී සඳහා නිලධාරීන් වෙත වාහන වෙන් කිරීම, රියදුරන්ට සහ රිය සහයකයන්ට රාජකාරී පැවරීම, වාහන ලැයිස්තුවක් සකස් කිරීම සහ යාවත්කාලින කිරීම, වාහන වලට සිදුවන හදිසි අනතුරු අවස්ථාවලදි විධිමත් ක්‍රියා පරිපාටිය කටයුතු කිරීම, කලාප සහ ප්‍රාදේශිය කාර්යාලවල ප්‍රධානීන් සහ ප්‍රවාහන නිලධාරීන් සමඟ අදාළ විෂය සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම, වාර්තා ලබා ගැනීම සහ යාවත්කාලින කිරීම ආදිය ප්‍රවාහන අංශයේ ප්‍රධාන කාර්යයන් හා වගකීම් වේ

පස්වන පරිච්ඡේදය
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පිහිටවනු ලැබ ඇති සමාගම්
I කොටස

සමාගම් පනතේ යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදුකළ ව්‍යාපාරික කටයුතු වලින් කොටසක් කළමනාකරණ සඳහා පහත සඳහන් පෞද්ගලික සමාගම් වෙත පවරා දී ඇත.

- සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික)සමාගම
  Mahaweli Livestock & Agro Enterprises (Pvt) Ltd
- සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශය (පුද්ගලික)සමාගම (MCB)
  Mahaweli Consultancy Bureau (Pvt) Ltd
- ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික)සමාගම(NRMS)
  Natural Resources Management Services (Pvt) Ltd

2021 වර්ෂය තුළ සමාගම් වල කාර්යය සාධනය

අ.අ.	සමාගම	වර්ෂය තුළ ඉටුකළ කාර්යයතත්වය/
01	සීෘස මහවැලි පශු සම්පත් හා කෘෂි / සමාගම (පුද්) ව්‍යාපාරික	▪ පළාතේ කිරි ගොවීන්ගෙන් කිරි එකතු කිරීම හා ඔවුන්ට එමඟින් සේවාවන් සැපයීම. ▪ කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා ඒ නිෂ්පාදන මහවැලි කලාප සහ අවට ප්‍රදේශ වල අලෙවි කිරීම. ▪ පුං ගවයන් ලෙස යොදා ගැනීම සඳහා මීගවයන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දීම. ▪ 2021 වසරේ මුල් කාර්තු දෙක තුළදී තත්වයෙන් උසස් බ්‍රොයිලර් මස් නිෂ්පාදනය කර අලෙවිය. ▪ මහකන්නයේ ගිරාදුරුකෝට්ටේ සත්ව ගොවිපල අක්කර 200 ක් බඩ ඉරිගු වගාව සඳහා ගොවීන් වෙත ලබා දීම සහ කුඹුරු අක්කර 25 ක් කුඹුරු වගා සිදු කර ඇත. ▪ දම්මින්න සත්ව ගොවිපලේ කන්න දෙකක් බිත්තර වී සඳහා හෙක්ටයාර 08 (අක්කර 20) වගා කර ඇත. ▪ සුළු වශයෙන් ඩ්‍රැගන් පෘට් වගාව
02.	සීස මහවැලි උපෙද්ශ/ සේවා කාර්යාංශය සමාගම (පුද්)	මෙම සමගම 2020.12.30දින සිට වාරිමාර්ග අමාත්‍යාංශයට මාරු වී ඇත.
.03	සීස ස්වභාවික සම්පත් කළමනාකරණ / සේවා පුද්ගලික සමාගම	ඈවර කිරීමට තීරණය කිරීමෙන් පසු සියලුම මූල්‍ය ප්‍රකාශන නීති අංශයට භාර දී ඇත.

වාර්ෂික ගිණුම්

II - කොටස

2022.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

			සමූහය			අධිකාරිය	
			රු '000	රු '000		රු '000	රු '000
			2022	**2021**		**2022**	**2021**
	සටහන්						
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපළ පිරියත හා උපකරණ	**(1)**		111,447,032	114,258,254		111,401,972	114,219,393
ආයෝජන (දිගු කාලීන)	**(2)**		235,989	23,104		636,565	421,485
අස්පෘෂ්‍ය වත්කම්			-	6		-	6
ප්‍රාග්ධන නොනිම් වැඩ			8,738	31,390		8,738	31,390
ජංගම නොවන වත්කම් එකතුව			111,691,760	114,312,754		112,047,276	114,672,274
පෛව වත්කම් - ප්‍රාග්ධන	**(3)**		320,905	286,717		309,674	278,294
ජංගම වත්කම්							
භාණ්ඩ/ තොග	**(4)**		270,140	276,905		264,778	273,724
පෛව වත්කම් - වෙළඳ	**(3)**		119,708	41,118		119,386	40,242
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**(5)**		4,576,005	3,471,407		4,566,296	3,462,625
බැංකු ඇපකර							
මුදල් හා මුදල් සමාන දෑ	**(6)**		272,418	1,177,597		271,802	1,175,376
ජංගම වත්කම් එකතුව			5,238,270	4,967,027		5,222,261	4,951,967
වත්කම් එකතුව			**117,250,935**	**119,566,498**		**117,579,210**	**119,902,534**
බැරකම්							
ජංගම බැරකම්							
ගෙවිය යුතු	**(7)**		39,760,813	39,819,011		39,721,101	39,815,804
උපචිත වියදම්	**(8)**		107,390	103,544		107,246	66,756
ජංගම බැරකම් එකතුව			39,868,202	39,922,555		39,828,347	39,882,560
ජංගම නොවන බැරකම්							
පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම්	**(9)**		1,413,100	1,343,221		1,400,912	1,332,168
විලම්බිත බදු							
ජංගම නොවන බැරකම් එකතුව			1,413,100	1,343,221		1,400,912	1,332,168
බැරකම් එකතුව			41,281,302	41,265,776		41,229,259	41,214,728
මුළු ශුද්ධ වත්කම්			**75,969,632**	**78,300,722**		**76,349,951**	**78,687,806**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය							
සමුච්චිත අරමුදල	**(10)**		70,823,574	73,877,177		70,823,574	73,877,177
සංචිත - ඉ/ගෙ ආදායම් හා වියදම් ගිණුම් ශේෂය			(2,723,686)	(1,238,559)		(2,338,096)	(844,052)
ආදායම් සංචිත - සමාගම්							
ප්‍රත්‍යාගණන සංචිත			7,869,744	5,662,104		7,864,472	5,654,681
ශුද්ධ වත්කම්/ ස්කන්ධය එකතුව			**75,969,632**	**78,300,722**		**76,349,951**	**78,687,806**

2022.12.31 අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යාලය පිළිබඳ ප්‍රකාශය

සමූහය	අධිකාරිය				සමූහය	අධිකාරිය
රු '000	රු '000				රු '000	රු '000
2021	2021				2022	2022
				<u>උපලේඛණය</u>		
			<u>ආදායම්</u>	(01)		
304,110	304,110		කුලී		309,934	309,934
653,583	653,583		රාජ්‍ය භාග		326,583	326,583
8,859	-		ගොවිපළ නිෂ්පාදන විකිණුම්		20,617	-
6,478	6,478		ආයෝජන ආදායම් (සමාගම්)		5,045	5,045
3,336,532	3,336,532		වෙනත් ආදායම්		3,342,394	3,342,394
4,309,562	4,300,703		**උත්පාදිත ආදායම**		4,004,572	3,983,955
			භාණ්ඩාගාර ප්‍රදාන -			
2,161,937	2,161,937		පුනරාවර්තන	(02)	3,030,026	3,030,026
3,314,843	3,314,843		- ප්‍රාග්ධන		366,518	366,518
-	-		- කෘෂිකර්ම හා පශු සම්පත්		160,741	160,741
-	-		විශාල හා මධ්‍යම වාරිමාර්ග ප්‍රතිසංස්කරණය		-	-
9,786,341	**9,777,483**				**7,561,856**	**7,541,240**
			<u>**අඩු කිරීම : වියදම්**</u>	(03)		
2,817,807	2,815,516		පුද්ගලික පඩි නඩි		2,960,628	2,958,451
86,400	86,343		ගමන් වියදම් හා යැපුම් දීමනා		76,206	75,954
154,543	154,543		සැපයුම්/ ප්‍රවාහන		213,750	213,750
440,492	440,492		නඩත්තු වියදම්		405,750	405,750
134,151	134,100		ගිවිසුම්ගත සේවා		127,263	127,203
1,950	1,950		රක්ෂණය		1,854	1,854
97,007	91,633		අනෙකුත් වියදම්		93,800	87,012
3,242,826	3,240,416		ක්ෂය වීම්		4,150,274	4,147,853
2,495,308	2,495,308		ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම් හා වෙනත් නඩත්තු කටයුතු, ප්‍රජා සංවර්ධනය හා වෙනත් ජානපදික සේවා	(04)	1,262,470	1,262,470
36,400	36,400		සංචාරක බංගලාවේ ලාභය /අලාභය	(05)	37,712	37,712
6,806	6,806		සංවර්ධන මධ්‍යස්ථානයේ ලාභය/අලාභය - ඕරාදුරුකොට්ට		7,326	7,326

5,950	5,950		ජල කළමණාකරණ ව්‍යාපෘතියේ ලාභය/අලාභය		6,872	6,872
34,430	34,430		පැළ තවාන් ලාභය/අලාභය	**(06)**	21,915	21,915
25,748	25,748		ගොවිපළේ ලාභය/අලාභය	**(07)**	24,264	24,264
632	632		යාන්ත්‍රික වැඩපොළේ ලාභය/අලාභය	**(08)**	(3,539)	(3,539)
293	293		හෙළ බොජුන් හල් ලාභය/අලාභය		204	204
(459,736)	(459,736)		මොරගහකන්ද විදුලි බලාගාරය ලාභය/අලාභය		(339,913)	(339,913)
9,121,007	**9,110,823**		**මෙහෙයුම් වියදම් එකතුව**		**9,046,837**	**9,035,138**
665,334	666,660		**මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ලැබූ අතිරික්තය/ (ඌනතාවය)**		(1,484,980)	(1,493,898)
506	506		එකතු කිරීම. ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභය/ අලාභය	**(9)**	(147)	(147)
665,841	**667,166**		**බදු පසු ලාභය**		(1,485,127)	(1,494,045)
	-					
(1,156,391)	(763,578)		2022.01.01 දිනට ඉ/ගෙන ආ ශේෂය		(1,238,559)	(844,051)
(490,550)	**(96,412)**		**ඉදිරියට ගෙන යන ශුද්ධ අතිරික්තිය (ඌනතාවය)**		**(2,723,686)**	**(2,338,096)**

2022 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		සමූහය		අධිකාරිය
		(රු '000)		**(රු '000)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		(1,485,127)		(1,494,045)
මුදල් නොවන වෙනස් වීම්				
	ක්ෂය වීම්	5,187,501		5,185,079
	පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම	69,879		68,744
	වැඩිවූ පෙව වත්කම් උපයාගැනීම්	(34,188)		(31,380)
	වත්කම් මාරුකිරීම්	(8,779)		(8,779)
	වත්කම් පවරා දීම්	473		147
	මෙහෙයුම් ක්‍රියාකාරකම්			
	තොග වැඩිවීම/ අඩුවීම	6,765		8,946
	පෙව වත්කම් වැඩිවීම/ අඩුවීම - වෙළඳ	(78,590)		(79,143)
	වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	(1,104,598)		(1,103,670)
	බැංකු ඇපකර වැඩිවීම/ අඩුවීම			
	ගෙවිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	(58,198)		(94,703)
	උපචිත වියදම්වල වැඩිවීම/ අඩුවීම	3,846		40,490
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**2,498,983**		**2,491,687**
ආයෝජන ක්‍රියාකාරකම්				
	දේපළ පිරියත හා උපකරණ මිලදි ගැනීම්	(151,976)		(151,781)
	දේපළ පිරියත හා උපකරණ නැවත අගය කිරීම	(8,750)		-
	අස්පෘෂ්‍ය වත්කම් වැඩිවීම	6		6
	වත්කම් විකිණීමෙන්	2,545		2,545
	ආයෝජන වැඩිවීම/ අඩුවීම	(212,885)		(215,080)
	නොනිමි වැඩ වැඩිවීම/ අඩුවීම	22,651		22,651
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(348,409)**		**(341,658)**
මූල්‍ය ක්‍රියාකාරකම්				
	මූල්‍ය ගාස්තු වැඩිවීම්/අඩුවීම්	-		-
	සමුච්චිත අරමුදලේ හා සංචිතවල වැඩිවීම/ අඩුවීම	(3,053,603)		(3,053,603)
	සංචිත නැවත ඇගයීම් වැඩිවීම/ අඩුවීම	(2,151)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(3,055,754)**		**(3,053,603)**
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩු වීම).		**(905,179)**		**(903,574)**
01.01.2022 වන විට මුදල් හා මුදල් සමාන දෑ		1,177,597		1,175,376
31.12.2022 වන විට මුදල් හා මුදල් සමාන දෑ		**272,418**		**271,803**

ස්කන්ධය වෙනස්වීම් දක්වන ප්‍රකාශය - සමූහය

	රු.'000	රු.'000	රු.'000	රු.'000
විස්තරය	ඒකාබද්ධ අරමුදල	සංචිත	ආදායම් හා වියදම්	එකතුව
2021.01.01. දිනට ශේෂය	76,779,867	5,626,304	(1,156,391)	81,249,780
වසර තුළ	282,781	-	665,841	948,621
විලම්බිත ආදායම	(3,187,920)			(3,187,920)
2021.12.31 දිනට ශේෂය	**73,874,727**	**5,626,304**	**(490,550)**	**79,010,481**
2022.01.01 දිනට **ශේෂය**	**73,877,177**	**5,662,104**	**(1,238,559)**	**78,300,722**
වසර තුළ	151,976	2,207,640	(1,485,127)	**874,489**
විලම්බිත ආදායම	(3,205,579)			**(3,205,579)**
2022.12.31 දිනට **ශේෂය**	**70,823,574**	**7,869,744**	**(2,723,686)**	**75,969,633**

ස්කන්ධය වෙනස්වීම් දක්වන ප්‍රකාශය - මහවැලි අධිකාරිය

	රු.'000	රු.'000	රු.'000	රු.'000
	ඒකාබද්ධ	සංචිත	ආදායම් හා	එකතුව
	අරමුදල	-	වියදම්	**81,647,912**
2021.01.01. දිනට ශේෂය	76,779,867	5,618,881	(763,578)	81,635,170
වසර තුළ	282,781	-	667,166	949,947
විලම්බිත ආදායම	(3,187,920)	-	-	(3,187,920)
2021.12.31 දිනට ශේෂය	**73,874,727**	**5,618,881**	**(96,412)**	**79,397,197**
2022.01.01 දිනට **ශේෂය(නැවත සඳහන් කර ඇත)**	73,877,177	5,654,681	(844,051)	79,397,197
වසර තුළ	151,781	2,209,791	(1,494,045)	867,528
විලම්බිත ආදායම	(3,205,384)	-	-	(3,205,384)
2022.12.31 දිනට **ශේෂය**	**70,823,574**	**7,864,472**	**(2,338,096)**	**77,059,341**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1.) **වාර්තාකරන ඒකකය**

1979 අංක 23 දරණ පනත යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යයන් එම පනතේ 12 වගන්තියෙහි දක්වා ඇති අතර මහවැලි සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය එමගින් පැවරී ඇත.
මහවැලි පනත අනුව යම් විශේෂ ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත දැක්වෙන කර්තව්‍ය විය යුතුය

(අ) ජලාශ, වාරිමාර්ග බෙදා හැරීමේ පද්ධතිය සහ විදුලි බල උත්පාදනය සහ සැපයීම සඳහා ස්ථාපනයන් ඉදිකිරීම හා මෙහෙයවීම ඇතුළුව මහවැලි ගංගා සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

(ආ) එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍යය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් සිදු කරනු ලැබිය හැකිය.

(ඇ) යම් විශේෂ ප්‍රදේශයක පූර්ණ හා ඒකාබද්ධ සංවර්ධනයට ප්‍රතිශ්ඨාධාර වීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම ;

(ඈ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ කෘෂිකාර්මික ඵලදා වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් ප්‍රශස්ත තත්ත්වයට පත් කිරීම සහ ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම සහ එම සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඉ) කිසියම් විශේෂ ප්‍රදේශයක භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ පවත්වා ගෙන යාම

(ඊ) ඕනෑම විශේෂ ප්‍රදේශයක ප්‍රජාවගේ පොදු සුබසාධනය සහ සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ එම ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කිරීම ;

(ඊ) ඕනෑම විශේෂ ප්‍රදේශයක ආර්ථික හා කෘෂිකාර්මික දියුණුව සඳහා අභ්‍යන්තර හා බාහිර වූ උභය පුද්ගලික ප්‍රාග්ධනය යෙදවීම නංවාලීම හා සුරක්ෂිත කිරීම ; සහ

(එ) මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීමෙහි සහ ක්‍රියාවට නැඟීමෙහි දී මෙන්ම යම් විශේෂ ප්‍රදේශයක් සංවර්ධනය කිරීමෙහි දී ද රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය
ආයතනවල, පළාත් පාලන ආයතනවල, රජයේ සංස්ථාවල සහ පෞද්ගලික හෝ රජයේ වූ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ එය නංවාලීම .

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කිරීම සඳහා අධිකාරියට පැවරී ඇති බලතල එම පනතේ 12 වැනි වගන්තියේ දක්වා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලිත සමාගම් හතරකින් සහ ආශ්‍රිත සමාගමකින් සමන්විත වේ. එනම් මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම, සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම සහ සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම වේ.

සියලුම අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිත සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති අතර, පහත සඳහන් මූලික කර්තව්‍යයන් සිදු කරයි.

සමාගම්වල කොටස් ප්‍රාග්ධනය ගැන විස්තර පහත පරිදි වේ.

	සමාගම	කොටසක මිල	සම්පූර්ණයෙන් ගෙවා නිකුත් කරඇති කොටස් ගණන	මහවැලි අධිකාරියට නිකුත් කර ඇති කොටස් ගණන
1	සීමාසහිත මහවැලි උපදේශක කාර්යංශ (පුද්ගලික) සමාගම	රු. 10	6385	6384
2	සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම	රු. 10	1502	1500
3	මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම	රු. 10	1,039,803	1,039,800
4	සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම	රු. 10	3	-

<u>මහවැලි සමාගම් වල මූලික කර්තව්‍යයන්</u>
පරිපාලිත

අ) මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම

අ) මහවැලි ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් ලබාදීම

ආ) සමාගම සඳහා අරමුදල් උත්පාදනය කිරීම සඳහා වාණිජ ව්‍යවසාය ආයෝජන කටයුතු කිරීම

ආ) සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම

(අ) ස්වභාවික සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය යටතේ එන නිර්මාණ සැලසුම, පුහුණුකිරීම්, ද්‍රව විද්‍යාත්මක අධීක්ෂණය, ඉඩම් භාවිතා සිතියම්කරණය, ජලාධාර ප්‍රදේශ සංරක්ෂණය සහ වනය ආශ්‍රිත කටයුතු පිළිබඳව වෘත්තීයමය උපදෙස් හා සේවා සැපයීම.

ආ) තොරතුරු සහ දත්ත සැපයීම සහ ශක්‍යතා අධ්‍යයන,
පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනය (EIA), මූලික පාරිසරික ඇගයීම් වාර්තා (IEER) ආදිය සකස් කිරීම

ඇ) සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම

(අ) මහවැලි ගොවීන්ට උසස් ගුණාත්මක බවින් යුත් සතුන් සැපයීම .
(ආ) කිරි හා මාංශ නිෂ්පාදනය හා අළෙවිකරණය

ඈ) සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම

අ) ගොඩනැගිලි, වාරිමාර්ග සහ ඉඩම් ජලාපවහන සහ මාර්ග ආදි ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි උපදේශන සේවා සැපයීම.
ආ) ගොඩනැගිලි, වාරිමාර්ග සහ ඉඩම් ජලාපවහන සහ මාර්ග ආදි ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම් කොන්ත්‍රාත්තු භාර ගැනීම .

ආශ්‍රිත සමාගම

ඉ) සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම

(අ) බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය හා අළෙවිය
(ආ) මහවැලි ගොවීන් සමඟ බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය කළ පසු මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළැඹීම.

කෙසේ වෙතත්, මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 දී මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම විසුරුවා හැරීමට තීරණය කළේය. එබැවින් මෙම සමාගමේ ගිණුම් ඒකාබද්ධ ගිණුම්වලට ඇතුළත් නොවේ. එවිට වත්කම් සහ බැරකම් සටහනක් ලෙස අනාවරණය කර ඇත.

2) පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම දක්වන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විතවේ. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම ප්‍රකාශන පිළියෙල කොට ඇත. අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තින් ඊට පෙර මූල්‍ය වර්ෂයේ අනුගමනය කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

.

2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම අනුවය. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනකාරි සාධක සඳහා ගැළපීමක් සිදු නොකරන ලදී

2.3 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කොට ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි. රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු ආසන්නතම දහසට වටයා ඇත.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල ප්‍රකාශිත වටිනාකම්වලට බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් ඇති තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන වලට එළැඹීමට කළමනාකාරීත්වයට සිදු වේ. ඓතිහාසික අත්දැකීම් සහ පවත්නා සංසිද්ධීන්ට අනුව සාධාරණ යැයි විශ්වාස කළ හැකි අපේක්ෂා ද ඇතුළත් වන පරිදි, තීන්දු හා ඇස්තමේන්තු පදනම් වේ. කරුණු එසේ හෙයින් සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල, එකී තීන්දු හා ඇස්තමේන්තු වලින් අපගමනය විය හැකිය.

මෙකී ඇස්තමේන්තු හා පාදක උපකල්පන, අඛණ්ඩ පදනමකින් විචාරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිශෝධනයක් සිදු කළේ නම්, එකී ප්‍රතිශෝධනයන් එකී කාලසීමාවට හා වෙනත් ඕනෑම අනාගත කාලසීමාවකට බලපාන්නේ නම් පමණක් එම ප්‍රතිශෝධනය එය සිදු කළ කාලසීමාව තුළ හඳුනා ගත යුතුවේ.

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි වෙනස් වීම්

පහත සඳහන් අවස්ථාවන්හි හැර ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ අනුගමනය කළ ප්‍රතිපත්තින්ම වේ.

2.5.1 ගොවිපළ, පැල තවාන් හා සංචාරක බංගලා ඒ ඒ මහවැලි කලාප යටතේ ඇති ආදායම් හා වියදම් ගිණුම් යටතේ වෙන වෙනම ගිණුම් ගත කරන ලදී.

2.5.2 ජෛව වත්කම් ඇගැයීමට ලක් කෙරෙන්නේ සාධාරණ වටිනාකමකින් යුතුවය. ලාභ හෝ අලාභ හඳුනාගනු ලබන්නේ ගොවිපල ගිණුමෙනි.

3) සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති එම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති කාලපරිච්ඡේදය සඳහාම අඛණ්ඩව අනුකූල වේ.

3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

3.1.1 මව් සමාගමේ සහ පරිපාලන සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම ද ඇතුළත්ව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, සකසා ඇත්තේ ඒකාබද්ධ ක්‍රමවේදයන් අඛණ්ඩව යොදාගනිමින් වාර්තාගත ප්‍රතිඵලය හා ස්කන්ධ ක්‍රමය පදනම අනුවය. ඒ අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තනි ආර්ථික ව්‍යුහයක් ලෙස පිළිඹිබු වන පරිදි ඒ පිළිබඳව මූල්‍ය තොරතුරු නිරූපණය කරනු ලබයි.

3.2 දේපළ, පිරියත හා උපකරණ

3.2.1 වත්කම්වල පිරිවැය එහි ප්‍රත්‍යාගණන වටිනාකම, ගැණුම් මිල හෝ ඉදි කිරීමේ පිරිවැය හා අදාළ වත්කම අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම අදාළ වන පිරිවැයෙන් සමන්විත වේ.

3.2.2 ක්ෂය ප්‍රතිපාදනය සියලු දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මත රේඛීය පදනමින් ගණනය කරන අතර එහිදී වත්කමක පිරිවැය එම වත්කම් වර්ගයේ ඇස්තමේන්තුගත ආයුකාලය සුදුසු කාලසීමාවක් පුරා හානිකරණය කරනු ලැබේ.වත්කමක් භාවිතය සඳහා පවතින අවස්ථාවේ ක්ෂයවීම් සිදු කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා ඇති බවට වර්ගීකරණය කරන දිනට පෙර නතර වේ. මෝටර් වාහන සම්බන්ධයෙන් පහත දක්වා ඇති ක්ෂයවීම් අනුපාත යෙදීමට පෙර 10% ක සුන්බුන් වටිනාකමක් අදාළ කරගනු ලැබේ.

3.2.3

1	ගොඩනැගිලි – කාර්යාල	2 ½ % වාර්ෂිකව
	වෙනත්	5% වාර්ෂිකව
2	මෝටර් වාහන	20% වාර්ෂිකව
3	දේපළ, පිරියත හා උපකරණ කාර්යාල උපකරණ සහ සුභසාධන අයිතම	15% වාර්ෂිකව
4	දේපළ, පිරියත හා උපකරණ - ජනන යන්ත්‍ර	15% වාර්ෂිකව
5	දේපළ, පිරියත හා උපකරණ - ඉදිකිරීම්	15% වාර්ෂිකව
6	දේපළ, පිරියත හා උපකරණ - පොදු	15% වාර්ෂිකව
7	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10% වාර්ෂිකව
8	පරිගණක සහ උපාංග	20% වාර්ෂිකව
9	ඇල මාර්ග	4% වාර්ෂිකව
10	වේලි	1% වාර්ෂිකව

3.3 ආයෝජන

3.3.1 ආශ්‍රිත සමාගමේ සිදුකළ ආයෝජන

ආශ්‍රිත සමාගමෙහි ආයෝජනය පිරිවැය අනුව ගිණුම්ගත කර ඇති අතර ශේෂ පත්‍රයේ දිගුකාලීන ආයෝජනයක් ලෙස වර්ගීකරණය කර ඇත. ආයෝජක සමාගමේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් අධිකාරියට සැලකිය යුතු බලපෑමක් නොමැති අතර එම නිසා ස්කන්ධ ක්‍රමය අනුගමනය කිරීම අනුචිත වේ.

3.3.2 අනෙකුත් ආයෝජන

අනෙකුත් ආයෝජන ශේෂ පත්‍රයේ දිගු කාලීන ආයෝජන ලෙස සලකනු ලබන අතර පිරිවැයට ගණනය කර දක්වා ඇත.

3.4 භාණ්ඩ තොග

භාණ්ඩ තොග තක්සේරු කර ඇත්තේ පිරිවැය හා නිෂ්කාෂණය ශුද්ධ වටිනාකම යන දෙනෙක් අඩු වටිනාකම අනුව වේ. අවශ්‍ය තැන්හි නිකුත් නොවන, දෝෂ සහගත හා යල්පැන ගිය තොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

3.5 වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රකාශ කොට ඇත්තේ නිෂ්කාෂණය කරගත හැකි වෙතැයි ඇස්තමේන්තු ගත වටිනාකම් මත වේ.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලට අයත් වන්නේ මුදල් ශේෂයන් හා ඉල්ලූ විට ගෙවිය යුතු බැංකු අයිරා ඇතුළත් වටිනාකම වන අතර එය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මුදල් කළමණාකරනයේ අනිවාර්ය අංගයක් වන එය මුදල්වල සංඝටයක් ලෙස අයත් ඇතුළත් වන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහාය

3.7 විදේශ ආධාර

ආධාර ලබා දෙන ආයතන විසින් 2012 දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද සමුච්චිත ගෙවීම්වල වාර්තා වී ඇති විදේශ ආධාර භාවිතා කිරීම. විදේශ මුදල් වලින් සිදුකරන ලද වියදම්, අදාළ ගෙවීම් සිදු කරන ලද දිනයන්හිදී පැවති විනිමය අනුපාත අනුව රුපියල්වලට පරිවර්තනය කර ඇත.

3.8 බැරකම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස වර්ගීකරණය ඇති බැරකම් යනු ඉල්ලූ විට ගෙවිය යුතු හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක කාලය ඇතුළත ගෙවා නිම කළ යුතු බැඳීම් වේ. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම ශේෂ පත්‍ර දිනයෙන් වසරකට වඩා කාලයක් පවතින බැඳීම් වේ.
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දැන සිටි සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

3.9 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම

සියලුම සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂික ලබාදීමට ප්‍රතිපාදන සලසා ඇත.පාරිතෝෂිත සඳහා සුදුසුකම් ලබන අඩමසක වැටුප, පළමු සේවා වසරේ පටන් සෑම වසර අගකදීම ගණනය කර මෙම ප්‍රතිපාදනය වෙන්කර ඇත.

3.10 ආදායම් ප්‍රකාශනය

3.10.1 මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලනය යටතේ පවතින ඉඩම් බදු දීමෙන් ලබන බදු කුලිය, නිල නිවාස වල කුලිය හා රාජ්‍යභාග, ආයෝජන වලින් ලබන ආදායම සහ පොලිය යනාදියෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආදායම සමන්විත වේ.

3.10.2 එම ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලැබීමට ඇති වැඩි සම්භාවිතාව අනුව සහ එය විශ්වාසනීය ලෙස මැනිය හැකි තරමට ආදායම ගණනය කර ඇත.
අනෙකුත් කුලී, රාජ්‍ය භාග, පොලී ආදායම උපචිත පදනම මත ගණනය කෙරේ.

3.10.3 රාජ්‍ය ප්‍රදානයන් " ප්‍රාග්ධන ප්‍රදානයන් හා පුනරාවර්තන ප්‍රදානයන්" ලෙස ප්‍රකාශ කරනු ලැබේ
පුනරාවර්තන ප්‍රදානයන්, අදාළ ප්‍රදානයන් මඟින් ගෙවීමට අපේක්ෂිත පිරිවැය වියදම් ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හඳුනා ගන්නා කාල සීමාවන්හි ක්‍රමානුකූල පදනමකින් යුක්තව, ලාභ අලාභ ගිණුමේ හඳුනා ගැනීම සිදු කෙරෙනු ලැබේ .

වත්කම්වලට අදාළ ප්‍රාග්ධන ප්‍රදානයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්බිත ආදායම් ලෙස නිරූපණය කරනු ලබයි. එය වත්කම්වල ඵලදායි ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනමින් මූල්‍ය කාර්යඵලය ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

3.11 වියදම

ආයතනයේ එදිනෙදා මෙහෙයුම් සඳහා වැයවන වියදම්,දේපළ පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් තබා ගැනීම සඳහා වැයවන වියදම් ඇතුළු සියලු වියදම් ආදායම් ප්‍රකාශනයේ සැලකිල්ලට ගෙන වසර සඳහා ලාභය/ අලාභය ගණනය කර ඇති අතර බොල් ණය හා අඩමාන ණය, දන්නා සියලු බැරකම් හා දේපළ, පිරියත හා උපකරණ වල ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් සිදු කොට ඇත.

3.12 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවුන සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා අදාළ අවස්ථාවල ගැළපීම් සිදු කර ඇත.

3.13 අවිනිශ්චිත අවස්ථා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට එරෙහිව ගොනු කර ඇති විවිධ නඩු සම්බන්ධයෙන් 2021.12.31 දිනට අසම්භාව්‍ය බැරකම රුපියල් මිලියන 62.631 කි.

3.14 විසිරුවා හැරීම

සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම ණයහිමියන් ස්වේච්ඡා විසුරුවා හැරීම යටතේ පවතී.

මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම
2020.12.31 දිනට වත්කම් හා බැරකම් (ණයහිමියන් ස්වේච්ඡා විසුරුවා හැරීම යටතේ)
සටහන

වත්කම්		2022 Rs.	2021 Rs.
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	07	3	3
වත්කම්	08	2,794,671	2,749,671
		2,794,671	**2,749,671**
ජංගම වත්කම්			
සිංගර් මැෂින් තොගය		29,480	29,480
පොළී ලැබිය යුතු	10	380,726	380,726
පුපුරණ ද්‍රව්‍ය පාලන ගිණුම		28,336	28,336
ආදායම් බදු ආපසු		62,008	62,008
වෙනත් ලැබියහැකි	11	25,000	25,000
භාණ්ඩාගා. බිල්		9,455,896	9,455,896
බැංකු මුදල්	12	6,229,626	4,466,061
අතැති මුදල්		2,521	2,521
		16,213,593	14,450,028
		19,008,267	17,244,702
මුළු වත්කම්			
ස්කන්ධය හා බැරකම්			
ස්කන්ධය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	06	10,398,000	10,398,000
අරමුදල් ලැබීම් ATI		150,325	150,325
අරමුදල් ලැබීම් EEC		10,000,000	10,000,000
අධිකාරියෙන් ලද මුදල		432,000	432,000
රඳවාගත් ලාභ/(පාඩු)		(2,433,223)	(4,196,788)
මුළු ස්කන්ධය		18,547,102	16,783,537
ජංගම බැරකම්			
උපචිත වියදම්	13	71,183	71,183
වත්කම්		2021 Rs.	2020 Rs.
විවිධ ණය හිමියන්		310,025	310,025
ශේෂ පිරික්සුමේ කලින් ලැබුනු පොළිය		79,957	79,957
මුළු බැරකම්		**461,165**	**461,165**
මුළු ස්කන්ධය හා බැරකම්		19,008,267	17,244,702

3.15 වේලි, ජලාශ, ඇලමාර්ග, මාවත්, වැව් හා අනෙකුත් ඉදිකිරීම් සහ ඉඩම් වත්කම්

2021.12.31දින විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ **වේලි, ජලාශ, ඇලමාර්ග, මාවත්, වැව් හා අනෙකුත් ඉදිකිරීම් සහ ඉඩම්** වල සාරාංශය පහත දක්වා ඇත.

3.15.1 වැව් ගණන

කලාපය	වැව් ගණන	මූල්‍ය යෙදවුම් (රු.මි)
බී කලාපය	84	6,790.00
සී කලාපය	56	21,100.00
ඩී කලාපය	23	1,380.00
ජී කලාපය	19	1,140.00
එච් කලාපය	127	21,913.85
එල් කලාපය	47	940.00
වලව	80	2,400.00
හුරුළුවැව	15	2,220.00
එකතුව	**451**	**59,163.85**

3.15.2 මාර්ග

කලාපය	වලව කලාපය(Km)	එල් කලාපය (Km)	බී කලාපය(Km)	මූල්‍ය යෙදවුම් (රු.මි)
ප්‍රධාන මාර්ග	100.00	51.0	549.0	21
ග්‍රාමීය මාර්ග	250.00	-	-	0.30
වෙළඳ පොල මාර්ග	12.5	-	-	0.015
කෘෂි මාර්ග	25.0	-	-	0.025
පාලම්	5.0	-	-	0.125
බෝක්කු	125.0	-	-	0.038
සපත්තු පාලම්	10.0	-	-	0.08
එකතුව	527.5	51.0	549.0	21.583

3.15.3 ජල සැපයුම සහ ලිං

ළිං	එල් කලාපය (ගණන)	හුරුළුවැව (ගණන)	මූල්‍ය යෙදවුම් (රු.මි)
පානීය ජල ළිං	350	-	0.07
වගා ලිං	150	297	0.223
බෝර වළ	100	-	0.04
උඩිස් ටැංකි	100	-	0.06
ප්‍රති ආශ්‍රිත ජල පිරි පහදු යන්ත්‍ර	-	1	0.0025
නල ළිං	-	48	0.0096
එකතුව	**700**	**346**	0.4051

3.15.4 වේලි ගණන

වේලි	(පිරිවැය රු. බිලියන)
කොත්මලේ	13.0
වික්ටෝරියා	9.8
රණ්දෙනිගල	5.8
රන්ටැඹේ	3.2

පොල්ගොල්ල	0.09
බෝවතැන්න	0.05
මිණිපේ	0.65
රත්කිඳ	1.9
මාදුරු ඔය	2.6
උඩවලවේ	0.14
චන්ද්‍රිකා වැව	0.08
මුළු	37.31

3.15.6 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉඩම්

කලාපය	මුළු ඉඩම් (හෙක්)	බැහැර කල ඉඩම් (හෙක්)	ඉතිරි ඉඩම් (හෙක්)
බී කලාපය	77,999.0	35,901.0	42,098.0
සී කලාපය	55,306.0	33,088.0	22,218.0
ඩී කලාපය	68,863.0	4,237.0	64,626.0
එච් කලාපය	57,225.0	31,431.0	25,794.0
ජී කලාපය	19,670.0	11,430.0	8,240.0
එල් කලාපය	29,087.0	6,142.0	22,945.0
වික්ටෝරියා	30,728.0	620.0	30,108.0
වලව	52,281.0	39,998.0	12,283.0
හුරුළුවැව	67,248.0	7,250.0	59,998.0
රඹකැන්ඔය	150,622.0	6,512.0	144,110.0
එකතුව	**609,029.0**	**176,609.0**	**432,420.0**

3.16 ආයෝජන දේපළ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආයෝජන දේපළ හඳුනාගැනීම, මැනීම සහ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 (SLPSAS 13) යොදා ගනී.

ආයෝජන දේපල මනිනු ලබන්නේ සාධාරණ වටිනාකම මත වන අතර, එය පිළිගත් හා අදාළ වෘත්තීය සුදුසුකම් සහිත සහ තක්සේරු කරනු ලබන ආයෝජන දේපලෙහි පිහිටීම සහ කාණ්ඩය පිළිබඳ මෑතකාලීන අත්දැකීම් ඇති ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් පවත්වනු ලබන මූලික තක්සේරුව මත පදනම් වනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 යටතේ "ආයෝජන දේපළ" ලෙස පිළිගෙන ඇති පහත සඳහන් ඉඩම් , ආයෝජන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් බැහැර කර ඇත. දේපළවල වටිනාකම් 2023 වර්ෂයේදී ගිණුම්ගත කෙරෙන අතර, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වනු ඇත.

කලාපය	ආයෝජන ව්‍යාපෘති	බැහැර කල ඉඩම් (හෙක්
බී කලාපය	352	3,035
සී කලාපය	184	1,066
ඩී කලාපය	15	715
එච් කලාපය	68	203
ජී කලාපය	8	32
එල් කලාපය	38	381
වික්ටෝරියා	36	67
වලව	73	562
හුරුළුවැව	13	74
රඹකැන්ඔය	10	399
එකතුව	797	6,534

විගණකාධිපති වාර්තාව

111

මගේ අංකය எனது இல. My No. IWM/B/MASL/01/22/34 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 දෙසැම්බර් 30 දින

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිතයන්ගේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ("අධිකාරිය") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

1.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

(අ) අධිකාරිය යටතේ ඉදිකරනු ලැබූ හා වර්තමානය වනවිට අධිකාරිය විසින් පරිපාලනය, ක්‍රියාකරවීම, නඩත්තුව හා වැඩිදියුණු කිරීම සිදුකරනු ලබන ප්‍රධාන වෙලි 11 ක පිරිවැය රු.බිලියන 37.31 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන සටහන් මගින් අනාවරණය කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 19 ඡේදය ප්‍රකාරව ඒවායේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද අධිකාරිය විසින් එම වත්කම්වල මෙහෙයුම් හා නඩත්තු වියදම් දරනු ලැබුවද, ඒ අතුරෙන් ප්‍රාග්ධනිත කළයුතු වියදම් හඳුනාගෙන නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, සුදුසු පදනමක් මත වාර්ෂිකව ක්ෂය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියේ කලාප හා අංශ 18 සඳහා වෙන වෙනම පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 118 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන හා 127 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් හෙළිදරව් කිරීම් ඇතුළත් සටහන් ඉදිරිපත් කර නොතිබුණි. තවද, කලාප 11 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 1 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය වසරේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළයුතු වුවද අධිකාරිය විසින් ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. තවද සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංසන්දනාත්මක තොරතුරු දැක්වීමේදී ඉකුත් වර්ෂ විගණිත ශේෂ ඉදිරිපත් කර නොතිබූ අතර, නැවත ප්‍රකාශිත ශේෂ පමණක් ඉදිරිපත් කර තිබුණි. එකී නැවත ප්‍රකාශිත අගයන්ට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 54 ඡේදයේ (අ) සිට (ඇ) දක්වා වූ ඡේද ප්‍රකාරව තොරතුරු හෙළිදරව්කරද නොතිබුණි.

(ඈ) දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 22 ඡේදය ප්‍රකාරව එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම් සම්බන්ධ ප්‍රාග්ධන වියදම් අදාළ වත්කම් ගිණුමට හර කළයුතු වුවත් කලාප 8 කට අදාළව රු.92,774,812 ක වටිනාකමකින් යුත් ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අයභාර වියදම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ii) අධිකාරියේ කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම් හඳුනාගෙන ඒවායේ වටිනාකම් හා අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.64,320,853 ක් වූ ඉඩම් කට්ටි 2 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(iii) ජංගම නොවන වත්කම් පන්ති 07 ක් සමාලෝචිත වර්ෂය තුළ රු.8,190,683ක අගයකට ප්‍රත්‍යාගණනය කර තිබූ අතර, එම ප්‍රත්‍යාගණනයට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 90 ඡේදය ප්‍රකාර හෙළිදරව් කළයුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 49 ඡේදය ප්‍රකාරව දේපල හා පිරියත උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටෙක එම වත්කම් පංතිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, සි කලාප නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ සම්පූර්ණ පිරිවැය රු.15,601,129 ක් වූ කාර්යාල උපකරණවලින් 2022 ජනවාරි 01 දිනට ප්‍රත්‍යාගණනයට ලක්කර තිබුණේ රු.11,725,422 ක් පිරිවැය වූ කාර්යාල උපකරණ පමණි. ඒ අනුව පිරිවැය රු.3,875,707 ක් වූ අදාළ වත්කම්වලින් සියයට 25 ක් ප්‍රත්‍යාගණනයට ලක් කර නොතිබුණි. වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ 2021 ජනවාරි 01 දිනට පිරිවැය (සාමාන්‍ය) රු.15,655,004 ක් වූ යන්ත්‍ර සූත්‍රවලින් ප්‍රත්‍යාගණනය කර තිබුණේ රු.10,561,272 ක් පිරිවැය වූ යන්ත්‍ර පමණි. ඒ අනුව අදාළ වත්කම්වලින් සියයට 33 ක් එනම් රු.5,093,735 ක පිරිවැය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iv) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 69 ඡේදය ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීම ආරම්භ කළයුත්තේ එම වත්කම් භාවිතයට ගැනීම ආරම්භවීමත් සමග වුවත් ඊට පටහැනිව, අධිකාරිය විසින් 2022 වර්ෂයේ රු.12,550,592 ක් වැයකර මිලදී ගෙන තිබූ බිප පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් 2023 අප්‍රේල් 28 දක්වා ස්ථාපිත කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව තබා තිබුණද, සමාලෝචිත වර්ෂයේ එම යන්ත්‍රය වෙනුවෙන් රු.1,021,239 ක් ක්ෂය කර තිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල 7 කට අදාළ නඩු 366 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හි 100 ඡේදය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. අධිකාරියට එරෙහි නඩු 23 ක් සඳහා අසම්භාව්‍ය බැරකම් ලෙස රු.56,696,667 ක් හඳුනාගෙන එම අගය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 8 හි 22 ඡේදය අනුව අවශ්‍ය පරිදි ප්‍රතිපාදනයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වූවත්, අධිකාරියේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ එම තොරතුරු හෙළිදරව් කර හෝ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සිදුනොවුනු බවට මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය, නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය - බී කලාපය යටතට පත් කිරීම 2021 මාර්තු 16 දින සිදුකර තිබුණු අතර, ඒ යටතේ මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතියේ එකතුව රු.121,050,992 ක වත්කම් හා රු.121,050,992 ක වගකීම් පවරාගෙන තිබුණි. 2022 ජනවාරි 01 දින ශේෂයට ඊට අදාළ ගැලපීම් සිදුකර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 135 ඡේදය ප්‍රකාරව ඊට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) වර්ෂයට අදාළ ආදායම් හා වියදම් හඳුනාගෙන උපචිත පදනම මත ගිණුම් තැබීම වෙනුවට ඉකුත් වර්ෂයේ ආදායම් හා වියදම් සමාලෝචිත වර්ෂයේ නැවත ප්‍රකාශ කර අලාභයට ගැලපීම් සිදුකර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වුණු රු.490,550,000 ක අලාභය සඳහා රු.748,009,000ක ගැලපීම් සිදුකර සමාලෝචිත වර්ෂය ආරම්භයේ අලාභය රු.1,238,559,000 ක් වන පරිදි සියයට 152 කින් වැඩිකර නැවත ප්‍රකාශ කර තිබුණි.

(ආ) ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු පාරිතෝෂික ගෙවීම් රු.83,774,749 ක් දක්වා නොතිබුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නොගැලපිය යුතුවූ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අගය රු.8,750,000 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ගලායාමක් ලෙසද, ප්‍රත්‍යාගණන සංචිතයේ රු.2,151,000 ක වැඩිවීම් මූල්‍ය කටයුතුවලින් ජනිත මුදල් ප්‍රවාහයක් ලෙසද දක්වා තිබුණි. තවද, මුදල් ගලායාම් නොවන රු.8,779,000 ක් වූ කලාප අතර වත්කම් මාරු කිරීම් හා නොනිමි වැඩවල රු.2,151,000 ක අඩුවීම් මුදල් ගලා යාම් ලෙස දක්වා තිබුණි.

(ඇ) අධිකාරියේ වත්කම් වෙනත් පාර්ශව විසින් භාවිතා කිරීමෙන් පැන නඟින ආදායම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි 33 වන ඡේදය ප්‍රකාරව හඳුනාගත යුතු වුවද, තඹුත්තේගම හා වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයන් මඟින්

ක්‍රියාත්මක කරන ලද කළුගල් ව්‍යාපෘතිවලට අදාළව පිළිවෙලින් ව්‍යාපාරිකයින් 14 දෙනෙකු හා 16 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.24,692,047 ක් හා රු.893,269,386 ක් ද, ලංකා පොහොර සමාගමෙන් හා මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු පිළිවෙලින් රු.2,352,000ක් හා රු.26,100,000ක් වූ බදු ආදායම්ද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් රු.671,503,748 ක, මොරගහකන්ද ව්‍යාපෘතියෙන් රු.536,539,275 ක, දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් රු.325,457,540 ක වත්කම් අධිකාරිය වෙත ලැබී තිබුණ ද එම වත්කම්වලින් සමාලෝචිත වර්ෂය වනවිට පිළිවෙලින් රු.589,325,677 ක, රු.466,896,356 ක හා රු.78,348,847 ක වත්කම් පමණක් ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව එකතුව රු.398,929,683 ක් වූ වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි 49 ඡේදය අනුව ප්‍රාග්ධන හා අයහාර ප්‍රදාන සහ වත්කම් ප්‍රදාන ලැබූ වහාම අයහාර ලෙස හඳුනාගත යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියට විදේශ ව්‍යාපෘති 03 කින් ලැබුණු වත්කම්වලට අදාළ හුවමාරු නොවන ගනුදෙනු වටිනාකම් ජීව කාලය අනුව විලම්භනය කර, 2022 දෙසැම්බර් 31 දිනට විලම්භනය කරන ලද ආදායම් රු.83,565,000 ක් සහ තවදුරටත් අයහාර ලෙස හඳුනාගතයුතු රු.39,095,160,211 ක් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි. මීට අමතරව මහා භාණ්ඩාගාරයෙන් අධිකාරියට ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව රු.3,204,892,000 ක් වූ සමාලෝචිත වර්ෂයේ විලම්භනය කරන ලද ආදායම් හා තව දුරටත් ආදායම් ලෙස හඳුනාගත යුතු සමුච්චිත අරමුදල් යටතේ දක්වා තිබූ රු.70,823,574ක් ප්‍රමිතියට අනුව ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 13 හි 20 ඡේදය අනුව ආයෝජන දේපල ලෙස හඳුනා ගතයුතු අධිකාරිය සතු බදු කුලී ඉපයීම් සඳහා බැහැර කරන ලද ඉඩම් හෙක්ටයාර 6534 ක් අගය කර, ප්‍රමිතියේ 27 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැති හා මුදල් ශේෂය යටතේ දක්වා තිබුණු මහවැලි සවිය හා මොරගහකන්ද අත්වැල ණය යොජනා ක්‍රමවල ශේෂ පිළිවෙලින් රු.80,797,751 ක් හා රු.28,561,609 ක් වූ අතර, බැංකුවෙන් ලද තහවුරු කිරීම් අනුව මීට අදාළ ශේෂ පිළිවෙලින් රු.81,936,909 ක් හා රු.

29.493.597 ක් විය. ඒ අනුව ශේෂ තහවුරු කිරීම් හා ගිණුම් ශේෂ අතර පිළිවෙලින් රු.1,139,158 ක හා රු.931,988 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුව සියයට 99 ක කොටස් හිමිකම පවතින මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම කෘෂිකර්ම, ග්‍රාමීය, ආර්ථික කටයුතු, වාරිමාර්ග ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට 2020 දෙසැම්බර් 31 දින පවරා තිබුණි. එසේ වූවද මට අදාළ රු.63,850 ක් වූ කොටස් 6385 ක ආයෝජනය 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දක්වා තිබූ අතර, එම ආයෝජන පැවරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙනද නොතිබුණි.

(එ) පහත දක්වා ඇති කරුණුවලට අදාළ එකතුව රු.44,770,945 ක් වූ ගෙවිය යුතු ශේෂ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

විස්තරය	මුදල් රු.
(i) මහවැලි කලාප 3 ක සිදුකළ ඉදිකිරීම් වෙනුවෙන් රාජ්‍ය ආයතන 2 කට ගෙවිය යුතු මුදල	22,819,672
(ii) දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය සඳහා අත්පත් කරගන්නා ලද ඉඩම් අක්කර 126.23 ක් වෙනුවෙන් 2018 වර්ෂයේ වන්දි ගෙවීමෙන් පසු 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ පොලී හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු මුදල්	18,258,685
(iii) 2022 වර්ෂයට අදාළ 2023 වර්ෂයේ ගෙවා නිබූ සී කලාපයේ නිල නිවාස අලුත්වැඩියා වියදම් හා රක්කිඳ බීජ ගොවිපලේ 2022/23 මහ කන්නය වෙනුවෙන් කළ ගෙවීම්වල එකතුව	3,692,588
	44,770,945

(ඒ) වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ රු.79,270,211 ක් වූ ස්ථාවර තැන්පතු සඳහා 2022 වර්ෂයට අදාළ පොලිය රු.2,080,669 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) පහත දක්වා ඇති කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු.12,549,542 කින් වැඩියෙන් දක්වා තිබුණි.

විස්තරය	මුදල රු.
(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 63 ඡේදය ප්‍රකාරව සේවා කාලය අවුරුදු 01 සිට 05 දක්වා මහවැලි ආරක්ෂක බළකායේ සේවකයින් 103 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික සඳහා වෙන් කිරීම් සිදුනොකිරීම	(6,338,112)
(ii) 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම රු.34,750,000 ක් වූ වාහන 4 ක් රු.41,794,209 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වැඩියෙන් දැක්වීම	1,408,862
(iii) අධිකාරියේ ගොඩනැගිලි ක්ෂය ප්‍රතිපත්තිය අනුව වටිනාකමින් සියයට 2.5 ක් වාර්ෂිකව ක්ෂය කළයුතු වුවත් ප්‍රධාන කාර්යාලයට අයත් පරිවැය රු.619,112,600 ක් වූ ගොඩනැගිලි සියයට 5 බැගින් ක්ෂය කිරීම හේතුවෙන් ගොඩනැගිලි ක්ෂය වැඩියෙන් දැක්වීම	15,477,815
(iv) අධිකාරියේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව සියයට 15 ක ක්ෂය අනුපාතයක් අදාළව පවතින, යන්ත්‍ර පිරියත යටතේ දැක්විය යුතු අයිතම 14 ක් සියයට 20 ක ක්ෂය අනුපාතයක් අදාළ වන වාහන යටතේ දැක්වීම හේතුවෙන් අංශ 4ක වාහන ක්ෂය වැඩියෙන් දැක්වීම	3,249,977
(v) විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු නොකිරීම	(1,249,000)
	12,549,542

(ඇ) විධිමත් අනුමැතියකින් තොරව දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අදාළ හිඟ බදු ආදායම් රු.46,478,749 ක් පෙර වර්ෂ ගැලපුම් ගිණුම් හරහා සහ සිකලාපයේ හිඟ බදු ආදායම් රු.29,740,601 ක් ඉඩම් පරිහරණ ගාස්තු ආදායම් ගිණුම් මගින් කපාහැර තිබුණි.

1.2.4 විගණනයට සාක්ෂි නොවීම

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට අවුරුදු 05 ඉක්මවූ ගෙවිය යුතු ශේෂ එකතුව රු.161,080,000 ක් වූ අතර, ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල පොත්වල වසර 05 ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.173,520,378 ක් වීමෙන් රු.12,440,378 ක වෙනසක් නිරීක්ෂණය විය. මුළු ගෙවිය යුතු ශේෂ එකතුවෙන් සියයට

98.6 ක් නියෝජනය කෙරෙන රු.39,231,461,000 ක් වූ අධිකාරියේ ප්‍රධාන කාර්යලයීය විවිධ ණයහිමි ශේෂය සඳහා උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයීය මූල්‍ය ප්‍රකාශනවල ජංගම ගිණුම් ශේෂ යටතේ 3001 අරමුදල් ගිණුම තුළ දැක්වෙන වසර ගණනාවක් තිස්සේ පැවත එන එකතුව රු.554,135,228 ක් වූ හර ශේෂ හා එකතුව රු.509,098,933 ක් වූ බැර ශේෂ තහවුරු කරගෙන අදාළ ගිණුම්කරණ ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සි/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ ආයෝජන රු.10,000,000 ක් දක්වා තිබුණු අතර, මෙම ආයෝජනයට අදාළව කොටස් සහතික, ප්‍රතිෂ්ඨාව තීරණය කරන ලද ආකාරය හා ඒ සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍ය මණ්ඩල තීරණ විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ආයෝජන තීරණයේ උචිතභාවය හා පැවැත්ම තහවුරු කරගැනීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙතනාන්විත මහහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්ව් ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබාගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ

කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මාගේ විගණනය මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමූහය පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමූහයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2.1(අ), (ඇ)ii, 1.2.3(ඇ), (ඉ), (ඌ) ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 72 වගන්තිය	අවසර පත්‍ර නිකුත් කිරීමේදී ඉඩම් මැන සැලසුම් සකස් කර හෝ යෝග්‍ය ඉඩම් තෝරා ගැනීම සිදුකර අවසර පත්‍ර නිකුත් කළයුතු වුවත්, 2014 වර්ෂයේ සී කලාපයේ ගිරාදුරුකෝට්ටේ කොට්ඨාශ කාර්යාලයේ පැවති ඉඩම් කච්චේරියේදී තෝරාගත් පුද්ගලයින් 99 දෙනෙකු සඳහා ඉහත අවශ්‍යතාවලින් බැහැරව හා ඉඩම් පෙන්වාදීමකින් තොරව ඉඩම් අවසර පත්‍ර ලබාදී තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (ඇ)	කන්දකාඩු හා ගිරාදුරුකෝට්ටේ විදුලිවැට ඉදිකිරීම හා එවි කලාපයේ මත්ස්‍ය මධ්‍යස්ථානය හා පොකුණු ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ (පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති) ට එකතුව රු.24,239,319 ක අත්තිකාරම් මුදල් 2021 වර්ෂයේ අවස්ථා 03 කදී ලබාදී තිබූ නමුත්, මෙම අත්තිකාරම් විගණිත දින වූ 2023 මැයි 19 දින වනවිටත් වර්ෂ 02 ක පමණ කාලයක් තිස්සේ පියවා නොතිබුණි. තවද ඊට අදාළ කාර්යයන්ද නිසි පරිදි ඉටුකර නොතිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති පිරිඩී 12 වක්‍රලේඛයේ 9.4 ඡේදය හා 2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය මගින් ස්ථාපනය කරන ලද මෙහෙයුම් අත්පොත 3.5 ඡේදය	අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව බාහිර ආයතන වෙත 2020 සිට 2023 දක්වා වූ කාලසීමාවේ මුදාහැර සිටි නිලධාරීන්/සේවකයින් 45 දෙනෙකු සඳහා ගෙවා තිබූ වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්ව මුදල් සහ අතිකාල දීමනා ලෙස පිළිවෙලින් රු.34,867,475 ක්, රු.5,440,787 ක්, හා රු.15,851,797 කින් 2023 මැයි 15 දින වනවිට ප්‍රතිපූරණය කරගෙන තිබුණේ රු.1,495,003 ක් පමණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) බකමූණ බස් නැවතුම් පොළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පිරිනැමීමට 2021 අගෝස්තු 24 දිනැති අංක අමප/21/1396/317/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී තිබුණි. බකමූණ බස් නැවතුම්පොල ඉදිකිරීම 2022 අප්‍රේල් 04 දින නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2023 අප්‍රේල් 28 දින වනවිට ඉදිකිරීම් අවසන් නොකර අත්හැර දමා තිබුණි. වැඩපූර්ව අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු එකතුව රු.මිලියන 13 ක් ද අධිකාරියට අයකර ගැනීමට නොහැකිවී තිබුණු අතර, 2022 අගෝස්තු 31 දින ගෙවා තිබුණු රු.6,238,208 ක සහතික කළ වැඩ වටිනාකමද ඇතුළුව මෙම කොන්ත්‍රාත්තුව සඳහා රු.19,238,208 ක් ගෙවා තිබුණි.

(ආ) මහඔය කලාපයේ නිල නිවාසයක් ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 14 දින රු.4,843,183 කට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර, ගිවිසුමට අනුව 2018 මැයි 06 දින වැඩ නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2023 මාර්තු 28 දින වනවිටත් කොන්ත්‍රාත්තුව නිම නොකර අදාළ ඉදිකිරීම් වැඩ අතහැර දමා තිබුණි. ඊට අදාළ රු.1,422,931 ක සංවලන අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී රත්කිඳ සංචාරක බංගලාව අලුත්වැඩියාවට අදාළ කොන්ත්‍රාත්තුවද 2018 දෙසැම්බර් 24 දින රු.12,107,000 ක මුදලකට උක්ත කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2019 ජූලි 19 දින වනවිට වැඩ නිම කළයුතු වුවත්, විගණිත දිනය වූ 2023 අගෝස්තු 16 වනවිට වැඩ නිම නොකර එම කොන්ත්‍රාත්තුවද අතහැර දමා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.3,447,508 ක මුදලක් සංවලන අත්තිකාරම් ලෙස ලබාදී තිබූ අතර, එම මුදලද අයකර ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි.

(ඇ) අධිකාරිය විසින් තම්මැන්නාව වැව ආශ්‍රිතව ආර්ථික මධ්‍යස්ථානයක් රු.6,514,819 කට ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ 2021 ඔක්තෝබර් 12 දින ගිවිසුම්ගතව තිබූ අතර, ගිවිසුම් ප්‍රකාරව අදාළ ඉදිකිරීම් කාර්යය දින 60 ක් තුළ නිම කළයුතු වුවත්, 2023 අප්‍රේල් 28 දින වනවිට අදාළ කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණු අතර, විගණිත දින වූ 2023 අප්‍රේල් 28 වන විට ඒ වෙනුවෙන් ගෙවූ රු.2,062,201 ක සංවලන අත්තිකාරම නිකුත් කර වසර 2 කට ආසන්න කාලයක් ගතවී තිබුණද එය ආපසු අයකර ගැනීමට හෝ එම කොන්ත්‍රාත්තුව සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මධ්‍යම පරිසර අධිකාරියේ, මධ්‍යම පළාත් කාර්යාලය ලෙස භාවිතා කරනු ලැබූ පොල්ගොල්ල වේල්ල අසල පිහිටි ගොඩනැගිල්ල මහවැලි අධිකාරිය වෙත පවරා ගෙන මධ්‍යම පරිසර අධිකාරියට අයත් කුණ්ඩසාලේ වරාපිටිය ප්‍රදේශයේ ඉඩමක නව

ගොඩනැගිල්ලක් ඉදිකර දීම සඳහා මහවැලි අධිකාරිය විසින් රු.32,096,839 ක කොන්ත්‍රාත්තුවක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ගිවිසුම්වලට එළඹීමෙන් තොරව ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත විගණිත දිනය වූ 2023 අප්‍රේල් 28 වනවිට එකඟවූ පරිදි මහල් 04 කින් යුක්ත වූ ගොඩනැගිල්ල ඉදිකර නොනිබුණු අතර, බිම් මහල පමණක් ඉදිකර තිබුණි.

2.3 වෙනත් කරුණු

2.3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම ව්‍යාපෘති කමිටුව විසින් තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාදී විගණිත දින් වනවිට වර්ෂ 4 ක් ගතවී තිබූ නමුත් රාජ්‍ය පෞද්ගලික් හවුල් ව්‍යාපාරය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

(ආ) මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම පරිහරණය කරමින් සිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ, බෙස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.2139 ක ඉඩම හා ගොඩනැගිලි 2020 වර්ෂයේ නැවත මහවැලි අධිකාරියට පවරා තිබුණද, එම වත්කම් නිසි පරිදි භාරදීමට හා භාරගැනීමට එම සමාගම හා අධිකාරිය කටයුතු කර නොනිබුණි. මෙම ඉඩම 2018 වර්ෂයේ රු.මිලියන 296 කටද, ගොඩනැගිල්ල රු.මිලියන 619 කටද තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබූ නමුත්, 2023 මැයි 15 දින විගණනය විසින් පරිශ්‍රය භෞතිකව පරීක්ෂා කිරීමේදී ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි නැවත භාවිතා කළ නොහැකි අයුරින් විනාශවී ගොස් ඇති බව හා ගොඩනැගිලි තුළ ගෘහ භාණ්ඩ හා උපකරණ කිසිවක් නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී ද, ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම 2019 වර්ෂයේදී ද ඇවර කිරීමට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොනිබුණි.

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 ජූනි 29 දිනැති අංක MASL/DG/පොදු/01 දරන ලිපිය හා 2019 පෙබරවාරි 01 දිනැති අංක DG/3/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව මහවැලි කලාපවල හා ව්‍යාපෘතිවල අත්‍යාවශ්‍ය හා කාලීන අවශ්‍යතා එනම් ජලාශ පද්ධති නඩත්තුව, ගොවිපලවල්වල ශ්‍රම අවශ්‍යතාවය, සනීපාරක්ෂක කටයුතු, කඳවුරු

නඩත්තුව හා වටිනාකම රු.5,000,000 දක්වා වූ සුළු ප්‍රතිසංස්කරණවලට අදාළ වැඩ ඉටුකර ගැනීම සඳහා ගොවි සංවිධාන මට්ටමින් ශ්‍රමිකයන් බඳවා ගතයුතු වූ නමුත්, සමාලෝචිත වර්ෂයේ සී කලාපය විසින් සිදුකර තිබූ නඩත්තු කාර්යයන්ට අදාළ වටිනාකම් එකතුව රු.46,045,718 ක් වූ සුළු පරිමාණ කොන්ත්‍රාත් (ශ්‍රම කොන්ත්‍රාත්) 59 ක් සහ එකතුව රු.9,281,309 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 05 ක් පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කර තිබුණි.

(ඉ) අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වාම අයකරගෙන නොතිබුණි.

(ඊ) අධිකාරිය අයකරන ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීම සඳහා, ලංකා විදුලිබල මණ්ඩලය, ජල විදුලි බලාගාර හිමිකරු හා මහවැලි අධිකාරිය ඇතුළත්ව විධිමත් ත්‍රෛපාර්ශවික ගිවිසුම්වලට එළඹ නොතිබීම නිසා ආයෝජකයින් 12 දෙනෙකුගෙන් 2021 හා 2022 වර්ෂ සඳහා රු.242,149,483 ක් අයකර ගත නොහැකිවී තිබුණි. මීට අමතරව මහවැලි විශේෂ බල ප්‍රදේශවල විදුලි ජනනයේ යෙදෙන කුඩා ජල විදුලිබලාගාර 65ක් නියාමනය හා ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය සඳහා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) වලව කලාපයේ කලුගල් කැණීම් කරන ලද ව්‍යාපාරිකයින් 16 දෙනෙකු වෙතින් 2009-2020 කාල පරිච්ඡේදයට අදාලව අය විය යුතු ඉඩම් පරිහරණ ගාස්තුව රු.1,038,026,047 ක් වූ අතර ඉන් විවිධ අවස්ථාවල රු.144,756,661 ක් පමණක් අයවී තිබුණි. 2020 දෙසැම්බර් 20 දිනැති අංක අමප/20/1852/317/012 දරන අමාත්‍ය මණ්ඩල නිරණය මඟින් ඉහත අයවිය යුතු රු.893,269,386 ක ඉඩම් පරිහරණ ගාස්තුවෙන් සියයට 75 ක් එනම්, රු.669,952,040 ක් කපාහැරීමටත් ඉතිරි මුදල වන රු.223,317,346 වාරික 36 කින් අයකර ගැනීමටත් අනුමත කර තිබුණි. තවද එම ව්‍යාපාරිකයින් අතුරින් ව්‍යාපාරිකයින් 05 දෙනෙකු විසින් එකඟවූ පරිදි එම වාරික ගෙවීම් මුදලින් රු.157,004,041 ක් ගෙවීම පැහැර හැර තිබුණි.

(ඌ) අධිකාරිය විසින් පාලනය හා නඩත්තු කරගෙන යනු ලබන කලාප 6 ක කි.මී.9,237.9ක් දිග ඇල මාර්ග රු.74,989,140,000 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ඇල මාර්ග තක්සේරුව වෘත්තීය සුදුසුකම් සහිත පිළිගත් තක්සේරුකරුවෙකු හෝ තක්සේරු මණ්ඩලයක් විසින් සිදුකර නොතිබීම හේතුවෙන් තක්සේරු වටිනාකමේ පිළිගත හැකිභාවය අභියෝගයට ලක්ව තිබුණි.

2.3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) (i) සහකාර අධ්‍යක්ෂ (ඉඩම්)ගේ 2015 අගෝස්තු 24 දිනැති අංක DL/01/01 දරන මහවැලි බල ප්‍රදේශයන්වල ඉඩම් වලින් ඉවත් කරනු ලබන බඹිජ ද්‍රව්‍ය සඳහා ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් වන ලිපිය ප්‍රකාරව බලපත්‍රයේ සඳහන් කැනීම් ප්‍රමාණය අනුව ඉඩම් පරිහරණ ගාස්තුව අයකල යුතු වුවත් අධිකාරියේ සී කලාපයේ 2016, 2017 හා 2018 වර්ෂවල මාසයක කැනීම් ප්‍රමාණයකට අදාළ ඉඩම් පරිහරණ ගාස්තුව පමණක් අයකර වැලි කැණීම් කිරීම සඳහා අවසරදී තිබුණි. මේ හේතුව මත වැලි කැණීම් බලපත්‍ර 386 කට අදාළව ඉතිරි කාල සඳහා අයවියයුතු ඉඩම් පරිහරණ ගාස්තුව රු.278,685,665 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. කෙසේ වෙතත් අධිකාරියට රු.278,685,665 ක ආදායමක් අහිමි කිරීම සම්බන්ධ වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද යන්න හා කැණීම් බලපත්‍ර ලබාදීමේදී වගකීම් විරහිතව ක්‍රියාකළ හා පසුව ඒ සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදුනොකළ නිලධාරීන් කවුරුන්ද යන්න පිළිබඳව පරීක්ෂණ සිදුකර වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ii) මෙවැනි ගැටළු මතු නොවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යටතේ 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මහවැලි ගඟ දෙපස මීටර 60 ක රක්ෂිත මායිම් සලකුණු කිරීමට එකඟවී තිබූ අතර, ඒ සඳහා 2018 වර්ෂයේ රු.1,000,000 ක් 2019 වර්ෂයේ රු.612,300 ක් ද ලෙස එකතුව රු.1,612,300 ක මුදලක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ නමුත්, විගණිත දින වූ 2023 ජූනි 19 දක්වා මැනීම් කටයුතු සිදුකර රක්ෂිත මායිම් සලකුණු කර නොතිබුණි.

(ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉඩම් කළමනාකරණයට හඳුන්වාදීම් සඳහා අධිකාරිය විසින් 2016 හා 2018 වර්ෂවලදී රු.6,973,405 ක් වැයකර ඉඩම් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර, පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් 60 ක් පුහුණු කිරීමටද කටයුතු කර තිබුණි. එසේ වුවද විගණිත දින වූ 2023 අගෝස්තු 09 වනවිටද එම තොරතුරු පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා එම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව අධිකාරියට අයත් බී, සී,ඩී, ජී, එච්, එල්, ඊ, හුරුළුවැව, වලව යන කලාපවල සහ ජලාශ හා මෙහෙයුම් අංශය යටතේ පවතින ජලාශ රක්ෂිතවල 2023 ජූලි 03 දින වනවිට අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් කට්ටි ප්‍රමාණය 2544 ක් සහ පුද්ගලයින් ප්‍රමාණය 402 ක් විය. මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා මේ අතරින් කලාප මට්ටමින් කට්ටි 910 ක් සඳහා ආයතනික ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර, කට්ටි 145 ක් වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. අධ්‍යක්ෂ (ජලාශ හා මෙහෙයුම්) යටතේ පවතින ජලාශ රක්ෂිතවල

අනවසර පදිංචිකරුවන් 150 දෙනෙකු වෙනුවෙන් ආයතනික ක්‍රියාමාර්ගද, 185 දෙනෙකු වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ගද ගෙන තිබුණි. මේ අනුව ඉතිරි කටයුතු 1489 හි පදිංචිකරුවන් 67 ක් ඉවත් කිරීම සඳහා විගණිත දින වූ 2023 අගෝස්තු 09 වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) මහවැලි ජනපදිකයින් සඳහා ණය ලබාදීමේ වක්‍රීය ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 50 ක මුදලක් 2006 වර්ෂයේ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවට ලබාදී තිබුණි. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අහෝසි වූ පසු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත අදාළ තැන්පතුව මාරුවී තිබූ අතර, විගණිත දින වන 2023 අප්‍රේල් 28 වනවිටත් මෙම මුදල අදාළ අරමුණ සඳහා යෙදවීමකින් තොරව තැන්පතුවක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. මීට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට ලැබුණු පොලිය රු.මිලියන 26.196 ක් බව එම බැංකුවෙන් තහවුරු කර තිබුණි.

(ඉ) රඹකැන්ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ ප්‍රදේශයේ ගල්වල යාය මහවැලි ගම්මානයේ මාර්ග සකස් කිරීම හා කුඹුරු ඉඩම් රළු මට්ටම් කිරීම සඳහා අමපාර වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත 2013-2014 කාලපරිච්ඡේදය තුළ අවස්ථා 05 කදී රු.මිලියන 11 ක අත්තිකාරම් ලබාදී තිබුණි. එම අත්තිකාරම් මුදලින් රු.මිලියන 8.1 ක මුදලක් 2019/2020 වර්ෂවල පියවා තිබූ අතර, රු.මිලියන 2.9 ක මුදලක් 2023 අප්‍රේල් 28 දින වනවිටත් පියවා නොතිබුණි.

(ඊ) අධිකාරිය සතු පැල තවාන් 11 කින් 06 ක් සහ ගොවිපලවල් 21කින් 13 ක් සමාලෝචිත වර්ෂයේ අලාභ ලබා තිබුණ අතර. එම අලාභය පිළිවෙලින් රු.27,429,000 ක් හා රු.72,452,000 ක් විය.

(උ) අධිකාරියට අයත් නිල නිවාස උපයෝජනයකින් තොරව ප්‍රදේශ ගණනාවක පැවතියදී නිලධාරීන් 15 දෙනෙකු සඳහා ඔවුන් පෞද්ගලිකව කුලියට ගත් නිවාස වෙනුවෙන් 2022 වර්ෂය තුළ නිවාස කුලී ලෙස රු.3,098,129 ක් ගෙවා තිබුණි.

2.3.3 අධිකාරිය සතු ඉඩම් බැහැර කිරීම

(අ) සීමිත සම්පතක් වන ඉඩම් මානව අවශ්‍යතා අනුව මනා විනයක් ඇතිව, විනිවිදභාවයකින් යුතුව කෘෂිකර්මාන්තය, පදිංචිය, කර්මාන්ත හා සංචාරක කටයුතු මෙන්ම පාරිසරික සමතුලිතතාවය සඳහා වඩාත් සැලසුම් සහගත හා විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ පරිහරණය කළයුතු වුවත්, අධිකාරිය විසින් ඒ සඳහා වූ නිශ්චිත වැඩපිළිවෙලක් මත කටයුතු කර නොතිබුණි. 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වගන්තිය අනුව ඉඩම් පරිහරණය සඳහා මූලික ව්‍යුහාත්මක

සැලසුම් සකස් කර තිබුණද, 2011 වර්ෂයෙන් පසු වර්තමාන ඉඩම් පරිහරණ අවශ්‍යතා අනුව එම ව්‍යුහාත්මකසැලසුම් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයන් 704 දෙනෙකු වෙත ඉඩම් හෙක්ටයාර 7832ක් ලබා දී තිබුණද ඉන් හෙක්ටයාර 2697ක්, එනම් ලබාදුන් ප්‍රමාණයෙන් සියයට 34 ක් පූර්ණ අසංවර්ධිතව පැවතුණි.

(ඇ) දීර්ඝකාලීනව බදු දුන් ඉඩම්වලින් ඔප්පු නිකුත් කරනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් කලාප 10 කින් විගණනය සිදුකළ නොරතුරු කැඳවීමට අනුව කලාප 05 කින් පමණක් නොරතුරු ලබාදී තිබුණු අතර, එම ලද නොරතුරු අනුව දීර්ඝකාලීන බදු ගිවිසුම් කාලය වූ වසර 30 අවසන් වූ ඉඩම් කොටස් 237 කට අදාළව ඉඩම් හෙක්ටයාර් 635.8799 ක් විය. මෙම දීර්ඝකාලීන බදුකර අවසන් වූ ඉඩම් සම්බන්ධයෙන් බදුකරය නැවත නිකුත් කරන්නේද, අවලංගු කරන්නේද, ඉඩම නැවත තක්සේරු කරන්නේද හෝ නැවත අධිකාරිය වෙත පවරා ගන්නේද යන්න පිළිබඳව විගණිත දින වූ 2023 අප්‍රේල් 28 දක්වා කළමනාකාරිත්ව්‍ය විසින් තීරණය කර නොතිබුණි.

(ඈ) දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම හා විදේශීය මූල්‍ය පහසුකම් යටතේ ආයෝජන අවස්ථා සඳහා ඉඩම් ලබාදීම යටතේ ආයෝජකයන් 04 දෙනෙකු වෙත රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද ප්‍රදේශයෙන් අක්කර 1750 ක් ලබාදී තිබුණි. ඉන් එක් ආයතනයක් වෙත බඩඉරිඟු වගාව සඳහා ලබාදී තිබූ අක්කර 500 එම ආයතනය විසින් අතහැර දමා තිබූ අතර, තවත් ආයතනයක් වෙත නිදහස් කර තිබූ අක්කර 250 සඳහා 2023 මාර්තු 28 දක්වාම බදු අනුමැතියක් ලබාදී හෝ බදු අයකරගෙන නොතිබුණු අතර, එකඟවූ පරිදි රු.1,125,000 ක කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. හෙනා වගාව සඳහා තෙවෙනි ආයතනය වෙත අක්කර 100 ක් ලබාදී තිබුණු අතර, 2020 දෙසැම්බර් සිට විගණිත දින වූ 2023 අප්‍රේල් 28 දින දක්වා හිඟ බදු රු.1,800,000 අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ඉඩම් අක්කර 150 ක් ලබාදී තිබූ අතර, එය විධිමත් පරිදි මැනුම් සිදුකර ගිවිසුමකින් ලබාදී නොතිබුණි.

(ඉ) බී කලාපයේ දම්මින්න කොටයාශයේ අළුත්වැව ඒකකයෙන් කෘෂිකාර්මික ව්‍යාපෘති යටතේ පොල් වගා කිරීම සඳහා සමාගමකට දීර්ඝකාලීන බදු පදනම් මත අක්කර 100 ක් ලබාදී තිබුණි. එහිදී මෙම අක්කර 100 ට අදාළව රජයේ ඉඩම් ආඥා පනත යටතේ 1983 දෙසැම්බර් 13 දින සිට අවුරුදු 30 ක කාලයකට අදාළව දීර්ඝකාලීන බලපත්‍රයක් ඉහත සමාගමට ලබාදී තිබුණු අතර, බදු කාලය 2013 දෙසැම්බර් 14 දිනෙන් අවසන්වී තිබුණි. බදු කාලය අවසන්වීමට පෙර එය තවදුරටත් එම සමාගමටම ලබාදීමට හෝ වෙනත් ඉල්ලුම්කරුවෙකුට ලබාදීමට අවශ්‍ය තීන්දු හා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

අනතුරුව අක්කර 100 සඳහාම වර්ෂයකට රු.7,302 බැගින් 2013 සිට 2017 දක්වාද, වර්ෂයකට රු.8,764 බැගින් 2018 සිට 2021 දක්වා ද එකතුව රු. 80,330 ක මුදලක් අදාළ සමාගමෙන් අයකර තිබුණු අතර, ඒ සඳහා තක්සේරුවක් ලබාගෙන ඒ මත බදු මුදල් අයකර නොතිබුණි.

(ඊ) දිර්ඝකාලීන බදු පදනමට වලව කලාපයේ ඉඩම් බදුදී ඇති ආයෝජන ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟව ඇති රු.19,919,338 ක් වූ හිඟ බදු මුදල් විගණිත දින වූ 2023 අප්‍රේල් 03 දින වන විටත් අය කරගෙන නොතිබුණි. එම ආයතන අතුරින් ආයතන 2 ක් අදාළ ඉඩම් බදුගත් අරමුණු සඳහා යොදවා නොතිබුණි.

2.3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

(අ) 2020 ජුනි 26 දිනැති අංක 2181/25 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් මහවැලි ජී කලාපය කාබනික කලාපයක් ලෙස ගැසට් කර කලාපයේ වැල්ලේවෙල ප්‍රදේශයේ රු.20,278,462 ක් වැය කර කොම්පෝස්ට් නිෂ්පාදන අංගනයක් හා අඩි 40x60 ගොඩනැගිලි 2 ක් 2021 වර්ෂයේ ඉදිකර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ රු.230,000 ක මුදලක් වැයකර කොම්පෝස්ට් පෙරලන යන්ත්‍රයක් සහ කොම්පෝස්ට් හලන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් සැලසුම් කළ කාර්යය මෙතෙක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මිලදී ගන්නා ලද යන්ත්‍ර හා ඉදිකළ ගොඩනැගිලි නිෂ්කාර්යව තබා තිබුණි. මීට අමතරව රු.11,270,000 ක් වැය කර මිලදී ගන්නා ලද විශාල හා කුඩා පරිමාණයේ බහුකාර්ය කැබලි කිරීමේ යන්ත්‍ර 23 ක් කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සඳහා යොදා නොගෙන ගවයින් සඳහා ලබා දෙන තෘණ කැබලි කිරීමට යොදවාගෙන තිබුණි.

(ආ) මහවැලි බී හා එල් කලාපවල ව්‍යාප්තව ඇති උග්‍ර වකුගඩු රෝගයට පිළියමක් වශයෙන් ප්‍රමිතියෙන් යුත් ජල සැපයුමක් සහතික කිරීමේ අරමුණින් ප්‍රති ආශ්‍රැත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් අධිකාරිය විසින් රු.80,000,000 වැය කර සපයා සවිකර තිබුණි. ස්ථාපිත කර තිබුණු යන්ත්‍ර 30 න් බී හා එල් කලාපවල පිළිවෙලින් යන්ත්‍ර 09 ක් හා යන්ත්‍ර 04 ක් 2023 මැයි 01 දින වනවිට අක්‍රිය තත්ත්වයේ පැවතුණි. බී කලාපයේ යන්ත්‍ර ස්ථාපිත කිරීමේදී ස්ථානීය පරීක්ෂාවන් හා ඇගයීම් සිදුකර ස්ථාන තෝරා නොගැනීම හේතුවෙන් පිරිපහදු යන්ත්‍ර 05 ක් නිෂ්කාර්යව පැවතුණු අතර, යන්ත්‍ර 04 ක් සවිකිරීමෙන් පසු ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3.5 ව්‍යාපෘති කාර්යසාධනය

(අ) මහවැලි බී කලාපයට අයත් කන්දකාඩුව ප්‍රදේශයේ අක්කර 3770 ක භූමි ප්‍රදේශයක් කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් ඇති කිරීම සඳහා අධිකාරිය විසින් තෝරාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙත රු.6,539,600 ක මුදලකට 2021 සැප්තැම්බර් 28 දින ප්‍රදානය කර තිබූ අතර, විගණිත දින වූ 2023 මැයි 23 වනවිට රු. 3,211,376 ක් විශ්ව විද්‍යාලය වෙත ගෙවා තිබුණි. 2022 මාර්තු 29 දිනැති අංක 22/0482/317/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සංවර්ධනය කිරීමට යෝජිත ඉඩමේ හිමිකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත පැවරීම හේතුවෙන් කොටසක් පමණක් නිමකර තිබූ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවේ හිමිකම හා ඉදිරි ගෙවීම් වගකීම් සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයකට එළඹීමට 2023 මැයි 31 දක්වා අපොහොසත්වීම මත විශ්ව විද්‍යාලය අදාළ පාරිසරික ඇගයීම් වාර්තාව අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් නිසි ශක්‍යතා අධ්‍යයනයකින් හා සැලසුමකින් තොරව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය වෙනුවෙන් විගණිත දින වනවිට වැය කරන ලද රු.3,211,376 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ආ) අධිකාරිය විසින් කිරිගව පාලනයේ නියුතු ගොවීන්ට මහවැලි බී, සී, ඩී, එල් සහ උඩවලව කලාපවල තෘණ වගාව සඳහා අක්කර 2802 ක් පමණ ලබාදී සත්ත්ව පෝෂණය වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, විගණිත දින වූ 2023 මැයි 31 දින වනවිටත් කිසිදු ඉඩමක් තෘණ වගාකරුවන් වෙත බෙදාදී නොතිබුණි. මෙහිදී එල් කලාපයේ යෝජිත තෘණ භූමි වෙනුවෙන් මූලික පාරිසරික පරීක්ෂණයක් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයට රු.1,551,958 ක මුදලක්ද, පුරාවිද්‍යා ඇගයුම් සමීක්ෂණයක් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට රු.140,099 ක මුදලක්ද, තෘණ වගා භූමිය මැනුම් කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත රු.4,879,825 ක මුදලක්ද ලෙස එකතුව රු.6,545,882 ක් අධිකාරිය විසින් වැය කර තිබුණි.

(ඇ) 2021 වර්ෂයේ සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද මහවැලි කලාප ආශ්‍රිත සමෘද්ධිලාභී කිරිගව පාලනයේ නියුතු ගොවීන්ගේ ගොවිපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අධිකාරියේ සම්බන්ධීකරණයෙන්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. පසුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිපාදන ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ගව නිවාස 150 ක් හා ජල භාජන 150 ක් ඉදිකිරීම සඳහා 2021 නොවැම්බර් 30 දින ලබා දී

තිබූ රු.1,425,000 ක අත්තිකාරම් මුදල විගණිත දින වූ 2023 මැයි 02 දින දක්වා පියවා නොතිබූ අතර, අදාළ කාර්යයන් සම්පූර්ණ කරද නොතිබුණි.

(ඇ) මහවැලි බී කලාපයේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි බෝග නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 540 ක භූමි ප්‍රමාණයක් මුතුවැල්ල වැලිකන්ද ප්‍රදේශයෙන් ලබාදීමට 2020 වර්ෂයේ සැලසුම් කර තිබුණු අතර විගණිත දින වූ 2023 ජූනි 30 වනවිට වර්ෂ 3 1/2 ක කාලයක් ගතවී තිබුණද, කිසිදු ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම ආයෝජන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීම රු.2,619,000 ක කොන්ත්‍රාත්තුවකට කොළඹ විශ්වවිද්‍යාලය වෙත පවරා තිබූ අතර, ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් විගණිත දින වනවිට ඉන් ගෙවා තිබූ රු.2,093,200 අධිකාරියට අලාභයක්ව තිබුණි.

(ඉ) මහවැලි කලාපවල ගොවීන්ට ගුණාත්මක බීජ වී නිෂ්පාදනය කරදීමේ වැඩසටහනක් ආරම්භ කර 2021 හා 2022 වර්ෂවල අධිකාරිය සතු රත්කිඳ බීජ ගොවිපලේ වී වෙලිම සඳහා රු.3,824,406 ක් වැයකර අලුතින් කමත් 3 ක් ඉදිකර, රු.60,073,046 ක් වැයකර යන්ත්‍ර 15 ක් හා උපකරණ මිලදී ගෙන තිබුණි. 2021 යල කන්නයේ සිට බීජ වී නිෂ්පාදනය ආරම්භ කර එම බීජ භාවිතයෙන් වගා කන්න 4 ක් හෙක්ටයාර 196.25 ක්, 195.75 ක්, 152.75 ක් හා 100 ක් වී වගා කර තිබුණු අතර 2023 යල කන්නයේ සිට බීජ වී නිෂ්පාදනය නතර කර කලින් පැවති කන්න බදු ක්‍රමය යටතේ ගොවිපොල සතු කුඹුරු වගා කර ගැනීමට ගොවීන්ට බදුදී තිබුණි. මේ හේතුවෙන් බීජ වී නිෂ්පාදනය සඳහා අධිකාරිය වැය කරන ලද රු.63,897,452 ක මුදලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි.

(ඊ) අධිකාරිය විසින් කුඩා පරිමාණ ජලවිදුලි බලාගාර ඉදිකිරීමට ආයෝජකයින් හා සුදුසු ස්ථාන 20 ක් හඳුනා ගැනීමට 2011 සිට 2013 වර්ෂය දක්වා රු.1,297,533 ක් වැයකර තිබුණද, ඉන් ව්‍යාපෘති 10 ක් විගණිත දින වූ 2023 අප්‍රේල් 28 දින දක්වා අවසන් කර නොතිබුණි.

(උ) 2022 වර්ෂය තුළ වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ වැව් 54 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර වාර්ෂික අයවැයෙන් රු.මිලියන 80 ක් වෙන්කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම වැඩසටහනට රු.මිලියන 81.4 ක් වැයකර තිබීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 102ක් වූ අතර, වැව් 32 ක් පමණක් පිළිසකර කර තිබීමෙන් භෞතික ප්‍රගතිය සියයට 59 ක් විය.

(ඌ) වලව කලාපයට අයත් මොරකැටිය අතු ඇල පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2021 සැප්තැම්බර් 17 දින රු.34,475,753 කට ඉදිකිරීම් සමාගමකට පවරා තිබුණු අතර 2022 ජූලි 08 දින ඉදිකිරීම් වැඩ නිම කළයුතුව පැවතුණද, විගණිත දින වූ 2023 අප්‍රේල්

28 වන විටද අදාළ ඉදිකිරීම් නිම කර නොතිබුණි. මීට අදාළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 9,752,927 ක් හා පළමු අතුරු ගෙවීම් ලෙස රු.2,062,244 ක් වශයෙන් රු.11,815,171ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(එ) රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද කොටයාශයේ නිල නිවාස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 23 දින රු.4,861,103 කට ප්‍රදානය කර තිබුණි. 2018 අප්‍රේල් 24 දින එහි වැඩ නිම කළයුතු වුවත්, විගණිත දින වූ 2023 අප්‍රේල් 28 වනවිට කොන්ත්‍රාත්තුව නිම නොකර ඉදිකිරීම් වැඩ අතහැර දමා තිබුණු අතර කොන්ත්‍රාත්කරුට ගෙවූ රු.1,417,556 ක සංචලන අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) අධිකාරියේ නිම නොකළ කොන්ත්‍රාත්තුවලට අදාළ ඉතිරි වැඩ කොටස් පරීක්ෂා කර බලා ඇස්තමේන්තු සකස් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා නව කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන කාර්යයන් නිම කිරීමට විගණිත දින වූ 2023 අප්‍රේල් 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් අවශ්‍ය බවට හඳුනාගෙන, මුදල් වෙන්කර ආරම්භ කර තිබූ ඉදිකිරීම් කාර්යයන් ගණනාවක් අසම්පූර්ණව නතරවී තිබූ අතර, එම ඉදිකිරීම් තුළින් ලබාගත හැකිව තිබූ ප්‍රයෝජන අත්පත් කරගැනීමද කවදුරටත් ප්‍රමාදවී තිබුණි.

(ඔ) දක්ෂිණ අධිවේගී මාර්ගය අදියර II හි මාතර සිට හම්බන්තොට දක්වා වූ කොටසේ ඉදිකිරීම් හේතුවෙන් අධිකාරියේ වලව විශේෂ බලප්‍රදේශයට අයත් අහුණුකොලපැලැස්ස හා මුරවැසිහේන කොටයාශවලට අයත් බෙදුම් ඇලවල් ආශ්‍රිත නිර්මිතයන්ට සිදුවූ හානි පුනරුත්ථාපනය වෙනුවෙන් ව්‍යාපෘති 10 ක් සඳහා අධිකාරිය විසින් 2021 මාර්තු 04 දින ඉදිරිපත් කළ රු.43,883,862 ක ඇස්තමේන්තුව ප්‍රකාරව අදාළ මුදල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2021 මාර්තු 10 දින වලව කලාපයේ තැන්පත් කර තිබුණද, විගණිත දින වූ 2023 අප්‍රේල් 28 දින දක්වා මෙම ඇලවල්වල පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර හෝ ස්ථාවර වත්කම්වලට සිදුවූ අලාභය ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 හඳුනාගත් පාඩු

(අ) 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.7,898,381 ක් ලෙස දක්වා තිබූ දිගන තේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබූ අංක PG-0455 දරන වාහනය 2021 මැයි 07 දින අනතුරකට ලක්ව තිබුණි. අනතුර සිදුවී වර්ෂ 02 කට අධික කාලයක් ගතවී තිබුණද වාහනයට සිදුවූ අලාභය තක්සේරු කර අලුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණ අතර වාහනයේ 2022/2023 වර්ෂයට අදාළව රක්ෂණය නිසි කලට සිදුනොකිරීම හේතුවෙන් රක්ෂණ වන්දි ලබාගැනීමට ද නොහැකි වී තිබුණි.

(ආ) මහවැලි කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා වෙත අනුයුක්ත කර තිබූ අංක CAF-1918 දරන රථය 2020 පෙබරවාරි 24 දින අනතුරකට පත්ව තිබුණද මුදල් රෙගුලාසි 104(4) අනුව මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු හානිය සම්බන්ධ පූර්ණ වාර්තාව විගණන දින වූ 2023 අගෝස්තු 08 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. අනතුරට අදාළ අලුත්වැඩියාවන් සඳහා අධිකාරිය විසින් රු.932,373 ක් වැයකර තිබූ නමුත් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණේ රු.318,350 ක් පමණක් බැවින්, රු.614,023 ක් වූ ඉතිරි අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙහිඅත්තකන්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර, මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකවරයකු වෙත ලබාදී තිබුණු වාහනයක් 2019 දෙසැම්බර් 22 දින අනතුරට ලක්වී තිබුණු අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු හානි සම්බන්ධ පූර්ණ වාර්තාව ඉදිරිපත් කර තිබුණේ 2023 මැයි 22 එනම් අනතුර සිදුවී වර්ෂ 03 කුත් මාස 05 කට පසුවය. වාහනය රු.9,991,909 ක ඇස්තමේන්තුවක් මත අලුත්වැඩියා කටයුතු සඳහා 2023 මාර්තු 23 දින නියෝජිත ආයතනයට භාරදී තිබූ අතර, රක්ෂණ වන්දි ලෙස රු.3,700,000 ක් පමණක් අනුමතවී තිබුණි. ඒ අනුව අයකර ගත නොහැකි රු.6,217,909 ක අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 වාහන පද්ධතිය කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු අංක WP-JF 3105 දරන වාහනය 2004-2005 කාලය තුළ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇති බව ඉකුත් වර්ෂවල විගණන වාර්තා මඟින් දක්වා තිබුණද 2023 ජුනි 23 දින දක්වා ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වාහන 15 ක් එම දෙපාර්තමේන්තුවට විධිමත්ව භාරදීමට හෝ අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු නොකර අධිකාරියේ තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල භූමියේ රඳවා තබා තිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී වාහන අපහරණය සඳහා පත් කළ කමිටුවේ නිර්දේශය අනුව වාහන 45 ක් වාහන ලෙස බැහැර කිරීමටත්, වාහන 31 ක් නැවත අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමටත්, වාහන 63 ක් අබලි යකඩ ලෙස බැහැර කිරීමටත් තීරණය කර තිබුණි. අබලි යකඩ ලෙස බැහැර කළ වාහන 63 ක වැසි අංක ඉවත් කර එම වැසි අංක මෝටර් රථ ප්‍රවාහන රෙජිස්ට්‍රාර් වෙත භාරදී තිබුණද, එම වාහනවලින් 25 ක හිමිකාරීත්වය

අධිකාරිය සතුව නොතිබුණි. අබලි යකඩ ලෙස ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා භාරදෙන ලද අංක 31-9908 හා 32-2129 දරන වාහන විගණිත දින එනම් 2023 අප්‍රේල් 28 වනවිට පෞද්ගලික පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන බව මෝටර් රථ ප්‍රවාහන රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. අබලි යකඩ ලෙස ඉවත් කිරීමට වැසි අංක ඉවත් කළ වාහන 44 ක ලියාපදිංචිය විගණිත දින වනවිටත් අවලංගු කර නොතිබුණි.

2.3.8 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 34 ක් පැවතුණු අතර, ඉන් තනතුරු 15 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් තනතුරු 12 ක් සඳහා වැඩබැලීම්, රාජකාරී ඉටුකිරීම/රාජකාරී ආවරණය හා කොන්ත්‍රාත් පදනම් මත රාජකාරී ඉටුකරමින් පවතින අතර, එම තනතුරු ස්ථිරව පිරවීමට කටයුතු කර නොතිබුණි. අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවුණු තනතුරු 10 ක් සඳහා ස්ථිරව 13 ක් ද, කොන්ත්‍රාත් පදනමින් 32 ක් ද, වශයෙන් නිලධාරීන් 45 ක් බඳවාගෙන තිබුණි. ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 04 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 63 දෙනෙකු ස්ථිරව බඳවාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම

IV කොටස

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක: 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
இலங்கை மகாவலி அதிகாரசபை
இல.: 500, டி.பி. ஜயா மாவத்தை, கொழும்பு 10.
Mahaweli Authority of Sri Lanka
No.: 500, T.B. Jayah Mawatha, Colombo 10, Sri Lanka.

දුරකථනය தொலைபேசி Telephone 011-2687491-5
පැක්ස් අංකය பெக்ஸ் இல. Fax No. 011-2687391 011-2687240
විද්‍යුත් තැපෑල மின்னஞ்சல் E-mail dgmasl@sltnet.lk dg@mahaweli.gov.lk
වෙබ් අඩවිය இணையத்தளம் Website www.mahaweli.gov.lk

මගේ අංකය : MASL/FIN/F4/AG/22/34

2024.02. 21

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක: 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිතයන්ගේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

උක්ත කරුණ සම්බන්ධයෙන් මා වෙත යොමු කරන ලද ඔබේ අංක IWM/B/MASL/01/22/34 හා 2023.12.30 දිනැති විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු පහත දැක්වේ.

1.2 **අභිතකර මතය සඳහා පදනම.**

1.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පරිපාලනය, මෙහෙයවීම, ක්‍රියාකරවීම,නඩත්තුව හා වැඩි දියුණු කිරීම සිදු කරනු ලබන ප්‍රධාන වෙලි 11 හි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීම සඳහා එම වෙලි වල නෛතික අයිතිය කා වෙත කෙසේ පැවරී ඇත්ද යන්න පිළිබඳව නිශ්චිතභාවයකට පැමිණ නොතිබීම මත ඒ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ දැනට පවතින ලිපි ලේඛන ආශ්‍රයෙන් මේ වනවිට සාකච්ඡා කර ගෙන යන අතර එහිදී නිශ්චිතවම අධිකාරියේ අයිතිය තහවුරු කර ගෙන විධිමත්ව තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ප්‍රධාන කාර්යාලය ඇතුළු කලාප සහ අංශවල මූල්‍ය ප්‍රකාශන උපයෝගී කරගෙන ඒ මත පදනම්ව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කරයි.

ප්‍රධාන කාර්යාලය ඇතුළු කලාප හා අංශ වල මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා අවශ්‍ය උපදෙස්, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පදනම්, ගිණුම් කේත මෙන්ම අදාල අරමුදල් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පොදුවේ තීරණය කර ඇති අතර, ප්‍රධාන කාර්යාලය ඇතුළු එක් එක් කලාප

හා අංශ සඳහා වෙන වෙනම උපදෙස්, ප්‍රතිපත්ති, ගිණුම් කේත පිළිබඳ තීරණ ගනු නොලැබේ. එසේම සියළුම වත්කම් හා වගකීම් වල භාරකාරත්වයක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නමින් පවතී.

ඒ අනුව ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළුම කලාප හා අංශ සඳහා එකම මූල්‍යමය හා මෙහෙයුම් තීරණ ක්‍රියාත්මක බැවින් වත්කම් හා වගකීම් වල භාරකාරත්වය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුවන නිසා " හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය"ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුලත් දත්ත තුලින් පමණක් ඉදිරිපත් කර ඇත.

එසේම කලාප හා අංශ සඳහා වෙන වෙනම අරමුදල් ලබා දීම මෙන්ම ඔවුන් විසින් තම අංශය/කලාපය සතු සම්පත් උපයෝජනය කර ගෙන ආදායම් ඉපැයීම තුලින් අරමුදල් රැස්කරන බැවින් එකී කලාප/අංශ සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වෙන් වෙන් වශයෙන් පිළියෙල කල යුතු බව පිළිගනිමි. ඒ අනුව ගිණුම් ප්‍රමිත ප්‍රකාරව කලාප / අංශ සඳහාද අදාල ආකෘතිය ලබාදී 2023 වර්ෂයේ සිට එම ආකෘතිය පදනම්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඇ) පිළිගනිමි. 2023 වර්ෂයේ සිට ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කරමි.

නැවත ප්‍රකාශිත ශේෂ සඳහා ජර්නල් සටහන් වල සංලක්ෂය සහ විස්තරාත්මක තොරතුරු නැවත ප්‍රකාශිත ප්‍රකාශනය තුළ පෙන්වා ඇත.

(ඈ)

i වලව, රඹකැන්ඔය, මැදිරිගිරිය, මොරගහකන්ද, හුරුළුවැව, ඊ කලාපය හා ප්‍රධාන වෙළි හා ජලාශ මෙහෙයුම් අංශය යන කලාප/අංශ 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග "පූර්ව වර්ෂ ගැලපීම" ලෙස නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලදි. තවද එවි කලාපයේ අදාල කොන්ත්‍රාත් වලින් වැඩ නිමවී නොනිබූ තම්මැන්නාව වැව අසල හෙලබොජුන් හල ඉදිකිරීම හා කලාවැව සංචාරක බංගලාව නවීකණය යන කොන්ත්‍රාත්වල වටිනාකම "කෙරිගෙන යන වැඩ" ගිණුමේ සටහන් කර තිබුනි. එසේම නොච්චියාගම කොට්ඨාස කාර්යාලය අළුත්වැඩියාව සඳහා ලබා දී ඇති රු.මිලි.02 ක මුදල "අත්තිකාරම්" ලෙස ලබා දී ඇති බැවින් ප්‍රාග්ධනිත කර නොමැත.

ii මෙම කටයුතු කර ගෙන යාම සඳහා සියලු කලාප වෙත උපදෙස් ලබා දෙමින් මා විසින් අංක DL/ADM/45-1 හා 2023.09.04 දිනැතිව ලිපියක් යොමු කර ඇති අතර ඒ අනුව කලාප වෙතින් ඉඩම් කොටස් මැනුම් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම ඉඩම්, තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු කරවා ගැනීම සඳහා විශාල මුදලක් ගාස්තු වශයෙන් ගෙවීමට සිදු වන අතර ප්‍රතිපාදන සීමා වීම මත සහ මේ සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් පවතින බැවින් එකී ඉඩම් ප්‍රමාණය අනුව මෙම කාර්යය වසරකින් නිම කිරීමට අපහසු බව දන්වමි. ඒ අනුව අදාළ සියලු ඉඩම් තක්සේරු කර නිම කර ගැනීමට වසර කිහිපයක් ගත විය හැකි බව දන්වන අතර තක්සේරු කරන පිළිවෙල අනුව අදාළ ඉඩම් ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. කෙසේ නමුත් මෙකී ඉඩම් වල පිහිටි <u>සියළු නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි තක්සේරු අගයන් ගිණුම් පොත් වලට ගෙන අවසන් කර ඇත.</u>

කොළඹ 10, ටී.බී.ජයා මාවතේ අංක 493 සහ 493/01 යන ඉඩම් වල තක්සේරුව 2023.02.01 දින ලැබී ඇති බැවින් 2023 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. කොළඹ 10, ටී.බී.ජයා මාවතේ,

අංක 500 දරණ ඉඩම තක්සේරු කිරීම සඳහා දෙපාර්තමේන්තුවෙන් පැමිණි පසු ඉඩමේ සැලැස්මෙහි වෙනසක් පවතින බවට දන්වන ලද අතර ඒ අනුව ඉඩමෙහි සැලැස්ම අලුතින් සකස් කරවා ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නියම කර තිබූ ගාස්තු මේ වන විට ගෙවා ඇත. ඒ අනුව එම දෙපාර්තමේන්තුවෙන් පැමිණ ඉඩම මැනීමේ කටයුතු සිදු කර ලද අදාළ මැනුම් වාර්තා මෙතෙක් එවා නොමැත. එම වාර්තා ලැබුණු පසු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලබා දී තක්සේරු වාර්තාව ලබා ගෙන එම වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.

iii 2023 වර්ෂයේ දී අදාල නිවැරදි කිරීම් සහ හෙලිදරව් කිරීමට කටයුතු කරමි.

iv යන්ත්‍රය සවි කිරීම සඳහා ඒහි යම් යම් ඉදිකිරීම් කටයුතු සිදු කල යුතුව තිබුණි. මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කල අතර ප්‍රතිපාදන සීමා වීම නිසා යන්ත්‍රය සවිකිරීමේ කටයුතු සිදුකල නොහැකි විය. එහෙත් මේ වන වි ප්‍රතිපාදන සපයා ගෙන ට නැවත ඇස්තමේන්තුවක් සකස් කර යන්ත්‍රය සවිකිරීමේ කටයුතු නිමකර ඇත.

එම වත්කම මිලදී ගත් දින සිට ක්ෂය කිරීම නිවැරදි කර පාවිච්චියට ගත් දින සිට ක්ෂය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.

(ඉ) 2023 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හා 22 ඡේදය අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ඊ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කිරීමට සටහන් කර ගන්නා ලදී.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඊට අදාල ගැලපීම් සිදු කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉදිරිපත් කර ඇත.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2023 වර්ෂයේ සිට පූර්ව වර්ෂ සඳහා වන ගැලපුම් කිරීම් සටහන් හැකිතාක් අවම කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ආ) ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස නිවැරදිව දක්වා ඇත.

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ) (i). <u>තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලය.</u>

බදු ලේඛණ යාවත්කාලීන කරමින් පවතින අතර 2023 වර්ෂයේ ගිණුම් වල ගැලපීම් කිරීමට කටයුතු කරමි.

(ii). <u>ඉඩම් පරිහරණ ගාස්තු - වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය.</u>

වාරිමාර්ග, වනජීවී හා වන සංරක්ෂණ, හා පරිසර යන විෂයභාර අමාත්‍යවරුන් විසින් 2020.11.13 දින ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුලත් නිර්දේශ සඳහා 2020.12.20 දිනැති අංක අමප/20/1852/317/012 දරණ අමාත්‍ය මණ්ඩල මඟින් මෙම එදිනට හිඟ ඉඩම් පරිහරණ ගාස්තුවෙන් 25% පමණක් අයකර ගැනීමට අවසර දී ඇත. ඒ අනුව අයකර ගත යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තුව රු. 223,317,346.00 ක්

වන අතර ඉන් රු. 67,135.153.98 ක් 2023.12.31 දිනට අයකර ගෙන ඇති බව දන්වා සිටිමි.

(iii). <u>ලංකා පොහොර සමාගම.</u>

මේ පිළිබඳ පරීක්ෂා කර බලා ලැබිය යුතු ආදායම් ලෙස හඳුනා ගැනීමෙන් පසු ගැලපීම් කිරීමට කටයුතු කරමි.

(iv). <u>මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම.</u>

මහවැලි සත්ව ව්‍යාපාරික (පුද්) සමාගමට මෙම ගොවිපල විධිමත් පරිදි බදු දී නොමැති බැවින් බදු දීම වෙනුවෙන් ලැබිය යුතු ආදායම් ගිණුම් වලට ගලපා නොමැති බව දන්වමි.

(ඇ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපාතියෙන් ලැබී තිබූ වත්කම් වලින් 2022.12.31 දින වන විට ප්‍රත්‍යාගණනය කිරීමට පැවතියේ රු.මි.5 ක වත්කම් ප්‍රමාණයක් පමණි.

ඉන් රු.මි.4 ක වත්කම් 2023 වර්ෂයේ මේ වන විට හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර එය ගිණුම් වල ගැලපීමට කටයුතු කර ඇත. ඉතිරි රු.මි.1.0 ක වත්කම්ද හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර 2023 වර්ෂයේ ගිණුම් වල ගැලපීමට කටයුතු කරමි.

මොරගහකන්ද ව්‍යාපාතියෙන් ලැබුණු වත්කම් වලින් රු.මි.459.6 ක වත්කම් අධිකාරිය වෙත මේ වනවිට පවරා ඇති අතර එය ගිණුම් ගත කර ඇත. මෙම ව්‍යාපාතිය 2023.03.31 දිනෙන් අවසන් වීමට නියමිතව තිබුණද ව්‍යාපෘති කාලය තවදුරටත් දීර්ඝ කර ඇති බැවින් ස්ථාවර වත්කම් පැවරීම හා නිරවුල් කිරීමේ කටයුතු තවදුරටත් සිදු වෙමින් පවති. එම පැවරීමේ කටයුතු විධිමත් පරිදි අවසන් වූ විට විමසුමේ දක්වා ඇති පරිදි ව්‍යාපෘතියෙන් ලැබුණු ස්ථාවර වත්කම් ගිණුම් ගතකර අවසන් කළ හැක.

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපාතිය මඟින් ලබා දී ඇති වත්කම් වලින් ගිණුම් ගත නොකරන රු.මි.102.2 ක වත්කම් විධිමත් පරිදි හඳුනාගෙන ඇත. එය 2023 වර්ෂයේදී ගිණුම්ගත කරමි. ඉතිරි වත්කම්ද පරීක්ෂා කර බලා හඳුනා ගැනීමෙන් පසු ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි 49 ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධන හා අයභාර ප්‍රදාන ලැබූ වහාම අයභාර ලෙස හඳුනා ගෙන ගිණුම් ගත කර ඇත.

ව්‍යාපෘති වලින් ලැබුණු / ඉදිරියේදී ලැබෙන වත්කම්, ගිණුම් ප්‍රමිතිය මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.

(ඊ) ආයෝජන දේපල ලෙස බැහැර කර ඇති ඉඩම් සඳහා අදාල තක්සේරු වටිනාකම් පදනම් කර ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස සියළුම නේවාසික ව්‍යාපාර කළමණාකරුවන් මඟින් දැනටමත් උපදෙස් නිකුත් කර ඇත [අධ්‍යක්ෂ (ඉඩම්)ගේ අංක DL/ADM/69-1 හා 2023.06.19 දිනැති ලිපිය]. ඒ අනුව 2023 වර්ෂයේ දී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.

(උ) 2022.12.31 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් ශේෂ තහවුරු කිරීම් ලබා දෙන ලද්දේ විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් පසුව බැවින් මෙසේ වෙනස් වීමක් පිළිඹිබු කරයි. මේ පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර අවශ්‍ය ගැලපීම් 2023 මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ඌ) ආයෝජන පැවරීමට අදාල කටයුතු විධිමත්ව සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී.

(එ)

I ඊ කලාපය, එවි කලාපය හා ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය යන කලාප/අංශ 3 හි ගෙවිය යුතු ශේෂ පිළිවෙලින් රු. 7,449,354.94, රු. 12,330,317.00 හා රු. 3,446,294.00 ක් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගෙවිය යුතු ශේෂ ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.

ii 2018 වර්ෂයේදී වන්දි ගෙවීමෙන් පසු 2022.12.31 දිනට ගෙවිය යුතු හිඟ පොලී මුදල වන රු. 16,252,018.00 හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු රු. 2,006,667.00 ක මුදල 2022.12.31 දින වන විටත් විධිමත් පරිදි ගණනය කර නොතිබුණි. එහෙයින් ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනය සමඟ ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත.

iii 2023 වර්ෂයේ මූල්‍ය පුකාශන වල ගෙවිය යුතු ශේෂ ලෙස ගිණුම් ගත කිරීමට කටුයුතු කරමි.

(ඒ) පිළිගනිමි. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඔ)

i පිළිගනිමි. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

ii අංක PF – 7750 වාහනය ස්ථාවර වත්කම් ලේඛනයේ PG-7750 ලෙස වැරදීමකින් ඇතුළත්ව ඇති අතර එය PF-7750 ලෙස නිවැරදි විය යුතු බැවින් ඒ අනුව නිවැරදි කර ඇත.

KV – 7839, CAE – 5358 යන වාහන 2021 වර්ෂයේ මොරගහකන්ද ව්‍යාපෘතියෙන්ද CAE -1918 සහ PG – 2160 වාහන දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන්ද ලැබී ඇති අතර එම වාහන 2019 වර්ෂය වන විට ද **භෞතිකව** මහවැලි අධිකාරිය වෙත ලබා දී තිබුණි. නමුත් විධිමත් ලේඛන මඟින් වර්ෂයකට පමණ පසුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පැවරීම් කර ඇති අතර එම අවස්ථාවේ ව්‍යාපෘති විසින් ලබා දෙන ලද ලේඛණ වල සඳහන් වටිනාකම් පදනම් කර ගෙන එම වාහන ගිණුම් ගත කර ඇත.

එබැවින් දැනට ගිණුම් ගත කර ඇති වටිනාකම්, ව්‍යාපෘති වෙතින් අදාළ වාහන විධිමත්ව පවරන ලද ලේඛනවල සඳහන් දින හා වටිනාකම් සහ 2019 වර්ෂයේ ප්‍රත්‍යාගණන වටිනාකම් පදනම් කර ගෙන 2023.07.05 දින නිවැරදි වටිනාකම් සහ ක්ෂය වීම් වටිනාකම් ජ'නල් සටහන් මඟින් නිවැරදි කර ඇත.

iii පිළිගනිමි. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

iv පිළිගනිමි, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග නිවැරදි කිරීමට කටයුතු කරමි.

v පිළිගනිමි, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අදාල "වෙන්කිරීම්" සිදු කිරීමට කටයුතු කරමි.

(ඔ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2020.05.20 දිනැති චක්‍රලේඛ අංක 2020/6 මඟින් ලබා දී තිබූ උපදෙස් පාදක කර ගනිමින් හිඟ ආදායම් මුදල් ලෙස පිළිවෙලින් රු.46,478,749.00 ක් හා රු. 29,740,601.00 ක් ආදායම් මුදල් සංශෝධනයක් සිදුකර ඇති බව දන්වමි.

අනුමැතියකින් තොරව හිඟ බදු හා ඉඩම් පරිහරණ ගාස්තු, ආදායමින් කපා හැරීමක් සිදු වී නොමැති අතර චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරීමක් සිදු කර ඇති බව දන්වමි.

1.2.4 **විගණනයට සාක්ෂි නොවීම**

(අ) මෙම ශේෂයන් පිළිබඳව විශ්ලේෂණයක් සිදුකර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ නිරවුල් කිරීමට කටයුතු කරමි.

(ආ) සෑම වසරකම ආරම්භයේදී හර ශේෂ හා බැර ශේෂ ඊට පෙර වර්ෂයේ අවසාන ජංගම ගිණුම් ශේෂ සමඟ ගැලපීම් සිදු කරනු ලැබේ. ඒ අනුව 2022 වර්ෂයේ දී ද අදාල ගිණුම්කරණ ගැලපීම් සිදුකර ඇත.

(ඇ) මේ පිළිබඳ විස්තර සොයා බලා ඉදිරියේදී ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.**

2.2.2 **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.**

(අ) ඉඩම් සංවර්ධන (සංශෝධන) පනතේ 72 වගන්තිය ප්‍රකාරව මහවැලි සී කලාපයේ ගිරාදුරුකෝට්ටේ කොට්ඨාසයේ 2014 වර්ෂයේදී සිමිත ඉඩම් කච්චේරියක් පවත්වා එම තේරීම් ලාභීන් වෙත නොමැනු යටතේ මායිම් දමා අවසර පත්‍ර නිකුත් කර පසුව මායිම් පෙන්වා ඉඩම් බැහැර කර ඇත. නවුත් හොබරියාව, රත්කිඳ, තෙල්දෙණියාය සහ උල්හිටිය යන ගම්මාන වල තේරීම් ලාභීන් 184 ක් සඳහා නොමැනු යටතේ මායිම් දමා අවසර පත්‍ර නිකුත් කර ඇතත් මිනුම්දෝරු මහතුන්ගේ සහය නොලැබුණ හෙයින් එකී ඉඩම් කොටස් මායිම පෙන්වා තේරීම්ලාභීන් වෙත භාර දී නොමැත.

2014 වර්ෂයේ සිට ඉඩම් මැනුම් කර ඉඩම් කට්ටි පෙන්වා දීමට කටයුතු කලත් සිතියම් ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් එම ඉඩම් පෙන්වීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. 2021 වර්ෂයේ මැනුම් කටයුතු සිදු කර ඉඩම් බැහැර කිරීමේ කටයුතු ආරම්භ කලත් එකී අවස්ථාවේ ඇති වූ විරෝධතාවයක් හේතුවෙන් එය ද නතර කිරීමට සිදු විය.

එසේ වුවත් අවසර පත්‍ර නිකුත් කර ඇති පුද්ගලයන් වෙත ඉඩම් බැහැර කිරීම සඳහා ඉඩම් හදුනාගෙන ඇති බව දන්වා සිටිමි.

(ආ) පිළිගනිමි. මහවැලි බී කලාපයේ කන්දකාඩු ගොවිපල වටා ඉදි කල අලිවැට හා එවි කලාපයේ ඉදිකල මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය හා මඩ පොකුණු ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද අත්තිකාරම් පියවීමට අදාල අංශ විසින් ඉදිරිපත් කල තොරතුරු ප්‍රමාණවත් මට්ටමක නොමැති බැවින් එය විධිමත් කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත.

සී කලාපයට අයත් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වටා ඉදි කරන ලද එල්ලෙන විදුලි වැටෙහි තාක්ෂණික ගැටළු පැන නැඟී ඇති බැවින් එය මහවැලි අධිකාරිය වෙත භාර ගැනීමට නොහැකි මට්ටමක පවතින බැවින් ඒ පිළිබඳව පරීක්ෂාකර වාර්තා කිරීම සඳහා මා විසින් විශේෂ කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තා ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වමි.

(ඇ) බාහිර ආයතන සඳහා මුදා හැර ඇති ආරක්ෂක බලකායේ ආරක්ෂක නියාමක නිලධාරීන් අතුරින් විශ්‍රාමික ජනාධිපතිතුමා වෙත මුදා හරින ලද නිළධාරීන් 05 දෙනා සහ වාරිමාර්ග අමාත්‍යාංශයට මුදා හරින නිළධාරීන් 14 දෙනා හැර අනෙක් ආයතන සඳහා අනුයුක්ත කරන ලද නිළධාරීන් මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ රාජකාරි සඳහා නැවත වාර්තා කර ඇත.

විශ්‍රාමික ජනාධිපතිතුමාගේ සහ අනෙකුත් ආයතන සඳහා මුදාහරින ලද ආරක්ෂක නියාමකයින් වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය සඳහා අදාල ආයතන වලට ලියාපදිංචි තැපෑලෙන් ලිපි යොමු කලත් එයට ප්‍රතිචාරයක් දක්වා නොමැති බව දන්වමි. එසේම වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට සහ අග්‍රාමාත්‍ය කාර්යාලයට මුදා හරින ලද නිළධාරීන්/ සේවකයින් වෙනුවෙන් වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම සිදුවන අතර ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය ගේ අංක MI/F/26/MA/2022 හා 2022.09.05 දිනැති ලිපිය මගින් ලබාදී ඇති උපදෙස් වලට අනුව වාරිමාර්ග අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයන් වෙනුවෙන් වැයකල මුදල් ප්‍රතිපූර්ණය කිරීමක් සිදු නොකරයි.

2.2.4 **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

(අ) බකමූණ නගරයේ මහජන බස්නැවතුම්පල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිලිබඳ මධ්‍යම උපදේශන කාර්යංශයට පිරිනැමීම සිදු කලේ එම කොන්ත්‍රාත්තුව සඳහා 2021 අගෝස්තු 24 දිනැති අංක අමප,21/1396/317/039 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශ ප්‍රකාරව ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල තීරණය මත වේ.

තවද මෙම කොන්ත්‍රාත්තුව, ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන් වල සිදු වූ සිඝ්‍ර වර්ධනය හා රට තුල ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ මුදල් ප්‍රතිපාදන නොමැති වීමෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත මෙම කොන්ත්‍රාත්තුව 2023.05.12 දින අවලංගු කර ඇත.

මෙම අවලංගු කිරීම සිදු කලේ එමගින් කිසිදු හානියක් රටේ මහජනතාවට හෝ පරිසරයට සිදු නොවන ලෙස වන අතර ඉදිරි වැඩ කටයුතු සඳහා අදාල ඇස්තමේන්තු සකස් කිරීමට නියමිතව ඇත. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වූ පසු මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිරි වැඩ කටයුතු නිමකිරීමට බලාපොරොත්තු වේ.

ඉහත වැඩපූර්ව අත්තිකාරම් නිරවුල් වන තෙක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවීමට ඇති වෙනත් කාර්යයක් සඳහා වූ රුපියල් මිලියන 13 ක් ද ගෙවීම් කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.

(ආ) රඹකැන්ඔය කලාපයේ මහඔය කඳවුරු පරිශ්‍රයේ iv ශ්‍රේණියේ නිල නිවාසයක් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත් අංක MA/TS/RIDE/B/57 යටතේ ස්පයිරල් කන්ස්ට්‍රක්ෂන්, අංක 334/5, මාලිගාතැන්න, ගුරුදෙණිය යන අය හට මෙම

කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 14 දින රු. 4,843,183.00 ක මුදලකට ප්‍රදානය කර ඇත. එම කොන්ත්‍රාත්තුව 2018 මැයි 06 දිනට වැඩ අවසන් කළ යුතුව පැවතුන අතර ඒ සඳහා රු. 1,414,555.65 සංවලන අත්තිකාරම් ගෙවා ඇත. නමුත් උක්ත කොන්ත්‍රාත්කරු විසින් එය අතහැර දමා ගොස් ඇති අතර ඒ වෙනුවෙන් ගෙවා ඇති සංවලන අත්තිකාරම් අය කර ගැනීම සඳහා මහවැලි අධිකාරියේ නීති අංශය මගින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසා ඇති අතර, ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් නීරීක්ෂණ පාදක කොට ගෙන නීති අංශය මගින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.

මෙහි ඉතිරි වැඩ නිම කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් පටිපාටියට යොමු කළද රටේ පැවති මූල්‍යමය හිඟය සමඟ ගොඩනැඟිලි ඉදි කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් එහි ඉදිකිරීම් කටයුතු ඉදිරියට කරගෙන නොගිය බව දැනුවත් කිරීමට කැමැත්තෙමි.

ඉදිරියේදී ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා මුදල් වෙන් වූ පසු මෙහි ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

රත්කිඳ සංචාරක බංගලාව අලුත්වැඩියාවට අදාළව 2018 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර වැඩ ආරම්භ කරනු ලැබීය. ඉහත කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 29 දින අහෝසි කර ඇති අතර කොන්ත්‍රාත්තුව අහෝසි කිරීම මත සකසන ලද අවසන් බිල්පතට අනුව ඉටු නොකළ වැඩ සඳහා 25% ක අධිභාරය වන රු. 2,424,281.54 මුදලද ඇතුළුව රු. 3,703,459.38 ක සම්පූර්ණ මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අය කිරීමට ඇති අතර 2023.08.23 දිනැති ලිපිය මගින් කොන්ත්‍රාත්කරු වෙත මේ බව දන්වා ඇත. මෙම ලිපියේ පිටපතක් ඉදිරි නීති කටයුතු සඳහා නීති අංශය වෙත යොමු කර ඇත.

රටෙහි ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 සහ 2023 වර්ෂවලදී නව ඉදිකිරීම් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් නොවූ අතර ඉදිරියේ දී මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්වූ පසු නව කොන්ත්‍රාත්තුවක් වශයෙන් මෙම කාර්යය අවසන් කල හැකි වේ.

(ඇ) ඉහත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම 2021 මැයි 25 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක IR/2021/31 අනුව 2021 ජුනි 14 දිනැති අංක 21/0967/317/026 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) ආයතනයට සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 (Supplementary 35) අනුව සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ පිරිනමා ඇත.

තවද අදාල කොන්ත්‍රාත්තුව සිදුකිරීමට අදාල ඉඩම, මාර්ග සංවර්ධන අධිකාරියේ රක්ෂිත සීමාවට අයත්ව තිබූ බැවින් සහ එම රක්ෂිත සීමාව තුළ මාර්ග සංවර්ධන අධිකාරිය අදාල ඉදිකිරීම සිදු කිරීමට අවසර ලබා නොදීම නිසා ඉහත කොන්ත්‍රාත්තුව 2023.04.28 දින අන්‍යෝන්‍ය එකඟතාව මත අහෝසි කිරීමට කටයුතු කර ඇත.

තවද මෙම ඉදිකිරීම් වෙනුවෙන් අදාල කොන්ත්‍රාත් සමාගමට ලබාදෙන ලද සංවලන අත්තිකාරම් මුදල වන රු. 2,062,201/= ක මුදල එම කොන්ත්‍රාත් සමාගමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ගෙවිය යුතු හෙල බොජුන් හල ඉදි කිරීමේ බිල් පතින් අඩුකර ගැනීමට කටයුතු කරන බවද දන්වා සිටිමි.

(ඇ) මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම පළාත් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පැරණි ගොඩනැගිලි සහිත වරාපිටිය ඉඩම පවරා ගැනීම සහ නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර ගරු අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2016.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/1857/704/052) ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව යෝජිත නව ගොඩනැගිල්ලේ පළමු අදියර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත සැලසුම් කර ඉදිකර

හාරදීමේ (Trunkey) පදනම මත පළමු අදියර පිරිනැමීමට අනුමැතිය ලැබී ඇත.

මෙම කාර්යය සඳහා වූ ඇස්තමේන්තුගත මුදල වන රු. 32,096,839.32 ක මුදල පළමු අදියර වශයෙන් බිම් මහලේ ස්ලැබ් (Slab Level) මට්ටම දක්වා ඉදිකිරීම සඳහා පමණක් ඉදිරිපත් කර ඇත . 2017.08.22 දිනැති අමාත්‍යාංශ ලේකම් විසින් මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති වෙත යොමු කොට ඇති MMDE/TS/Miscellaneous/ 2017/083 අංකය සහිත ලිපියෙහි ලේකම් විසින් එම ගොඩනැගිල්ල පුද්ගලිකව නිරීක්ෂණය කල බවත්, ඉතා ඉක්මනින් ප්‍රයෝජනයට ගතහැකි සතුටුදායක මට්ටමේ ඇති බවද දන්වා ඇත. මීට අමතරව මෙම ගොඩනැගිලි කාර්යාලය ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති හෙයින්, ඉදිරියේ දී මධ්‍යම පරිසර අධිකාරිය වෙත ප්‍රතිපාදන ලැබීමෙන් පසු ඉදිකිරීම් කඩිනමින් අවසන්කර එම කාර්යාලයේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත බව දැනුම් දී ඇත.

2.3 වෙනත් කරුණු

2.3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මෙම සමාගම රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස (PPP) ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන පහත ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත.

PFD/PMD/APP/irri/2023/08/02 හා 2023.05.02 හා 2023.05.09 දිනැති ලිපිය මඟින් පිළිවෙලින් "අමාත්‍ය මණ්ඩලය පත් කල සාකච්ඡා සම්මුති කමිටුව (CANC) සහ "ව්‍යාපෘති කමිටුව" රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කර ඒවා ඇත.

ඒ අනුව මෙම කාර්යට අදාල සියළු ලිපිලේඛන ව්‍යාපෘති කමිටුව (CANC) වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන අනතුරුව එය අමාත්‍ය මණ්ඩලය පත් කල සාකච්ඡා සම්මුති කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර එම අනුමැතිය මත ඉදිරි මාස 03 ඇතුලත පුවත්පත් දැන්වීම් පල කර අදාල ආයෝජකයා තෝරා ගැනීමට සැලසුම් කර ඇත.

මේ සඳහා 2023.05.25, 2023.06.28 හා 2023.07.19 යන දිනයන්හි ව්‍යාපෘති කමිටුව නැවත රැස් වූ අතර එම රැස්වීම් වලදී යෝජිත වූ කරුණු සම්බන්ධ වාර්තාවක් 2023.08.07 දින අමාත්‍ය මණ්ඩලය පත්කල සාකච්ඡා සම්මුති කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 2023.08.27 දින අමාත්‍ය මණ්ඩල පත් කල සාකච්ඡා සම්මුති කමිටුව රැස්වූ අතර ව්‍යාපෘති කමිටුව ඉදිරිපත් කල වාර්තාව පදනම් කර ගනිමින් කටයුතු කිරීමට දෙන ලද උපදෙස් අනුව ලිපිලේඛණ සකස් කර ව්‍යාපෘති කමිටුව 2023.09.26 දින රැස් වී එහිදී අභිලාෂයන් කැඳවීමේ දැන්වීම, අයදුම්පත, ව්‍යාපෘති මාර්ගෝපදේෂය සඳහා සම්මත ඉල්ලිම, කාල රාමුව යන ලේඛණයන් සකස් කර අමාත්‍ය මණ්ඩලය පත්කල සාකච්ඡා සම්මුති කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට සූදානම් කර ඇත. ඉන්පසුව පුවත්පත් දැන්වීම් පලකොට අභිලාෂයන් කැඳවීම සිදු කරනු ඇත.

එසේම " සමාගමේ වත්කම් පිළිබඳ තක්සේරුව ලබා ගැනීම'' හා "බාහිර පුද්ගලයින් තිදෙනෙකු වෙත පවරා ඇති සමාගමේ කොටස් නැවත මහවැලි අධිකාරිය වෙත පවරා ගැනීම" සඳහා රජයේ ආයතන සමඟ එක්ව කටයුතු

කල යුතු බැවින් එම කාර්යන් අවසන් වූ විගස අමාත්‍ය මණ්ඩල පත්කල සාකච්ඡා සම්මුති කමිටු රැස්වීම පවත්වා ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ගෙන ඇත.

(ආ) මෙම පරිශ්‍රයේ මෙම සමාගම පිහිටුවීමට ප්‍රථම අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය ස්ථාපිතව තිබී ඇති අතර එය 1998 වසරේදී මෙම සමාගම ලියාපදිංචි කිරීමත් සමඟම එහි තිබූ කාර්යාල උපකරණ ආදිය අළුතින් පිහිටවූ සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම වෙත භාර දී එය අධිකාරිය එම සමාගම වෙත කල ආයෝජනයක් ලෙස ගිණුම් වල "ආයෝජන" ලෙස දක්වා ඇත. එම නිසා අධිකාරියේ වත්කම් ලේඛණයේ දෙමටගොඩ පරිශ්‍රයේ ගොඩනැගිලි වල හා ඉඩමෙහි වටිනාකම පමණක් සඳහන්ව ඇත.

(ඇ) මෙම සමාගම් දෙක අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව ඇවර කිරීම සඳහා ඇවරකරුවන් පත් කර ඇති අතර ඇවරකරුවන්ගේ රැස්වීම් වාර දෙකක් මේ වන විට පවත්වා ඇත. ඊට අමතරව සේවක අර්ථසාධක අරමුදල සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල හා දේශීය ආදායම් දෙපාර්තමේනතුව ආදී ආයතන වෙතින් අයවීම් සම්බන්ධ තොරතුරුද කැඳවා ඇත. විධිමත් පරිදි රජයේ ගැසට් පත්‍රයේ හා ජාතික පුවත්පත් දෙකක දැන්වීම් ඵලකර ණයහිමියන්ගේ රැස්වීමක්ද පවත්වා ඇත. ඒ අනුව සමාගම් දෙක ඇවර කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ඈ) වර්ෂය තුල සිදු කල යුතු කාර්යන් වසර මුලදී ඇස්තමේන්තු ගත කරයි. ඒ අනුව වර්ෂය ආරම්භයේ කාර්යන් සඳහා ලබා දිය හැකි අවම ශ්‍රම දින ගණන ඒ අනුව අදාල කාර්ය නියමිත කාලයේදී අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ලබා දීම සිදු කරයි.

ගොවි සංවිධානය මඟින් මෙම කාර්යය සිදු කිරීමේදී ආයතනයට පහත අවාසි සිදුවේ.

- කොන්ත්‍රාත් කටයුත්ත අදාල බල ප්‍රදේශයට අයත් මූල්‍ය, තාක්ෂණික හා කළමනාකරණ හැකියාවන් යන අවශ්‍යතා සපුරන ගොවි සංවිධාන අවම වීම මත අවශ්‍ය අවස්ථාවේදී අදාල කාර්ය සිදු කර ගැනීම අපහසු වීම.

- කම්කරු කාර්යාලයේ නිතිරීති වලට යටත්ව ගොවි සංවිධාන ලියාපදිංචි කල යුතු බැවින් එවැනි ගොවි සංවිධාන සොයා ගැනීමේ අපහසුව

- ශ්‍රමික අවශ්‍යතා වලට සරිලන විශේෂිකරණයට ලක්වූ ශ්‍රමිකයන් එහි නොමැති වීම.

- ජල පාලන කටයුතු වලදී පුද්ගල පක්ෂපාති බවට කටයුතු කිරීම නිසා ජල කළමනාකරණයට බාධා වීම.

- ගොවි සංවිධාන පදනමෙන් ලබා ගන්නා ශ්‍රමිකයන් පසුකාලීනව සේවක අයිතිවාසිකම් ඉල්ලීම.

- වාර්ෂිකව ගොවි සංවිධාන නිළධාරීන් වෙනස් වීම මත වගකීම් පැහැර හැරීම.

- ගොවි සංවිධාන මඟින් කම්කරුවන් ලබා ගැනීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් මුදල සඳහා 5% ක අතිරේක මුදලක් ගෙවිය යුතු වුවත් කොන්ත්‍රාත් පදනමට අවම මිල ගණන් කැඳවා අඩුම මිලට අවශ්‍යතාවය ඉටු කර ගත හැක.

ඒ අනුව විධිමත් ක්‍රමවේදය යටතේ ශ්‍රම අවශ්‍යතා සපුරා ගෙන ඇත. එසේම ගොවි සංවිධාන මඟින් කම්කරුවෙකු ලබා ගැනීමේදී නුපුහුණු කම්කරුවෙකුට අවම වශයෙන් රු. 2,000.00 ක්ද, සනීපාරක්ෂකයෙකු සඳහා රු.3,000.00 ද 5% ලාභාංශයක් ගොවි සංවිධානයට ගෙවිය යුතුයි.

නමුත් විවෘත මිල කැඳවීම යටතේ වසරතුලම ශ්‍රම ඒකකයකට වැයවන්නේ රු. 1,466.50 ක් පමණකි. එබැවින් ඉහත කරුණු සළකා බලා කොන්ත්‍රාත් පදනම මත මෙම කාර්ය සිදුකර ඇත.

(ඉ) අදාල ගබඩා සඳහා කුලි මුදල් ගෙවීමට වී අළෙවි මණ්ඩලයට හැකියාවක් නොමැති බව වී අළෙවි මණ්ඩලයේ සභාපති විසින් ලිඛිතව දන්වා තිබූ පරිදි එම ගබඩා කුලී ගෙවීමෙන් නිදහස් කර වී අළෙවි මණ්ඩලය වෙත පවරා ගැනීමට අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස සභාපති, වී අළෙවි මණ්ඩලය වෙත දැනුම් දී ඇත. එහි ප්‍රගතිය අනුව ඉදිරි කටයුතු සිදු කරමි.

(ඊ) කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති ආයෝජකයන් විසින් 2021 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සලකා බලා එවක සිටි ජනාධිපති ලේකම්වරයා විසින් "ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව" අයකිරීම අත්හිටුවන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා අදාල අනෙකුත් ආයතන වෙත උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව එම තීරණය ලබා දුන් 2021 නොවැම්බර් මස සිට අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නොලැබී ඇත.

එසේ වුවද 2022 ජූනි මාසයේදී අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව නැවත අයකල හැකි බව ජනාධිපති ලේකම්වරයා විසින්ම උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව 2022 ජූනි මස සිට ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව ලැබිය යුතු වුවද ඒ වනවිට ලංකා විදුලි බල මණ්ඩලය මුහුණ දී සිටි මූල්‍ය අර්බුදය හේතුවෙන් කුඩා පරිමාණ ජල විදුලි බලාගාරවලින් මිලදී ගත් විදුලිය සඳහා ගෙවීම් නොකල අතර ඒ අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතද ලැබිය යුතු ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව නොලැබුණි. නමුත් මේ වන විට එකී මූල්‍ය අර්බුදය ක්‍රමයෙන් සමනය වෙමින් පවතින බැවින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් අදාල කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘති සඳහා නිහ මුදල් ගෙවීම ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතද අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව 2023 ජූලි මස සිට ලැබෙමින් පවතී.

කෙසේ වුවද ජනාධිපති ලේකම් වරයාගේ උපදෙස් පරිදි ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව ගෙවීම අත්හිටවූ 2021 නොවැම්බර් මස සිට 2022 ජූනි මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුව අයකර ගැනීමට හැකියාවක් නොමැත.

මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 65 ඉදිකර ඇත්තේ මෙයට වසර 15-25 තරම් පෙර වන අතර ඒවා ඉදිකිරීමේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මැදිහත් වීමකින් තොරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අදාල අනුමැතීන් ලබා දී ඇත. වර්තමානයේදී මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වලින් ජනනය කරනු ලබන විදුලිය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් මුදල් ගෙවනු ලබන්නේ ඒවායේ නඩත්තු වියදම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් වන පරිදි පිලියෙල කරන ලද ගෙවීම් ක්‍රමයකට (Tariff) අනුවය. එසේ හෙයින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුවක් අයකර ගන්නේනම් එකී බලාගාර සඳහා ගෙවනු ලබන ගෙවීම් ක්‍රම ඊට අනුකූලව සංශෝධනය කල යුතු වේ. එසේ හෙයින් මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 65 වෙතින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ශාස්තුවක් අයකර ගැනීම සඳහා ගිවිසුම් ගතවීමේ හැකියාවක් දැනට නොමැත.

(උ) 2020 දෙසැම්බර් 20 දිනැති අංක අමප/20/1852/317/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ව්‍යාපාරිකයින් 15 දෙනෙකු වෙතින් අයවිය යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු ලෙස මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති ව්‍යාපාරිකයන් 15 දෙනා පහත පරිදි වේ. ඒ අතුරෙන් ආර්. එල් බැසිල් රෝහණ , වයිනා ස්ටෝට් කන්ස්ට්‍රක්ෂන් සමාගම, සී. කේ. දිසානායක යන අය විසින් සියලු හිඟ මුදල් ගෙවා අවසන් කර ඇති අතර ශ්‍රී ලංකා යුධ හමුදාව හා කේ.ජී රත්න කුමාර යන අය විසින් විධිමත්ව මාසික වාරික ගෙවමින් පවතී. ඉතිරි අයගෙන් මෙම මුදල් අය කර ගැනීම සඳහා පොදු දේපල පනත යටතේ ඒ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වන පොලිස් බල ප්‍රදේශ වල පැමිණිලි ගොනු කර ඇති අතර මාගා ඉංජිනේරියන් වෙත කොළඹින් පැමිණිලි ගොනු කිරීමට කටයුතු කරන ලෙස අදාළ පොළිස් ස්ථානයෙන් උපදෙස් ලබා දී ඇත.

(ඌ) ප්‍රධාන වේලි හා ජලාශ, වැව්, පාරවල් හා අදාල ඇල මාර්ග වල වටිනාකම් තක්සේරු කිරීම වෘත්තීය සුදුසුකම් ලත් වරලත් ඉංජිනේරුවන් (Chartered Engineers) විසින් පහත සඳහන් නිර්නායකයන් යටතේ තක්සේරු කර ඇත.

I). කුඩා, මධ්‍යම සහ මහ වැව් ඉදිකිරීමට සඳහා භාවිතා කල අමුද්‍රව්‍ය වල ප්‍රමාණය පවතින ඒකක මිලෙන් ගුණ කිරීමෙන්

II). පාරවල්, ප්‍රධාන, අතු බෙදුම් හා කෙත් ඇලවල් කි.මී.1 ක් ඉදි කිරීම සඳහා භාවිතා කල අමුද්‍රව්‍ය වල ප්‍රමාණය පවතින ඒකක මිලෙන් ගුණ කිරීමෙන්

2.3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ)

i මහවැලි සී කලාපයේ 2016, 2017 හා 2018 වර්ෂවල මාසයකට අදාල ඉඩම් පරිහරණ ගාස්තු පමණක් අයකර වැලි කැනීම් කිරීම සඳහා වැලි කැනීම් බලපත්‍ර 386 කට අදාල ඉතිරි කාල සඳහා අයකර ගතයුතු ඉඩම් පරිහරණ ගාස්තු රුපියල්:509,861,400/= ක් දක්වා ඇති අතර මෙම මුදල නිවැරදි නොවන බැවින් එම මුදල නිවැරදි කර ගැනීමට අදාල තොරතුරු ලබා ගැනීමට භූ විද්‍යා හා පතල් කාර්යංශයේ බදුල්ල කැනීම් ඉංජිනේරු වෙත ලිපි යොමු කර ඇත. ඒ අනුව අයවිය යුතු මුදල රු.278,685,665.00 ක් බව RMR/BD/RPM/Mmahaweli/2023/13 හා 2023.07.17 දින කාර්යභාර ඉංජිනේරු (බදුල්ල), බණිජ හා පතල් කැණීමේ කාර්යංශය මගින් දන්වා ඇත. ඒ අනුව අදාල මුදල සංශෝධනය විය යුතු බව දන්වමි.

තවද රජයට ආදායමක් අහිමි කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගැනීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් මගින් පරීක්ෂණයක් සිදු කර ඇත. එම විමර්ශනයේ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

(ආ) ඉඩම් කළමනාකරණය කාර්යක්ෂම කරලීම අරමුණු කර ගනිමින් අප ආයතනයට ඉඩම් කළමනාකරණ (E-Slims) දත්ත පද්ධතිය 2016 වර්ෂයේ හඳුන්වා දී ඇත. ඒ අනුව 2019 වසර වන විට රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කැබලි පන්දහසකට අධික ප්‍රමාණයක තොරතුරු ඊට ඇතුලත් කර ඇත. නමුත් මෙම වැඩසටහන සඳහා පුහුණු කළ නිලධාරීන් 60 දෙනා උසස්වීම් ලැබීම හා සේවයෙන් ඉවත් වීම යන හේතු නිසා වැඩසටහනට යොදවා ගැනීමට නොහැකි වීම, කොරෝනා වසංගතය, 2019 වසරේ දී ඉඩම් ඔප්පු ලබා දීමේ කඩිනම් වැඩ සටහන සඳහා සියලු නිලධාරීන් ඒ සඳහා

යොදවා ගැනීම හා රජයේ දත්ත අවකාශය LGC1 සිට LGC2 දක්වා මාරු කිරීම යන කරුණු හේතුවෙන් අදාල දත්ත පද්ධතිය අක්‍රීය වීම මත දත්ත ඇතුලත් කිරීම නතරවී ඇත. 2023.05.23 හා 2023.08.10 යන දින වල පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ද මෙම කරුණු පිළිබඳ කරන ලද නිර්දේශ පදනම්ව කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක විශේෂඥ සහය ද ලබා ගනිමින් 2023 වසරේසදී මෙම පද්ධතිය නැවත යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. තාක්ෂණ ඇගයීම් කමිටුව හා උපදේශන ප්‍රසම්පාදන කමිටුව (CPC) යන කමිටු පත්කර ඇති අතර මේ වන විට තාක්ෂණ ඇගයීම් කමිටුවෙහි කමිටු වාර දෙකක් පවත්වා මිල ගණන් පිළිබඳ එකගතාවය ලබා ගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරමින් පවතී. ඒ අනුව තොරතුරු ඇතුලත් කිරීම සඳහා කලාප හා කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් සකස් කර 2024 අප්‍රේල් මස වන විට ඉඩම් දත්ත ඇතුලත් කර අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) තවදුරටත් භුක්තිය දරණ අනවසරකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගැනීම සඳහා රක්ෂිත ඉඩම් මැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී මැනුම් කටයුතු කිරීමට සූදානම් කර ඇත. ඊට අමතරව කලාප තුල ජලාශ රක්ෂිත අනවසර ලෙස මහ කන්නයේ වී වගාව සඳහා පමණක් රක්ෂිත ඉඩම් වල අනවසර ක්‍රියාකාරකම් 1489 න් 547 ක් පමණ අනවසරයෙන් වගා කටයුතු සිදු කල අතර කලාපීය මට්ටමින් දැනුවත් කිරීම සිදු කර එම අනවසර වගාවන් සඳහා ඉඩම් වලට අතුලුවීම වලක්වා ඇත.

ඊට අමතරව ස්ථීර බෝග වගා කරන ලද අනවසර පුද්ගලයින් 651ක් වන අතර ඔවුන්ට එරෙහිව ආයතනික ක්‍රියාමාර්ග හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර ඇත. තවද අනවසරයෙන් ඉඩම් භුක්ති විඳි පුද්ගලයින් 17 ක් පමණ ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ස්ථීර නිවාස ඉදිකර ඇති පුද්ගලයින් පදිංචි ඉඩම් හදුනා ගැනීම සඳහා මැනුම් කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මැනුම් කටයුතු වලට සමගාමීව සන්තකය ආපසු ලබා ගැනීම පනත යටතේ කටයුතු කර ඊට එරෙහි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සුදානම් කර ඇත.

තවදුරටත් අනවසර ක්‍රියාකාරකම් වලක්වා ගැනීම සඳහා අංක DL/ADM/69-1 හා 2023.09.12 ලිපිය මගින් නැවත අනවසර අල්ලා ගැනීම් සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සියළුම නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. රට අමතරව සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් හා අධීක්ෂණ නිලධාරීන් වෙත තමා විසින් අධීක්ෂණය කලයුතු රක්ෂිතය හා සිතියම් ඇතුලත්ව රක්ෂිත ආරක්ෂා කර ගැනීම පුද්ගලිකව රාජකාරි කර භාර දෙන ලෙස DL/ADM/69-1 හා 2023.08.04 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී ඇත. DL/ADM 69-1 හා 2023.09.01 ලිපිය මගින් ජලාශ රක්ෂිත වල අනවසර ඉදිකිරීම් ඇතුලු සියළුම අනවසර ක්‍රියාකාරකම් වලට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා සියළුම කලාප මට්ටමින් ක්‍රියාත්මක වැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

අධ්‍යක්ෂ (ජලාශ හා මෙහෙයුම්) යටතේ පවතින ජලාශ රක්ෂිතවල අනවසරකරුවන් ඉවත් කිරීම සඳහා මායිම් හඳුනාගත යුතු අතර ඒ සඳහා මැනුම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ඊට අමතරව අනවසර කරුවන් 67 දෙනාගෙන් 57 ක් සඳහා ඉඩමෙන් ඉවත්වන ලෙස ලිපි නිකුත් කර ඇති අතර එම අනවසරකරුවන් ඉවත් කිරීම සඳහා ආයතනික ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ඇ) ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) සහ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා ආරම්භ කර ඒ අනුව අදාළ තැන්පත් මුදල් වන රු.මිලි. 50 සඳහා වර්තමානය වනවිට රු.මිලි. 26.196 ක පොලී ආදායම සමඟ මුළු එකතුව රු.මිලි. 76.196 ක ශේෂයක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පවතින බවට සනාත කර ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේද එකඟතාවය අනුව ණය අයදුම්කරුවන් පෙර සඳහන් නිර්ණායක අනුව 10 දෙනෙකු බැගින් තෝරා අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) වෙත එවන ලෙස සියලුම කලාප ලිඛිතව දැනුවත් කර ඇත.

කොටියාශ කාර්යාල, ඒකක කාර්යාල මට්ටමින් ව්‍යාපාර සංවර්ධන නිලධාරීන්/ආයතන සංවර්ධන නිලධාරීන් ගේ මූලිකත්වය යටතේ, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (සංවර්ධන)ගේ මගපෙන්වීම සහ කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන්ගේද අධීක්ෂණය යටතේ ණය අයදුම්කරුවන් තෝරාගෙන නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

ණය අයදුම්කරුවන් 100 ක් මූලික අදියර යටතේ උපරිම රු.මි.0.5 දක්වා ණය මුදල් කෘෂිකර්ම, සත්වපාලන, හා වෙනත් අගය එකතුකළ නිෂ්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම හා පවතින ව්‍යාපාර නවීන තාක්ෂණය භාවිතාකර වැඩිදියුණු කිරීම සඳහා පෙර කී නිර්ණායක අනුව අදාළ ක්‍රමවේදය ඔස්සේ ලබාදීමටද සැලසුම් කර ඇත.

එක් කලාපයකින් 10 දෙනෙකු බැගින් තෝරාගන්නා ව්‍යවසායකයින්ගේ ව්‍යාපෘති වාර්තා අධ්‍යනය කර,ක්ෂේත්‍රය පරීක්ෂා කර ණය අයදුම්පත්‍රය නිර්දේශ කර බැංකුව වෙත යොමුකිරීමට කටයුතු කෙරේ.එහිදී අදාළ බැංකු ශාඛාව විසින් ව්‍යාපෘති වාර්තාව අධ්‍යනය කර ක්ෂේත්‍ර අධ්‍යනයෙන් අනතුරුව ණය අයදුම්කරුගේ ණය වාර්තා සහ ඇපකරුවන් සහ අදාල කොන්දේසි අධ්‍යනය කර ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කෙරේ.

මේ වනවිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව උක්ත පරිදි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාල විසින් යෝජිත අවබෝධතා ගිවිසුම් කෙටුම්පතක් මහවැලි අධිකාරිය වෙත ලබා දී ඇත.එය අවශ්‍ය සංශෝධන සහිතව නෛතිකභාවය අධ්‍යයනය කර විධිමත් ගිවිසුම් සකස් කිරීම නීති අංශය මඟින් සිදු කරගෙන යයි.

2023.12.31 වන විට ව්‍යවසායකයින් 100 කට ණය ලබා දී අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(ඉ) මේ පිළිබඳ වාරිමාර්ග අධ්‍යක්ෂ (අම්පාර) ගේ අංක DI/AMP/W/06/WG/01/2023 හා දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ලබා දෙන ලද මුදලින් සියළු ගෙවීම් කර ඉතිරි ශේෂයන් නොමැති බවත් ඒ පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවක් අප වෙත ලබා දී ඇත.

එහි කාර්ය සාධනය විධිමත්ව සහතික කර ගැනීමෙන් පසු පියවීමේ කටයුතු සිදු කර ගැනීමට කටයුතු කරමි.

(ඊ) **පැල තවාන් අලාභ ලැබීමට හේතු**

පැල නිෂ්පාදන වියදම් අධික වීමට හේතු වී ඇත්තේ ශ්‍රම ඒකකයක පිරිවැය වැඩි වීම හා එයට සමගාමීව අනෙකුත් වියදම් ඉහළ යාම, පැල සිටුවා නඩත්තු කිරීමේදී විශාල පිරිවැයක් දැරීමට සිදුවීම වැනි හේතූන්වේ. පැලයක වර්තමාන වෙළඳපොළ මිල අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පැල තවාන් වලට අවශ්‍ය කරන පැල වර්ග ලබා දිය නොහැකි වීම, එසේම අධිශ්‍රේණි පැල විකුණුම් මිල 450*750 ක පරාසයක වූවද මෙම පැලද ගොවිපලේ සහන මිලට ලබා දීම, 2021 වසර තුල රට තුල පැවති අර්බුදකාරී තත්වය මත පැල සිටුවීම් හා මිලදී ගැනීම්ද අඩු වීම හේතූන් බලපා ඇත.

එහෙත් ඉදිරියේදී මෙම අලාභය අවම කර ගැනීමට පහත පියවර ගෙන ඇති බව දන්වමි.

1. 2024 වර්ෂයේ සිට පරිසර සංරක්ෂණ කටයුතු සඳහා මහවැලි පැල තවාන් මගින් වන පැල හා අවශ්‍ය සෙසු පැල ප්‍රජා වැඩසටහන් හරහා පැල සිරටුවීම සිදුකර පැල මිලදී ගැනීම සිදුකරමින් සැලසුම් කල පරිදි නිලධාරීන් දැනුවත් කර ඇත.

2. මහවැලි ගොවීන් වෙත කෘෂිකාර්මික බෝග පැල ලබා දීම.

මෙම පැල 50% දායකත්ව (සහන මිලට) හෝ නොමිලයේ ලබා දීම සීමා කිරීම.

3. ලාභ/ අලාභ ගණනය සඳහා නොමිලේ ලබා දෙන ලද පැල වල වටිනාකම ගණනය සඳහා යොදා ගැනීම.

4. පැල තවාන් සඳහා කම්කරු ශ්‍රම නඩත්තු වියදම් අවම කිරීම.

5. ඉහළ වටිනාකමකින් යුත් ආර්ථිකමය වශයෙන් ද වැදගත්කමක් සහිත පැල වර්ග නිෂ්පාදනය වැඩි කිරීම.

6. සෑම පැල තවානකම පැල වල විකුණුම් මිල වැඩි කිරීමට කටයුතු කිරීම.

7. පැල තවාන් තුල ඇති ගම්මිරිස්, අඹ, පොල්, කිලෝපේර, කෙසෙල් වැනි වගාවන් ක්‍රමවත්ව නඩත්තු කර එහි අස්වනු අලෙවිය මඟින් ආදායම් ඉහළ නැංවීම.

(උ) 2019 වර්ෂයේ E කලාපය අළුතින් ආරම්භ කර හසලක, මිණිපේ හා විල්ගමුව ප්‍රදේශ තුලද කෘෂිකර්ම, පශු සම්පත් හා අනෙකුත් සංවර්ධන කටයුතු ආරම්භ කිරීමත් එයට සමගාමීව වික්ටෝරියා කාර්යාලයේ කාර්ය මණ්ඩලය E කලාපය වෙත අනුයුක්ත කිරීමද සිදු කරන ලදි.

එහෙත් E කලාපය නව සංවර්ධන කලාපයක් ලෙස හදුන්වා දුන් බැවින් ඒ තුල (විල්ගමුව, මිණිපේ හා හසලක) ස්ථාපිත මහවැලි ගොඩනැගිලි නොතිබූ බැවින් කාර්යාල සහ නේවාසික පහසුකම් සඳහා පෞද්ගලික කුලී නිවාස ලබා ගැනීමට සිදු වූ අතර. ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන අනුමැතිය මත නිවාස කුලි ගෙවීම් කර ඇත.

2.3.3 අධිකාරිය සතු ඉඩම් බැහැර කිරීම.

(අ) මහවැලි කලාපවල පවතින සීමිත ඉඩම්, ජාතික හා කාලීන අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ කෘෂිකාර්මික , කාර්මික හා විවිධ ව්‍යාපෘති මෙන්ම පදිංචිය සඳහා ද රජයේ ඉඩම් ආඥා පනතේ හා ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ලබා දීමට කටයුතු කරයි.ඒ අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීමේ දී අනුගමනය කරන ක්‍රමවේදය පහත පරිදි වේ.

මෙවැනි ආයෝජන ඉඩම් බදු පදනම් මත ලබා දීම මගින් ජාතික අවශ්‍යතාවයන් ඉලක්ක කරගනිමින් කෘෂිකාර්මික,පශු සම්පත් නිෂ්පාදන හා කාර්මික ක්ෂේත්‍ර නිෂ්පාදන දේශීය වශයෙන් නිෂ්පාදනය කරමින්, ආර්ථිකය ශක්තිමත් කිරීම,විදේශ විනිමය උත්පාදනය,රැකියා අවස්ථා පුළුල් කරමින් විරැකියාව දුරලීම, දිලිඳු බව පිටුදැකීම් හා ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය ආදිය සෘජු හා වක්‍ර ලෙස ඉලක්ක කර ඇත.

ඒ අනුව හඳුනාගත් ආයෝජන ඉඩම් සඳහා පුවත්පත් දැන්වීම් මගින් අභිලාෂයන් කැඳවීම් හෝ රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන මත වරණීය පදනම් යටතේ ආයෝජකයින් තෝරාගැනීමේ ක්‍රමවේදය අනුගමනය කර ඇත. ඒ අනුව විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත විධිමත් කමිටුවක්

මගින් තාක්ෂණික,සමාජීය හා මූල්‍ය නිර්ණායක ඔස්සේ ව්‍යවසායකයින් ඇගයීමට ලක් කරන අතර ඉඩම්, ඉඩම් පරිහරණ සැලැස්මට අනුව භෞතික සැලසුම් නිර්දේශය යටතේ විධිමත් ක්‍රමවේද අනුගමනය කරමින් රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයෝජකයින් වෙත ලබාදීමට කටයුතු කර ඇත.

(ආ) ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කර ඇති ඉඩම් පිළිබඳ 2023 වර්ෂය වන විට බැහැර කර තිබූ මුළු ඉඩම් හෙක්ටයාර් ප්‍රමාණය සහ ආයෝජකයන් සංඛ්‍යාව ද එහි සංවර්ධන තත්ත්වය ද ඇතුළත් වාර්තාව මගින් දක්වා ඇත.මෙහිදී ඉඩමේ සංවර්ධන තත්වය සාපේක්ෂ මිනුමක් ලෙස ලබාගෙන ඇත.

(ඇ) පුවත්පත් දැන්වීම් මගින් අභිලාෂයන් කැඳවීම හෝ වරණීය පදනම යටතේ ආයෝජකයින් තෝරාගැනීමේ ක්‍රමවේදය අනුගමනය කර ඇත. ඒ අනුව විවිධ ක්ෂේත්‍ර වල ප්‍රවීණයන්ගෙන් සමන්විත විධිමත් කමිටුවක් මගින් තාක්ෂණික,සමාජීය හා මූල්‍ය නිර්ණායක ඔස්සේ ව්‍යවසායකයින් ඇගයීමට ලක් කරන අතර ඉඩම්, ඉඩම් පරිහරණ සැලැස්මට අනුව භෞතික සැලසුම් නිර්දේශය යටතේ විධිමත් ක්‍රමවේද අනුගමනය කරමින් රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව විනිවිදභාවයක් සහිතව විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරාගනු ලැබූ ආයෝජකයින් වෙත රජයේ ඉඩම් ආඥා පනත යටතේ වසර 30 ක කාලසීමාවක් සඳහා දීර්ඝකාලීන බදු ලබාදීම සිදු කරයි.

දිගුකාලීන බදු පදනම අවසන් වූ පසු සාමාන්‍ය ක්‍රමවේදය මත නව බදු අනුමැතියක් ලබා ගෙන මුල් ආයෝජකයාට වරණීය පදනම මත ලබා දීමට කටයුතු කරනු ලැබේ. වසර 30 ක් අවසන් වූ ඉඩම් සඳහා නැවත බදුකරය ලබා දීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඈ) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත කොන්දේසි ඇතුලත් වන පරිදි භුක්තිය භාරදීමේ වාර්තාවක් මගින් ඉඩම් බැහැර කර ඇති අතර තවද මේ දක්වා අයවීමට ඇති බදු මුදල් අයකර ගැනීම සඳහා නේවාසික ව්‍යාපාර කළමනාකාර වෙත උපදෙස් ලබා දී ඇත.

RAN ප්ලාන්ටේෂන් ආයතනය වෙත බඩ ඉරිගු වගාව සඳහා ආසන්නම ඉඩමේ රජයේ තක්සේරුව මත මත පදනම්ව ඉඩම භාර දී ඇත. එම ආයොජකයා වෙත ඉඩම් මායිම් පෙන්වන අවස්ථාවේදී ගැටළුකාරී තත්වයක් ඇති වූ බැවින් වගා කල හැකි වූ ප්‍රමාණයට පමණක් පසුව කාර්යසාධන බදු මුදල වූ රු.555,750.00 ක මුදලක් ගෙවා ඇත. මෙම ඉඩම සඳහා ආදිවාසී නායක ඇතුළු පිරිස විසින් අභියාවනාධිකරණයේ නඩුවක් පවරා ඇති බැවින් ඉඩමේ සංවර්ධන කටයුතු අත්හිටුවන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බැවින් ඉඩමේ සංවර්ධන කටයුතු නතර කර ඇත.

බඩඉරිඟු වගාව සඳහා සී.එස්.ඩබ්. හර්බල් ප්ලාන්ටේෂන් ආයතනය මගින් කාර්යසාධන බදු මුදල වශයෙන් රු.450,000.00ක මුදල ගෙවා ඇති අතර වාර්ෂික බදු මුදල අයකර ගැනීමට නේවාසික ව්‍යාපාර කළමනාකාර වෙත උපදෙස් ලබා දී ඇත.

(ඉ) එන්.කේ.එන්.එල්.කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඩිවලොප්මන්ට් ආයතනය වෙත දිගුකාලීන බදු පදනම් මත මෙම ඉඩම ලබා දී ඇත. සම්පූර්ණ සංවර්ධනය කර බදු කාලය අවසන් කර ඇත. නව බදුකරයක් ලබා දීමෙදී අක්කර 50 ට වැඩි ඉඩමක් බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන බදු අනුමැතියක් ලබා ගත යුතුය. දිගුකාලීන බදු කාලය අවසන් වූ පසු සාමාන්‍ය ක්‍රමවේදය මත නව බදු අනුමැතියක් ලබා ගෙන මුල් ආයෝජකයාට ඉඩම් ලබා දීමට කටයුතු

කරනු ලැබේ. වසර 30 ක් අවසන් වූ ඉඩම් සඳහා නැවත බදුකරය ලබා දීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඊ) **<u>නන්දසේන හේරත්.</u>**

මෙම අයගේ දළ තක්සේරුව මත හිඟ බදු මුදල රු. 3,724,800.00 ක් ලෙස විගණිත දින වන විට හඳුනාගෙන තිබුණි. එහෙත් මේවන විට මුළු බදු හිඟය රු. 6,540,763.00 ක් ලෙස හඳුනා ගෙන ඇත. මෙම අය විසින් අදාළ ඉඩමෙහි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අත්තිවාරම් දමා ඇත. වෙනත් සංවර්ධන කටයුත්තක් සිදු කර නොමැත. මෙම ආයෝජකයා විසින් අදාළ ඉඩම අවලංගු කිරීමට එරෙහිව හා බදුකරය ලබාදෙන ලෙස අභියාචනාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත. සංවර්ධනය සඳහා වසර 2 ½ ක කාලයක් ඉල්ලා සිටී. ඉහත සියළුම හිඟ බදු මුදල ගෙවීමෙන් අනතුරුව සංවර්ධනය සඳහා ලබා දීමට නඩුවේ සමතය සඳහා කටයුතු කරමින් පවතී.

<u>ලයිසියම් ජාත්‍යන්තර පාසල.</u>

අදාළ ආයතනය වෙත හිඟ බදු මුදල වන රු.11,854,160.00 මුදලක් හිඟ බදු මුදල් ලෙස පවතින අතර එම මුදල අයකර ගැනීම සඳහා එන්තරවාසි යොමු කර ඇත. එහෙත් හිඟ බදු මුදල මේවන තෙක් ගෙවා නොමැති අතර ඉඩම අවලංගු කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

<u>ලලිත් සංජීව.</u>

විගණිත තොරතුරු අනුව ලලිත් සංජීව වෙනුවට ඉරේෂා ස්පයිසි ලංකා පුද්ගලික සමාගම ලෙස සංශෝධනය විය යුතුය. එම සමාගම විසින් 2022.12.31 දිනට රු. 2,168,618.00 ක මුදලක් හිඟව පවතී. රටේ පැවති කොරෝනා තත්වය හමුවේ බදු ගෙවීමට සහන කාලයක් ලබා දෙන ලෙස අදාළ ආයතනය ඉල්ලා ඇත. එහෙත් අධිකාරිය විසින් අදාළ හිඟ බදු මුදල් ගෙවන ලෙස දන්වා ඇති අතර බදු මුදල අයකර ගැනීම සඳහා නෛතික කටයුතු ආරම්භ කිරීමට එන්තරවාසි යැවීමට කටයුතු කර ඇත.

2.3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

(අ) 2021 වසර දී එවකට පැවැති සෞභාග්‍යා කෘෂිකර්ම වැඩසටහන යටතේ හරිත කෘෂිකර්මාන්තයක් අරමුණු කොට ගෙන භෝග සඳහා රසායනික පොහොර භාවිතය සම්පූර්ණයෙන්ම නතර කිරීම හා කාබනික පොහොර භාවිතයට ගොවීන් යොමු කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව මහවැලි කලාප වල කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය සම්බන්ධයෙන් විශේෂිත වූ වැඩසටහනක් ක්‍රියාත්මක විය.

ඒ අනුව මහවැලි කලාප සඳහා වානිජ මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා , කාර්යක්ෂමව නිෂ්පාදනය කිරීම හා එහි සීඝ්‍රතාවය වැඩි කිරීම සඳහා විවිධ යන්ත්‍ර සූත්‍ර මහවැලි කලාපයන් වෙත මිලදී ගැනීම සිදු විය.

එහිදී බී කලාපයේ අරලගංවිල බීජ වී නිෂ්පාදන ගොවිපල හෙක්ටයාර් 96 ක වාරි බිම් සඳහා අවශ්‍ය කරන කාබනික පොහොර කාර්යක්ෂමව හා වේගවත්ව නිෂ්පාදනය කිරීම උදෙසා මෙම යන්ත්‍ර සූත්‍ර ගොවිපල වෙත මිලදී ගැනීම සිදු විය.

2021 වසර මෙම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු වූ අතර යන්ත්‍ර ගොවිපල වෙත ලැබීම සිදු වූයේ 2022 වර්ෂයේ පළමු කාර්තුවේ අග භාගයේදීය. ඒ අනුව කොම්පෝස්ට් නිෂ්පාදනය හා ගොවිපල සඳහා මෙම පොහොර යොදා ගැනීමට ගොවිපල කළමනාකාරීත්වය සියළු කටයුතු සූදානම් කළද 2022 වසර මැද භාගයේ දී රටේ උද්ගත වූ මූල්‍ය අර්බුදය හමුවේ පැවති සීමිත සම්පත් තුල, ගොවිපල සංවර්ධන කටයුතු බොහොමයක් අඩපණ විය. .ඒ අනුව කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියට වැය වන විදුලිය

හා යටිතල පහසුකම් සඳහා ප්‍රමාණවත් මුදල් නොමැති වීම නිසා තාවකාලිකව මෙම යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීම ද ප්‍රමාද විය.

(ගොවිපල සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන හා ඉන්ධන අවම වීම හේතුවෙන් මුළු වාරි බිම් ප්‍රමාණය වන හෙක්ටයාර් 95 න් හෙක්ටයාර් 47 ක් පමණක් 2022 යල වගා කිරීමට හැකි වූ අතර 2022/23 මහ කන්නයේ හෙක්ටයාර් 43 ක් පමණක් වගා කිරීමට හැකි වූ බවත්, තවදුරටත් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ගොවිපල වාරි බිම් 2023 යල කන්නයේ සිට ප්‍රාදේශීය ගොවි ජනතාව වෙත කන්න බදු දුන් බව සඳහන් කරමි.)

මෙම තත්වය මත තවදුරටත් ගොවිපල තුල කොම්පෝස්ට් නිෂ්පාදනයට මෙම යන්ත්‍ර යොදා ගැනීම අපහසු බැවින් ජී කලාපයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන අංගනය වෙත මෙම යන්ත්‍ර ලබා දීම සම්බන්ධයෙන් ද සැලසුම් කලද පවතින මූල්‍ය අර්බුදය හා වර්තමානය තුල රසායනික පොහොර භාවිතයට ගනු ලැබූ රාජ්‍ය ප්‍රතිපත්ති තීන්දු තීරණ මත මෙම නිෂ්පාදන අංගනයද නිෂ්පාදන ක්‍රියාවලිය තාවකාලිකව අඩපන වී ඇත. එබැවින් ඉදිරියේදී කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට විභවතාවයක් පවතින ස්ථානයන් වෙත මෙම යන්ත්‍ර සූත්‍ර ස්ථාන ගත කර කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කිරීමට සැලසුම් කර ඇත.

විශාල හා කුඩා පරිමාණයේ බහුකාර්යය කැබලි කිරීමේ යන්ත්‍ර 23 ක් 2021 වර්ෂයේ කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන සඳහා මිලදී ගනු ලැබූ අතර මෙම යන්ත්‍ර 23 ලබා දීම පහත වගුවේ සඳහන් කර ඇත.

විශාල හා කුඩා පරිමාණයේ බහුකාර්යය කැබලි කිරීමේ යන්ත්‍ර 23 ක් 2021 වර්ෂයේ කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන සඳහා මිලදී ගනු ලැබූ අතර මෙම යන්ත්‍ර 23 ලබා දීම පහත වගුවේ සඳහන් කර ඇත.

යන්ත්‍ර වර්ගය	ප්‍රමාණය	ලබා දුන් කලාප					
		බී	සී	ජී	ර.ඔ	එච්	වලව
බහුකාර්ය කැබලි කරන යන්ත්‍ර (මධ්‍යම ප්‍රමාණ)	11		4	-	-	7	-
බහුකාර්ය කැබලි කරන යන්ත්‍ර (විශාල ප්‍රමාණ)	12	1	-	1	1	7	2
කොම්පෝස්ට් හලන යන්ත්‍ර	01	*	-	-	-	-	-
කොම්පෝස්ට් කලවම් කිරීමේ යන්ත්‍ර	01		-	-	-	-	-

* ගොවිපල ,අරලගංවිල

ඉහත නම් සඳහන් කලාප වෙත මෙම යන්ත්‍ර සූත්‍ර බෙදා දීම එම කලාපයන්හි නිෂ්පාදන විභවතාවයන් හා නිර්දේශිත මුදල් ප්‍රතිපාදන මත ලබා දීම සිදු කරන ලදී.

සී කලාපය වෙත ලබා දී ඇති බහුකාර්ය කැබලි යන්ත්‍ර 04 න් යන්ත්‍ර 03 ක් එවි කලාපයේ නිෂ්පාදන ඉලක්කයන් හා වැඩි නිෂ්පාදන ධාරිතාවයන් මත විධිමත්ව ලබා දීම සිදු කරන ලදී.

එවි කලාපයේ ගොවීන්ගේ අවශ්‍යතාවය මත එම යන්ත්‍ර සූත්‍ර 03 කලාපය වෙත විධිමත්ව භාර දීම සිදු කර ඇත.

කරුණු මෙසේ වුවද 2022 වර්ෂය වන විට රටේ පැවතුනු මූල්‍ය අර්බුදය සහ රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති තීරණ වලට අනුව නැවත රසායනික පොහොර භාවිතයට අවකාශ ලබා දීම මත කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය මන්දගාමී විය.

මේ හේතුවෙන් කාබනික පොහොර නිෂ්පාදනයට මිලදී ගත් මෙම යන්ත්‍ර කිරි ගව පාලන කටයුතු සඳහා ආදේශනය ලෙස යොදා ගනු ලැබූ අතර කිරි ගවයන්ට ආහාර සූක්ෂමව ලබා දීමේ ක්‍රමයක් ලෙස, අදාල ආහාර වර්ග උදා;- තෘණ වර්ග කුඩා කැබලි කර ලබා දීම තුලින් කිරි නිෂ්පාදනය වැඩි කිරීමට හේතු වේ.මෙහිදී කාබනික පොහොර නිෂ්පාදනය හා සැසඳීමේදී මෙම උපකරණ වලින් මෙම වකවානුව තුල කිරි නිෂ්පාදනය සඳහා මෙම යන්ත්‍රයන් භාවිත කිරීම සාපේක්ෂව ලාභදායී හා ඵලදායී ක්‍රියාවකි. එම නිසා රජයේ ප්‍රතිපත්ති මත කාබනික පොහොර නිෂ්පාදනය අවම වීම තුලින් යන්ත්‍ර සූත්‍ර අදාල කාර්යයේ යොදා ගැනීමට නොහැකි වුවත් එම යන්ත්‍ර වලින් මනා කලමනාකාරිත්වයෙන් යුතුව කිරි ගව පාලනය සඳහා යොදා ගැනීම රටේ ආහාර සුරක්ෂිතතාවය සඳහා ඉවහල් වේ.

(ආ) බී කලාපයේ ස්ථාපිත කර තිබූ යන්ත්‍රවලින් විමසුමේ දක්වා ඇති යන්ත්‍ර 09 න් 06ක් සඳහා අදාල අළුත්වැඩියාව සිදුකිරීමට අදාල ටෙන්ඩර් ක්‍රියාවලිය සිදු වෙමින් පවතින බව ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අංක DNCWSTL/PD/4/6 හා 2023.10.06 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. යන්ත්‍ර 02ක් සමාජ සත්කාරක සංවිධානයක් වන "Lions club Colombo of Excellence" ආයතනය මඟින් අදාල අළුත්වැඩියාව සිදුකරමින් පවතී. අනෙක් යන්ත්‍රය ක්‍රියාත්මක තත්වයේ පවතී.

විමසුම මඟින් දක්වා ඇති එල් කලාපයේ යන්ත්‍ර 04 අළුත්වැඩියා සඳහා ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට දැන්වූ පසු එම දෙපාර්තමේන්තුව විසින් අංක DNCWS/PD/ප්‍රති ආශ්‍රිත හා 2023.03.13 දිනැති ලිපිය මඟින් අදාල අළුත්වැඩියාවන් කිරීම සඳහා මූලික ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින බව දැනුම් දී ඇත.

2.3.5 ව්‍යාපෘති කාර්යසාධනය

(අ) කන්දකාඩු කෘෂිකර්ම ආයෝජන ව්‍යාපෘතියේ පරිසර බලපෑම් අධ්‍යයන වාර්තාව සකස් කිරීම හා එහි ඉදිරි කටයුතු පැවරීම පිළිබඳ සාකච්ඡාවක් 2023.06.01 දින පැවැත්විණි. (ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන්ගේ, NLDB, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය නිලධාරීන් සමඟ)

එහිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මඟින් සිදුකර EIA අධ්‍යයන වාර්තාව සඳහා උපදේශක සේවාවට අදාල ඉදිරි ගෙවීම් කිරීම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ප්‍රතික්ෂේප කරන බැවින් ගිවිසුම් ප්‍රකාරව පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත.

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සංදේශයක් 2023.08.08 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසුව අංක 2023/353/5279 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් මෙම පරිසර අධ්‍යයන කටයුතු සඳහා මෙතෙක් දරා ඇති වියදම් හා ගිවිසුම් ප්‍රකාරව ඉදිරියට කල යුතු ගෙවීම් සම්බන්ධයෙන් උපදෙස් හා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය

මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස දුන් උපදෙස් අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කර ඇත.

(ආ) මහවැලි බී, සී හා උඩවලව කලාප වල තෘණ භූමි ලෙස නිදහස් කිරීමට සුදුසු ඉඩම් කොටස් හඳුනා ගෙන අවසන් කර ඇත. උඩවලව කලාපයේ මයුරපුර කොට්ඨාසයේ තෘණ භූමි සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 735.36ක කොටසෙහි මී ගව අභිජනන ගොවිපල 15 ක් සඳහා අක්කර 75 ක් නිදහස් කිරීමට පරිසර අනුමැතිය හා (කිරි ගොවීන් තෝරා අවසන් කර ඇති අතර) එම ඉඩම් කොටස් බැහැර කිරීමට ගරු ජනාධිපතිතුමාගේ අවසරය ලබා ගැනීමට වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාට අංක MASL/LD/22/01 හා 2023.08.25 දිනැති ලිපිය යොමු කර ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා අදාල රේඛීය අමාත්‍යාංශ වල අනුමැතිය ලැබී ඇත. (මධ්‍යම පරිසර අධිකාරිය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් කමිටු සැලැස්ම සකසා දීම.)

2022 වර්ෂයේ රටේ පැවති අර්බුධකාරී තත්වය හේතුවෙන් මෙම කටයුතු යම් ප්‍රමාදයක් වුවත් යෝජිත භූමිය කිරිගව පාලන ගොවීන්ට බෙදා දීමට 2022.07.21 දින ඉඩම් කව්ළෙරියක් පවත්වා පුද්ගලයින් 47 දෙනෙකු වෙත බැහැර කිරීමට මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. 2022 නොවැම්බර් මස වන විට එල් කලාපයේ තෘණ භූමි කිරි ගොවීන්ට නිදහස් කිරීමට අවශ්‍ය නීතිමය කටයුතු සම්පූර්ණ කර තිබුණද ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/00/08 හා 2022.11.11 දිනැති ලිපිය අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට රජයේ ඉඩම් බැහැර කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් ව්‍යාපෘතියෙහි කටයුතු තාවකාලිකව නවතා ඇති බව දන්වා සිටිමි.

(ඇ) කිරිගව පාලනයේ නියුතු ගොවීන්ගේ ගොවිපල සංවර්ධන කිරීමේ ව්‍යාපාතිය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ගව නිවාස 150 ක් හා ජල භාජන 150 ක් ඉදිකිරීමට අත්තිකාරම් නිදහස් කළ ද රට තුල දිනෙන් දින භාණ්ඩ මිල ඉහල යාම හේතුවෙන් එම මිලට ගව ගාල් සහ ආහාර භාජන ඉදි කිරීමට නොහැකි බව දන්වා ඇත.

ඒ අනුව පවතින සිමිත ප්‍රතිපාදන යටතේ ගව ගාල් 74 ක් ඉදි කරන ලෙස මාගේ අංක MASL/LD/38 -1 හා 2022.06.21 දිනැති ලිපි මඟින් ඔවුන් වෙත දන්වන ලදි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මූදල්)ගේ අංක CSB/ACCT/C/18/06/23 (06) හා 2023.06.01 දිනැති ලිපිය මඟින් මේ සඳහා රු.14,185,303.70 මුදලක් වියදම් කල බවත්, ඉතිරි මුදල සඳහා 2023.06.01 දිනැති රු. 64,696.30 ක චෙක්පත අප වෙත ලබා දෙන ලදී.

එහෙත් අත්තිකාරම් මුදල නිරවුල් කිරීම සඳහා ලබා දෙන ලද විස්තර ප්‍රමාණවත් නොවන බැවින් එම චෙක්පත හා විධිමත්ව හා කඩිනමින් නිරවුල් වාර්තා ඉදිරිපත් කරන ලෙස එම ආයතනය දැනුවත් කර ඇත.

(ඈ) මුතුවැල්ල ව්‍යාපෘතියේ පරිසර අධ්‍යන කටයුතු වල ක්ෂෙත්‍ර වැඩසටහන් ආරම්භ කිරීම සමඟ පහත සඳහන් තත්වයන් හේතුවෙන් එහි කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කරගෙනයාමට ගැටළුකාරී තත්වයන් මතු වූ අතර ඒ අනුව සැලසුම් කල කාලයට වඩා අධ්‍යන කටයුතු ප්‍රමාද විය.

i. කොරොනා වෛරසය ව්‍යාප්තිය හේතුවෙන් ඇතිවූ සංචරණ සීමා හේතුවෙන් අන්තර්පළාත් සංචරණ සිදුකිරීම අත්හිටුවීම හා එම කාලය තුල විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල අතර සම්බන්ධීකරණ ගැටළු මතු වීම .

ii. ක්ෂෙත්‍ර අධ්‍යන කටයුතු ආරම්භයේදී ව්‍යාපෘති භූමි ප්‍රදේශ අවට පදිංචි කරුවන් හා භූමිය ආශ්‍රිත අනවසර පදිංචි කරුවන්ගේ විරෝධතා දැක්වීම් හා

එම විරෝධතා වලට හේතු වූ ඉඩම් ගැටළු විසඳීම සඳහා යම් කාලයක් ගත වීම.

iii. ව්‍යාපෘති සංවර්ධනය සඳහා පුවත්පත් මගින් බාහිර ආයෝජකයන් වෙතින් සංවර්ධන අභිලාශයන් කැඳවූ අවස්ථාවේදී පෞද්ගලික ආයෝජකයන් විසින් ඔවුන්ගේ මූල්‍ය වියදමින් අවශ්‍ය යටිතල පහසුකම් සපයා ගැනීමට යටත්ව කටයුතු කල බැවින් ජල මූලාශ්‍ර හා යටිතල පහසුකම් සැපයීමට අදාල කටයුතු ශක්‍යතාවයන් අධ්‍යයනය මහවැලි අධිකාරිය විසින් සිදු නොකරන ලද නමුත් පසුව ගත් තීරණය අනුව හා පරිසර අධිකාරිය විසින් ලබාදුන් කාර්යනිර්ණයට අනුව (Terms Of Reference) හා පරිසර අධ්‍යයන කටයුතු වල අවශ්‍යතාවය පරිදි ව්‍යාපෘතියේ ජල මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනයන් හා යටිතල පහසුකම් සංවර්ධනය මහවැලි අධිකාරිය විසින් සිදුකිරීමට තීරණය වූ බැවින් ඒ පිළිබඳ සැලසුම් සකස් කිරීම සඳහා කල්ගත වීම.

කොළඹ විශ්ව විද්‍යාලය මඟින් කෙටුම්පත් IEE වාර්තාව 2022.10.17 දින සකස් කර ලබා දුන් අතර එම වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ හා අනෙකුත් ආයතන එම වාර්තාව අධ්‍යනය කර නැවත සංශෝධන ඉදිරිපත් කරන ලද අතර අවසන් වාර්තාව 2023.07.09 දින මධ්‍යම පරිසර අධිකාරියට යොමු කරන ලදී.

අවසන් IEE වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ව්‍යාපාතිය සඳහා පරිසර අනුමැතිය ලබා ගැනීම සැලසුම් කර ඇති බැවින් මෙම ව්‍යාපාතියට අදාල ඉදිරි සංවර්ධන කටයුතු කිරීමේ හැකියාවක් ඇත.

(ඉ) මහවැලි සී කලාපයේ රත්කිඳ බීජ නිෂ්පාදන ගොවිපල වාරි/වර්ෂාපෝෂිත ඉඩම් 2013 වර්ෂයේ සිට වෙන්දේසි ක්‍රමවේදය මත කන්න බදු පදනමෙන් කලාපයේ වාරි ඉඩම් හිමිකම් නොමැති දෙවන හා තෙවන පරම්පරාවල තරුණ ප්‍රජාව වෙත ලබා දීම සිදු කරනු ලැබීය. නමුත් 2021 වර්ෂයේදී රාජ්‍ය ප්‍රතිපත්ති මත කලාපීය ගොවි ප්‍රජාව සඳහා සහතික බීජ වී සපයාදීමේ අරමුණින් රත්කිඳ ගොවිපල වාරි බිම් හෙක්. 196 ක වගා කටයුතු 2021 යල කන්නයේ සිට මහවැලි අධිකාරිය විසින් සිදු කරන ලදී.

2020 වර්ෂයේ උද්ගත වූ කොවිඩ් වසංගත තත්වයෙන් පසු ඇතිවූ ආර්ථික අර්බුදය මත 2021/22 මහ කන්නයේදී රසායනික පොහොර හා කෘෂි යෙදවුම් ආනයනය සීමාකාරී වීමත්, 2022 යල කන්නයේදී රට දැඩි ඉන්ධන අර්බුදයකට මුහුණ පෑමට සිදුවීමෙන් බීම් සැකසීම් කටයුතු නිසි කලට සිදු කිරීමට නොහැකි වීමත්,2022/23 මහ කන්නයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීම සීමාකාරී වීම හා අවශ්‍යය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රවාහය නිසි ලෙස නොලැබීම මත ඉලක්කයන් සපුරාලීමේ ගැටළුකාරී තත්වයයන් ඇතිවීම යන හේතූන් මත ඉතා සාර්ථකව සිදු කරනු ලැබූ බීජ වී නිෂ්පාදන වැඩසටහන සඳහා යොමු කල භූමිය ක්‍රමිකව අඩු කිරීමට සිදු විය.

තවද වර්තමානයේ භාණ්ඩාගාර මුදල් ලබා ගැනීමේදී පවතින අර්බුදකාරී තත්වය හමුවේ ගොවිපල වල පවතින විභවතාවයන් මත සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම, ලාභදායී ආර්ථික ඒකක බවට පත්කිරීම හා ජාතික නිෂ්පාදනයට ඉහල දායක්ත්වයක් ලබා දීම අරමුණු කොට ගෙන රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදයට හෝ දීර්ඝකාලින බදු ක්‍රමවේදයට පුද්ගලික ආයෝජකයන් සම්බන්ධ කර ගැනීම සඳහා අමාත්‍යය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබීය.

ඒ අනුව විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් සුදුසු ආයොජකයන් සම්බන්ධ කර ගැනීම සඳහා වන කාර්යයන් මේ වන විටත් සිදුකරමින් පවතින නමුත් මේ සඳහා යම් කාලයක් ගත වන බැවින් සම්පූර්ණ බීම් ප්‍රමාණය වගා කිරීම හා වී නිෂ්පාදනය අරමුණු කරගෙන 2023 යල කන්නයේ සිට විධිමත් ක්‍රමවේදයන් මත ගොවිපල වාරි/වර්ෂා පෝෂිත භූමි වෙන්දේසි ක්‍රමවේදය මත කන්න බදු දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර හෙක්ටයාර 193 ක් කන්න බදුදීමෙන් රු.මි.14.6065 ක ආදායම් ලබාගැනීමට සමත් විය.

2021 වර්ෂයේදී කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය ලබාදුන් ප්‍රතිපාදන යොදාගනිමින් රත්කිද බීජ නිෂ්පාදන ගොවිපලෙහි බීජ වී නිෂ්පාදන වැඩසටහන සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම, ගොවිපල යටිතල පහසුකම් නවීකරණය කිරීම හා කමත් 03ක් ඉදි කිරීම, විභව නිෂ්පාදනයක් සඳහා සෘජුව හා වක්‍රව දායක වේ. 2021/22 මහ කන්නයේ බීජ වී මෙ.ටො.403 ක් හා වාණිජ වී මෙ.ටො.52 ක් නිෂ්පාදනයට මෙමගින් පිටිවහලක් වූ අතර, අලෙවියෙන් ලද මූල්‍ය වටිනාකම රු.මි. 72 ක් පමණ වේ. බීජ වී නිෂ්පාදනය සංකීර්ණ හා සූක්ෂම ක්‍රියාවලියකින් යුක්ත වන අතර, භූමිය සැකසීමේ සිට පසු අස්වනු හානි අවම කිරීම දක්වා වූ මෙම ක්‍රියාවලියේදී උක්ත ලබා ගත් උපකරණ හා පහසුකම් නිසි අයුරින් කන්න කිහිපයක් යොදවා ගන්නා ලදී. නමුත් වර්තමානයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමේ ගැටළුකාරීත්වය මත ගොවිපල බීජ වී නිෂ්පාදන කටයුතු කිසිසේත්ම සිදුකල නොහැකිවන බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව පුද්ගලික ආයෝජකයන් සම්බන්ද කර ගැනීමේ කාර්යයන් සිදුකරනතෙක් වෙන්දේසි ක්‍රමවේදයට අනුව කන්න බදු දීම සිදු කලයුතුවේ.

ඒ අනුව උක්ත මුදල නිෂ්කාර්ය වියදමක් නොව ආයෝජනයක් ලෙස සැලකිය හැක.

(ඊ) කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති ආයෝජකයන් විසින් 2021 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සලකා බලා එවක සිටි ජනාධිපති ලේකම්වරයා විසින් "ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව" අයකිරීම අත්හිටුවන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා අදාල අනෙකුත් ආයතන වෙත උපදෙස් ලබාදී තිබුනි. ඒ අනුව එම තීරණය ලබා දුන් 2021 නොවැම්බර් මස සිට අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නොලැබී ඇත.

එසේ වුවද 2022 ජූනි මාසයේදී අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව නැවත අයකල හැකිවන පරිදි ජනාධිපති ලේකම්වරයා විසින්ම උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව 2022 ජූනි මස සිට ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව ලැබිය යුතු වුවද ඒ වනවිට ලංකා විදුලි බල මණ්ඩලය මුහුණ දී සිටි මූල්‍ය අර්බුදය හේතුවෙන් කුඩා පරිමාණ ජල විදුලි බලාගාරවලින් මිලදී ගත් විදුලිය සඳහා ගෙවීම් නොකල අතර ඒ අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතද ලැබිය යුතු ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව නොලැබුණි. නමුත් මේ වන විට එකී මූල්‍ය අර්බුදය ක්‍රමයෙන් සමනය වෙමින් පවතින බැවින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් අදාල කුඩා පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘති සඳහා නිහ මුදල් ගෙවීම් ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතද අදාල ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව 2023 ජූලි මස සිට ලැබෙමින් පවතී.

කෙසේ වුවද ජනාධිපති ලේකම්වරයාගේ උපදෙස් පරිදි ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව ගෙවීම අත්හිටවූ 2021 නොවැම්බර් මස සිට 2022 ජූනි මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීමට හැකියාවක් නොමැත.

(උ) වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ මූලිකවම අත්‍යාවශ්‍ය වැඩ හඳුනා ගැනීම සඳහා එක් එක් කලාප මගින් වැඩ විස්තර ලබා ගත් අතර එයින් ප්‍රතිපාදන හා අත්‍යාවශ්‍යම කල යුතු වැඩ අනුව පහත සඳහන් පරිදි වැව් 275 ක් තෝරා ගන්නා ලදී.

වැව් පමණක් සංවර්ධනය කිරීම - වැව් 199

වැව් සංවර්ධනය සහ රොන් මඩ ඉවත් කිරීම - වැව් 10

රොන්මඩ ඉවත් කිරීම - වැව් 66

එයින් වැව් 152 ක වැඩ අවසන් කර ඇත.

2020 වැඩ අවසන් කල වැව් ගණන - 20

2021 වැඩ අවසන් කල වැව් ගණන - 100

2022 වැඩ අවසන් කල වැව් ගණන - 32

ඉතිරි වැව් 123 පිළිබඳ විස්තර පහත පරිදි වේ.

2022 වසරේ වැඩ ආරම්භ කර 2023 වසරේද වැඩ කටයුතු කරන වැව් ගණන-

06

ප්‍රතිපාදන අවම වීම හේතුවෙන් නවතා ඇති වැව් ගණන - 30

ප්‍රතිපාදන අවම වීම හේතුවෙන් නවතා ඇති වැව් ගණන - 30

zලසුම් කටයුතු සිදු කරන වැව් ගණන - 08

සැලසුම් කටයුතු සිදු කරන වැව් ගණන - 08

මුදල් ප්‍රතිපාදන නොමැති බැවින් සහ වැව් වල නඩත්තු හා මෙහෙයුම් කටයුතු

වලට බලපෑම් නොවන නිසා ඉදිකිරීම් නවතා ඇති වැව් ගණන - 12

වාරි සෞභාග්‍ය වැඩ සටහන යටතේ තෝරා ගත්තද කිසිදු ඉදි කිරීමක් නොකල වැව් ගණන - 67

(ඌ) මෙම කොන්ත්‍රාත්තුව 2021.09.17 දින රු.34,475,753.07+VAT ක මුදලකට යූ.පී.රනුග්ගේ ආයතනයට ප්‍රදානය කර ඇත. ගිවිසුම් ප්‍රකාරව වැඩ ආරම්භක දිනය 2021.10.01 වන අතර, 2022.07.08 වන දිනට වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2021 යල කන්නය සඳහා ජල නිකුතුව අවසන් වීමෙන් පසුව එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. තවද 2021/2022 මහ කන්නය හා 2022 යල කන්නය සඳහා ජල නිකුතුව අවසන් වීමෙන් පසුව එළැඹී කාලය තුළදී මෙහි ඉදිකිරීම් කටයුතු සිදු නොවුණි. එනම් රටේ පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික ගැටළු හේතුවෙන් එම වසර තුළ වාර්ෂික වැඩ සැලැස්මෙන් මෙම ව්‍යාපෘතියට මුදල් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට නොහැකිවීම මෙයට හේතුව විය. එමනිසා 2023.08.04 තෙක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලදී. තවද අත්තිකාරම් බැඳුම්කරය හා කාර්යසාධන බැඳුම්කරය දීර්ඝ කර ඇත. මෙහි 2023 යල කන්නය සඳහා ජල නිකුතුව අවසන් වීමෙන් පසුව ඉතිරි වැඩ නිමකර ව්‍යාපෘතිය අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

(එ) රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද කොට්ඨාශයේ නිල නිවාස ඉදි කිරීමට අදාලව 2017 නොවැම්බර් 23 දින රු. 4,861,103/= කට කොන්ත්‍රාත් අංක MA/TS/RAMBA/B/14 යටතේ ඉන්ඩිපෙන්ඩන්ට් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ ඩිවලොප්මන්ට් යන කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර ඇත. 2018 අප්‍රේල් 18 දිනට වැඩ අවසන් කළ යුතු වුවත් එහි මුල් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අතහැර දමා ගොස් තිබුණි. එම කොන්ත්‍රාත්කරු වන ඉන්ඩිපෙන්ඩන්ට් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ ඩිවලොප්මන්ට් ආයතනය වෙත ගෙවා ඇති සංවලන අත්තිකාරම් මුදල වන රු. 1,243,051.56 ක මුදල අයකර ගැනීම සඳහා මහවැලි අධිකාරියේ නීති අංශය මගින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසා ඇති අතර, ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් නීරීක්ෂණ පාදක කොට ගෙන නීති අංශය මගින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.

තවද එම කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කොටස DDG/TS/CON/RAMBA/B/14 යටතේ ඉදි කිරීම් අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කර ඇත.

(ඒ) පිලිගනිමි. ඉදිරියේදී මෙවන් තත්වයන් අවම වන සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි.

(ඔ) මේ සඳහා රු.43,883,862.00 මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් වලව කලාපයට ලැබී තිබුණි. වාරි ඇලවල් ඇතුළු නිරීමිතයන්ට සිදු වූ හානි යථා තත්වයට පත් කිරීමට ව්‍යාපෘති 10 ක් සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවෙන් ව්‍යාපෘති 08ක් සඳහා වැඩ අනුමැතිය ලැබී ප්‍රසම්පාදන කටයුතු ද ආරම්භ කර ඇති බව දන්වමි.

2.3.6 හදුනාගත් පාඩු

(අ) නේවාසික ව්‍යාපාර කළමණාකාර ඊ කලාපයට අයත් අංක WP/PD – 0455 කැබ් රථය 2021.05.07 දින අනතුරට ලක්වීම සම්බන්ධ මූලික විමර්ශනයක් පවත්වා එම නිර්දේශ පදනම් කර ගෙන කැබ් රථයේ අලුත් වැඩියා කිරීම සහ ඇස්තමේන්තු ගත මුදලින් රක්ෂණාවරණයෙන් ආවරණය නොවන මුදල කැබ් රථයේ රියදුරු ලෙස රාජකාරී කල සේවකයාගෙන් අය කිරීමට දැනුම් දී ඇත.

වාහන අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුගත මුදල රු.3,419,152.42 ක් වන අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 පරිදි ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය වෙත අංක MASL/ADM/DP/2337 හා 2023.08.23 දිනැති ලිපිය මඟින් මේ පිළිබඳ දැනුවත් කර ඇත.

(ආ) අංක CAE – 1918 දරණ වාහනය අනතුරකට ලක්වීම සම්බන්ධව මූලික විමර්ශණයක් සිදු කිරීමට අදාලව ප්‍රකාශ ලබා ගැනීම සඳහා පැමිණෙන ලෙස අවස්ථා දෙකකදී වෙන්වෙන් වශයෙන් එවකට මහවැලි කේන්ද්‍රයේ අධ්‍යක්ෂ ලෙස රාජකාරී සිදු කල නිලධාරී මහතාට සහ කොන්ත්‍රාත් පදනමින් සේවය කරන ලද රියදුරු මහතාට දැනුම් දී තිබුණද ඒ සඳහා පැමිණ නොතිබුණි.

වාහනය අනතුරට ලක්වීමෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සිදු වූ මුල්‍යමය අලාභයෙන් රක්ෂණාවරණයෙන් ආවරනය නොවන මුදල වන රු. 1,652.40 ගෙවන ලෙස එකී රියදුරු මහතාට දැනුම් දී තිබුණද එය සඳහා මේ වන තෙක් ගෙවා නොමැති බව දන්වා සිටිමි.

(ඇ) <u>අංක WP PH – 0845 කැබ් රථය අනතුරකට පත්වීම.</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත සිදුව ඇති මූල්‍යමය අලාභයෙන් රක්ෂණයෙන් ආවරණය නොවන මුදල රු. 6,217,909.16 (රු.9,991,909.16 - රු.3,774,000.00) ගෙවීම් කරන ලෙස අදාල නිලධාරී මහතා වෙත 2023.05.29 හා 2023.06.16 දිනැති ලිපි මඟින් දැනුම් දී ඇත.ගෙවීම් සම්බන්ධව මෙතෙක් පිලිතුරක් ලබා දී නොමැත. එබැවින් 2023.08.07 දිනැති ලිපිය මඟින් මේ සම්බන්ධව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීති අංශය මඟින් කටයුතු සිදු කරමින් පවතී.

2.3.7 වාහන පද්ධතිය කළමනාකරණය

(අ) <u>අංක WP JF – 3105 දරණ කැබ් රථය අස්ථානගත වීම.</u>

වලව කලාපයට අනුයුක්ත අංක WP JF – 3105 දරණ කැබ් රථය අස්ථානගත වීම සම්බන්ධව මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා 2023.05.02 දිනැති ලිපිය මඟින් පත්කරන ලද කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.

මෙම දරණ කැබ් රථය අස්ථානගත වීම සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (1) අනුව 2023.06.21 දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇති

අතර මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ කටයුතු සඳහා ලේකම්තුමා විසින් පත්කල කමිටුව ප්‍රකාර අදාල විමර්ශනය ආරම්භ කර ඇත.

(ආ) වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් මෙම වාහන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා දෙන ලෙස හෝ එම වාහන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත රැගෙන යන ලෙස දැනුම් දී ඇතත් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත.

(ඇ) කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ කාල සීමාව තුල ආනයනය කරන ලද උක්ත වාහන එම අවස්ථා වලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කාර්යාල නමින්ද තවත් සමහර වාහන ආධාර සපයන ලද ආයතන නමින්ද ලියාපදිංචි කර ඇත. අදාල වාහන ව්‍යාපෘතිය අවසානයේ එහි මූලිකම ආයතනය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දීමට කටයුතු කර ඇති නමුත් එහි ලියාපදිංචි අයිතිය විධිමත් අන්දමින් පවරා දීමට කටයුතු කර නොමැත. වසර 30 කට අධික පැරණි මෙම අබලි වාහන වල අයිතිය සඳහන් ආයතන දැනට රට තුල ක්‍රියාත්මකව නොපවතී.

අංක 31 – 9908 හා 32- 2129 වාහන වල අයිතින් පිළිවෙලින් හයාමාතෝඩා හා හිල් ඉන්ටර්නැෂනල් යන විදේශීය ආධාර සැපයූ ආයතන වේ. උක්ත වාහන දෙක ඉහත (II) හි සඳහන් ආකාරයට ගෙන්වන ලද වාහන වේ. එහි වැසි අංක කපා ඉවත් කර මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය වෙත භාරදීමට කටයුතු කර ඇත. 2023 වර්ෂයේ අගොස්තු මස පැවති අපහරන (Disposal) ක්‍රියාවලිය යටතේ අබලි ද්‍රව්‍ය ලෙස (යකඩ බරට) අදාල ටෙන්ඩරය අනුව විකුණුම්කරුවන් විසින් දැනටමත් මුදල ගෙවා කලාප වලින් රැගෙන ගොස් ඇත.

2023 වර්ෂයේ මැයි මාසයේදී වාහන ලෙස බැහැර කිරීමට හඳුනාගන්නා ලද වාහන අපහරණය කටයුතු සිදු කර අවසන් කර ඇති බව දන්වා සිටිමි.

2.3.8 මානව සම්පත් කළමනාකරණය

2023.09.01 දින ගරු විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් හා වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා හා අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන වල නිලධාරීන් සමඟ පැවැත්වූ විශේෂ සාකච්ඡාවේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වර්තමාන කාර්යභාරයට අනුගතව ප්‍රතිව්‍යුහගත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු බවත්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉදිරි වැඩ සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන ලෙසත් තීරණය වීම.

ඒ අනුව අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ අයදුම්පත් කැඳවා තනතුරු පුරප්පාඩු පිරවීම තාවකාලිකව අත්හිටුවා ඇති බව දන්වමි.

එම.එල්.ඩී.සී. මහේන්ද්‍ර අබේවර්ධන,

අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

පිටපත්.

1. ලේකම් - වාරිමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022

V - කොටස

පටුන

1.1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය

1. වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය 173

2. රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය 174

3. රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය 175

1.2. එක් එක් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

1.2.1 කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල ප්‍රගතිය 176-177
1.2.2 වාරි සෞභාග්‍ය වැඩසටහන 178
1.2.3 මහවැලි ආයෝජන කලාප සහ පාරිසරික සංචාරක කලාප සංවර්ධනය 178
1.2.4. ආයතන සංවර්ධන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය 178
1.2.5. ඉඩම් ලබා දීම 179
1.2.6. පරිසර සංරක්ෂණය 179

1. **ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය**

1.1 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු. මිලියන)	3957.10	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, වවුනියාව, මුලතිව්
අරමුදල් මූලාශ්‍රය	GOSL	ප්‍රතිලාභීන්	5,700 පවුල්
ව්‍යාපෘති කාලසීමාව	2012-2023		
මූල්‍ය වෙන් කිරීම 2022 (රු. මිලියන)	40.00	**2023 ප්‍රතිපාදන ඉල්ලීම් (රු. මිලියන)**	32.00
සමුච්චිත මූල්‍ය ප්‍රගති පිරිවැය (රු. මිලියන)	2534.386	**මූල්‍ය ප්‍රගතිය 2022 (රු. මිලියන)**	37.666
		සමස්ත භෞතික ප්‍රගතිය	92.5 %
භෞතික ප්‍රගතිය - 2022	• මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය - කිලෝමීටර 30 කි • වැව් පුනුරුජ්ජාපනය - වැව් 01 • වාරි ඇල පුනරුත්ථාපනය - කි.මී1.5 • ගොඩනැගිලි ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම - ගොඩනැගිලි 01 • මිනුම් කර ඇති බිම් කොටස් - කැබලි අක්ෂර 744 • ඔප්පු ප්‍රදානය - 1940 ප්‍රදාන සහ ඔප්පු සම්පූර්ණ කර ඇත • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන - වැඩසටහන් 83		
සමස්ත භෞතික ප්‍රගතිය 2022.12.31	• කිලෝමීටර් 422 ක මාර්ග ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම • නල බෝක්කු 393ක් ප්‍රතිසංස්කරණය කරන ලදී • ඇළ කිලෝමීටර් 81ක් ප්‍රතිසංස්කරණය කර ඇත • වැව් 01 හා ප්‍රතිසංස්කරණය කරන ලද වාරි ව්‍යුහයන් 131 ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම • ඉඩම් කැබලි අක්ෂර 16698 ක් මැන ලබා ඇත. • ප්‍රදාන සහ ඔප්පු 5412ක් සම්පූර්ණ කර ඇත • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 1498ක් පවත්වන ලදී • ගොඩනැගිලි 140ක් ඉදි කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම • ගොවීන් 5800ක් සඳහා කෘෂිකර්ම හා පශු සම්පත් ව්‍යාප්ති සේවා		

1.2 රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු. මිලියන)	1086.00	ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක	අම්පාර
අරමුදල් මූලාශ්‍රය	GOSL	ප්‍රතිලාභීන්	(මහඔය /පදියතලාව) පවුල් 15, 975
ව්‍යාපෘති කාලසීමාව	2012-2023		
මූල්‍ය වෙන් කිරීම **2022** (රු. මිලියන)	60.00	**2023** ප්‍රතිපාදන ඉල්ලීම් (රු. මිලියන)	රු.මි. 43
සමුච්චිත මූල්‍ය ප්‍රගති පිරිවැය (රු. මිලියන)	706.648	මූල්‍ය ප්‍රගතිය **2022** (රු. මිලියන)	46.636
		සමස්ත භෞතික ප්‍රගතිය	86%
භෞතික මූල්‍ය ප්‍රගතිය **2022**	• ආනයනික සීමා සහිත බෝග වගා කිරීම හෙක්ටයාර 2084 • ගෙවතු සංවර්ධනය උද්‍යාන 13715ක් • ගොවීන් / නිලධාරීන් පුහුණු වැඩසටහන් 60 • කිලෝමීටර් 35ක මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම • වැව් 3ක් ප්‍රතිසංස්කරණය කිරීම • ගොඩනැගිලි 4ක් ඉදිකිරීම • ඉඩම් මැනුම් සහ බිම් කැබලි 600 ක් අවසන් කිරීම • බලපත්‍ර 359ක් නිකුත් කර ඇත • කැබලි අක්ෂර 28 ක් සඳහා වන්දි ගෙවන ලදී • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 78		
සමස්ත භෞතික ප්‍රගතිය **2022.12.31**	• හෙක්ටයාර 2084 ආනයනික සීමා සහිත බෝග වගා කිරීම • ගෙවතු සංවර්ධනය උද්‍යාන 13715ක් • ගොවීන් / නිලධාරීන් පුහුණු වැඩසටහන් 60 වැඩසටහන. • මාර්ග කිලෝමීටර 246 ක් සම්පූර්ණ කර ඇත • වැව් 3ක ප්‍රතිසංස්කරනය නිම කර ඇත. • 1.925 km F ඇළ සහ D ඇළ සහ අමුණ 2ක් ප්‍රතිසංස්කරණය කර ඇත. • ගොඩනැගිලි 79ක් නිම කර ඇත • ඉඩම් මැනුම් කිරීම් කැබලි 2,264 ක් සම්පූර්ණ කර ඇත. • අවසර පත්‍ර 2137 නිකුත් කරන ලදී • කැබලි අක්ෂර 568ක් සඳහා වන්දි ගෙවා ඇත. • ආයතනික සංවර්ධන වැඩසටහන් 514 සම්පූර්ණ කර ඇත • කුඩා ව්‍යාපාර 51ක් සඳහා වෙළඳපල අවස්ථා ලබා දීම • ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 10 ක් පවත්වා ඇත. • 50% දායකත්වය යටතේ 41 දෙනෙකු සඳහා යන්ත්‍රෝපකරණ සැපයීම • වගා ළිං 121 ක් ඉදිකරන ලදී. • සනීපාරක්ෂක සෞඛ්‍ය සේවා පද්ධති 840ක් වැඩිදියුණු කර ඇත. • විදුලි අලි වැට කිලෝමීටර් 10 ක නඩත්තු කටයුතු • රුක් රෝපණ වැඩසටහන යටතේ පැල 5000ක් සිටුවා පරිසර වැඩසටහන් 8ක් පවත්වන ලදී.		

1.3 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	1100.00	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	බදුල්ල (රිදීමලියද්ද)
අරමුදල් මූලාශ්‍රය	GOSL	ප්‍රතිලාභීන්	පවුල් 19, 127
ව්‍යාපෘති කාලසීමාව	2012-2022		
මූල්‍ය වෙන් කිරීම 2022	40.00	**2023 ප්‍රතිපාදන ඉල්ලීම් (රු. මිලියන)**	0.00
සමුච්චිත මූල්‍ය ප්‍රගති පිරිවැය (රු. මිලියන)	870.577	**මූල්‍ය ප්‍රගතිය 2022 (රු. මිලියන)**	33.997
		සමස්ත භෞතික ප්‍රගතිය	98%
භෞතික මූල්‍ය ප්‍රගතිය 2022	• කි.මී. 18.5 මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත • හෙක්ටයාර 3468 ක් තුල ආනයනික සීමා සහිත භෝග වගා කිරීම සිදු කර ඇත • ගෙවතු සංවර්ධනය යටතේ ගෙවතු 17079 ක් සංවර්ධනය කර ඇත • ගොවීන් / නිලධාරීන් පුහුණු වැඩසටහන් යටතේ වැඩසටහන් 48 ක් පවත්වා ඇත • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 25 පවත්වා ඇත • රුක් රෝපණ වැඩසටහන 3 ක් යටතේ රුක් රෝපණ කටයුතු සිදු කර ඇත • වැව් 2 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් වී ඇත • ගොඩනැගිලි 1ක් ඉදිකර නඩත්තු කර ඇත		
සමස්ත භෞතික ප්‍රගතිය 2022	• වැව් 22 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් වී ඇත • 1 ව්‍යුහයක් පුනරුත්ථාපනය කර ඇත . • ඇළ කිලෝමීටර් 72.84ක් ප්‍රතිසංස්කරණය කරන කටයුතු අවසන්කර ඇත • 108.10 km ප්‍රමාණයක මාර්ගය ප්‍රතිසංස්කරණය කර ඇත. • බෝක්කු 4ක් ප්‍රතිසංස්කරණය කර ඇත. • ගොඩනැගිලි 43ක් නිම කර ඇත • ආනයනික සීමා සහිත භෝග වගා කිරීම හෙක්ටයාර 1508 • ගෙවතු 17079 ක ගෙවතු සංවර්ධනය • ගොවීන් / නිලධාරීන් පුහුණු වැඩසටහන් 48 ක් පවත්වන ලදී • සනීපාරක්ෂක පහසුකම් 2,284 ක් සපයා ඇත. • ආයතනික සංවර්ධන වැඩසටහන් 310ක් පවත්වන ලදී. • රුක් රෝපණ වැඩසටහන් 9ක් පවත්වන ලදී		

1. කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල ප්‍රගතිය

1.1. කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

අංක	ප්‍රධාන සංචාරකය	ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)	ප්‍රගතිය (මෙ.ටො)	%
1	**කෘෂිකර්ම නිෂ්පාදනය**			
1.1	**බීජ - මහවැලි ගොවිපල**			
	බීජ වී	2,832.6	1,443.00	85%
	වෙනත් ක්ෂේත්‍ර බෝග	83.8	15.12	18%
1.2	**බීජ - ගොවින්**			
	බීජ වී	4,909.5	5,018.50	102%
	වෙනත් ක්ෂේත්‍ර බෝග	1,232.1	1,008.20	82%
1.3	**ආහාර බෝග නිෂ්පාදනය**			
	වී	985,547.0	723,944.00	73%
	වෙනත් ක්ෂේත්‍ර බෝග			
	ලොකු ලූනු	74,792.0	11,358.00	15%
	සෝයා	7,227.0	8,485.90	117%
	උඳු	5,485.0	1,244.00	23%
	කවුපි	2,634.0	1,861.00	71%
	කුරක්කන්	2,479.0	1,366.50	55%
	මූං ඇට	10,121.0	1,319.00	24%
	බඩ ඉරිගු	83,417.0	20,112.00	24%
	රට කජු	8,436.0	2,388.00	28%
	මිරිස්	64,435.0	10,140.00	16%
	තල	753.0	394.40	52%
	කහ	5,750.0	6,820.00	119%
	ඉඟුරු	3,680.0	4,680.00	127%
1.4	**පළතුරු**			
	කෙසෙල්	182,340.0	152,230.00	83%
	පැපොල්	57,036.0	38,970.00	68%
	පේර	20,750.0	18,020.00	87%
	අනෙකුත් පලතුරු (අඹ,Dragon , අන්නාසි, පැෂන්, තැඹිලි)	35,852.0	58702.50	163%
1.5	**එළවළු**	233,175.0	212,154.00	91%
2	**කාබනික කලාප සංවර්ධනය - ජී කලාපය (හෙ.ක්)**	1,970.0	1,745.80	89%
2.1	මහවැලි කලාප වල කාබනික පොහොර නිෂ්පාදනය - කොම්පෝස්ට්	304,532	27199	59%

1.2. පශු සම්පත් නිෂ්පාදනයේ ප්‍රගතිය සහ පශු සම්පත් හා ධීවර අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

	ප්‍රධාන ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්කය 2022	ප්‍රගතිය 31.12.2022
	කිරිගව සංවර්ධනය			
	ගොවිපල සැලසුම් සැකසීම හා කිරි ගොවීන් පුහුණු කිරීම	කිරි ගොවි පවුල්	2000	1445
	ගව නිවාස හා උපාංග ලබාදීම	නිවාස හා උපාංග	380	420
	විසිතුරු මත්ස්‍ය වගාව			
	අභිජනන ගොවිපල සංවර්ධනය	ගොවීන්	17	12
	මඩ පොකුණු/ නිරෝධායන පොකුණු ලබාදීම/යටිතල පහසුකම් සංවර්ධනය	ගෘහ	102	97
	කුකුළු නිෂ්පාදන ප්‍රවර්ධනය			
	සුළු පරිමාණ ගොවීන් මධ්‍ය පරිමාණයට පුළුල් කිරීම	ගොවි පවුල්	120	120
	මසක් වයසැති පැටවුන් ලබාදීම	වැඩසටහන්	40,536	37,692
	මධ්‍ය පරිමාණ ගොවීන් වාණිජ ඒකක බවට පත් කිරීම	ගොවිපල	37	37
	මත්ස්‍ය ඇඟිල්ලන්	මිලියන	30	22.8
	මත්ස්‍ය ඇසිත්තන්	මිලියන	32	21.31
	මිරිදිය ඉස්සන්	මිලියන	6	5.94
	දැල්කූඩු ලබාදීම	කූඩු	4	4

		ඉලක්කය (මෙ.ටො) වාර්ෂික	ප්‍රගතිය (මෙ.ටො)	%
	සත්වපාලන			
	මිරිදිය මත්සය (මෙ.ටො)	14,000	14397.7	100 %
	කිරි (ලිටර් මිලි)	50	48.34	96 %
	බිත්තර (මිලි)	80	61	76 %
	විසිතුරු මසුන් (යුගල මිලි)	41	42.55	100 %

2 වාරි සෞභාග්‍ය වැඩසටහන

වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහනේ ප්‍රගතිය - 2022.12.31

කලාප	2022 සඳහා හඳුනාගත් වැව්	ප්‍රතිපාදන (රු. මි)	පුනුරුත්ථාපනය කල වැව් 2022	
			ඉලක්කය	ප්‍රගතිය
බී	9	4.00	3	1
සී	8	17.8	5	2
ඩී	14	7.73	9	4
එච්	37	16.21	21	20
හුරුළුවැව	1	0.32	1	0
එල්	5	1.7	2	0
වලව	5	8.97	3	1
රඹකැන් ඔය	25	23.10	9	4
ඊ	7	0.20	1	0
එකතුව	**111**	**80.00**	**54**	**32**

3 . මහවැලි ආයෝජන කලාප සහ පාරිසරික සංචාරක කලාප සංවර්ධනය

මහවැලි ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

ප්‍රධාන ක්‍රියාකාරකම	ඒකකය	වාර්ෂික ඉලක්කය	ප්‍රගතිය 30.09.2022
ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයින් තෝරා ගැනීම	ඇගයීමට ලක්කල අයදුම්කරුවන් සංඛ්‍යාව	200	165
	බැහැර කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)	100	14.58

4. ආයතන සංවර්ධන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

	ප්‍රධාන සංචාරකය	ඉලක්කය	ප්‍රගතිය	%
	වෘත්තීය පුහුණුව ලත් රැකියා විරහිත තරුණයින් රැකියා සඳහා යොමු කිරීම (තරුණයින්)	975	697	71%
	මහවැලි කලාපවල දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම (ක්‍රීඩක ක්‍රීඩිකාවන්)	2050	2264	100%
	මහවැලි සවිය ණය යෝජනා ක්‍රමය යටතේ තෝරාගත් කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට ණය පහසුකම් ලබා දීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීම (ප්‍රතිලාභීන්)	250	250	100%

5. ඉඩම් ලබා දීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ප්‍රදාන නිකුත් කිරීමේ ප්‍රගතිය - 2022.12.31

කලාප	වාර්ෂික ඉලක්කය (ඔප්පු)	ප්‍රමාණය
බී	6,700	5,363
සී	7,700	3,897
ඩී	300	727
ඊ	100	99
ජී	1,100	1,673
එච්	5,600	5,245
එල්	5,000	1,243
හුරුළුවැව	1,600	655
රඹකැන් ඔය	1,500	657
වලව	34,800	4,241
එකතුව	**65,000**	**23,830**

6. පරිසර සංරක්ෂණය

පරිසර සංරක්ෂණ වැඩසටහනේ ප්‍රගතිය - 2022.12.31

ප්‍රධාන සංචාරක	ඒකකය	ඉලක්කය 2022	ප්‍රගතිය 31.12.2022
පැල නිෂ්පාදනය (මහවැලි තවාන්, පාසල් ළමුන් හා ගොවීන් මඟින්)	පැල	661,250	920,360
ඉහළ ජලාධාර හා පහළ නිම්න ප්‍රදේශ ආශ්‍රිත රුක්රෝපණය	පැල	207,600	226,751
ඉහළ ජලාධාර ප්‍රදේශ ආශ්‍රිත පාංශු සංරක්ෂණ වැඩසටහන	මීටර	20000	10456
පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන	වැඩසටහන්	101	94
පාරිසරික බලපෑම් අධ්‍යයනය	ව්‍යාපෘති	Open	7
ඉහළ ජලාධාර ප්‍රදේශ ආශ්‍රිත ජල තත්ව හා ජල විද්‍යා අධ්‍යයනය	ස්ථාන	27	27
පටක රෝපිත පැල නිෂ්පාදනය	පැල	370,000	50350
අලිමිනිස් ගැටුම් අවම කිරීම(අලිවෙඩි, එනජයිසර් ආදිය) හා ජීව වැට නඩත්තුව	කි.මී	31.5	31.5
ආක්‍රමණශීලී ආගන්තුක ජලජ ශාඛ ඉවත්කිරීම	වැව් ගණන/ හෙක්ටයාර	4	4
උද්‍යාන අලංකරණය හා කසළ කළමනාකරණය	වැඩසටහන්	3	5
හරිත උද්‍යාන පිහිටුවීම	උද්‍යාන	12	1